# සිළුමිණ
சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 93 වැනි කාණ්ඩය 11 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුද්ධ වර්ෂ 2565ක් වූ කුම්භ රවි 29 භාග මැදින් පුර එකළොස්වක තිථිය ලත් රිවි දින ■ වෂී 2022ක් වූ මාර්තු මස 13 වැනිදා ඉරිදා මිල රු 100.00



















# සර්වපාක්ෂික සමුළුව මාර්තු 23 දා

# පළාත් සභා සහ පුංචි ඡන්දෙ ළඟදීම

නිහාල් පී. අබේසිංහ

පළාත් සභා හා පළාත් පාලන මැතිවරණ හැකි ඉක්මනින් පැවැත්වීමට රජය තීරණය කර ඇත. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් සහ අගමැති මහින්ද රාජපක්ෂයන් ප්‍රමුඛ ඇමැති පිරිසක් සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ඇතුළු ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයන් පිරිසක් ඉකුත් දා කළ විශේෂ සාකච්ඡාවේදී ඉදිරිපත් වූ යෝජනාවකට අනුව මේ තීරණයට එළැඹුණු බව රජයේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් සිළුමිණට ඉකුත් සිකුරාදා හෙළි කෙළේය.

## සිමෙන්ති හිඟය අවසන්-ලංවා සිමෙන්ති වෙළෙඳ පොළට



මෙරට විශාලතම සිමෙන්ති කම්හල වන ලංවා සංස්ථා සිමෙන්ති කම්හලේ නිෂ්පාදන කටයුතු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් මාගම්පුර කර්මාන්ත පුරයේදී ඉකුත් දා ආරම්භ විය. මෙම කර්මාන්ත ශාලාව මඟින් පැයකට සිමෙන්ති කොට්ට ලක්ෂ දෙකක් නිපදවිය හැකි අතර, වසරකට සිමෙන්ති මෙට්‍රික් ටොන් ලක්ෂ 28ක් නිෂ්පාදනය කළ හැකිය. ඒ අනුව වසරකට සිමෙන්ති කොට්ට මිලියන 76ක් නිෂ්පාදනය කළ හැකි බවට තක්සේරු කර තිබේ. ශ්‍රී ලංකාවේ වාර්ෂික පාරිභෝගික අවශ්‍යතාවය සිමෙන්ති මෙට්‍රික් ටොන් ලක්ෂ 70ක් වන අතර ඉන් මෙතෙක් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කළේ සිමෙන්ති මෙට්‍රික් ටොන් ලක්ෂ 30කි. මෙම අවස්ථාවට ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සභාපති නන්දන ජයදේව ලොකුවිතාන, ඇමැතිවරුන් වන චමල් රාජපක්ෂ, බන්දුල ගුණවර්ධන, පවිත්‍රා වන්නිආරච්චි සහ රාජ්‍ය ඇමැති ඩී. වී චානක ඇතුළු ආරාධිතයන් රැසක් එක්ව සිටියහ. **(සටහන - රසික කොටුදුරගේ, ඡායාරූපය - සාලිය රූපසිංහ)**

## දෙමසක් ඇතුළත සංචාරකයන් ලක්ෂ 2ක්



තාරක වික්‍රමසේකර

මේ වසරේ මුල් දින 65 තුළ සංචාරකයන් ලක්ෂ දෙකකට අධික පිරිසක් පැමිණ තිබෙන බව සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග සිළුමිණට කීය. ජනවාරි 01 වැනිදා සිට මාර්තු 06 දක්වා වූ කාලය තුළ මෙරටට පැමිණ ඇති සංචාරකයන් සංඛ්‍යාව 200,798 ක් බවද ඔහු පෙන්වා දුන්නේය. ජනවාරි මාසයේ දී සංචාරකයන් 82,327 දෙනෙකු මෙරටට පැමිණ ඇති අතර පෙබරවාරි මාසයේ පැමිණි සංචාරකයන් ගණන 96,507කි. මාර්තු මස මුල් දින 06 තුළ මෙරටට පැමිණ ඇති සංචාරකයන් සංඛ්‍යාව 21,964කි. මෙරටට වැඩිම සංචාරකයන් පැමිණ ඇත්තේ රුසියාව, ජර්මනිය, ඉන්දියාව යන රටවල්වලිනි. එසේම නව සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සැලසුම් කර ඇති බවත් පැවසූ ඇමැතිවරයා ගෝලීය සංචාරක ප්‍රවර්ධන වැඩසටහන ද මේ වසර තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව කීවේය. ඒ යටතේ වසරේ දෙවන කාර්තුවේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 56ක් ඒ වෙනුවෙන් යෙදවීමට කටයුතු යොදා තිබේ.


## සංවර්ධන ලොතරැයියේ 2017/18 වසරේ වංචා රැසක්

සුභාෂිණී ජයරත්න

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2017 සහ 2018 වර්ෂයන්හි වැඩ සටහන් පටිගත කිරීම්, ගිවිසුම් කඩ කිරීම්, වාහන අනිසි භාවිතා කිරීම් ආදියෙන් වංචා රැසක් සිදුව තිබේ. සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන් පටිගත කිරීමේ අරමුණින් රුපියල් මිලියන 38ක් වැය කර ඉදිකරන ලද චිත්‍රාගාරය අපේක්ෂිත අරමුණ වෙනුවෙන් 2015 සිට මේ දක්වාම භාවිත නොකර ඇති අතර, ඒ වෙනුවෙන් රුපියල් මිලියන 2,146ක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට වැඩසටහන් පටිගත කිරීම සඳහා ගෙවා ඇත.

මෙම කරුණු හෙළි වූයේ පාර්ලිමේන්තුවේදී කෝප් කමිටුව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත්ගේ

2 පිටුවට

# බලගන්වමු සිහින
ව්‍යාපාරයට සවිමත් සබැඳියාවක්

සන්නිවේදන තාක්ෂණයේ අති නවීනතම සුවිශේෂී සේවාවන් රැසක් සමඟින් තොරතුරු සන්නිවේදනයේ විශිෂ්ටතම විසඳුම් ඔබ වෙත ගෙන එමින් ඔබේ ව්‍යාපාරය දිනෙන් දින දියුණුව කරා රැගෙන යන්නට ඔබ දකින සිහින බලගන්වන්නට SLT-MOBITEL වෙතින් ව්‍යාපාරික ප්‍රජාව වෙත තොරතුරු සන්නිවේදනය හා සබැඳුණු විශිෂ්ටතම ව්‍යාපාර විසඳුම් මාලාවක්!

දැන් SLT-MOBITEL සමඟින් ඔබ දකින ලොකුම සිහිනයත් සිහිනයක් නොවේ.


මෙම විශේෂ දීමනා 2022 මාර්තු 18 දක්වා වලංගු වේ.

#NODREAMTOOBIG

011 2 389 389 0705 004 000 bizsolutions@slt.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව


## සිම්පල් මෑන්



"මොන ප්‍රශ්න තිබුණත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ටික ගැන බලන එක නං හොඳයි."

## ලයිසන් අලුත් කරන්න මාස 6ක සහන කාලයක්

තාරක වික්‍රමසේකර

අප්‍රේල් මස 1 වැනිදා සිට ජූනි 30 වනදා දක්වා කල් ඉකුත් වන රියැදුරු බලපත්‍රයන්හි වලංගු කාල සීමාව මාස 6කින් දීර්ඝ කර ඇතැයි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පවසයි. එමෙන්ම ජූලි මස 01 සිට සැප්තැම්බර් 30 දක්වා කල් ඉකුත් වන රියදුරු බලපත්‍ර කල් ඉකුත් වන දිනයේ සිට මාස 03 කින් දීර්ඝ කිරීමටද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

කොවිඩ් වසංගතය නිසා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ද දීර්ඝ කාලයක් වසා තැබුණු හෙයින් රියදුරු බලපත්‍ර විශාල සංඛ්‍යාවක් එකවර අලුත් කිරීමට සිදුවීම නිසා එය දෙපාර්තමේන්තුවට දැරිය නොහැකි ප්‍රමාණයක් බවත් අදාළ දීර්ඝ කිරීම් කාලය තුළදී රියදුරු බලපත්‍ර අලුත් කර ගන්නා ලෙසත් දෙපාර්තමේන්තුව ඉල්ලා සිටී.

## පාරිභෝගික, ග්‍රහලෝක සහ ක්ෂය රෝග ජගත් දින සැමරුම්

2 පිටුවට

## සියලු සිසුන් සඳුදා සිට පාසලට

රජයේ පාසල්හි සියලු සිසුන් මාර්තු 14 සඳුදා සිට පාසල් පැමිණිය යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිවේදනය කර තිබේ. ඒ අනුව සියලුම සිසු සිසුවියන් සාමාන්‍ය පරිදි පාසලට පැමිණිය යුතු වේ. වසංගතය හමුවේ පාසල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය යටතේ අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බවද එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වේ.

## ඖෂධ මිල හිතුමතේට බෑ

ඖෂධ මිල තීරණය කිරීමට ඔසුසල් හිමියන්ට හෝ ආනයනකරුවන්ට ලබා දී නොමැති බවත් ඖෂධ මිල තීරණය කිරීම එසේ හිතුමතේ කළ නොහැකි බවත් ඖෂධ නිෂ්පාදනය සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

## ආසියානු බැංකුවෙන් ඩොලර් බිලියන 2ක්

අමිල මලවිසූරිය

මේ වසර තුළ ලංකාවේ ක්‍රියාත්මක වන ව්‍යාපාති වෙනුවෙන් ඩොලර් බිලියන 02 ක ණය ආධාර ආසියානු සංවර්ධන බැංකුව මඟින් වෙන් කර තිබේ. පසුගිය වසරේ මෙරට සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ඩොලර් මිලියන 750 ක සහන ණය මුදලක් ලබා දුන් අතර, එම ව්‍යාපෘති මේ වන විට ඉහළ ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ සභාපති සත්සුගු අසකාවා මෙම කරුණු හෙළි කෙළේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් සමඟ ඉකුත් 10 වැනිදා ජනාධිපති කාර්යාලයේ පැවැති සාකච්ඡාවකදීය. ආසියානු සංවර්ධන බැංකුවේ 55 වැනි වාර්ෂික සම්මේලනය සැප්තැම්බර් මස 5 සිට 8 දක්වා කොළඹදී පැවැත්වීමට නියමිතය.

# වසර 116ක දිවි ගමනට සමුදුන්

# ඩිංගි හාමි ආත්තම්මා



● අමිල මලවිසූරිය

**සියවසකටත් වඩා වැඩි ජීවිත කාලයක් ගෙවූ ඇය ඉකුත් මාර්තු 9 වැනිදා රාත්‍රියේ සිය ජීවන ගමනට සමුදුන්නාය. නමින් ඇය කංකානම් ගමගේ ඩිංගිහාමිය. මාතර අකුරැස්සේ අතුරලිය සුන්දර ගම්මානයේදී ඇය උපත ලැබුවේ 1906 ජනවාරි 11 වැනිදාය. මියෙන තුරුම යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවූ ඩිංගිහාමි ජීවත් වූයේ වාහල කනංකේ, පාළුවත්ත ගම්මානයේ සිය බාල පුතුගේ නිවෙසේය.**

වියපත් නමුදු නිතර සුන්දර, සුපසන් සිනාවකින් මුව සරසාගෙන සිටින පින්බර ආත්තම්මා කෙනෙකු වූ ඩිංගිඅම්මා මීට කලකට පෙර අපට හමු වූයේය. පුතුගේ නිවෙසේ මිදුලේ අඹ ගස් සෙවණේ එදා විවේකිව පුටුවක අසුන්ගෙන සිටි ඇය ස්නේහවන්ත සිනහවකින් අප පිළිගත් අයුරු අදටත් සිහිපත් වේ. දත් නැති මුව වටේ මෙන්ම රැළි වැටුණු සුදු වන් වූ මුහුණේ තැනින්තැන දිගට දිගේ වැවුණු කෙස් ගස් නිසා 'රැවුල් ආත්තම්මා'ලෙස කාගෙත් ආදරයට පාත්‍රව සිටි ඩිංගිහාමි ආත්තම්මා ගීතයක් සේ සුන්දර සිය ජීවිත කතාව එදා අප හමුවේ තැබුවේ සොම්නසින් යුතුවය.



ඩිංගි හාමිගේ වැඩිහිටි හැඳුනුම් පත

## ලංකාවේ වයස්ගතම කාන්තාව ඇයයි



බුදුන් වඳින අම්මා

"අම්මයි තාත්තයි එක්ක අපේ පවුලේ හත් දෙනෙක් හිටියා. අපේ පවුලේ සහෝදර සහෝදරියන් හතර දෙනෙක්. මමයි පවුලේ බාලයා. මගේ සහෝදර සහෝදරියෝ කවුරුවත්ම මේ වෙද්දි ජීවතුන් අතර නැහැ. ජීවතුන් අතර ඉන්නේ මම විතරයි. මම ඉපදුණ අතුරලිය ගම හරිම ලස්සනයි. ගහකොල සතා සීපාවා, දිය කඩිති, මහා ගස්වැල්වලින් ලස්සන වුණු ගමක්. ඒ කාලේ ගමේ තාර පාරවල් තිබුනේ නැහැ. සතියකට දෙකකට සැරයක් කරත්තයක් දෙකක් පාරේ ගියා මිසක් ගමේ මිනිස්සු වැඩි හරියක් ගියේ පයින් තමයි. ගම්මු කඳමළු අරගෙන ගියේ කර තියාගෙන. ගමන් බිමන් නැගම් ගියෙත් එහෙමයි. ගම් පළාතේ වැඩිදෙනෙක් කළේ ගොවිතැන. ගමේ ඈතට වෙන්න කඩ මණ්ඩියක් තිබුණා මතකයි."



පවුලේ බාල දරුවා වීම නිසා පවුලේ සියලු දෙනාගේ නොමඳ ආදරයට ලක්වූ ඩිංගි අම්මා පාසල් ගොස් ඇත්තේ අතුරලිය නාරංකැටිය පාසලටය. පාසල් ජීවිතයේ සොඳුරු මතක ඇය අප සමඟ කීවේ උද්‍යෝගයෙනි.

"ඒ කාලේ ගුරුවරු හරිම සැරයි. ඉස්කොලේ යන්නේ නැති ළමයි බලන්න ලොකු ගුරුතුමා ගෙවල්වලට එනවා. ඇවිත් නඩු දමනවා කියනවා ළමයි පාසල් එව්වේ නැතිනම්. ඒ නිසා කෑම නොකෑවා කෑවා කියලා බලන්නේ නැතුව, තියන ඇඳුමක් ඇඳගෙන අපිට ඉස්කෝලේ යන්න වුණා."

එසේ පාසල් ගිය ඩිංගි හාමි අධ්‍යාපන කටයුතු මෙන්ම ගෙවතු වැඩ, අත්කම් වැඩ පමණක් නොව වගා කටයුතුවලද නිරත වූවාය.

" අපි පාත්ති හදලා ලස්සනට මල් වැව්වා. ඒවාට පොහොර දාන්න අපි කෙල්ලෝ ටික කොළපොතක් අරගෙන පාසලේ ඉඳලා ගමේ කරත්ත පාරවල් දිගේ ගියා මට අද වගේ මතකයි. එදා වැඩිදුර

## දරුවන් 2යි, මුනුපුරු මිනිබිරියන් 24යි

අධ්‍යාපනය කරන්න පාසලට ගියේ අඩුවෙන්. වත්තේ කුඹුරේ ගෙදර වැඩ කරන්න තමයි අම්මලා අපිට ඉගැන්නුවේ. පොල් ලෙලි තැලුවා.වත්තේ පිටියේ වගා කළා. වී ගොවිතැන කළා. එව්වට මහ ඇයෝ එක්ක පිරිමි අපේ සහෝදරයන් එක්ක උදව් කළා. කෙල්ලො අපි මැහුම් ගෙතුම් කළා. බීරළු රේන්ද වියනවා. පැඳුරු වියනවා. මටත් අම්මා තමයි පැඳුරු වියන්න ඉගැන්නුවා. අපේ නැද්දටත් රටා දමලා ලස්සනට පන් මළු, පන් පැඳුරු වියන්න හැකියි"



ඇය ට ලබා දී ඇති තිළිණ සහතික

## අවුරුදු කුමරි කිරුළ ද පැලඳි ඇය නැටුම, ගැයුමටත් හපනියක්

සොඳුරු යෞවනය පිළිබඳ ඩිංගි හාමි අත්තම්මාගේ මතක ද බෙහෙවින් සුන්දරය. ඇය ඒ මතක අවදි කළේ කෝල සිනහවක් පාමිනි.

"මම ගැටිස්සි කාලයේ හරිම දඟයි කියලා අපේ අම්මයි, නැන්දලයි කියනවා. එදා අපේ ගමේ අවුරුදු කුමාරිය වුණෙත් මමයි. අවුරුදු කුමාරි වෙලා මම තෑගි දිනලා තියෙනවා" ඩිංගි හාමි අත්තම්මාගේ වත පුරා ඇති සුන්දරත්වය ඇය අතීතයේදී සුන්දර යුවතියකව සිටි බවට සාක්ෂි සපයයි. එමෙන්ම සියවසක් ඉක්මුවද අදටත් ඇය බොහෝ නිරෝගීය. ඒ නිරෝගී බවට හේතුව ආහාරපාන පුරුදු බව ද ඇය අපට කීවාය.

"ඒ කාලේ අපි වැඩිපුර කෑවේ කැකුළු හාල් බත් එක්ක අල, බතල, කොස්,දෙල්. මිරිදිය මාළු තමයි කෑවේ. කරවල හොඳි එක්ක කොස් කන්න මම අදත් කැමැතියි. ඉඳ හිට මස්, මාළු කනවා. අපි ඒ කාලේ නැවේ වැවේ, ඇලේ දොලේ තමයි. ඒ කාලයේ එස්.ඒ වික්‍රමසිංහ මහත්තයා දේශපාලනය කරනවා මට මතකයි. ඒ මහත්තයා ගමේ මිනිස්සුන්ට හරියට උදවු කළා. අපේ ගෙදර සමඟ සමීප සම්බන්ධතාවයකුත් වික්‍රමසිංහ මහත්යාට තිබුණා."

ඩිංගි හාමි ගේ විවාහය සිදු වන්නේ මවුපියන්ගේ පූර්ණ අනුදැනුම මත මඟුල් කපුවකු මාර්ගයෙනි. ඇයගේ අත ගත් ඔහු එම්.ජී ධනෝරිස් අප්පු ය.

"කසාද බැඳලා මම උන්දෑ එක්ක කනංකේ පාළුවත්ත ගමට ආවා. අපිට දරුවන් තුනක් හිටියා. කොල්ලෝ දෙන්නයි එක දුවයි. දුව පුංචි කාලයේදිම මිය ගියා. පසුව පුතාලා දෙන්න හදාගෙන අපි මෙහෙ හිටයා. මගේ එක්කෙනා කුළී වැඩ කළා. මමත් තේ දළු කැඩුවා. කුරුඳු ඉඩම් උදළු ගෑවා."

මීට වසර 44කට පෙර ඩිංගි හාමිගේ සැමියා ජීවිතයෙන් සමුගත්තේය. ඔහු පැලඳවූ මංගල මුදුව මියෙනතුරුම ඇයගේ වෙඳැගිල්ල සැරසුවේය. දෙදරු මවක වන ඩිංගි හාමිගේ ලොකු පුතු එම්.ජී පියදාස (83) වන අතර බාල පුතු එම්.ජී සිරිසේන (79)ය. ඩිංගි හාමිට මුනුපුරු මිනිබිරියන් 24 දෙනෙකි. ඒ සියලු දෙනා සමඟ ඇය සිය ජීවිතයේ සැඳෑ සමය ගත කළේ ඉතා සතුටිනි. ගීත,සිංදු, කවි, සී පද කියන්නට මනා හැකියාවක් තිබූ ඩිංගිහාමි ආත්තම්මා රබන් වැයීමටත් පැල් කවි,පතල් කවි සහ නෙළුම් කවි කියන්නට ද හපනියකි. ආගම දහමටද ඇල්මක් ඇති ඇය තුන් සරණ කවි කියන්නේ ඉතා මිහිරිවය.

දිනපතා මල්පහන් පුදා බුදුන් වඳින ඇය ජ්‍යෙෂ්ඨ පුරවැසියකු ලෙස විවිධ ඇගයීම්වලටද ලක්වූවාය. එසේ ඇය ලැබූ තිළිණ, සහතික ඇය අපට පෙන්වූයේ සතුටිනි. වැලිගම වැලිවිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, එහි නිලධාරින් මෙන්ම,දකුණු පළාත් සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම් තුමා ද ඩිංගිහාමිගේ දුක සැප නිරතුරුවම සොයා බැලූ බව ද අපට දැනගන්නට ලැබිණි.

එහෙත් ජීවිත ගමන යනු ආවොත් යළි යා යුතුම ගමනක් බව පසක් කරමින් ඉකුත් 09 වැනිදා ඩිංගි හාමි ද දිවි ගමන හැරගියාය. ජීවිත ගමනෙන් සමුගන්නා තුරුම ඩිංගිහාමි ආත්තම්මා රැකබලා ගත්තේ ඇයගේ බාල පුතු සහ ඔහුගේ බිරිය කේ. වී. කරුණාවතී(73)ය. සිය මවට මෙන්ම ඩිංගි හාමි අම්මාට සෙනෙහස පෑ කරුණාවතී ඩිංගිහාමිගේ වියෝවින් තැවෙන්නීය.

"මම මගේ නැන්දාම්මාට මගේ අම්මට වගේ සැලකුවේ. මගේ අම්මා වසර කිහිපයකුට පෙර මිය ගියා. ඉතින් මම මගේ අම්මා කියලා හිතාගෙන නැන්දම්මාට සැලකුවා. රෑ දෙගොඩ හරියේත් දුව දුව කියලා අම්මා කතා කරනවා. අම්මට සලකන එක වදයක් කියලා මම හීනෙන්වත් හිතුවේ නැහැ. ඒ නිසාම අම්මා පාළුව අපට හැමදාමත් දැනෙයි."

මෙරට වයස්ගතම කාන්තාව වූ ඩිංගි හාමි ආත්තම්මා දැන් අප අතර නැත. එහෙත් වයස අවුරුදු 116ක් තරම් දිගු ආයු කාලයක් ගෙවන්නට පින් කළ ඇය සිය සමීපතමයන් අතර ඉතිරි කර ගිය මතක සදාදරණීයය.

**ඡායාරූප සහ පසුබිම් තොරතුරු- හබරාදුව නිමල් අල්ගෙවත්ත**


## කහතුඩුව අවමංගල්‍යාධාර සමිති 45 වැනි සංවත්සරය 26 - 27 දිනවල

කහතුඩුව අවමංගල්‍යාධාර හා සුබසාධක සමිතියේ 45 වැනි සංවත්සර සැමරුම වෙනුවෙන් 26 වැනිදා දහවල් කහතුඩුවේ ශ්‍රී නන්දනාරාම විහාරස්ථානයේදී සපිරිකර සංඝගත දක්ෂිණාවක් පැවැත්වේ. ඊට පසු සංවත්සර මහා සභා රැස්වීම කහතුඩුව ශ්‍රී නන්දනාරාමාධිපති පෙතිගමුවේ සුමනතිස්ස හිමිපාණන් හා කහතුඩුව සුමන පුෂ්පිකාරාමාධිපති ඌනපානේ සෝරත හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් 27 දී සවස 2 ට කහතුඩුව ශ්‍රී නන්දනාරාමයේදී පැවැත්වේ.

## හම්බන්තොට සිංහගිරි විහාරයේ පින්කම් මාලාවක්

හම්බන්තොට අඩි 100 පාර සිංහගිරි විහාරාධිපති සූරියවැව ජාතික පාසලේ ආචාර්ය, ශාස්ත්‍රපති, විතාරන්දෙණියේ වජිර හිමියන්ගේ අනුශාසනා පරිදි සිංහගිරි විහාර දායක සභාව සංවිධානය කරන මැදින් මහ පිංකම මාර්තු 17 දා පෙරවරු 7.00 සිට පැවැත්වේ.

## කහවත්තේ ආනන්ද නාහිමිට සංඝනායක ධූරයක්



පස්සර, බිබිලේගම ශ්‍රී මංගල බෝධිරාජරාමාධිපති ශාස්ත්‍රපති කහවත්තේ ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේට ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව මඟින් ඌව පළාතේ උපප්‍රධාන සංඝනායක පදවිය පිරිනමා ඇත. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ප්‍රධාන විශ්වවිද්‍යාල කීපයකින් ගෞරව උපාධි ලබාගත් නාහිමියෝ බිබිලේගම මහා විද්‍යාලයේ විශ්‍රාමලත් විදුහල්පති වරයෙකි. ජාතික, ආගමික, සාමාජික, සංස්කෘතික හා අධ්‍යාපනික සේවාවන් රාශියක් ඉටු කිරීම නිසා සංඝ සභාව මෙම පදවිය පිරිනමා ඇත.

1 වෙනි පිටුවෙන්

## පළාත් සභා සහ පුංචි ඡන්දෙ...

මේ සඳහා අවශ්‍ය මැතිවරණ නීති රීති සංශෝධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම තේරීම් කාරක සභාවේ සභාපති සහ අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධනට දැනටමත් උපදෙස් දී තිබේ.

මේ අතර රජය හා ශ්‍රීලනිපය අතර සාකච්ඡාවේදී ශ්‍රීලනිපය කළ ඉල්ලීමක් අනුව පවත්වන සර්වපාක්ෂික සමුළුව මාර්තු 23 පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කරමින් පවතී.

## සංවර්ධන ලොතරැයියේ...

සභාපතිත්වයෙන් ඉකුත් 10 වැනිදා පැවැති කාරක සභා අවස්ථාවේදීය. මෙයට අමතරව සුදුසුකම් සපුරා නොතිබූ ප්‍රවාහන හිමිකම් නොමැති නිලධාරීන් 8 දෙනෙකු සඳහා නිල වාහන වෙන් කිරීම්, 2008 වර්ෂයේදී වාහන නියෝජිත ආයතනයකින් රුපියල් මිලියන 8 කට වඩා වටිනා කැබ් රථයක් කිසිදු අනුමැතියකින් තොරව මිලදී ගැනීම හා එම වාහනය සම්බන්ධ මතු වූ නීති කටයුතු වෙනුවෙන් අතිවිශාල මුදලක් මණ්ඩලයට දැරීමට සිදුවීම පිළිබඳව විගණන වාර්තා මඟින් ප්‍රශ්න කර තිබේ.

## පාරිභෝගික, ග්‍රහලෝක සහ ක්ෂය රෝග ජගත් දින සැමරුම්

'සාධාරණ ඩිජිටල් මූල්‍ය' තේමාවෙන් යුතුව මාර්තු 15 වැනිදාට යෙදෙන මෙවර ජගත් පාරිභෝගික අයිතිවාසිකම් දිනය සැමරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සිවිල් සංවිධාන රැසක් කටයුතු යොදා ඇත. එමෙන්ම මාර්තු මස දෙවනි සති අන්තයේ යෙදෙන ජාත්‍යන්තර ග්‍රහලෝකාගාර දිනය සැමරීම සඳහා 12 වැනි සෙනසුරාදා පෙරවරුවේ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර පරිශ්‍රයේදී විශේෂ වැඩසටහනක් පැවැත්වේ. තවද මාර්තු 24 වැනිදාට යෙදෙන ක්ෂය රෝග දිනය නිමිත්තෙන් වැඩසටහන් ගණනාවක් පැවැත්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්ෂය රෝග මර්දන සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන සැලසුම් කර තිබේ. වසර 2035 දී ක්ෂය රෝගයෙන් තොර ශ්‍රී ලංකාවක් සඳහා කැපවීමේ අරමුණින් එම වැඩසටහන් පැවැත්වෙන අතර මෙවර දිනයේ තේමාව ජීවිතයට 'ආයෝජනයක් - ක්ෂය රෝගයෙන් තොර හෙටක් යන්නය'



**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මඟින් ප්‍රකාශිත 'මාධ්‍ය සමීක්ෂා - iv' ශාස්ත්‍රීය ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී ඉකුත් මාර්තු 02 වැනිදා පැවැත්වුණි. ජනමාධ්‍ය අමාත්‍ය ඩලස් අලහප්පෙරුමගේ ප්‍රධානත්වයෙන් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අනුෂ පැල්පිට ගේ සහභාගිත්වයෙන් පැවැති උත්සවයේ ප්‍රධාන දේශනය ප්‍රවීණ මාධ්‍යවේදී නාලක ගුණවර්ධන පැවැත්වූ අතර උපහාර කලාප ශාස්ත්‍රීය දේශනය ආචාර්ය ටියුඩර් වීරසිංහ විසින් පවත්වන ලදී. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සභාපති මහින්ද පතිරණ විසින් ජනමාධ්‍ය අමාත්‍ය ඩලස් අලහප්පෙරුමට අදාළ කෘතිය පිළිගැන්වූ අවස්ථාවයි මේ.**



**මාරාපොළ ශ්‍රී නාග තපෝවනයේදී වෛද්‍ය සායනයක් පැවැත්වූ අතර එම අවස්ථාවට සහභාගි වූ ගම්පහ දිස්ත්‍රික් බෝ නොවන රෝග ඒකකයේ වෛද්‍ය චින්තක ලියනගේ, කොරස මූලික රෝහලේ ප්‍රධාන වෛද්‍ය රුවන් රණසිංහ, ග්‍රාම නිලධාරිනී නිල්මිණි රත්නපාල, හෙද කාර්ය මණ්ඩලයේ ගයනි චම්පා ඩී.එම්. ජයසිංහ, එම්.ඩී.සී. රුවන්ති, ඩබ්.ඒ. ජයසිරි සහ සංවිධායක මණ්ඩලයේ විශ්‍රාමික යුද හමුදා නිලධාරි සාලිය නෙරංජන ඇතුළු පිරිස සායනය අවසානයේ සේයාරුවකට පෙනී සිටි අයුරු.**

BOVANS
ලොව ප්‍රකට ලේයර්ස්
ශ්‍රී ලංකාවේ සරු එල නෙලා ගත් කිකිළි පැටවුන්
* වැඩි බිත්තර නිෂ්පාදනයක්
* ඉතාම ශක්තිමත් බිත්තර කටුවක්
* වැඩි ජීවන ශක්තියක්
දික්කන්ද ෆාම්ස්
යක්කල පාර, වතුරුගම. බ: ප:
ටෙලි: 033 5626501 ෆැක්ස්: 033 2279674

තොග වශයෙන් විකිණීමයි
ක්‍රියාකාරී තත්වයේ පවතින සහ නොපවතින ඉලෙක්ට්‍රොනික විදුලි උපකරණ, උපාංග සහ අමතර කොටස් විකිණීමට ඇත. පරීක්ෂා කර බලා මිල ගණන් ඉදිරිපත් කිරීම 2022 මාර්තු 14 සිට 16 දක්වා කාර්යාලීය වේලාව තුළ පහත ලිපිනයේ දී පැවැත්වේ.
ක්‍රවුන්සිටි ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගම
නොː 793/28, කඩොල්කැලේ වත්ත,
ලියනගේමුල්ල, සීදුව.





**ලොව ප්‍රථම අගමැතිනිය වන සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ ඡායාරූපමය චරිතාපදාන ග්‍රන්ථය ජගත් කාන්තා දිනය යෙදී තිබුණු මාර්තු 8 දා කොළඹ බණ්ඩාරනායක කෞතුකාගාරයේදී දොරට වැඩීම සිදුවිය. මේ එහිදී ග්‍රන්ථයේ සම්බන්ධීකාරක ආචාර්ය රන්ජිත් කබ්රාල් විසින් ග්‍රන්ථයේ ප්‍රථම පිටපත බණ්ඩාරනායක කෞතුකාගාරයේ ලේකම් සුනේත්‍රා බණ්ඩාරනායකට පිරිනැමූ අවස්ථාව. මෙම ග්‍රන්ථය සරත් පෙරේරා, ඩබ්. එම්. කේ. විජේබණ්ඩාර සහ නාලක ගුණවර්ධනගේ සම්පාදනයකි.**



**කොළඹ සරසවි ශ්‍රීපාලි මණ්ඩපයේ අධ්‍යාපන අංශයේ මහාචාර්ය රංජන් හෙට්ටිආරච්චි විසින් සම්පාදිත මාධ්‍ය පර්යේෂණ ග්‍රන්ථය නිකුත්වීම මාර්තු 7 දා කොළඹ ජාතික පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී උත්සවාකාරයෙන් පැවැත්විණි.**

**මාධ්‍ය පර්යේෂණ ග්‍රන්ථයේ මුල් පිටපත මහාචාර්ය රංජන් හෙට්ටිආරච්චි විසින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් මොහාන් සමරනායක වෙත පිළිගැන්වූ අවස්ථාව මෙහි දැක්වේ.**



**රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්නගේ ප්‍රතිපාදන යටතේ කලණ මිතුරු කැළ සුබසාධක සමිතිය වෙත ප්ලාස්ටික් පුටු බෙදාදීමක් ඉකුත්දා සිදුකරන ලදී. ශ්‍රීලනිප කැලණිය සංවිධායක සම්පත් අලහකෝන්ගේ මැදිහත්වීමෙන් එම පුටු සමිතියේ සභාපති කේ. සී.එන්. වීරසිරිට ලබාදුන් අවස්ථාව මෙහි දැක්වේ.**

# සීමා වූ ආනයනික සීමා

● ටානියා මෝසස්

**ක්‍රමවේද තුනක් ඔස්සේ කෙටි කලකට ආනයනය සීමා කළ බව පසුගිය 09වැනිදා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිවේදනය කළේය. පවතින ආර්ථික තත්ත්වය පිළිබඳ සිදුකළ විග්‍රහයකින් අනතුරුව මහ බැංකු නිර්දේශ මත මේ සීමා ප්‍රකාශයට පත් විය.**

පළමු ක්‍රමවේදය යටතේ තෝරාගත් ආනයනික භාණ්ඩ ආනයනය අධෛර්ය කිරීම සඳහා බදු පැනවිණි. දෙවැනි ක්‍රමවේදයට අනුව ඇතැම් ආනයනික භාණ්ඩවලට බලපත්‍ර ලබා ගැනීම අනිවාර්ය කෙරිණි. තුන්වන ක්‍රමවේදය යටතේ ඇතැම් ආනයනික භාණ්ඩ සඳහා බදු සහ බලපත්‍ර අනිවාර්ය කර තිබිණි. විශේෂ ආනයන බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ දැඩි අධීක්ෂණයක් තුළය. එම බලපත්‍රය මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ආනයන - අපනයන පාලක විසින් ලබා දෙන්නකි.

ඒ අනුව අනිවාර්ය වලංගු බලපත්‍රයක් යටතේ පමණක් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ 367 ආනයනය කිරීමට යටත්ව පසුගිය 09 වැනිදා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් ගැසට් නිවේදනයක් නිකුත් කළේය. ඒ අතුරින් භාණ්ඩ 38ක් සඳහා විශේෂ බදු පැනවිණි. ආනයනයට බලපත්‍ර ලබා ගැනීම අනිවාර්ය භාණ්ඩ යටතට ගැනෙන ආහාර බාණ්ඩය අතර ඇපල්, දොඩම්, මිදි, වියළි මිදි, රට ඉඳි, බටර්, මුදවපු කිරි, යෝගට්, ඕට්ස්, චොක්ලට් වර්ග, පැස්ටා, කෝන් ෆෙලක්ස්, ඛනිජ ජලය, ආදිය විය. මස් හා මාළු ආශ්‍රිත නිෂ්පාදන, සකස් කරන ලද ආහාර, පිටි ආශ්‍රිත නිෂ්පාදන, ආනයනික මත්පැන් වර්ග සහ ආනයනික දුම්වැටි වර්ග සඳහා ද බලපත්‍ර අනිවාර්ය කර තිබිණි.

පාරිභෝගික භාණ්ඩ ලෙස සුවඳ විලවුන් සහ ක්ලෝන් වර්ග, රූපලාවණ්‍යය ද්‍රව්‍ය, මුඛ සෞඛ්‍යයට අදාළ නිෂ්පාදන, ඉටිපන්දම් සහ ලාම්පු වර්ග, ටයි වර්ග, ක්‍රීඩා පාවහන්, හිස් වැසුම්, කුඩ, පනා, සෙරමික් නිෂ්පාදන, වීදුරු නිෂ්පාදන, විදුලි නොවන ගෘහස්ථ උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ, ගමන් මලු, හම් හා රබර් මිශ්‍රිත පාවහන්, ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන, රැවුල් කැපීමේ විද්‍යුත් උපකරණ සහ උපාංග, සඳහා ද ආනයන සීමා පැනවී තිබුණේ බලපත්‍ර අනිවාර්ය කරමිනි.

වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, මයික්‍රොවේව් උඳුන්, රයිස් කුකර්, ටෝස්ටර්, තේ සහ කෝපි සෑදීමේ යන්ත්‍ර, ඇස් කණ්ණාඩි, රූපවාහිනී, අත් ඔරලෝසු, සෙල්ලම් බඩු අනිවාර්ය ආනයන සීමාවලට යටත් විය. සියලුම වර්ගයේ ජංගම සහ ස්ථාවර දුරකථන ඩිජිටල් සහ වීඩියෝ කැමරා, පරිගණක සහ පරිගණක උපාංග පමණක් නොව, ගිටාර්, ඕගන්, වයලින් වැනි තෝරාගත් සංගීත භාණ්ඩ ද මේ බලපත්‍ර මත ආනයනයට යටත් කෙරිණි.

කෙසේ වෙතත් මුදල් අමාත්‍යාංශය පැවසුවේ රටේ පවතින ආර්ථික තත්ත්වය ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් වඩා යහපත් මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කිරීමට ආනයන සීමාකිරීමේ ක්‍රමෝපායන් ඉවහල් වනු ඇතැයි විශ්වාස කරන බවය.

මෙම තාවකාලික ආනයන සීමා පවතින්නේ රටේ උග්‍රවී ඇති ආර්ථික අර්බුදය කළමනාකරණය කරගන්නාතුරු පමණක් බව ද රජය දැනුම් දුන්නේය.

මේ ප්‍රවේශ රටේ සමාජ ආර්ථික දේහය විෂයෙහි කෙසේ බලපානු ඇති ද? එය විද්වත් කථිකාවක් ගොඩනැඟීම සඳහා පදනම සපයන අතිශය කාලීන ප්‍රවේශයකි. අප මේ අවස්ථාව විවරණය කරගැනීම සඳහා මුලින්ම සම්බන්ධ කරගන්නේ දේශපාලන ආර්ථික විද්‍යාව පිළිබඳ අපේ රටෙහි විද්වතෙක් වන මහාචාර්ය සුමනසිරි ලියනගේ ය. මේ මොහොතේ පැනවූ ආනයන සීමා සම්බන්ධව ඔහු තුළ පවතින්නෙ පැහැදිලි සුබවාදී දැක්මකි. එහෙත් ඒ සීමා පැනවූ ආකාරය පිළිබඳ ඔහුට යම් මතවාදයක් තිබේ.

"මම හිතන්නෙ ආනයන සීමා කිරීම මේ අවස්ථාවේ හැටියට වැදගත් සහ ගතයුතු පියවරක්. නමුත් ඒ සීමා කිරීමේ ක්‍රමය ඒ තරම්ම උචිත නෑ. මේ නිෂ්පාදන යම්කිසි බලපත්‍ර ක්‍රමයක් යටතේ ආනයන කිරීමයි සිදුවෙලා තිබෙන්නෙ. බලපත්‍ර ක්‍රමය යටතේ ආනයනය කිරීම විශාල දූෂණයන්ට මඟ පාදනවා පමණක් නොවෙයි, අපේක්ෂිත ප්‍රතිඵල අත්කර නොදෙන්නත් පුළුවන්.

මා හිතන විදිහට බලපත්‍රවලට ආනයනයට කරනවාට වඩා හොඳයි තෝරාගත් භාණ්ඩ තහනම් කිරීම. ලංකාව තවමත් අවුරුද්දකට අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියනයකට වඩා වැඩි ප්‍රමාණයක් වැය කරනවා.

මේ අනිවාර්ය ආනයන පාලනය සමඟම ඊට සමාන්තරව ගත යුතු පියවර තමයි ආදේශක ගුණාත්මක විදිහට නිෂ්පාදනය. චීස් වැනි නිෂ්පාදන ආනයනය කරන ප්‍රමාණයට සමාන වටිනාකමකින් අපි චීස් අපනයනය කරනවා. චීස් වැනි නිෂ්පාදන ගුණාත්මක විදිහට නිෂ්පාදනය කළ හැකියි. අනෙක් අංශවලත් ආනයන ආදේශක ලෙස එවැනි නිෂ්පාදන හැකියාවක් ඇති කළ යුතුයි. විශේෂයෙන් රටේ කාර්මික නිෂ්පාදන සඳහා මෙවැනි පියවරක් ගත යුතුයි. මෙය ඉතාම වැදගත් ප්‍රවේශයක්.



මේවන විට පවතින ආර්ථික අස්ථාවරත්වයෙන් ගොඩ ඒමට ආනයන පාලනය පමණක් ප්‍රමාණවත් නොවන බව මහාචාර්යවරයාගේ හැඟීමය." අද ලංකාවේ පවතින විදේශ විනිමය සංචිත අර්බුදයකට ආනයන සීමා කිරීමෙන් යම්තාක් විදේශ විනිමය ඉතිරි කරගන්න පුළුවන්. නමුත් අද තිබෙන ආර්ථික අර්බුදයට මේ පියවර ප්‍රමාණවත් නෑ. මේ අවුරුද්දේ ඩොලර් බිලියන 6ක් ණය වාරික ලෙස අපට ගෙවන්න වුණා. ලංකාවේ ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ සැලකිය යුතු තරම් හිඟයක් තිබෙන අවස්ථාවක ගත යුතු පියවර තමයි යම් කාලපරිච්ඡේදයක් තුළ මෙම ණය නොගෙවීමට එකඟත්වකින් හෝ ඒක පාර්ශ්විකව තීරණයක් ගැනීම. මේ අදහස විවේචනයට තුඩුදිය හැකියි. එහෙත් සිදුකළ යුතු ප්‍රායෝගිකම දේ එයයි.

මේ ඇති වූ තත්ත්වයට මෙරට පහළම තීරය වගකිව යුතු නැති බවත් මේ අර්බුදයට වගකිව යුතුවන්නේ ඉහළ මධ්‍යම පන්තිය හා ඉන් ඉහළ සමාජ තීරුව බවත් මහාචාර්යවරයා කියයි. මේ ආනයන පාලනයෙන් යම් පීඩාවක් ඇති වේ නම් ඒ මධ්‍යම පන්තියෙන් ඉහළ සමාජ තීරුවේ පරිභෝජන රටාවට බවත් ඔහු පෙන්වා දෙයි.

"රටේ දෘෂ්ටියෙන් ගත්තොත් අද පවතින ආර්ථික අර්බුදයට ප්‍රධානම හේතුව අපි අපේ රටේ ශක්තියට වඩා පරිභෝජනය කරන ජාතියක් වීම. එවැනි තත්ත්වයක දී මෙවැනි ආනයන සීමා අත්‍යාවශ්‍යයයි. "

මේ අර්බුදයෙන් ගොඩඑන්නට හැකි යම් ප්‍රායෝගික ක්‍රියාවලීන් කිහිපයක් මාහාචාර්යවරයා පෙන්වා දෙන්නේය.

පළමු පියවර ලෙස ඉදිරි වසර කිහිපය තුළ අපට වාර්ෂිකව ගෙවන්නට නියමව තිබෙන ඩොලර් බිලියන 06ක ණය මුදල වසර පහක් තුළ ගෙවීම අත්හිටුවීම. ඒ හැර අනෙක් හැම පියවරකින්ම වෙන්නෙ මේ කියන ණය කන්ද වැඩි කර ප්‍රශ්නය කල් දැමීමක්. මේක ජාත්‍යාන්තර මූල්‍ය අරමුදලට ගියත් මිත්‍ර රටවලට ගියත් සිදුවෙනවා. 2012න් පස්සෙ ණය කන්ද සමුච්ඡනය වෙන විදිහට ආණ්ඩු ක්‍රියා කිරීමයි මෙතෙක් ලංකාවේ අනුගමනය කළ ක්‍රමවේදය. කෙටිකාලීනව ණය නොගෙවීමේ එකඟතාවකට නැවිත් මේ අර්බුදයෙන් මිදෙන්න බෑ. මේ දිගුකාලීන ව්‍යුහාත්මක අර්බුදයට පිළියම් සොයන විට එහි නරක ප්‍රතිවිපාක සමාජයේ පහළ තීරුවට නොලැබෙන ලෙස කටයුතු කළ යුතුයි. මේ සමඟ ලංකාවේ අයවැය ලේඛනය තුළ ආණ්ඩුවේ ආදායම ඉහළ දැමීමට අනුක්‍රම බදු ක්‍රමයක් අනුගමනය කළ යුතුව තිබෙනවා. බදු අය කරන සීමාව අද තිබෙන දෙලක්ෂ පනස් දහසෙන් ලක්ෂය දක්වා පහළට දැමිය යුතුව තිබෙනවා." මහාචාර්යවරයා කියන්නේය.

මහාචාර්ය සිරිමල් අබේරත්න කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකි. ඔහු මේ ප්‍රශ්නය දකින්නේ වෙනස්ම ප්‍රවේශයකිනි.

"මෙය ආනයනික භාණ්ඩ සීමා කිරීමකට වඩා තෝරා ගත් භාණ්ඩ පාලනය කිරීමක්. අපි කන්න බොන්න ඕනේ මොනවද කියලා තීරණය කරන්නෙ වෙනත් පාර්ශ්වයක්. එය මොන තරම් ආචාරධර්මවලට එකඟද යන ප්‍රශ්නය තිබෙනවා.




වමේ සිට, මහාචාර්ය සුමනසිරි ලියනගේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සිරිමල් අබේරත්න

දෙවනුව අපි භාණ්ඩ තෝරා ගැනීමේදී නිර්ණායක හදනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ, සුඛෝපභෝගී භාණ්ඩ සහ සුඛෝපබෝගී නොවන භාණ්ඩ ලෙස. අපි පහසුවෙන් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සහ අත්‍යවශ්‍යය භාණ්ඩ වර්ග කළාට එහෙම කරන්න බෑ.

උදාහරණයක් ගත්තොත් අපි හිතනවා පිටරටින් ගෙන්වන ෂැම්පු බෝතලයක් ගෙදර සිටින කාන්තාවකට අත්‍යවශ්‍ය නැහැ කියලා. නමුත් රූපලාවණ්‍යාගාරයක් පවත්වන කෙනකුට එය අනිවාර්යෙන්ම අවශ්‍ය භාණ්ඩයක් විය හැකියි. එවිට අපි කොහොමද විනිශ්චය කරන්නෙ මෙහි ප්‍රතිවිපාක බලපාන්නෙ පාරිභෝගිකයන්ටද නැත්තම් නිෂ්පාදකයන්ටද කියලා. ඒ වගේම වර්තමානයේ දී නිෂ්පාදන අමුද්‍රව්‍ය හිඟකමින් යම් යම් නිෂ්පාදන අඩාළ වී තිබෙනවා. එවිට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ මොනවද යන්න තීරණය කරන්නේ කොහොමද?

මහාචාර්යවරයා විශ්වාස කරන්නේ මේ ආනයන තහනම දූෂණ රැසක් නිර්මාණය කරන භූමියක් නිර්මාණය කරනු ඇති බවය.

දැන් මේ තෝරා ගත් භාණ්ඩ ගෙන්වන්න දේශපාලනික හෝ යම් කිසි නිලධාරියක් ගෙන් අනුමැතියක් අවශ්‍යය වෙනවා. මෙය සංකල්පයක් විදියට ගේන්න පුළුවන් වුණත් අප වැනි රටක අනුමැතිය ගන්නවා කියන එක බරපතළ ප්‍රශ්නයක්.

වෙන රටවල්වල එක අත්සනකින් කර ගන්න දේ මෙහේ අත්සන් දහයක් විතර ඕනෙ. ඒ වගේම අනුමැතිය හැමෝටම ලබා ගන්න බැහැ. කවුරු හරි ඒ පැත්තෙන් සම්බන්ධ කමක් තිබෙන යමක්කමක් තිබෙන කිසියම් කෙනෙක් වෙනවා නම් තමයි ඔය අනුමැතිය ප්‍රායෝගික වෙන්නේ. එවිට අපිට පේනවා මේතුළත් ගැටලු සහගත දේවල්.

ආනයන පාලනය කරලා විදේශ සංචිත බේරාගන්න හදන වැඩපිළිවෙළ අපට අලුත් දෙයක් නෙමෙයි. ඒවා එක්දහස් නවසිය හැට හැත්තෑ ගණන්වල ලංකාවේ අනුගමනය කර ප්‍රතිපත්තිමය වශයෙන් අර්බුදයකට ගිහින් ඉවර වුණු දේවල්. නැවත එතෙන්ට යන්න වෙනවා කියන්නෙ අපේ රටේ ඉතිහාසය ගැන පවා නොදැනුවත් ව ඇති බවයි.

මහාචාර්ය අබේරත්නයන්ට අනුව ආනයන පාලනය විදේශ විනිමය අර්බුදයට යහපත් විකල්පයක් නොවේ. ඔහු පෙන්වා දෙන්නේ මේ විකල්පය පවතින ගැටලුව තවත් උග්‍ර කරනු ඇති බවය. විදේශ විනිමය ප්‍රශ්නය මතු වුණේ වසර ගණනාවක සිටම අපනයන ප්‍රවර්ධනය නොකර දුර්වල වෙන්න හැරීම නිසා. අපි කළේ අපනයන වැඩි නොකර බහු පාර්ශ්වීය ණය, ව්‍යාපෘති ඔස්සේ ණය ගැනීමයි. 2007 සිට ආණ්ඩුවේ සුරැකුම් පත් විවෘත කර වාණිජ ණය ගත්තා. මෙතෙක් කල් වුණේ අපනයන ප්‍රවර්ධනයක් නොමැතිව ණයවලින්ම ඇද ගෙන ගිය එක. දැන් අපිට ණය දෙන්න කවුරුත් නැහැ. සංචාරක කර්මාන්ත අඩපණයි.

පවතින අර්බුදයට හොඳම විකල්පය ලෙස මහාචාර්යවරයා පෙන්වා දෙන්නේ ආයාත පාලනය සහ අපනයනය ප්‍රවර්ධනයයි.

"මෙතනදි අපේ අපනයන ආදායම් මට්ටම් විදේශ විනිමය වැඩි කර ගන්නට අවශ්‍යයි. නමුත් එය එක රැයකින් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. තැනට යනකම් පවතින අර්බුද මඟහරවා ගන්න තමයි 1944 දී Bretton Woods සමුළුව හරහා මූල්‍ය අරමුදල යන ආයතනය නිර්මාණය වෙන්නේ. එයින් සිදුවන්නේ විදේශ විනිමය ගැටලුවලට මුහුණ දෙන එහි සාමාජික රටවලට සහාය වීමයි.

ලංකාවත් මෙම සමුළුවේ මුල සිටම සමාජිකයෙක්. දැන් අපට අවසාන වශයෙන් සහාය පතන්න තිබෙන්නේ මේ මූල්‍ය අරමුදල විතරයි. එනිසා මෙම පවතින අර්බුදයෙන් මිදෙන්න නම් මූල්‍ය අරමුදල වෙත යා යුතුයි.

ඒ සඳහා මූල්‍ය අරමුදලට අපි මේ ප්‍රශ්නයෙන් ගොඩ එන ඉදිරි සැලැස්ම ලිඛිතව පෙන්විය යුතුයි. එම වැඩපිළිවෙළට ඇතුළත්වන කොන්දේසි හය හතක් අපට ඉදිරිපත් කළ හැකියි. මේ ණය අර්බුදය කෙටිකාලීනව පාලය කර ගැනීමත් දිගුකාලීනව පවතින ගැටලුවෙන් ගොඩ ඒමත් යන කාරණාවලට අවශ්‍ය කරන වැදගත් කරුණු ඒ අතර තිබෙනවා. මහාචාර්යවරයා අවසාන වශයෙන් කියන්නෙ අප ඉන්නේ පැරසිටමෝල් පෙත්තකින් ගොඩ යා හැකි ව්‍යාධියක නොවන බවය. බෙහෙවින්ම අසීරු ඔත්පල අවස්ථාවක දී කළ යුතු ප්‍රතිකර්මත් සංකීර්ණ බව ය; දරාගත යුතු බව ය; ජාතියක්







# යකඩ යකාට බිලිවූ ජීවිත

● තාරක වික්‍රමසේකර

**දුම්රිය පාපුවරුවේ ගමන් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. කාලයක් බොහෝ දුම්රිය මැදිරි පාපුවරුව අසල තිබූ නිවේදනයකි මේ. එහෙත් මේ නියමයට, අවවාදයට, මඟීන් කොපමණ අවධානයක් යොමු කෙළේදැයි යන්න නම් ගැටලුවකි. දුම්රිය පාපුවරුවේ ගමන් කිරීමෙන් සිදු වන අනතුරුවලින් ජීවිතය බේරාගත හැකි වන්නේ කලාතුරකිනි. එසේ දිවි බේරුණද බොහෝ විට සදාකාලික ආබාධිතයන් බවට පත්වේ.**



උඩරට දුම්රිය මාර්ගයේ විදේශීය තරුණියක් අවදානම් අයුරින් ගමන් කරන අයුරු

> දුම්රියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හෝ වැඩිපුර වින්දනයක් ලබා ගැනීම යන කුමන හෝ හේතු මත පාපුවරුවේ ගියද එය අවදානම් ගමනකි



මේ අපේ රටේ ධාවනය වන අන්තිම දුම්රිය නොවේ. (සේයාරුව- විමල් කරුණාතිලක)



ප්‍රංශ ජාතික තරුණිය උඩරට මැණිකේ දුම්රියෙන් වැටීමෙන් පසු රෝහලට ගෙන ගිය අයුරු

පාපුවරුවේ ගොස් දුම්රියෙන් ඇද වැටී තුවාල ලබා බේරුණු ප්‍රංශ ජාතික තරුණියක් ගැන අපට පසුගිය දිනවල අසන්නට ලැබුණි. ඇය උඩරට මැණිකේ දුම්රියේ පාපුවරුවේ එල්ලී ගමන් කිරීමේදී ඔහිය හා ඉදල්ගස්හින්න දුම්රිය ස්ථාන අතරදී බිම්ගෙයක වැදී දුම්රියෙන් ඇද වැටුණාය. ඒ සැණින් ඇයගේ පෙම්වතා ද ධාවනය වන දුම්රියෙන් පැන්නේය. ඔහු තුවාල ලැබූවද තරුණිය වැටුණු ස්ථානය තෙක් ආපසු දිව ගොස් ඇය ඔසවාගෙන ආවාය. අනතුරු වූ සැණින් දුම්රිය මඟීන් දුම්රියේ හදිසි අනතුරු දම්වැල ඇදීම නිසා දුම්රිය නැවැත්වූ අතර, දුම්රිය යළි මඟ දුරක් පසුපසට ගැනීමෙන් පසුව අනතුරට පත් තරුණිය එම දුම්රියෙන්ම හපුතලේ දුම්රිය ස්ථානය දක්වා දුම්රියෙන් රැගෙන ගිය අතර පසුව එතැන් සිට දියතලාව රෝහල වෙත ගිලන් රියකින් රැගෙන යන ලදී.

දුම්රිය පාපුවරුවේ ගමන් කිරීමට බලපවත්නා ප්‍රධාන හේතූන් දෙකකි. එයින් පළමුවැන්න දුම්රියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීමයි. දෙවැන්න ඉඳහිට යන මඟීන් වැඩිපුර වින්දයක් ලබා ගැනීම පිණිස අවදානම් ගමනක යෙදීමයි. මේ කොයි ආකාරයෙන් පාපුවරුවේ ගියද එය අවදානම් ගමනකි.

දුම්රිය හා සම්බන්ධ අනතුරුවලින් 100%ක්ම මෙන් සිදුවන්නේ දුම්රියේ වරදින් නොව මඟියාගේ හෝ ඒ හා සම්බන්ධ වන අනෙක් පාර්ශ්වයේ වරදිනි.

මෑත කාලයේදී දුම්රියෙන් ඇද වැටී මියගිය හා තුවාල ලැබූවන් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. දුම්රිය ආඥා පනතේ මෙන්ම, මෝටර් රථ ආඥා පනතේ ද දුම්රිය මාර්ගයක් හරහා පදිකයකු මෙන්ම වාහන ගමන් කළ යුතු ආකාරය දක්වා ඇතත් බොහෝ දෙනා දුම්රිය රේල් ගේට්ටු නොමැති හරස් මාර්ගයන්හි රතු පැහැති අවදානම් සංඥා එළි දැල් වී තිබියදී ගමන් නොකරන්නැයි යනුවෙන් දක්වා තිබුණද දුම්රිය පෙනි පෙනී ගමන් කරන අයුරු දක්නට ඇත.

අපේ ජන වහරේ "ඉක්මන් කොටයි" යනුවෙන් ඇති වහරට අනුව පසුගිය දිනවල එවන් අනතුරු රැසක්ම සිදු විය. හික්කඩුව අසලදී ත්‍රිරෝද රථයක ගමන් කළ එකම පවුලේ සිවු දෙනකු වවුනියාව සිට බෙලිඅත්ත දක්වා ධාවනය වූ 'රජරට රැජිණි' ශීඝ්‍රගාමී දුම්රියේ ගැටී මිය ගියේ එවැනි 'ඉක්මනක' ප්‍රතිඵලයක් ලෙසිනි.

එමෙන්ම වනවාසලදී, කන්කසන්තුරයේ සිට පැමිණි උත්තර දේවි ශීඝ්‍රගාමී දුම්රියයේ වැදුණු මෝටර් රථයක් කුඩුපට්ටම් වී ගියේ එහි හිමිකරු එතැනම ජීවිතක්ෂයට පත්කරමිනි. ඒ දුම්රිය මාර්ගය හරහා නොසැලකිලිමත්ව ගමන් කිරීමේදී වූ අනතුරු දෙකකි.

අපි යළිත් දුම්රිය පාපුරුවට බසිමු.

උඩරට මාර්ගයේ මේ වන විට ධාවනයට යොදා ඇත්තේ උඩරට ධාවනය වෙනුවෙන්ම විශේෂයෙන්ම නිෂ්පාදනය කර ඇති චීනයේ නිෂ්පාදිත එස් 12 හා එස් 14 බලවේග කට්ටල දුම්රියයන් ය. එම දුම්රියයන්ගේ පාපුවරුව ඇත්තේ දුම්රිය බඳට සමාන්තරවය. අනෙක් දුම්රියයන්ගේ පාපුවරුවට පිවිසීමට හැකි පරිදි දුම්රිය බඳ පාපුවරුවේදී මඳක් ඇතුළට වන්නට විවරයක් ඇති නිසා පය තැබීම පහසුය. එහෙත් උඩරට දුම්රියයන්ගේ පාපුවරුව බඳට සමාන්තරව ඇතුළට වන්නට නිපදවා ඇති නිසා දුම්රියට ගොඩවීම හා එයින් බැසීම පවා තරමක් අපහසුය. මෙවන් පාපුවරුවක් ඇති දුම්රියක පාපුවරුවේ ගමන් කිරීම ඉතාම අවදානම්ය.

යම් අයකු පාපුවරුවේ ගමන් කළයුතු වන්නේ දුම්රිය පාපුවරුව අසල සිට එළියෙන් ඇති අත්වැට අල්ලාගෙනය. එවිට අත් දෙක එළියේ ඇති නිසා පොඩි ගැස්සීමකදී වුවත් වැඩි බරක් එළියට යෙදවේ. මේ නිසා දුම්රියෙන් එළියට විසිවීමට ඇති අවදානම ඉතා ඉහළය. නොසිතන ලෙසින් පාපුවරුවෙන් මඟියා එළියට වැටෙන්නේ එලෙසිනි. එසේ නොවන්නට ඇතැම් මඟීන් පහතින් ඇති පාපුවරුවේ එල්ලී ගමන් කරති. එවිට සිදුවන්නේ දුම්රිය ස්ථානයක වේදිකාවේ ගැටී හෝ දුම්රිය මාර්ගයේ දෙපසින් ඇති සංඥා කුලුනු හෝ බිම්ගෙවල් හෝ පාලම් හි ගැටී අනතුරට පත්වීමයි. පසුගිය සතියේ මහව සන්ධියේ සිට පෙරවරු 4.45ට කොළඹ බලා පැමිණි දුම්රියේ ආ තරුණයකුගේ පාදයක් එලෙසින් දුම්රිය වේදිකාවේ ගැටී පාදය වෙන්වී ගියේ මීරිගම දුම්රිය ස්ථානයට ආසන්නයේදීය. ඔහුගේ දිවි බේරුණද තරුණයාගේ අනාගතය අඳුරේය.

කාර්යාල දුම්රිය භාවිත කරන මඟීන් වුවද පාපුවරුවේ ගමන් කරන්නේ ඉඩකඩ නොමැතිකම නිසාම ද යන්න ගැන තවදුරටත් විමසා බැලිය යුතුය. මහව හන්දියේ සිට බෙලිඅත්තේ සිට එසේ නැත්නම් කුරුණෑගල සිට පැමිණෙන දුම්රියන්ගේ මඟීන් පාපුවරුවේ එල්ලී ගමන් කරන්නේ මීරිගම හෝ මුහුදුබඩ මාර්ගයේ නම් අලුත්ගම හෝ දකුණු කළුතරින් පසුවය. අලුත්ගම හෝ මීරිගමින් පසු කොළඹට පැමිණීමට සැලකිය යුතු දුම්රිය සංඛ්‍යාවක් ඇත. නමුත් සිදුවන්නේ අන්තිම තත්පරයේදී දුම්රියට පැමිණීමට මඟීන් පුරුදුව සිටීම හෝ ශීඝ්‍රගාමී දුම්රියේම කෙසේ හෝ එල්ලී යාමට උත්සාහ දැරීමය. ඒ සඳහා මඟියාට ද පැහැදිලි සාධාරණ හේතූන් රැසක්ම තිබිය හැකිය. එහෙත් සියලු දෙනාම ශීඝ්‍රගාමී දුම්රියේ යාමට හෝ එකම වේලාවට පැමිණීම නිසා අධික තදබදයක් හට ගනී. කාර්යාල දුම්රිය සේවාව ද හිටිවනම මඟීන් නන්නත්තාර කිරීම නිසා මේ තත්ත්වය තවත් වැඩි වේ. දුම්රිය කාල සටහනේ සංශෝධනය කළ හැකි ස්ථාන වෙත දුම්රිය බලධාරීන්ගේ ඇස එතරම් යොමුව නැත. ඒ එක් පැත්තක් පමණි. අනෙක් පැත්ත වනුයේ තමන්ගේ ආරක්ෂාව තමන් විසින් සලසා ගැනීමයි.

විදේශ රටවල නම් දුම්රිය ගමනාරම්භයට පෙර දුම්රියේ දොර වැසෙන ක්‍රමයක් තිබුණද අපේ රටේ එවන් ක්‍රමවේද තවත් කාලාන්තරයකට ක්‍රියාත්මක කළ නොහැකිය.

දැනටත් ස්වයංක්‍රීයව විවෘත වන හා වැසෙන දොරවල් ඇති, කන්කසන්තුරේ නගරාන්තර දුම්රියේ දොරවල් හා සෙල්ලම් කරන මඟීහු වෙති. මේවා වෙනස් වන්නට නම් අපගේ ආකල්ප වෙනස් කළ යුතුය. තත්පර ගණනක් නොඉවසා දුම්රිය පෙනි පෙනී හරස් මාර්ගයට වාහන දමන්නේ එනිසාය.

**දුම්රියෙන් ඇද වැටීම්**

| වසර | ඇද වැටුණු සංඛ්‍යාව | තුවාල ලැබූ සංඛ්‍යාව | මරණ |
|---|---|---|---|
| 2016 | 76 | 75 | 01 |
| 2017 | 74 | 70 | 04 |
| 2018 | 107 | 102 | 05 |
| 2019 | 76 | 71 | 05 |
| 2020 | 43 | 43 | 00 |

**දුම්රිය හරස් මාර්ග අනතුරු**

| වසර | අනතුරු සංඛ්‍යාව | තුවාල ලැබූ සංඛ්‍යාව | මරණ |
|---|---|---|---|
| 2016 | 84 | 47 | 14 |
| 2017 | 86 | 59 | 12 |
| 2018 | 101 | 69 | 13 |
| 2019 | 82 | 30 | 10 |
| 2020 | 61 | 16 | 09 |

**දුම්රිය මාර්ගයේ ගමන් කර ගැටුණු හා සියදිවි නසාගත් පිරිස**

| වසර | අනතුරු සංඛ්‍යාව | තුවාල ලැබූ සංඛ්‍යාව | මරණ |
|---|---|---|---|
| 2016 | 430 | 260 | 180 |
| 2017 | 437 | 260 | 180 |
| 2018 | 468 | 251 | 212 |
| 2019 | 443 | 243 | 200 |
| 2020 | 254 | 155 | 09 |

2016 වසරේ සිට වසර 4ක් තුළදී දුම්රිය අනතුරුවලින් තුවාල ලද සමස්ත සංඛ්‍යාව 1,540 කි. මේ අනුව බලන විට, වසර 4කට මේ සංඛ්‍යාව අනුව එක් දිනකට අනිවාර්යෙන්ම එක් අයකු හෝ වැඩි පිරිසක් අනතුරුවලට ලක් වන බව පෙනී යයි.

එවන් තත්ත්වයක් දැක දැන මාධ්‍ය මඟින් පවා මේ සම්බන්ධයෙන් පෙන්නුම් කර තිබියදී අවධානය යොමු නොකිරීම සැබැවින්ම කනගාටුදායකය.

දුම්රිය මාර්ගයේ ගමන් කරන අයට විරුද්ධව නඩු පැවරිය හැකි වුවත් එවන් නඩු පැවරුමක් ගැන අප අසා නැත. කෙසේවුවත් දුම්රිය අනතුරු පිළිබඳ සංඛ්‍යා ලේඛනවලින් පෙනී යන්නේ අපට සිතාගත නොහැකි තරම් විශාල අනතුරු සංඛ්‍යාවක් සිදුවී ඇති බවයි. මේ සිදුවීම් මාලාව හරහා කියාපාන කරුණු දෙකෙන් පළමු වැන්න එම අනතුරුවලින් සිදු වන ජීවිත හානියයි. දෙවැන්න අනතුරු නිසා සිදුවන දේපළ හානියයි. එමෙන්ම අනතුරු නිසා අතරමඟ දුම්රිය ප්‍රමාද වීමෙන් මෙන්ම ඊට පසුපසින් පැමිණෙන දුම්රියයන් ප්‍රමාදය හරහා රටේ සංවර්ධනයට වැය කෙරෙන මිනිස් ශ්‍රමය නිකරුණේ විනාශ වී යයි.

මේ සම්බන්ධයෙන් සිළුමිණ දුම්රිය සාමාන්‍යාධිකාරි ධම්මික ජයසුන්දරගෙන් විමසූ විට ඔහු පැවසුවේ දුම්රිය පාපුවරුවේ ගමන් කිරීම ඉතාම අවදානම් බවත් අවට සිරි නැරඹීමට මෙන්ම විනෝදකාමීත්වයට පාපුවරුවේ අසුන් ගෙන ගමන් කිරීමට පවා ඇතැමුන් පෙලඹ ඇති බවයි.

"මෙය ඉතාම අවදානම් වැඩක්. හුඟක් මඟීන් මෙන්ම සංචාරකයන් ඒ ගැන අවධානය යොමු කරන්නේ නැහැ. බොහෝ විදේශ රටවල එලෙසින් දුම්රිය පාපුවරුවේ ගමන් කිරීමට හැකියාවක් නැහැ. පාපුවරුවේ ගොස් උඩරට සිරි නරඹන්න ඇතැම් දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් උත්සාහ කරනවා. නමුත් අවදානම දන්නා අය කිසිවිටක එවැනි දෙයක් කරන්නේ නැහැ.

ඉදිරියේදී ආරක්ෂක අංශයේ නිලධාරීන් යොදවා පාපුවරුවේ ගමන් කරන මඟීන්ට එලෙසින් ගමන් නොකරන ලෙස අවවාද කිරීමට පියවර ගන්නවා. ඒ වගේම පාපුවරුවේ සිට සෙල්ෆි සේයාරූ ගැනීම හෝ පාපුවරුවේ එල්ලී ගමන් කිරීම වැළැක්වීමටත් පියවර ගැනීමට කටයුතු යොදනවා. විදේශිකයන් එලෙසින් ඇද වැටුණහොත් එය අපේ රටේ සංචාරක ව්‍යාපාරයට බලපානවා. දුම්රිය සේවාවටත් එය කැළලක්. අපේ විශ්වසනීයත්වය පිළිබඳ ගැටලු ඇති වෙනවා."

දුම්රිය ආරක්ෂක අධිකාරි අනුර ප්‍රේමරත්න පැවසුවේ දුම්රිය මාර්ගය, දුම්රියට සීමා කර දුම්රියේ ගමන් කිරීමේදී තම ආරක්ෂාව උපරිමව සලසා ගන්නා ලෙසයි.

"වාර්ෂිකව සිදුවන අනතුරු හා මියයෑම් සලකා බැලීමේදී අපට පෙනී යන්නේ මහජනතාවගේ මෙන්ම මඟීන්ගේ අවධානයේ අඩුවක් තිබෙන බවයි. දුම්රියේ ආසන හිස්ව ඇත්නම් අසුන් ගෙන හෝ ආසනවල මඟින් අසුන්ගෙන ඇත්නම් අනිවාර්යෙන්ම ආරක්ෂාව සලසා පාපුවරුවෙන් දුරස්ව ගමන් කිරීමයි. පාපුවරුව භාවිත කළ යුත්තේ නැඟීමට හා බැසීමට පමණයි.

ඒ වගේම විශේෂයෙන්ම මුහුදුබඩ මාර්ගයේ මුහුදු සුළං නිසා තනි බලවේග දුම්රියන්ගේ ශබ්දය හොඳින් ඇසෙන්නේ නැහැ. එම නිසා දුමරිය මාර්ගය හරහා ගමන් කරන්නන් අනිවාර්යෙන්ම සැලකිය යුතු වේලාවක් හොඳින් දෙපස බලා දුම්රිය මඟ හරහා යා යුතුයි. එමෙන්ම ජංගම දුරකථනයෙන් කතා කරමින් දුම්රිය මාර්ගයේ ගමන් කිරීමද ඉතාම භයානකයි."

මඟීන් පළමුව තම ජීවිතය ගැන අවධානය යොමු කළ යුතුමය. වින්දනය, ආශ්වාදය ගැන දෙවනුව අවධානය යොමු කළ යුතුය. දුම්රියේ ගැටී ජීවිතය බේරුණද ජීවිත කාලය පුරාවටම විඳවිය යුතුය. ඒ බව තේරුම් ගන්නේ නම් මේ අවදානම දුරු කිරීම අපහසු නොවනු ඇත.

---




● සටහන හා සේයාරූ නිශානී හේරත් බන්නැහැක

# පාසල් විවෘත කිරීම ගැන මවුපියන් කියන කතා

## පාසල් විවෘත කිරීම හොඳයි

**විෂ්මිත ලියනගේ (30) මහනුවර - බැංකු නිලධාරී**



මොනතරම් බාධක කම්කටොලු මැද වුණත් පාසල් නැවත විවෘත කරලා ඉගෙනුම් ඉගැන්වීම් කටයුතුවල යෙදීම නම් අගය කළ යුත්තක්. මොකද, දරුවාට පාසල් අධ්‍යාපනයේ නිසිඵල නෙළාගත හැකි වන්නේ ඍජුවම පන්ති කාමරයක් තුළ ගුරු - ශෝල සබඳතා සමඟ සිදුවන අධ්‍යාපනයකදී පමණයි. අපි පාසල් යන කාලේ ඔන්ලයින් ගැන අහලවත් නෑ. ඔන්ලයින් ක්‍රමය මඟින් නිවසේ සිටින සිසුවාට ඉගැන්වීමේ ක්‍රමය අසාර්ථකයි. ඔන්ලයින් පන්තිවලට සහභාගී වෙන ගමන් සිසුන් වෙන වෙන දේ කරනවා. එවිට පාඩමට අවධානය අඩු වෙනවා. නිසි විනයක් පවත්වාගෙන යන්නත් බෑ. පහුගිය වසර දෙකක් පුරාවට දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබාදෙන්න නොහැකි වුණා.

## බිඳ වැටුණු පාසල් අධ්‍යාපනය නැංවීමට දැන් හැකිවේවි

**ගයාත්‍රි අනුරාධා (25) මහරගම - හෝටල් සේවිකා**



කොරෝනා වසංගතය හේතුවෙන් අනිත් හැමදේටම වගේම පාසල්, පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනයටත් මරු පහරක් වැදුණා. එක ශ්‍රේණියක ඉඳලා ඉගැන්වීම්, විභාග කිසිම දෙයක් නොමැතිව ඊළඟ වසරට යන්න සිදුවුණා. ඒ රික්තය පුරවන්න හරිම අමාරුයි. පහ වසර ශිෂ්‍යත්වය, අ.පො.ස, සා.පෙළ හා උසස් පෙළ විභාග කල්දමන්න සිදු වුණේ හරි ඉගැන්වීමක් සිදු නොවූ නිසයි. කොහොමහරි දරුවන්ට, ගුරුවරුන්ට කොවිඩ් එන්නත් ලබාදීලා පාසල් නැවත පටන්ගෙන ඉගෙනීම් සිදුකිරීම අගය කළ යුත්තක්. ඒ විතරක් නෙමෙයි කෙටි නිවාඩු කාලයක් පමණක් ලබාදීලා නැවතත් ඉක්මනින් පාසල් පටන්ගෙන විෂය නිර්දේශය ආවරණ කිරීම සුභවාදී දෙයක්. බිඳවැටුණු පාසල් අධ්‍යාපනය ගොඩගැනීමට ගත් හොඳ ප්‍රයත්නයක්.

## එන්නත් ලබාදී ඇති නිසා පාසල් පටන් ගැනීමට පුළුවන්

**තුෂාරි ගමගේ (48) ජාඇල - ගෘහණියක්**



අපිට මතක ඇති කාලෙක මේ තරම් දිගු කාලසීමාවක් එක දිගට පාසල් විතරක් නෙමෙයි රට අක්‍රිය වෙලා තිබුණේ නෑ. කොරෝනාව මුළු රටම උඩු යටිකුරු කළා වගේම පාසල් අධ්‍යාපනයත් මුළුමනින්ම කඩා ඉහිරෙව්වා. ඒත් මොනා කරන්නද? හැමදාම කොරෝනා කිය කියා පාසල් වහගෙන ඉඳලා හරි යන්නෙ නැනේ. කොරෝනාවට අවශ්‍ය පිළියම් යොදලානේ තියෙන්නේ. පාසලට විවිධ ප්‍රදේශවලින් විවිධ ජනවර්ග අතරින් විවිධ සංස්කෘතීන්වල සිසුන් එනවා තමයි. කොරෝනා ආසාදිත වූ අයගෙන් අනිත් සිසුන්ට, ගුරුවරුන්ට පැතිරිලා පාසල් නැවත වසා දමන්න වූ අවස්ථා නැතුවා නොවෙයි. ඒත් හැමදාම පාසල් වහගෙන ඉඳලා බෑනේ.

## රට සාමාන්‍යකරණය වී ඇති නිසා විවෘත කළත් කමක් නෑ

**ශෙහානි රේචල් පෙරේරා (22) බොරලැස්ගමුව - ගිණුම් සහකාර**



පහුගිය අවුරුද්දේ පාසල් විවෘත කිරීම පොඩි අවදානමක් තිබුණා. පාසල් විවෘත කළත් තම දරුවන්ව පාසල් වලට එවන්න සමහර දෙමවුපියන් බිය වුණා. කොරෝනාවලින් කාටවත් අනුකම්පාවක් සමාවක් නැති තත්ත්වයකට අපි පහුගිය කාලේ මුහුණ දුන්නා. එකක් ඉවර වෙද්දි එකක් විදිහට විවිධ කොවිඩ් ප්‍රභේද ආවනේ. ඒ නිසා පාසල් විවෘත කළත් සමහර දරුවෝ පාසල් ආවේ නෑ. කොවිඩ් වුණත් දැන් සාමාන්‍යකරණය වෙලා. රට සාමාන්‍යකරණය වීමත් සමඟ පාසල් අධ්‍යාපනයත් සාමාන්‍ය තත්වයට පත්වෙලා. ඒ නිසා කෙටි නිවාඩුවක් දීලා පාසල් නැවත විවෘත කර දරුවන්ට අධ්‍යාපනය ලබාදීම හොඳ දෙයක්. ඒකට හේතුව අපේ අනාගතය තියෙන්නේ අපේ දරුවන් නිසයි.

## පාසලෙන් සිසුවා පරිපූර්ණ වන නිසා විවෘත කිරීම වටිනවා

**උදය කුමාර හේවාබටගොඩ (38) ගම්පහ - කාර්යාල සේවා**



පාසල් නැවත විවෘත කරපු එක කොච්චර හොඳ දෙයක්ද? පාසලට ගිහින් පන්ති කාමරය තුළ උගන්වද්දි දරුවන්ට පාඩම් හොඳින් මතක හිටිනවා. අපහසු තැන්, විමසා ගැටලු නිරාකරණය කරගන්න පුළුවන්. ඔන්ලයින් අධ්‍යාපනය සාර්ථක නෑ. කරන්න දෙයක් නැතුවට තාවකාලික පිළියමක් වුණාට, පාසලක් තුළින් බලාපොරොත්තු වන්නේ ඉගෙනීම විතරක්මත් නෙමෙයිනේ. කණ්ඩායම් හැඟීමෙන් සාමුහිකත්වයෙන්, විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරතවීමත් තවත් අංශයක ඉගැන්වීමක්. සිසුවා දැනුමින් ද, ගුණ නුවණින්, සාරධර්මවලින් සපිරි ක්‍රියාශීලී පූර්ණ යෞවනත්වයට පත්වීම දක්වා යන ගමනට පාසල් අධ්‍යාපනය ඉමහත් පිටුබලයක් ලබාදෙනවා.

## දිගු නිවාඩුවෙන් පසු පාසල් ඇරඹීම සුබ පෙර නිමිත්තක්

**චමති යසාරා පෙරේරා (23) කොළඹ**




පාසල් අධ්‍යාපන ක්‍රමය හරිම තරගකාරී වුණා. කොරෝනා නිසා හරි පාසල් දිගු කාලයක් වසා තැබීමෙන් ඒ තරගකාරිත්වයෙන් යම් තරමකට හරි දෙමාපියන් හා දරුවන් මිදුනා කියන්න පුළුවන්. තරගකාරීත්වය සීමාව ඉක්මවා යෑම හොඳ නැති නිසා පහුගිය කාලේ පාසල් දරුවන්ගෙන් සමහරෙක් මේ පීඩනයෙන් මිදුනා වෙන්න පුළුවන්. ඒ පැත්තෙන් බලද්දි පාසල් දරුවන් කාටත් යම් විවේකයක් ලැබුණු එක නම් හොඳයි. ඒත් එක දිගටම පාසල් වසා තැබීමෙන් හා ගුරු උද්ඝෝෂණ නිසා දරුවන්ට එකදිගටම මඟහැරුණු පාසල් විෂය නිර්දේශය ආවරණය කරන්න කෙටි නිවාඩුවක් පමණක් ලබාදීලා පාසල් නැවත විවෘත කිරීම පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ හොඳ පෙර ගමනක්, සුබ නිමිත්තක් ලෙස හඳුන්වාදිය හැකියි.

AFTER A/L?

BECOME THE NEXT GLOBAL SMART GRADUATE

NIBM POWERING GREAT MINDS



OBL
MAKING THE T-SHAPED PERSON

BUSINESS
COMPUTING
ENGINEERING
LANGUAGES
DESIGN
PSYCHOLOGY
DATA SCIENCE
LOGISTICS

SCAN ME
www.nibm.lk

## SCHOOL OF COMPUTING & ENGINEERING

**DEGREE PROGRAMMES**
BSc (Hons) Computing
BSc (Hons) Information Technology for Business
BSc (Hons) Ethical Hacking & Network Security
BSc (Hons) Quantity Surveying and Commercial Management
BS (Hons) Creative Multimedia
Bachelor of Software Engineering (Honours)
Bachelor of Information Technology
Bachelor of Business Analytics
Bachelor of Engineering (Honours) -Civil Engineering
Bachelor of Intelligent Digital Technologies

**DIPLOMA PROGRAMMES**
Higher National Diploma in IoT Engineering
Diploma in Software Engineering
Diploma in Network Engineering
Diploma in Quantity Surveying
Diploma in Computer System Design
Higher National Diploma in Computer Science with -Artificial Intelligence (KIC - Peradeniya)

**CERTIFICATE PROGRAMMES**
Certificate in Computer Science
Certificate in Software Engineering
Certificate in Network Engineering
Certificate in Advertising and Graphic Designing
Certificate in IoT
Certificate in JAVA Application Development
Certificate in WEB Application Design & Development
Certificate in Personal Computer Based Application Packages
Certificate in Workplace Essentials
Certificate in Computer Applications
Certificate in Workplace Essentials
Advanced Certificate in Full Stack Web Development (KIC - Peradeniya)

## SCHOOL OF BUSINESS

**MASTERS /DEGREE PROGRAMMES**
MBA Global Business
BA (Hons) Management and Leadership
BA (Hons) Human Resource Management
BA (Hons) Professional Accounting
BSc (Hons) Digital Banking and Finance

**DIPLOMA PROGRAMMES**
Higher National Diploma in Business Management
Higher National Diploma in Human Resource Management
Higher National Diploma in Professional Accounting
Higher National Diploma in Digital Banking and Finance
Advanced National Diploma in Human Resource Management
Advanced Diploma in Financial and Management Accounting
Advanced Diploma in Business Management
Advanced Diploma in Digital Banking and Finance
Advanced Diploma in Brand Management and Digital Marketing

**CERTIFICATE PROGRAMMES**
Advanced Certificate in Business Management
Advanced Certificate in Human Resource Management
Advanced Certificate in Digital Banking and Finance
Advanced Certificate in Digital Entrepreneurship
Advanced Certificate in Digital Marketing
Advanced Certificate in Event Management

**FOUNDATION PROGRAMMES**
Foundation Programme for Bachelor's Degree

## PRODUCTIVITY AND QUALITY CENTRE

**DEGREE PROGRAMMES**
BEng(Hons) Manufacturing Engineering
BSc(Hons) Global Logistics

**DIPLOMA PROGRAMMES**
Higher National Diploma in Logistics Management
Advanced Diploma in Supplies and Materials Management
Advanced Diploma in Operations and Supply Chain Management
Advanced Diploma in Industrial and Manufacturing Management
Advanced Diploma in Facility and Maintenance Management

**CERTIFICATE PROGRAMMES**
Advanced Certificate in Data Analytics
Advanced Certificate in Supplies and Materials Management

## SCHOOL OF LANGUAGE

**DEGREE PROGRAMMES**
BA (Hons) English Studies

**DIPLOMA PROGRAMMES**
Advanced Diploma in Company Administration and Secretarial Proficiency
Advanced Diploma in Teaching English for Speakers of Other Languages
Diploma in English(For A/L students)
Diploma in English for Professionals

**CERTIFICATE PROGRAMMES**
Advanced Certificate Course in English Language
Advanced Certificate course in Secretarial Practices
Certificate Course in English Language
English Conversation for Professionals

## SCHOOL OF DESIGN

**DEGREE PROGRAMMES**
Bachelor of Arts Interior Architecture
Bachelor of Arts (Hons) in Fashion Design

**DIPLOMA PROGRAMMES**
Diploma in Interior Design (Part-Time)

**CERTIFICATE PROGRAMMES**
Advanced Certificate in Fashion Design

**FOUNDATION PROGRAMMES**
Foundation in Design

## SCHOOL OF HUMANITIES

**MASTERS / DEGREE PROGRAMMES**
MSc. Applied Psychology
BSc. (Hons) Psychology & Counselling
BA(Hons) Broadcasting & Journalism

**DIPLOMA PROGRAMMES**
Higher Diploma in Psychology & Counselling
Advanced Diploma in Psychology & Counselling

**CERTIFICATE PROGRAMMES**
Certificate Course in Psychology and Counselling

**FOUNDATION PROGRAMMES**
Foundation in Psychology

## SCHOOL OF EDUCATION

**DIPLOMA PROGRAMMES**
Advanced Diploma in Primary Teaching (Offered at Galle Campus)

## BUSINESS ANALYTIC CENTRE

**MASTERS / DEGREE PROGRAMMES**
MSc. Data Science
BSc(Hons) Data Science

**DIPLOMA PROGRAMMES**
Higher Diploma in Data Science
Advanced Diploma in Data Science

**CERTIFICATE PROGRAMMES**
Advanced Certificate in Data Science


**FOUNDATION PROGRAMMES**
Foundation in Data Science

කොළඹ 011 732 1000
BUSINESS 011 566 4831 | 070 7100 100
COMPUTING / ENGINEERING 071 236 0533 | 077 9922 011
LANGUAGE 070 732 1000
PRODUCTIVITY AND QUALITY CENTRE 070 620 0100 | 011 732 1010

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය | නො120/05, විද්‍යා (විජේරාම) මාවත, කොළඹ 07

ගාල්ල (091)5636363 (091)5636636 (077)4977550
මාතර (076)0972550 (041)2237544 (041)2237545
මහනුවර (081)2236651 (081)5621604 (070)5621604
කුරුණෑගල (037)2222778 (037)5620298 (070)2222778
NIC (කිරුළපන) (011)5650666 (011)2515212 (011)2515213
KIC (පේරාදෙණිය) (081)2085917 (081)2085927 (070)1981000

Coventry University · Deakin University · Griffith University · Limkokwing University · UTM · Microsoft Imagine Academy · Oracle Academy · vmware · bcs · CISI · CMA · aat Sri Lanka




භාවිතය අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය

මධ්‍යම පරිසර අධිකාරිය
පරිසර අමාත්‍යාංශය

# සිමෙන්ති හිඟයට තිත! ලංවා සිමෙන්ති වෙළෙඳ පොළට

● රසික කොටුදුරගේ



ලංවා සංස්ථා සිමෙන්ති කෝපරේෂන් කර්මාන්ත ශාලාව මඟින් නිපදවන සංයෝග කරනලද ද්‍රාවක සිමෙන්ති, සංයුක්ත පෝර්ට්ලන්ඩ් සිමෙන්ති සහ සාමාන්‍ය පෝර්ට්ලන්ඩ් සිමෙන්ති

**පසුගියදා අප මාගම්පුර කර්මාන්ත පුරවරය බලා පිටත් වූයේ එහි ඉදිකර ඇති මෙරට විශාලතම සිමෙන්ති කර්මාන්ත ශාලාව නැතිනම් ලොව විශාලතම සිමෙන්ති කර්මාන්ත ශාලා මුල් විස්ස අතරට එක්වන "ලංවා සංස්ථා සිමෙන්ති කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය සිය නිෂ්පාදන කටයුතු ආරම්භ කරනු දැක ගනු රිසියෙනි. මෙරට කර්මාන්ත අමාත්‍යංශය යටතේ ලියාපදිංචි දේශීය සිමෙන්ති කම්හල් හයක් ඇති අතර, ඒ ලැයිස්තුවට අලුතෙන් එක්වන නව කම්හල හම්බන්තොට මිරිජ්ජවිල ඉදිකෙරුණු මේ සිමෙන්ති කම්හලයි.**

පසුගිය හත්වැනිදාට යෙදුණ සුබ මොහොතින් මේ කටයුත්ත ආරම්භ කෙරුණේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙනි. අනතුරුව ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා ඉදිකිරීමට යෝජිත නව වානේ කර්මාන්ත ශාලාව සඳහා ද මුල්ගල් තැබුවේ මෙරට වේගවත් සංවර්ධනයක් කරා යන ගමනේ සුබ ලකුණු දක්වමිනි. අක්කර දෙසිය පනහක භූමි භාගයක ඉදිවෙන මෙම වානේ කර්මාන්ත ශාලාව සඳහා ආයෝජනය කර ඇති මුදල ඇමරිකානු ඩොලර් මිලියන හාරසියක් වන අතර මෙහි නිෂ්පාදන කටයුතු 2024 වසර අවසානය වීමට ප්‍රථම ආරම්භ කළ හැකි වෙතැයි ගණන් බලා තිබේ.

ඇමරිකානු ඩොලර් මිලියන සීයක් ආයෝජනය කරමින් ඉදිකිරීම් ආරම්භ කළ සිමෙන්ති කර්මාන්ත ශාලාව නූතනයේ ලොව දියුණු රටවල පමණක් දැකිය හැකි අති දියුණු තාක්ෂණික යන්ත්‍රසූත්‍රවලින් සමන්විත වේ. මේ කර්මාන්ත ශාලාවේ කටයුතු සියයට අනූ පහක් පමණ සිදු වන්නේ ස්වයංක්‍රීය තාක්ෂණ මඟිනි. එනිසා ලොව මුල්පෙළේ සිමෙන්ති කර්මාන්ත ශාලා විස්ස අතරට මේ කර්මාන්ශාලාව ද එක්ව තිබේ. එසේම දකුණු ආසියා කලාපයේ ඇති දැවැන්ත සිමෙන්ති නිෂ්පාදන ආයතන කිහිපය අතරට මේ කර්මාන්ත ශාලාවද එක්ව තිබේ. මෙහිදී උත්සව සභාව ඇමතූ ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සභාපති, නන්දන ජයදේව ලොකුවිතාන කියා සිටියේ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු පුළුල් වීමත් සමඟ මෙරට සිමෙන්ති අවශ්‍යතාව දේශීයව සපුරා ගැනීමට ඉදිරියේදී හැකිවන බවයි.

මෙහිදී වාරිමාර්ග,රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂයන් පවසා සිටියේ පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂයන්ගේ දීර්ඝකාලීන සැලසුම් මඟින් ශුෂ්ක කලාපයක්ව පැවති හම්බන්තොට දිස්ත්‍රික්කය පූර්ණ පරිවර්තනයට ලක්වී ඇති බවයි. ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශයේ තරුණ පිරිස අනාගත අපේක්ෂාවෙන් කටයුතු කරන බව පැවසූ අමාත්‍යවරයා රාජ්‍ය නිලධාරීන් ආයෝජකයන් දිරිගැන්වෙන අයුරින් සහාය දැක්වීමේ අවශ්‍යතාව ද පෙන්වා දුන්නේය.



(වමේ සිට) ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සභාපති, නන්දන ජයදේව ලොකුවිතාන සහ එහි ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු ප්‍රසාද් ද සිල්වා

දකුණු ආසියාවේ දුර්වලම ආර්ථිකයක් බවට මේ රට පත්කර තිබියදී නොපැකිළව රට බාරගෙන පැමිණෙන සියලු අභියෝගයන්ට මුහුණ දෙමින් රටට අවශ්‍ය සියලු දේ දේශීයව නිෂ්පාදනය කර ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා රට රැගෙන යාමේ වගකීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන් හා මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂයන් ප්‍රමුඛ රජය බාරගෙන ඇති බව ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඩී. වී. චානක පැහැදිලි කළේය.

ලංකාවේ සාමාන්‍ය සිමෙන්ති අවශ්‍යතාව මෙට්‍රික්ටොන් මිලියන හතකට ආසන්නය. මේවෙද්දි ලංකාව නිපදවන්නේ මිලියන තුනක පමණ ප්‍රමාණයකි. මිලියන හතරක් මෙරටට ආනයනය කරයි. මේ කර්මාන්ත ශාලාව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමත් සමඟ ඉන් ලැබෙන සිමෙන්ති මෙට්‍රික් ටොන් මිලියන දෙකයි දශම අටෙන් ඉන් කොටසක් පූර්ණය වන අතර එළඹෙන වසරේදී මෙහි අනෙක් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භවීමත් සමඟ මෙරට සම්පූර්ණ සිමෙන්ති අවශ්‍යතාව පූර්ණය වේ. ඉන් විදේශයන් කරා ඇදී යන විශාල ධනස්කන්ධයක් රට තුළ ඉතිරි කරගත හැකි බව පෙන්වා දුන් අමාත්‍යවරයා, ආයෝජන කලාප දහ හතරක් මේ වනවිට රට තුළ පැවතින බවත්, 2024 වර්ෂය අවසාන වීමට ප්‍රථම නව ආයෝජන කලාප එකොළහක් ස්ථාපිත කිරීමට රජය අපේක්ෂා කරන බවත්, මීට අමතරව මෙම භූමියේම තවත් කර්මාන්ත ශාලා හතක කටයුතු ලබන මස ආරම්භ කරන බවත් එමඟින් අපනයන ආදායම වර්ධනය කර ආර්ථික ඉලක්ක සපුරාගනිමින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකි වන බව පෙන්වා දුන්නේය. රුහුණු ආර්ථික පරිවර්තනයේ කේන්ද්‍රස්ථානය ලෙස හම්බන්තොට මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ මෙලෙස ඉදිවන එක් කර්මාන්ත ශාලාවකින් ලැබෙන ප්‍රතිලාභ අසීමිතය. අප රටේ ශ්‍රම බළකායට අත්වැලක් වෙමින් රැකියා දසදහස් ගණනක් මෙම රුහුණුපුර ආයෝජන කලාපය හරහා හිමි වේ. මේ ආකාරයට දේශීය ව්‍යාපාර බිහිවීම හොඳ ප්‍රවණතාවක් මෙන්ම අර්ථික සංවර්ධනයට පිටුවහලකි. එමෙන්ම අනාගත ආයෝජනයකි.

තිරසර සංවර්ධන සංකල්පය පදනම් කරගනිමින් ඉදිකෙරුණු මෙම කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සිළුමිණ කළ විමසීමේදී මෙම කර්මාන්ත ශාලාවේ ප්‍රධාන කළමනාකාරවරයා ලෙස කටයුතු කරන ප්‍රසාද් ද සිල්වා කියා සිටියේ "අක්කර 63 විශාල භූමි භාගයක ඉදිවුණු මෙහි වාර්ෂික නිෂ්පාදන ධාරිතාව සිමෙන්ති මෙට්‍රික් ටොන් මිලියන හතරක් වන බවත්, පළමු අදියර යටතේ


ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් කර්මාන්ත ශාලාව දිස්වන අයුරු

> **"මෙහි වාර්ෂික නිෂ්පාදන දාරිතාව මෙට්‍රික් ටොන් ලක්ෂ විසිඅටකි. එළෙඹන වසරේදී එහි අනෙක් කර්මාන්ත ශාලාවේ වැඩ නිමවීමත් සමඟ ලැබෙන මුළු නිෂ්පාදන දාරිතාව මෙට්‍රික්ටොන් ලක්ෂ හතළිහකි. ඒ මඟින් මෙරට සිමෙන්ති අවශ්‍යතාව මුලුමනින්ම පියවිය හැකි අතර විදේශයන් වෙත ඇදී යන ඩොලර් බිලියන ගණනක් ඉන් ඉතිරි වේ"**

සිමෙන්ති මෙට්‍රික් ටොන් මිලියන දෙකයි දශම අටක් දේශීය වෙළෙඳපොළට සැපයීමට හැකියාව ඇති බවයි. මෙමඟින් ඇති වී තිබෙන සිමෙන්ති අර්බුදයට විසඳුමක් ලබාදීමට හැකි බවද හෙතෙම පෙන්වා දුන්නේය. එසේම අනෙක් කර්මාන්ත ශාලාව ඉදිවූ පසුව මෙරට සිමෙන්ති අවශ්‍යතාවය මුළුමණින්ම සපුරාලිය හැකි බව ඔහුගේ අදහසය.

මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ පිහිටි සංස්ථා සිමෙන්ති කර්මාන්තශාලාව සහ හම්බන්තොට අන්තර්ජාතික වරාය එකිනෙකයා කරමින් ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් (පෞද්.) සමාගම සහ හම්බන්තොට ඉන්ටනැෂනල් පෝර්ට් ගෲප් (පෞද්.) සමාගම අතර විශේෂ ගිවිසුම් දෙකකට ඉකුත් වසරේ අත්සන් තැබිණි. මෙම ගිවිසුම්වලට අනුව ලංවා සංස්ථා සිමෙන්ති සමාගම වෙත අනුයුක්ත කර ඇති ජැටිය පරිශ්‍රයේ මෙහෙයුම් කටයුතු කිරීමට පූර්ණ ස්වයංක්‍රීය ස්ටැකර් රික්ලේමර් යාර්ඩ් (Stacker Reclaimer Yard) සහ බ්‍රිජ් - ටයිප් ෂිප් අන්ලෝඩර් (Bridge Type Ship Unloaders) ද්විත්වයක් මෙම කර්මාන්තශාලාව සතුය. මින් නූතන තාක්ෂණය අනුව යමින් ශ්‍රමය වෙනුවට තාක්ෂණය භාවිතයෙන් භාණ්ඩ හැසිරවීම සිදු කළ හැකි බව" ප්‍රධාන කළමනාකරු ප්‍රසාද් ද සිල්වා පෙන්වා දෙයි.

මෙම කටයුතු මෙහෙයවීම සඳහා ඉන්ජිනේරුවන් හතළිහකට ආසන්න ප්‍රමාණයක සේවය ලබාගන්නා අතර එකසිය විස්සක පමණ සේවක සංඛ්‍යාවකින් මේ අති දැවැන්ත කර්මාන්ත ශාලාව මෙහෙයවිය හැකිය.

වරාය සහ කර්මාන්තශාලාව යා කරන ඉහළම කාර්යක්ෂමතාවකින් යුත් කන්වේයර් බෙල්ට් එක නිසා අපතේ යෑම් සහ පරිසර දූෂණය අවම වන අතර, මෙය පරිසර හිතකාමී ලෙස කටයුතු කරමින් කාර්යක්ෂමතාව වැඩිකර ගැනීම සම්බන්ධයෙන් අනෙකුත් සමාගම්වලටද මහගු ආදර්ශයක් සපයයි.

සාමාන්‍යයෙන් සිමෙන්ති කර්මාන්ත ශාලවක් පවත්වාගෙන යන්නේ ඒකාබද්ධ බලාගාරයක් වශයෙනි. මෙහිදී සිදු කෙරෙන්නේ අමුද්‍රව්‍ය ගෙනැවිත් ඇඹරීම ය. මෙම ලෙස වෙන්වෙන් වශයෙන් අඹරා ගන්නා අමුද්‍රව්‍ය එක්කර සිමෙන්ති සෑදීම සිදු කරයි.

මෙහි දී ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නේ ක්ලින්කය. මීට අමතරව ජිප්සම්, ෆලයි ඈෂ්, ස්ලැග්, ලයම්ස්ටොන්, කැල්සියට් යොදාගනී. දූහුවිලි ඇතුළු නොවන පරිදි ආවරණය කර අමුද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන මේ කන්වේයර් බෙල්ට් එක මඟින් පැයකට අමුද්‍රව්‍ය ටොන් 1,200ක් ප්‍රවාහනය කිරීමේ හැකියාව පවතී. එමෙන්ම නවීනතම යටිතල පහසුකම් භාවිත කරමින් ටොන් 60,000ක ධාරිතාවෙන් යුත් නෞකාවකින් රැගෙන එනු ලබන අමුද්‍රව්‍ය දින 3ක් තුළ ගොඩබෑමට හැකිවෙයි.

මෙම කර්මාන්ත ශාලාව මඟින් වසරකට සිමෙන්ති මෙට්‍රික් ටොන් ලක්ෂ 28ක් නිෂ්පාදනය කරන අතර සිමෙන්ති කොට්ට මිලියන 76ක් පමණ නිෂ්පාදනය කළ හැකි බවට තක්සේරු කර තිබේ. වර්තමානයේ ලෝකයේ පවතින ඉහළම තාක්ෂණය කම්හලට යොදාගෙන ඇති අතර සියලු නිෂ්පාදන කටයුතු ස්වයංක්‍රීයව සිදු කරයි. මේ කර්මාන්තශාලාව මඟින් උසස්ම තත්ත්වයේ නිෂ්පාදන ලබාගත හැකිවීම ඉදිකිරීම් කර්මාන්තයට බෙහෙවින් වාසිදායක වන අතර නවීනතම යුරෝපීය තාක්ෂණය යොදා ගැනීම නිසා කාර්යක්ෂමතාව ද ඉතා ඉහළය. ස්මාර්ට් ඔෆිස් සංකල්පය අනුවයමින් මෙම කම්හලේ සම්පූර්ණ ක්‍රියාවලිය ඕනෑම මොහොතක ස්මාර්ට් ජංගම දුරකතනයක තිරයකින් නැරඹීමට හැකි වීම විශේෂය. මෙම කර්මාන්ත ශාලාවේ පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය යන්ත්‍රසූත්‍ර ඇතුළත් වෙයි. මෙය ජාත්‍යන්තර ප්‍රවණතාවලට සමගාමී වන, ශ්‍රමය වෙනුවට තාක්ෂණය භාවිතයෙන් භාණ්ඩ හැසිරවීම සම්බන්ධ පුරෝගාමී පියවරකි. භාණ්ඩ ප්‍රවාහන නෞකා 3 කට සමාන ගබඩා පහසුකම් ලංවා සංස්ථා සිමෙන්ති කර්මාන්ත ශාලාව සතු වන අතර, වරායේ සිට කර්මාන්ත ශාලාව දක්වා අමුද්‍රව්‍ය ප්‍රවාහනයට කිලෝමීටර් 2.1ක දිගින් යුත් කන්වේයර් බෙල්ට් එකක්ද යොදා ඇත. එයින් පැයකට ටොන් 1200ක වේගයෙන් අමුද්‍රව්‍ය කර්මාන්තශාලාව තුළට ගෙන්වා ගැනීමට හැකිය. හම්බන්තොට වරායේ සිට අමුද්‍රව්‍ය ස්වයංක්‍රීයව නළ මාර්ග ඔස්සේ ඇවිත් පැයකට සිමෙන්ති කොට්ට ලක්ෂ 2ක් ඇසුරුම් බවට පත්වෙයි.

මෙම ලංවා සංස්ථා සිමෙන්ති කර්මාන්තශාලාව මඟින් සාමාන්‍ය පෝර්ට්ලන්ඩ් සිමෙන්ති, පෝර්ට්ලන්ඩ් කොම්පසිට් සිමෙන්ති සහ සංයෝග කරනලද ද්‍රාවක සිමෙන්ති (බ්ලෙන්ඩඩ් හයිඩ්‍රොලික් සිමෙන්ති - මේවා මුහුදු ආශ්‍රිත ජලාශ පරිසරවල ඉදිකිරීම් සඳහා යොදා ගනී) වැනි සිමෙන්ති වර්ග නිපදවීමට නියමිතය. ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් හී සම්පූර්ණ ආයෝජනය ලංවා සමූහ ව්‍යාපාරය සතුවන අතර ශ්‍රී ලාංකිකයකුගේ තනි අයිතිය හිමි එකම සහ විශාලතම සිමෙන්ති කර්මාන්තශාලාව මෙය වේ. මෙහි ආයෝජකයා මෙන්ම සභාපතිවරයා වන්නේ නන්දන ජයදේව ලොකුවිතානය. මැදවච්චිය, කොබිටියගොල්ලෑව නම් දුෂ්කර ගම්මානයේ උපත ලබා ව්‍යාපාරික ලෝකය දිග්විජය කළ හෙතෙම මේ වන විට දෙස් විදෙස් ව්‍යාපාර රැසක හිමිකරුවෙකි.

සිලෝන් ස්ටීල් කෝපරේෂන් සමාගමේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඔනික්ස් සමූහ ව්‍යාපාරයේ ප්‍රධානියා වන්නේද නන්දන ජයදේව ලොකුවිතානය. එසේම ඩුබායි මැරියට් අල් ජඩාෆ් හෝටලයේ හිමිකරු ද වෙයි. කොරියානු සමාගමක් විසින් පවත්වාගෙන යනු ලැබූ ඔරුවල වානේ සංස්ථාව විකුණන අවස්ථාවේ හෙමෙ විසින් මිලදී ගනු ලැබීය. 2021 දී හොරණදී විවෘත වූ දකුණු ආසියාවේ විශාලතම ටයර් කම්හල වන ෆෙරෙන්ටිනෝ ටයර් කෝපරේෂන් (පුද්) සමාගමේ හිමිකරු වන්නේද ලොකුවිතානය.

ඡායාරූප -සාලිය රූපසිංහ

---

● සුභාෂිණී ජයරත්න



ලිලාන් විසින් ජායාරූප ලබා ගැනීම මඟින් ශාකවල දත්ත ලබා ගන්නා ආකාරය

# කෘෂි විප්ලවීය ව්‍යාපෘතියක් වෙනුවෙන් රටවල් 53 ක් පැරදවූ අපේ තරුණ ව්‍යවසායකයා

- අවසන් 20 අතරට ආසියාතික රටවල් 4 කුත්
- කුසගිනි නිවීම ව්‍යාපෘතියේ අරමුණ වුණා
- කාලගුණික වෙනස් විම් සම්බන්ධ අනාවැකි සඳහා ජාත්‍යන්තරයේ අවධානය

**පොදුරාජ්‍ය මණ්ඩලීය යෞවන සම්මාන උළෙල සඳහා රටවල් 17 කින් නව නිපැයුම්කරුවන්, ක්‍රියාකාරීන් සහ ව්‍යවසායකයන් ඇතුළු තරුණ තරුණියන් 20 දෙනෙකු අවසන් තරගකරුවන් ලෙස ප්‍රකාශයට පත්වූයේ පසුගියදාය. ඒ කලාපීය රටවල් අබිබවමින් ලාංකික තරුණ ව්‍යවසායකයෙකු වන ලිලාන් දයානන්ද ද මෙවර අවසන් 20 දෙනා අතරට පත් වූයේ ඔහු විසින් කුසගින්න නැති කිරීම හා කාලගුණික වෙනස්වීම් අරමුණු කර ගනිමින් ජාත්‍යන්තරයට ඉදිරිපත් කළ කෘෂි විප්ලවීය ව්‍යාපෘතිය වෙනුවෙනි.**

මාර්තු 16 වැනි දින මාර්ගගත ක්‍රමයට පැවැත්වෙන නිල සම්මාන උළෙලේදී සෑම කලාපයකින්ම ඉහළම තරගකරු කලාපීය ජයග්‍රාහකයා ලෙස ප්‍රකාශයට පත් කෙරෙන අතර මෙම කලාපීය ජයග්‍රාහකයින් පස්දෙනාගෙන් එක් කැපී පෙනෙන තරුණයෙක් 2022 වසරේ පොදුරාජ්‍ය මණ්ඩලීය තරුණ ව්‍යවසායකයා බවට පත් වීමට නියමිතය.

ELZIAN AGRO ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂවරයා වන ලිලාන් දයානන්ද 2021 වසරේ කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාරික කළමනාකරණ විශේෂවේදි උපාධිය අවසන් කර ජාත්‍යන්තරයට ප්‍රවේශ වන්නේ දක්ෂ හා නිපුණතා පිරිපුන් තරුණ ව්‍යවසායකයකු වශයෙනි.

කාලගුණික වෙනස්වීම් සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමඟ කටයුතු කරන්නට ඔහුගේ ගමන්මග විවර වූ අතර, තවදුරටත් මේ සම්බන්ධ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයන්හි පාඨමාලා මාර්ගගත ක්‍රමයට හදාරමින් ඒ පිළිබඳ දැනුම් වර්ධනය කර ගන්නටත් ඔහුට හැකිවිය. මෙවර පොදු රාජ්‍ය මණ්ඩලීය යෞවන සම්මාන උළෙල පැවැත්වූයේ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් මුහුණ පා ඇති ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමේ විසඳුම් ඉදිරිපත් කිරීමේ වේදිකාවක් වශයෙනි.

පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල බිලියන 2.5 කට ආසන්න ජනතාව අතරෙන් 60% ක් පමණ සිටින්නේ වයස අවුරුදු 30 ට අඩු තරුණ ප්‍රජාවය. මේ රටවල් අතරින් 32 ක් කුඩා රාජ්‍ය වන අතර ඒ රටවල ආර්ථික ගමන් මඟට තරුණ නායකත්වය, දැනුම අතිශයින්ම වැදගත් වී ඇත. මෙම පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් 53 අබිබවමින් ලිලාන් දයානන්ද අවසන් 20 දෙනා අතරට පත්වූයේ මෙම තරගාවලියට අදාළව ඔහු විසින් ඉදිරිපත් කළ තිරසාර සංවර්ධන අරමුණු 17 න් එකක් වන කුසගින්න නිවීම සඳහා ඉදිරිපත් කළ ව්‍යාපෘතිය ඇගැයීම වෙනුවෙනි. මේ අවසන් 20 දෙනා අතරට ලංකාව පමණක් නොව ඉන්දියාව, පාකිස්ථානය හා සිංගප්පූරුව යන ආසියාතික රටවල් 3 ක් ද ඇතුළත් වීම විශේෂත්වයකි. අමතරව අප්‍රිකාව, නයිජීරියාව, උගන්ඩාව වැනි අප්‍රිකානු රටවල් ද, කැරිබියන් දූපත් මෙන්ම යුරෝපා හා කැනඩාවේ රටවල් කිහිපයක් හා පැසිෆික් දූපත් කිහිපයක්ද අයත් විය.

'ලංකාවේ කුසගින්න නැති කිරීම'ලිලාන්ගේ ප්‍රධානම ඉලක්කය වූ අතර, එයට සබැඳියාවක් දක්වමින් කාලගුණයට අදාළව ඔහු විසින් තරගාවලියේ උප අරමුණුද සාක්ෂාත් කළේය. 2019 වසරේදි ඔහු විසින් ආරම්භ කළ ELZIAN AGRO ආයතනයේ අද වන විට 84 දෙනකුගේ කණ්ඩායමක් බවට පත්ව ඇත.

වඩා හොඳ සෞඛ්‍යය, විධිමත් ආහාර නිෂ්පාදනය සහ නව ව්‍යාපාරවලට සහාය වීම ඉලක්ක කරගත් නවෝත්පාදනයන් ඉදිරිපත් කිරීම පමණක් නොව ග්‍රාමීය ගොවීන්ට බෝග අස්වැන්න වැඩි කර ගැනීම සඳහා ස්මාර්ට් කෘෂි විද්‍යා විසඳුම් ලබාදීම, දත්ත පදනම් වූ අනාවැකි හරහා පසෙහි තත්වයන් පිරික්සීම, කාලගුණයේ සැලකිය යුතු වෙනස්කම් සහ පළිබෝධ තර්ජන කලින් දැනුම්වත් කිරීම ආදී කාලීන වටිනාකමකින් යුතු අංශ කිහිපයක් ඔහුගේ ව්‍යාපෘතියට ඇතුළත් වෙයි. මෙම ව්‍යාපෘතිය ගොවීන් 50,000කට අධික සංඛ්‍යාවක් වෙත මේ වන විටත් ළඟා වී ඇත.

මෙම තරගාවලියේදී පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් තරුණ ව්‍යවසායකයින් අප්‍රිකාව, ආසියාව, කැරිබියන්, යුරෝපය සහ කැනඩාව සහ පැසිෆික් වශයෙන් කලාපීය බාණ්ඩ පහක් යටතේ වර්ග වෙයි.

ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලීය ජූරි සභාවක් සියල්ල විනිශ්චය කෙරෙන අතර තේරුණු අවසන් 20 දෙනාට කුසලානයක්, සහතිකයක් සහ පවුම් 1,000 බැගින් ලැබීමට නියමිතය. ඔවුන්ගෙන්ද කලාපීය සම්මානලාභීන් පස් දෙනෙකු තෝරා ගන්නා අතර, එසේ තේරුණු අයට අමතර පවුම් 2,000 ක් ලැබීමට නියමිතය.

කලාපීය සම්මානලාභීන්ගෙන් එක් අයකු වසරේ පොදුරාජ්‍ය මණ්ඩලීය තරුණ ව්‍යවසායකයා ලෙස තෝරා ගන්නා අතර ඔහුට පවුම් 5,000 ක සම්පූර්ණ මුදල් ත්‍යාගය පිරිනැමේ.

රැජිනගේ ප්ලැටිනම් ජුබිලිය සනිටුහන් කිරීම සඳහා, පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය වන Queen's Commonwealth Trust (QCT) මඟින් තවත් අතිරේක ත්‍යාගයක් පිරිනැමීමට කටයුතු කර ඇත.

# අමුතු ඉලන්දාරියෝ

මාණිකයගේ

**සතියේ දේශපාලන විග්‍රහය**

● දමිත් කෝට්ටේගොඩ ලියයි

**තමන්ගේ තරම නොදැන කටයුතු කරලා අපහසුතාවට, නින්දාවට පත්වෙන මිනිස්සුන්ට අපේ ගම්වල කියන්නේ 'ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න' දැන ගන්න ඕනෑ කියලා. ඒ වගේම ඒ වගේ මිනිස්සු යම් වැඩක් කරලා ඒක අසාර්ථක කරගත්තාම අපි කියන්නේ 'ඒ වැඬේ ලත් තැනම ලොප් වුණා' කියලා. නැතිනම් නගරේ භාෂාවෙන් 'ඇණ ගත්තා' කියලත් කියනවා.**

මේ වගේ කතා සාගරයක් මැද්දේ තවත් කතාවක් ඇහුණා. ඒ ගුණදාස කපුගේ කියන ජනප්‍රිය ගායකයාගේ තවත් අතිශය ජනප්‍රිය ගීතයක කොටසක්. 'පාර කියන්නේ කෙලෙසද ඇය මට - ඇයට ද පාරක් ඇති නැති ගාණය'

මේ අටුවා ටීකා සේරම ඔළුවට ආවේ 'විමල් - ගම්මන්පිල' කියන සුළු පක්ෂ දෙකේ නායකයින් දෙන්නා පසුගියදා අල්ලපු අඩව්ව ගැන තැන තැන කියන නිමක් නැති කතා අහලා.

ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ සහ පිවිතුරු හෙළ උරුමය නායක උදය ප්‍රභාත් ගම්මන්පිල පසුගියදා ඇල්ලූ අඩව්ව අපි කවුරුත් විශ්මයට පත් නොකළට කිසියම් දේශපාලන කම්පනයක් නම් ඇති කළා. ඒ මුළු රටම කොවිඩ් වසංගතයෙන් සහ ඒ ඇසුරින් නිර්මාණය වූ ආර්ථික ගැටලුවලින් බැටකමින් සිටියදී, ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව මේ අර්බුදයට විසඳුම් සෙවීමට වෙහෙස ගනිමින් සිටියදී අනවශ්‍ය, නැතිනම් අතාත්වික දේශපාලන ප්‍රහසනයක් රඟ දැක්වීම කිසිසේත්ම ජනතාව අපේක්ෂා නොකළ දෙයක් වීම නිසයි. මේ තත්ත්වය වඩාත් සරල ආකාරයෙන් කිව්වොත් 'බොරදියේ මාළු බෑමට සූදානමින් සිටින' දේශපාලන අවස්ථාවාදීන් කිහිපදෙනකුට හෝ කල්ලියකට මිස මේ අවස්ථාවේ දේශපාලන අර්බුදයක් පොදු ජනතාවට කිසිසේත් අවශ්‍ය වුණේ නැහැ. ජනතාවගේ ඒකායන බලාපොරොත්තුව වුණේ මේ කෙටිකාලීන ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම පමණයි. ඒත් 'ආරේ ගති නෑරේ 'කිව්වා වාගේ මේ දේශපාලන අවස්ථාවාදීන්ට පොදු ජනතාව ගැන හෝ ඔවුන් පීඩාවට පත්කරන අර්බුද ගැන කිසිම ආකාරයක වගකීමක් හෝ වගවීමක් තිබුණේ නැහැ. කොටින්ම ජනතාව ගැන 'වගේ වගක් 'තිබුණේ නැහැ. පැහැදිලිව ඔවුන් තුළ තිබුණේ තම පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍රය ඉටුකර ගැනීමේ පටු වුවමනාව පමණක් බව පැහැදිලිව දැකගත හැකි වුණා.

## ● කැබිනට් වගකීම හරියට දැරුවාද?

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් නායකත්වය දෙන වත්මන් ආණ්ඩුව තුළ කටයුතු කරන දේශපාලන පක්ෂ විසින් පොදු අරමුණු පසෙකලා තම පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍ර සහ වුවමනා එපාකම් මත කටයුතු කරන බවට කාලයක් පුරා චෝදනාවක් තිබුණා. ඒ වගේම කැබිනට් සාමූහික වගකීම වැනි වටිනාකම් ගැන මෙම පක්ෂවල ඇතැම් නායකයන් කිසිදු ආකාරයක අවධානයක් යොමු නොකරන බවයි දැකගත හැකි වුණේ.

මේ අතර අපි කවුරුත් දන්නා පරිදි පසුගිය 02 වැනි දා 'ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ 11' යැයි ස්වයං නාමකරණය කරගන්නා ලද පක්ෂ 11ක් එක්ව සකස් කළ 'මුළු රටම හරි මඟට' නම් ප්‍රකාශනය එළිදැක්වීම කොළඹ 'මොනාක් ඉම්පිරියල්' හිදී සිදු වුණා.

'කන්න දුන්න අත හපා කන' නැතිනම් 'ඉඳගෙන සිටින අත්ත කපා ගන්නා' පන්නයේ රැස්වීමක් වුණ මෙයට පක්ෂ 11ට අයත් නායකයන් සහභාගී වුණත් ඊට පසු වඩාත් ආන්දෝලනයට ලක් වූ මාධ්‍ය සාකච්ඡාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක මෛත්‍රීපාල සිරිසේන සහ ජාතික කොන්ග්‍රසයේ නායක එල්. එම්. එම්. ආතාවුල්ලා සහභාගී නොවීම විශේෂත්වයක්. විශේෂයෙන් මෙම මාධ්‍ය සාකච්ඡාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් සහභාගී වුණේ එහි පසුපෙළ නායකයකු වශයෙන් සැලකිය හැකි හෙක්ටර් බෙත්මගේයි. මෙය පක්ෂ 11 මහත් උනන්දුවෙන් ගත් ප්‍රයත්නය, නැතහොත් 'ගැම්ම' ලත් තැනම ලොප් කළ සිදුවීමක් ලෙසයි දේශපාලන විශ්ලේෂකයන් සැලකුවේ.

## ● විපක්ෂය කර අරී

විමල් - ගම්මන්පිල අමාත්‍යධුරවලින් නෙරපා හැරීම පැහැදිලිම සමාජය තුළ, විශේෂයෙන් සමාජ මාධ්‍ය තුළ ඇති කළේ දැඩි උනන්දුවක්. සමාජ මාධ්‍ය නිරීක්ෂණය කළ විට පැහැදිලිව දැකගත හැකි වුණේ විමල් - උදය සම්බන්ධයෙන් සෘණාත්මක සහ හාස්‍යජනක ප්‍රතිචාර පමණයි. බොහෝ සමාජමාධ්‍ය ක්‍රියාකාරීන් මෙන්ම දේශපාලන නිරීක්ෂකයන් පවා පක්ෂ 11 නායක රැස්වීම සහ වැඩපිළිවෙළ දෙස බැලුවේ සෘණාත්මක ආකල්පයක් සමගයි.

මේ අතර විමල් - උදය අඩව්ව ගැන විපක්ෂය වෙතින් ද නිසි පිළිගැනීමක් හෝ උණුසුම් ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. ඔවුන් මේ හාස්‍යජනක රංගනය දෙස සැකසුමුව බැලූ අතර එය තවත් මොහොතකින් 'නොසලකා හැරීමක්' බවට පත් වුණා. වඩාත් සරල ආකාරයෙන් මේ ත්ත්ත්වය පැහැදිලි කළහොත් 'විපක්ෂය විමල් - උදය තම ආණ්ඩු විරෝධයට ජවයක් හා නව ආලෝකයක් ලෙස සලකනවා වෙනුවට එය 'නොසැලකිය යුතු 'දෙයක් ලෙසයි සැලකුවේ.

මේ සම්බන්ධයෙන් මෙම ලියුම්කරු සමඟ අදහස් දක්වමින් සමගි ජනබලවේගයේ නායකයෙක් සඳහන් කළේ 'විමල් - ගම්මන්පිල කැබිනට් එකෙන් එළෙව්වට ඒකෙන් විපක්ෂයට ඇති දේශපාලන වාසියක් නැහැ. මොකද මේක ඡන්දයක් හෝ වෙනත් දේශපාලන අභියෝගයක් තිබෙන අවස්ථාවක් නෙමෙයි. ආණ්ඩුවේ, විපක්ෂයේ වගේම ජනතාවගෙත් සම්පූර්ණ ම අවධානය යොමු වෙලා තිබෙන්නේ වත්මන් ආර්ථික අර්බුදය කළමනාකරණය කරගෙන ජනජීවිතය යථා තත්ත්වයට පත්කර ගැනීම ගැනයි. ඒ නිසා විමල් - උදය ඇති කළ දේශපාලන කම්පනයට වැඩි ආයුෂ නැහැ. ඒක කාලයත් සමඟ සමහන් වෙලා යාවි' යන්නයි.

මධ්‍යස්ථ දේශපාලන විචාරකයන්ගේද පොදු අදහස වන්නේ 'විමල් - උදය රංගනය වේදිකාවේ තිරය ඇරීමටත් පෙර ප්‍රහසන නාට්‍යයක් ආරම්භ කිරීමක්' බවයි.

## ● ආණ්ඩුව නොසැලී

මාර්තු 02 වැනිදා දේශපාලන කරළිය තුළ දැඩි කම්පනයක් සිදුකරනු ඇතැයි ද ආණ්ඩුව බරපතළ අර්බුදයකට ලක්වනු ඇතැයි ද ඇතැමුන් උපකල්පනය කළ ද ජනපතිවරයා - අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව මේ ක්ෂණික සිදුවීම හමුවේ කටයුතු කළ ආකාරය ප්‍රශස්තය. විමල් - උදය වහාම අමාත්‍යධුරවලින් ඉවත් කිරීම තුළින් ආණ්ඩුව බරපතළ දේශපාලන පණිවුඩයක් සහ අනතුරු ඇඟයීමක් කළ අතර ඊට පසුව ජනපතිවරයා තත්ත්වය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට සැලසුම් සහගතව පියවර ගත්තා.

මෙහිදී ජනපතිවරයා සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක මෛත්‍රීපාල සිරිසේන අතර පසුගිය 08 වැනිදා පැවැති සාකච්ඡාව අතිශයින් තීරණාත්මක එකක් වුණා.

මෙම හමුවේදී ජනපතිවරයා විසින් විමල් සහ ගම්මන්පිල අමාත්‍ය පදවිවලින් ඉවත් කිරීමට හේතු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකයාට පැහැදිලි කළ අතර එහිදී හිටපු ජනපතිවරයා අදාළ සිදුවීම ගැන සිය කනස්සල්ල පළ කළ බව ජනපති කාර්යාල ආරංචි මාර්ග සඳහන් කළා.

ජනපතිවරයා සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකයා අතර පැවැති මෙම විශේෂ සාකච්ඡාව ගැන මාධ්‍ය දැඩි අවධානයක් යොමු කළ ද ඒ සාකච්ඡා මඟින් ඇතැම් මාධ්‍ය හෝ කණ්ඩායම් අපේක්ෂා කළ ප්‍රතිඵල නොලැබුණු බව දැකගත හැකි වුණා.

මේ හමුවේ ගැන පසුව මාධ්‍ය හමුවේ කරුණු පැහැදිලි කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රචාරක ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත බණ්ඩාර පැවසුවේ 'ආර්ථික අර්බුද මැද දේශපාලන අර්බුදයක් නිර්මාණය කිරීමෙන් රට අරාජික කර ජනපතාව පීඩාවට ලත් කළ නොහැකි බවයි.

## ● සර්ව පාක්ෂික සමුළුව

'ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය මෙම අවස්ථාවේ ආණ්ඩුවෙන් ඉවත් නොවෙන්නේ ඇයිදැයි සමහරු ප්‍රශ්න කරනවා. එය ක්‍ෂණිකව කළ හැකියි. නමුත් වසර ගණනාවක් රටේ ආණ්ඩු කළ දේශපාලන පක්‍ෂයක් ලෙස තීන්දු ගත යුත්තේ පක්‍ෂයේ අනාගතය, ආණ්ඩු නිර්මාණය කිරීම, බලය ලබාගැනීම ගැන නොව ජනතාව පත්ව ඇති පීඩාවෙන් මුදා ගැනීම ගැන හිතලයි. ඒ නිසා ආණ්ඩුව සමඟ සාකච්ඡා කරමින් ජනතා ගැටලුවලට විසඳුම් සෙවීමට ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය බුද්ධිමත් තීන්දුවක් ගෙන තිබෙනවා. ආර්ථික අර්බුද මැද දේශපාලන අර්බුදයක් නිර්මාණය කිරීමෙන් රට තවත් අරාජික කර ජනතාව පීඩාවට පත් කළ නොහැකි බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරයයි' ශාන්ත බණ්ඩාර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවර තව දුරටත් පැහැදිලි කරමින් අවධාරණය කළා.

මේ අතර වත්මන් දේශපාලන ව්‍යාකූලතා සමහන් කර ගැනීමට ආණ්ඩුවට සම්බන්ධ පක්ෂවල සර්ව පාක්ෂික සමුළුවක් කැඳවීමට ද ජනපති - මෛත්‍රී සාකච්ඡාවලදී එකඟත්වය පැමිණීම අනාගත දේශපාලන සංහිදියාව වෙනුවෙන් රජයට ගත් වැදගත් පියවරක් ලෙස සැලකිය හැකියි. එයට හේතුව වන්නේ පොදුවේ රැස්ව සාකච්ඡා කර සම්මුතියෙන් රාජ්‍ය පාලනයට දායක විය හැකි නම් පටු දේශපාලන න්‍යාය පත්‍ර සහ අවස්ථාවාදී සැලසුම් පහසුවෙන් පරාජය පත් කිරීමට සියලු පාර්ශ්වලට අවස්ථාව උදා වීමයි. ඒය පැහැදිලිවම 69 ලක්ෂයේ ජනවරම ආරක්ෂා කර ගැනීමට මෙන්ම දුන් පොරොන්දු ඉටුකර හදිසියේ උද්ගත වූ කොවිඩ් වසංගය, විදේශ සංචිත හිඟය වැනි ගැටලුවලට ශක්තිමත්ව මුහුණදීමට අවස්ථාව උදා කරනවා.

## ● චෝදනාවලට අගමැති දුන් පිළිතුරු

විමල් - ගම්මන්පිල ප්‍රහසනය හරහා නිර්මාණය වූ දේශපාලන ආතතිය සමහන් වෙමින් පවතින මේ අවස්ථාවේ ඒම අර්බුදයෙන් ගොඩයාමට හෝ තම ව්‍යාපෘති ශක්තිමත් කරගෙන ජනතා අවධනාය දිනා ගැනීමට තැත් කළ අවස්ථාවාදී බලවේග ගැන ද මේ මොහොතේ අපගේ අවධානය යොමු කළ යුතු වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකයන් දැඩිව අවධාරණය කරන පරිදි මේ අවස්ථාවේ දේශපාලන අර්බුදයක් කිසිසේත් ජනතාවගේ සුබසිද්ධියට හේතු නොවන නිසයි. එමෙන්ම 'දේශපාලන ළදරු වළිප්පුව' වැලඳී ඇතිවුන් තවත් වටයකින් නව අර්බුද නිර්මාණය කිරීමට මෙය අවස්ථාවක් කරත හැකි නිසයි.

මේ සියලුම දේශපාලන අර්බුද සහ සමාජ අසහනයන් නිර්මාණය වන්නේ කොවිඩ් වසංගතය හේතුවෙන් නිර්මාණය වූ පශ්චාත් ප්‍රතිඵල ලෙසයි. අපි පැහැදිලිව දන්නවා කොවිඩ් වසංගතය නිසා රටට අත්වූ සෘණාත්මක ප්‍රතිඵල මොනවාද කියා. විශේෂයෙන් සංචාරක ව්‍යපාාරයේ දැවැන්ත බිඳ වැටීම වගේම කොවිඩ් අර්බුදය නිසා විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් අහිමිවීම මේ අර්බුදයට සෘජු උත්තේජනයක් වුණා. අපි දන්නවා කොවිඩ් වසංගතය නිසා ඉතාලිය ප්‍රමුඛ යුරෝපීය රටවල්, මැදපෙරදිග කලාපයෙත් විශාල පිරිසක් නැවත මවු රටට පැමිණියා. ඒ වගේම වාර්ෂිකව සිදුවන ලක්ෂ තුනකට ආසන්න විදේශ රැකියා සඳහා පිටත්ව යාම් බරපතළ ලෙස පහළ ගියා. ඉහළ වැටුප් හිමිවන දකුණු කොරියාව වැනි රටවල රැකියා අවස්ථා අහිමි වුණා. මේ සියල්ල සමඟයි වත්මන් අර්බුදය නිර්මාණය වුණේ. ඒයට ආර්ථිකමය වශයෙන් තිරසර විසඳුමක් සෙවීම මිස අවස්ථාවාදී දේශපාලන කුමන්ත්‍රණ මගින් එයට කිසිම පිළිතුරක් ලබාදිය නොහැකියි. ඒ නිසා ජනතාව වගේම මේ සැලසුම් සහ කුමන්ත්‍රණවලට සම්බන්ධ සහ ආවඩන සියලු දෙනා මේ යථාර්ථය වටහා ගත යුතුයි. එසේ නොවී ශ්‍රී ලංකාව මුහුණ දෙන යථාර්ථයෙන් පිට උදාහරණ ගෙනහැර පාමින් ජනමනස විකෘති කර නොමඟ යැවීමක් නොකළ යුතුයි.

## ● අවහිරතා ඇතිවීමට හේතුව

මේ අදහස වඩාත් තහවුරු වන ප්‍රකාශයක් සහ බොරදියේ මාළු බෑමට කැසකවන කල්ලිවලට සෘජු පිළිතුරක් අගැමැති මහින්ද රාජපක්ෂයන් විසින් පසුගිය 08 ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම -2022ට එක්වෙමින් කළා.

'අපි අද බොහොම අසීරු තත්ත්වයක ඉන්න බව අපි පිළිගන්නවා. විදුලිය, ඩීසල්, ගෑස් හිඟ වෙනකොට අපේ රටේ කාන්තාවො දුක්විඳින බව අපි දන්නවා. මේ ළඟදි ජනාධිපතිතුමාගෙ ගෙදර ඉස්සරහට ගිය කාන්තාවක් මේ ගැන එතුමා දන්නවද කියලා ඇහුවා. කවුරුවත් කියන්න ඕන නෑ; ජනාධිපතිතුමා ඒ ගැන දන්නවා. මට මතකයි දෙවැනි කොරෝනා රැල්ල වෙලාවේ ඔය කට්ටිය ජනාධිපතිතුමාට බල කළා රට වහන්න කියලා. වැහුවෙ නැත්නම් ස්වයං ලොක්ඩවුන් කර ගන්නවා කිව්වා. එහෙම රටක් මාස ගණනක් වැහුවාම ආර්ථික වශයෙන් ප්‍රපාතයට වැටෙන බව වහන්න කියපු අය දැනගෙන හිටියා. රට වහලා ගාමන්ට් ඇරල තියෙනකොට ගාමන්ට් වහන්න ගාමන්ට් පොකුරක් හැදෙයි කියලා ඒකත් වහන්න ඒ අය බලපෑම් කළා. එදා රට වැහුවාම මීට වඩා ජනතාවට විපාක විඳින්න සිද්ධ වෙන බව ජාතිය අමතලා කියලා තමයි ජනාධිපතිතුමා රට වැහුවේ. අද ඒක ඇත්ත වෙලා තියෙනවා. අද රට වහන්න කියපු අය කවුරුවත් දුක් විඳින ඔබ වෙනුවෙන් පෙනී සිටින්නේ නෑ. ඒ විතරක් නොවෙයි අපිව පරාද කරලා 2015 ගෙදර යැව්වා. ඒ වෙනකොට අපි නොරොච්චෝලෙ ඇතුළු විදුලි බලාගාර ගණනාවක් අවුරුදු අටක් තුළ ඉදි කරලයි ගෙදර ගියේ. නමුත් 2015 ඉඳන් යහපාලන ආණ්ඩුව එක මෙගාවොට් එකක් ජාතික විදුලි බල පද්ධතියට එකතු කළේ නෑ. එහෙම අය අද පන්දම් අරගෙන විදුලි කප්පාදුවට එරෙහිව පෙළපාළි යනවා. ඒ යන කාටවත් මතක නෑ එක මෙගාවොට් එකක්වත් ඒ ගොල්ලො එකතු කළේ නැති බව

ආදරණීය සොයුරියනි, මේ තිබෙන දුෂ්කරතා විතරක් නොවෙයි, ඒවා ඇති වීමට බලපෑ හේතුත් තේරුම් ගන්න. අපි පක්ෂ භේදයක් නැතිව මේ ගැන හිතමු. මේ දුෂ්කර අවස්ථාවේ ඉවසීමෙන් වැඩ කරමු'

## ● දේශපාලන ළදරු වලිප්පුව


යළිත් සාකච්ඡාවේ ආරම්භයට පැමිණිය යුතුයි. ඒ විමල් වීරවංශ සහ උදය ප්‍රභාත් ගම්මන්පිල යන වත්මන් ආණ්ඩුව බිහිකිරීමට මුල්ගල තැබූවා යැයි කුප්‍රකට දේශපාලන චරිත දෙක ගැන විශ්වාසයකින් ජනතාව සහ දේශපාලන ව්‍යපාර ආණ්ඩුව වෙතින් පියවරක් පසු පසුට ගනීද යන්න ගැන මධ්‍යස්ථ විමසීමක අප යෙදිය යුතුයි.

මෙහිදී වඩාත් වැදගත් කරුණ වන්නේ විමල් - ගම්මන්පිල ගැන සමාජයේ පවතින තක්සේරුවයි. හුදු දේශපාලන මඩ සහ අවලාදවලින් ඔබ්බට ගොස් මධ්‍යස්ථව කරුණු විග්‍රහ කළ විට විමල් - ගම්මන්පිල යනු මහින්ද රාජපක්ෂ යන දැවැන්ත වනස්පතියේ සෙවණ ලබමින් වැඩුණු අරටුවකින් තොර පඳුරු ලෙස සැලකිය හැකියි. ඊට හේතුව වන්නේ ඔවුන්ගේ ඊනියා ප්‍රචාරකවාදී ජාතිකත්වය අති උත්කර්ෂවත් ලෙස ඉහළට යන්නේ මහින්ද රාජපක්ෂයන්ගේ දේශපාලන ප්‍රහර්ශය මතම පදනම්වීම නිසයි. ජවිපෙ කථිකයකු පමණක් වූ විමල් වීරවංශ ජාතික තලයට ඔසවා තබන්නේ මේ අනුහස් දේශපාලන පෞරුෂය මිස විමල් විසින් උපයා ගත් හෝ නිර්මාණය කරගත් දේශපාලන පෞරුෂයක් නොවෙයි. ඒ නිසාම විමල් වීරවංශ කියන්නේ ශ්‍රී ලංකා දේශපාලනයේ විශ්වාසනීය හෝ ගරු කටයුතු දේශපාලන පෞරුෂත්වයක් නොවෙයි. ඒ නිසා රාජපක්ෂ පවුලේ ප්‍රහර්ෂයෙන් පිට විමල් වීරවංශට දේශපාලන අනාගතයක් තිබිය හැකි යැයි සිතිය හැකිවන්නේ දේශපාලන අඥබාලයකුට පමණයි. ඒ බව විමල් - ගම්මන්පිල මාර්තු 02 රංගනයෙන් පසු වඩ වඩාත් තහවුරු වෙමින් තිබෙනවා.

උදය ප්‍රභාත් ගම්මන්පිල ගැන විමල්ට වඩා දෙයක් කතා කරන්න බැහැ. ගම්මන්පිලගේ දේශපාලන සුජාතභාවය ගැන මෙන්ම භාවිතය ගැන මෙරට දේශපාලන ලෝකයට බරපතළ විවේචන තිබෙන්නේ බොහෝ කාලයක සිටයි.

මෙවැනි අස්ථාවර සහ අපකීර්තිමත් තත්ත්වයක් තුළ විමල් - ගම්මන්පිල දේශපාලන ප්‍රහසනය දර්ශන වාර දෙක තුනකින් අවසන් වනු ඇති බවත් ඒම රංගනය ඉතිහාසයේ කුණු බක්කියට වැටෙනු ඇති බවත් කැට තබා පැවසිය හැකියි. ඒ පසුවට වඩාත් පැහැදිලි ඉඟිය පසුගියදා ජනපතිවරයා සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකයා අතර පැවැති විශේෂ සාකච්ඡාවේදී ලැබුණා.

'ආර්ථික අර්බුදය මැද දේශපාලන අර්බුදයක් නිර්මාණය කිරීමට අපට අවශ්‍ය නැහැ' ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රටට දුන් පණිවුඩය එයයි. මේ පණිවුඩය විමල් - ගම්මන්පිල වගේම කඩිනම් ආණ්ඩු වෙනසක් ගැන සිහින දකින සියලු අවස්ථාවාදීන් විසින් අවධානයට ගත යුතුයි.







**අස්ථාවර සහ අපකීර්තිමත් තත්ත්වයක් තුළ විමල් - ගම්මන්පිල දේශපාලන ප්‍රහසනය දර්ශන වාර දෙක තුනකින් අවසන් වනු ඇති බවත් ඒම රංගනය ඉතිහාසයේ කුණු බක්කියට වැටෙනු ඇති බවත් කැට තබා පැවසිය හැකියි.**

**මෙහිදී වඩාත් වැදගත් කරුණ වන්නේ විමල් - ගම්මන්පිල ගැන සමාජයේ පවතින තක්සේරුවයි. හුදු දේශපාලන මඩ සහ අවලාදවලින් ඔබ්බට ගොස් මධ්‍යස්ථව කරුණු විග්‍රහ කළ විට විමල් - ගම්මන්පිල යනු මහින්ද රාජපක්ෂ යන දැවැන්ත වනස්පතියේ සෙවණ ලබමින් වැඩුණු අරටුවකින් තොර පඳුරු ලෙස සැලකිය හැකියි. ඔවුන්ගේ ඊනියා ප්‍රචාරකවාදී ජාතිකත්වය අති උත්කර්ෂවත් ලෙස ඉහළට යන්නේ මහින්ද රාජපක්ෂයන්ගේ දේශපාලන ප්‍රහර්ශය මතම යැපෙමින් ය.**

**වත්මන් දේශපාලන ව්‍යාකූලතා සමහන් කර ගැනීමට ආණ්ඩුවට සම්බන්ධ පක්ෂවල සර්ව පාක්ෂික සමුළුවක් කැඳවීමට ද ජනපති - මෛත්‍රී සාකච්ඡාවලදී එකඟත්වය පැමිණීම අනාගත දේශපාලන සංහිදියාව වෙනුවෙන් රජය ගත් වැදගත් පියවරක් ලෙස සැලකිය හැකියි.**



# ප්‍රතික්ෂේප කළ පෙමක් නිසා ජීවිතයෙන් වන්දි ගෙවූ පාසල් සිසුවිය

## ජගත් කාන්තා දිනය දා හාලිඇළ 18 හැවිරිදි සිසුවිය ඝාතනය වූ හැටි

● අමිල මලවිසූරිය

**ලෝක කාන්තා දිනය යෙදී තිබුණේ පසුගිය මාර්තු 08 වැනිදාටයි. එදින කාන්තාවන්ගේ අයිතිවාසිකම්, සමාජීය වශයෙන් මුහුණ දෙන ගැටලු ආදී නොයෙක් දෑ ගැන බොහෝ සේ කතාබහට ලක්වූයේ විවිධ උත්සව ආදියද සංවිධානය කරමිනි.**

එලෙස කාන්තා දිනය සැමරෙද්දී එදින යොවුන් වියට පා තබමින් සිටි යුවතියක කුරිරු ලෙස පොරෝ පහරකින් ඝාතනය කර තිබුණේ බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇළ පොලිස් වසමේ, උඩුවර වත්ත පහළ කොටසේදියි.

ඇය, 18 හැවිරිදි ධර්මරාජා ලිදියායි. දෙමෝදර, හතේ කණුව, උඩුවර වත්ත පහළ කොටස, ජන උදානගම ලයිම් නිවාසවල විසූ ලිදියා හාලිඇළ දෙමළ මහා විද්‍යාලයේ 12 ශ්‍රේණියේ සිප්සතර හදාරමින් සිටියාය. ඇය කාන්තා දිනයදාම අමානුෂික ලෙස ඝාතනය කර තිබුණේ තවත් අහස පොළොව නුහුළන අපරාධයක් සනිටුහන් කරමිනි. ලිදියාගේ ඝාතකයා ඇගේ නිවෙසට යාබද නිවෙස් දෙකකට එපිට නිවෙසක වාසය කළ 32 හැවිරිදි රාමයියා දිවාකරන් නමැත්තායි. ඔහු ලිදියා සමඟ ප්‍රේම සබඳතාවකට උත්සාහ කළත් ඊට ලිදියා සහ ඇයගේ පවුලේ උදවිය දැඩි ව විරෝධය පළ කළේ ලිදියා තවමත් අධ්‍යාපනය හදාරන පාසල් සිසුවියක්ව සිටි හෙයිනි.

ලිදියාගේ මව මුත්තුරාජ් මලර්ය. පියා 56 හැවිරිදි කරුපයියා ධර්මරාජාය. දෙදෙනාම උඩුවර වත්ත තේ ඉඩම්හි කම්කරුවන් ලෙස රැකියාවේ නියුතුව සිටියහ. ලිදියාට වැඩිමහල් සහෝදරයෙක් වේ. ඔහු බදුල්ල නගරයේ හෝටලයක රැකියාව කළේය. හාලිඇළ දෙමළ මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් සිටි ලිදියා ඉගෙනීමටද හපන්කම් පෑවාය. ඊට අමතරව ඇය පාසලේ බාලිකා ශිෂ්‍ය භට කණ්ඩායම ද නියෝජනය කළ සිසුවියකි. 12 ශ්‍රේණියේ ඉගෙන ගනිමින් සිටි ඇය ලබන වසරේ අපොස උසස් පෙළ විභාගයට මුහුණ දීමට නියමිතව සිටියාය. ඇයගේ එකම බලාපොරොත්තුව වී තිබුණේ උසස්පෙළ සමත්ව විශ්වවිද්‍යාල වරම් දිනා ගැනීම බව ඇයගේ දෙමාපියෝ හඬා වැටෙමින් පැවැසූහ.

පාසල් සිසුවියක වුවත් ලිදියාගේ රූ සපුව යෞවනත්වයේ පසුවන මනරම් යුවතියක් බඳුය. වැඩිදුර අධ්‍යාපනයක් නොලත් රාමයියා දිවාකරන් 32 හැවිරිදි වියේ පසුවන තරුණයෙකි. ලිදියාගේ නිවෙසට යාබද නිවෙස් දෙකකට එපිටින් නිවෙසේ වූ දිවාකරන් හාලිඇළ, 7 කණුව හෝටලයක කම්කරුවකු ලෙස සේවය කළේය. ඔහුගේ දෙමාපියන්ද උඩුවර වත්තේ කම්කරුවන්ය. දිවාකරන්ට බාල සහෝදරයෙක්ද විය.

රූමත් පෙනුමකින් යුත් ලිදියා දකින වාරයක් පාසා දිවාකරන් සිතුවේ ඇය හා ප්‍රේම සබඳතාවක් ගොඩනගා ගැනීමටයි. ඒ සඳහා මීට වසරක පමණ කලෙක සිටම දිවාකරන් නොගත් උත්සාහයක් නොමැත. ඊට දෙදෙනා අතර වූ අවුරුදු 15ක පමණ තරම් වූ වයස් පරතරය ගැන ද දිවාකරන් නොසිතුවේය. එහෙත් ඊට ලිදියාගෙන් ලැබුණේ යහපත් ප්‍රතිචාරයක් නොවේ. ඇය දිවාකරන්ට කිසිදු කැමැත්තක් නොදැක්වූවාය. ඒ නිසාවෙන්ම අසල්වාසි නිවෙස්හි වාසය කළත් ලිදියාට, දිවාකරන් වහකදුරු මෙන් විය.

දිනක් ලිදියා, ඇය සමඟ දිවාකරන් ප්‍රේම සබඳතාවකට උත්සාහ කරන බව සිය දෙමාපියන්ටද පැවැසුවාය.

"අම්මේ මට දිවාගෙන් බේරෙන්න බෑ. ඒකා මාත් එක්ක යාළු වෙන්න එනවා. මං යන හැමතැනම පස්සෙන් එනවා. මට ලැජ්ජාවේ බෑ. සමහරදාට ඉස්කෝලේ ගාවටත් එනවා."

ඒත් සමඟ ලිදියාගේ දෙමාපියෝ ද දිවාකරන්ට දැඩි විරෝධයක් පාන්නට වූහ. විශේෂයෙන්ම ලිදියා තවම අධ්‍යාපනය ලබන දරුවකු හෙයින් එම විරෝධය තව තවත් තීව්‍ර විය.

2021 අගෝස්තු මාසයේ දිනක් ලිදියාගේ දෙමාපියන් සහ දිවාකරන් අතර ගැටුමක්ද හට ගැනිණි. ඒ දිවාකරන් ලිදියාගේ 'පස්සෙන්' ඒමේ ප්‍රතිඵලයක් ලෙසිනි. එදින දිවා විසින් ලිදියාගේ පියාට සහ සහෝදරයාට පිහියකින්ද කෙටුවේය. ඒ පිළිබඳ හාලිඇළ පොලිස් පොතේද පැමිණිල්ලක් සටහන් විය. එම පැමිණිල්ල පිළිබඳව හාලිඇළ පොලිසිය විසින් බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කිරීමත් සමඟ නඩු විභාගයක්ද සිදු විණි.

එම නඩු විභාගය පසුව හාලිඇළ සමථ මණ්ඩලයට යොමු කිරීමත් සමඟ සමථ මණ්ඩලයෙන් දෙපාර්ශ්වය සමතයකට පත්කොට රුපියල් 50,000ක වන්දි මුදලක් ලිදියාගේ පියාට සහ සහෝදරයාට ගෙවීමටද දිවාකරන්ට නියෝග කළේය. ඒ වාරික දෙකකිනි. එහි පළමු වාරිකය ගෙවීමට නියමිතව තිබී ඇත්තේ මේ මස 13 වැනි ඉරිදා දිනයි.

මේ අතරේ දිවාකරන් නිතර සැක කළේ ලිදියා පාසල් මිතුරකු හා ප්‍රේම සබඳතාවක් පවත්වන බවටයි. එම ප්‍රේමය ඔහුට ලිදියා සමඟ ප්‍රේම සබඳතාවක් ගොඩනගා ගැනීමට තිබෙන ලොකුම බාධාවක් බව ඔහු සිතූ වාර අනන්ත බව දිවාකරන් පොලිස් අත්අඩංගුවට ගැනීමෙන් පසුව අනාවරණය විය.

ඉකුත් මාර්තු 8 වැනිදායි. එදින ලිදියා පාන්දර 6.30ට පමණ නිවෙසෙන් පිටත් වූයේ නිවෙසේ සිට කිලෝමීටර් හයක පමණ දුරින් හාලිඇළ නගර මධ්‍යයේ වූ හාලිඇළ දෙමළ මහා විද්‍යාලය කරා යාමටයි. සවස 1.30ට පමණ පාසල නිම වීමෙන් පසු ලිදියා බදුල්ල - බණ්ඩාරවෙල බස් රථයකට නැගුණේ නිවෙස කරා යාමටයි. ඇය සුපුරුදු පරිදි බස් රථයෙන් බැස්සෙ උඩුවර වත්ත, හතේ කණුව බස් නැවතුමෙනි.

අනතුරුව ඇය ගමන් කරන්නට වූයේ නිවස කරා යාමට තිබෙන කඳුකර මාර්ගයක් වූ වලස්බැද්ද මාර්ගයේ පා ගමනිනි. බස් රථයෙන් බැස නිවෙසට කිලෝමීටරයක පමණ දුරක් යා යුතුය. එදින ඇගේ අවාසනාවේ මහිමය නම් බස් රථයෙන් බැස එම මාර්ගයේ ගමන් කිරීමට සිටියේ ඇය පමණක් වීමයි. මාර්ගය දෙපස තේ පඳුරුවලින් ගහණ තේ වත්තයි. ලිදියාට ගමන් කරන්නට හැකි වූයේ මීටර් 400ක් පමණ දුරකි.

සිත්පිත් නැති මාරයා ලිදියා ඩැහැගැනීමට මඟ රැක සිටියේය. තේ පඳුරු අස්සේ සැඟව සිටි එකී මාරයා වෙනකකු නොව දිවාකරන්ය. ඔහු එක්වරම ලිදියා වෙත කඩා පැන්නේ අත් පොරොවක්ද අතැතිව මාරාවේශයෙනි. ඒ සමඟම දෙදෙනා අතර බහින්බස් වීමක්ද සිදුවී තිබිණි. එය දුරදිග යාමත් සමඟ දිවාකරන් හිත්පිත් නැත්තෙකු සේ ක්‍රියාත්මක වූයේ අතෙහි වූ පොරොවෙන් ලිදියාගේ හිස දෙබෑ වෙන්නට පහරක් ගසමිනි. පාසල් නිල ඇඳුමින් සිටි ඇය ඇද වැටුණේ කුඩා කල සිට ආගිය මාර්ගය රුධිරයෙන් නහවමිනි. ඇයගේ ගෙළ ප්‍රදේශයට සහ හිසට පොරෝ පහර දුන් ඝාතකයා පොරොව තේ වත්තට විසිකොට පැන දිව්වේය.

සවස 2.30ට පමණ එම ස්ථානයෙන් දහවල් ආහාරය සඳහා ගමන් කරමින් සිටියේ උඩුවර වත්ත ලයිම් අංක 13හි කංකානම වන වේළු පෙරියසාමියි. ඔහු දුටු දෙයින් තුෂ්ණිම්භූත වී ගියේය. ලේ ගංගාවක් මැද වැටී සිටි ලිදියා අසලට ළංවූ පෙරියසාමිට ඇයව හඳුනා ගැනීමට ඒහැටි වෙලාවක් නොගියේ ලිදියා උඩුවර වත්තේ කා අතරත් හොඳ හිත දිනාගත් පාසල් සිසුවියක ලෙස ප්‍රචලිතව සිටි හෙයිනි.



වමේ සිට, ලිදියාගේ පියා කරුපයියා ධර්මරාජා සහ මව මුත්තුරාජ් මලර්



ඝාතනයට යොදාගත් පොරෝව

"අනේ දෙවියනේ... මේ කරුපයියගේ දුවනේ..." ඔහුට කියැවුණේ එපමණකි. වේළුසාමි ක්ෂණිකවම ලිදියාගේ මරණය සැල කර සිටියේ ලිදියාගේ පියා කරුපයියා සමඟ එක්ව සේවය කරන කරුපයියාගේ මිතුරකුටයි.

උඩුවර වත්ත පහළ කොටස මාර්ගයේ පාසල් සිසුවියක වන ලිදියා පාසල් නිල ඇඳුමෙන්ම ඝාතනය කොට සිටින වග අවට ගම් සිසාරා ලැව්ගින්නක් සේ පැතිර යන්නට ගත වූයේ නිමේෂයකි. මිනිත්තු ගණනක් ගතවෙද්දී ලිදියාගේ මළසිරුර වූ ස්ථානයට උඩුවර වත්තේ පමණක් නොව අවට ගම්වාසී සිය ගණනක් දෙනා රැස්වන්නට වූයේ 'අනේ අපොයි' යැයි විස්සෝප වෙමිනි.

ඒ අතරේ 119 පොලිස් හදිසි ඇමැතුම් අංකය ඔස්සේ හාලිඇළ පොලිසියටද ලිදියාගේ ඝාතනය සැලවිණි. එසැණින් හාලිඇළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් ගුණතිලකගේ මෙහෙයවීමෙන් එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ඩබ්ලිව්. එම්. දයානන්ද ප්‍රමුඛ නිලධාරින් එම ස්ථානය කරා ගොස් විමර්ශන ආරම්භ කෙරිණි. පොලිස් ස්ථානාධිපතිවරයා විසින් බදුල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුජිත් වෙදමුල්ලද දැනුවත්කොට ඔහුගේ උපදෙස් මත ඝාතකයා සොයා පුළුල් විමර්ශනයක් ඇරැඹෙද්දී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් ලිදියාගේ ඝාතනය පිළිබඳව විමර්ශන සඳහා සොකො නිලධාරින් ඇතුළු විමර්ශන කණ්ඩායම් කිහිපයක්ම යෙදවීමටද උපදෙස් දුන්හ. ලිදියා ඝාතනය දිවාකරන් විසින් සිදුකළ බව පොලිස් නිලධාරින් අනාවරණය කර ගැනීමත් සමඟ ඔහු සැඟව සිටි ස්ථාන සොයා පොලිස් නිලධාරින් පුළුල් මෙහෙයුම් සිදු කළේය. අවට සෝදිසියේදී ඝාතනයට යොදාගත් අත්පොරොවද තේ වත්තේ තිබී සොයා ගැනීමට පොලිසිය සමත් වූහ.

## ඝාතනය වූයේ හාලිඇළ දෙමළ මහා විද්‍යාලයේ සිසුවියක්




ගුරු සංගම් සහ මව්පියන් හාලිඇළ නගර මධ්‍යයේ සිද්ධියට විරෝධතාවක නිරත වූ අයුරු.







වමේ සිට, බදුල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුජිත් වෙදමුල්ල, හාලිඇළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් ගුණතිලක සහ හාලිඇළ පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ඩබ්ලිව්. එම්. දයානන්ද



ලිදියා පාසල් රැගෙන ගිය පොත් බෑගය

ඒ අතරේ ඝාතනයට පසුදින එනම් 9 වැනිදා පෙරවරුවේ ඝාතකයා බදුල්ල - කොළඹ දුම්රිය මාර්ගයේ ගමන් කරමින් සිටින බවට පොලිසියට සැල වී තිබිණි. ඔහුව අත්අඩංගුවට ගැනීමට පොලිස් කණ්ඩායමක් ක්‍රියාත්මක වෙමින් සිටියදී හාලිඇළ පොලිස් ස්ථානයට පැමිණි ලිදියාගේ ඝාතකයා පොලිසියට බාර වන්නට වූයේ ඔහුට වෙනත් ගැලවීමක් නොමැති වග දත් හෙයිනි.

"මං කෝච්චියට බෙල්ල තියන්න හැදුවේ සර්. ඒත් පස්සෙ හිතුණා පොලිසියට ගිහිල්ලා බාර වෙනවා කියලා. "

ලිදියාගේ ඝාතකයා පොලිසියට බාර වෙමින් පාපෝච්චාරණය කරන්නට වූයේ එවැන්නකි. හාලිඇළ පොලිස් අත්අඩංගුවට පත් සැකකාර දිවාකරන්ගෙන් පොලිස් නිලධාරින් දිගින් දිගටම ප්‍රශ්න කරන්නට වූයේ නිරපරාදේ ලිදියා ඝාතනය කළේ කුමක් නිසාද යන්න විමසමිනි.

"සර්... මට ලිදියත් එක්ක යාළු වෙන්න ඕන වුණා. එයාට නිතරම කිව්වා මට කැමැති වෙන්න කියලා. ඒත් ලිදියා මට කැමැති වුණේම නෑ. එයා මට අකැමැති නිසා මං පහුගිය ටිකේම හැසිරුණේ පිස්සෙක් වගේ සර්. මට ඇය නැතිවුණොත් කියලා ඉවසුම් නැතුව හිටියේ. ඒකයි සර් මගේ අතින් මේ දේ වුණේ. "

ලිදියාගේ ඝාතනයේ සැකකාර දිවාකරන් අත්අඩංගුවට පත් දිනම බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට හාලිඇළ පොලිස් නිලධාරිහු කටයුතු කළහ. ඒ අනුව බදුල්ල වැඩබලන මහේස්ත්‍රාත් නීතිඥ රොනාලි අබේවික්‍රම විසින් සැකකරු හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කරන තෙක් ලබන 18 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසට නියෝග කළාය. පාසල් ශිෂ්‍යාවක වන ලිදියාගේ ඝාතනයට සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලා ලංකා ගුරු සංගමය හාලිඇළ නගරයේදී ඉකුත් බ්‍රහස්පතින්දා දින විරෝධතාවකද නිරත වූහ.

අනාගතය ජයගන්නට වෙර වීර්යයෙන් අධ්‍යාපනය හදාරමින් සිටි ලිදියාගේ ඉරණම් ගමන කාන්තා දිනයද සමරන දින අවසන් වූයේ ඉතාම අවාසනාවන්ත ලෙසිනි. මිනිස් සමාජයේ මෙවැනි පාපතරයන් නිසා තරුණ දරුවන්ට අත්වන ශෝචනීය ඉරණම ඛේදනීයය.

මේ පිළිබඳ විමර්ශන බදුල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුජිත් වෙදමුල්ලගේ උපදෙස් මත හාලිඇළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් ගුණතිලකගේ මෙහෙයවීමෙන් එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ඩබ්ලිව්. එම්. දයානන්ද ඇතුළු පොලිස් සැරයන්වරුන් වන 1477 ජයසිංහ, 19803 රත්නපාල, 59200 ජයප්‍රකාශ්, 54262 කසිර්, පොලිස් කොස්තාපල්වරුන් වන 40922 එදිරිසිංහ, 74708 ඒකනායක සහ 78779 රාජපක්ෂ යන නිලධාරිහු සිදු කළහ.

**ජායාරූප - ආර්.එම්. විජේරත්න - හාලිඇළ සමූහ**

## ඝාතකයා සිසුවියගේ නිවෙසට යාබද තරුණයෙක්



ලිදියාගේ ඝාතනයෙන් වැලපෙන ඇයගේ ආච්චි අම්මා






# රටේ පොදු ප්‍රශ්න ගැන සිළුමිණෙන් ප්‍රශ්න 5ක්

## මත ගැටෙන තැන

• සුභද්‍රා දේශප්‍රිය

**1** ජිනීවා මානව හිමිකම් මහකොමසාරිස්වරිය ඉදිරිපත් කළ වාර්තාවට බහුතර රටවල් ශ්‍රී ලංකාවට සහය පළකිරීම මෙරටට කෙසේ බලපෑම් කරයි ද?

**2** ලෝක වෙළෙඳපොළේ බොර තෙල් මිල ඉහළයාමට සාපේක්ෂව ඉන්ධන මිල නැවත ඉහළ යයිද?

**3** හවුල්කාර පක්ෂ 11කින් යුතු කණ්ඩායම හරහා නව දේශපාලන බලවේගයක් ගොඩනැගෙයිද?

**4** අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය කිරීමට යම් බාධාවක් පවතින අතර එය අඛණ්ඩව පවත්වා ගැනීමට ඔබේ යෝජනා කෙබඳුද ?

**5** විශේෂ භාණ්ඩ හා සේවා බදු කෙටුම්පතේ 3(2) වගන්තිය ඉවත් කිරීම පිළිබඳ රජයේ යෝජනාව සම්බන්ධයෙන් ඔබ දරන අදහස කුමක්ද?



## රටවල් බහුතරයක් සහය දීම අපිට ලොකු ශක්තියක්

කර්මාන්ත අමාත්‍ය
**එස්. බී. දිසානායක**

**1** රටවල් බහුතරයක් සහය පළකිරීම අපිට විශාල ශක්තියක්. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ කොමසාරිස්වරිය පෞද්ගලික න්‍යාය පත්‍රයක් හදාගෙන අපිට පහර දෙනවා. මේ රටේ වසර 30ක් තිබුණ ගැටලුව පරාජය කරලා මානුෂීය මෙහෙයුම අපි ජයග්‍රහණය කරපු දවසේ ඉඳලා අපිට මේ ගැටලුව අපිට තිබුණා.

අපිට එරෙහිව පෞද්ගලික න්‍යාය පත්‍රයක් හදාගෙන පහර දෙන බවකුයි පේන්නේ. අපිට පමණක් නොවෙයි තවත් රටවල් කිහිපයකට අවශ්‍ය දේ අමුඅමුවේම ලැජ්ජාවක් නැතිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය තුළ කරනවා. ඒ ඇමරිකාවට අවශ්‍ය දේ. විශේෂයෙන් ජර්මනියට දිගට හරහට සෞදි අරාබිය ගහනවා. ජර්මනියට ගහන්න උදව් කරනවා. මහ බ්‍රිතාන්‍ය ඒ ගැන කතාවක් නැහැ.

පසුගිය දවස්වල ඇෆ්ගනිස්ථානයට බෝම්බ ප්‍රහාර එල්ල වෙනවා. ඒ ගැන කිසිදු කතාවක් නැහැ. ඒ අතර ලංකාවේ 30 අවුරුදු යුද්ධයක් අවසන් කරලා මානුෂිය මෙහෙයුමක් කරපු ලංකාවේ මානව හිමිකම් කඩ වුණා කියලා කියනවා. මෙය වෙනම න්‍යාය පත්‍රයක් මතයි සිදුවෙන්නේ. ලෝකය අද මේක තේරුම් අරගෙන තියනවා. ඒ නිසා රටවල් බහුතරයක් අපිට සහය දීම අපිට ලොකු ශක්තියක්. ඒ රටවල්වලට අපි ගෞරවය ප්‍රණාමය පුද කරනවා.

**2** ලෝක වසංගතයක් වන කොවිඩ් වසංගතයත් සමඟ බොරතෙල් වැඩිවීම පටන් ගන්නවා. ස්කොට්ලන්ත සමුළුවේදී ලෝකයේ රාජ්‍ය නායකයන් එකතු වෙලා මේ පොසිල ඉන්ධන 50%කින් අඩු කළ යුතු fiau එම ඉන්ධන භාවිත කිරීම 2050 වන විට සම්පූර්ණයෙන් ඉවත් කිරීමටත් තීරණය කෙරුණා. ලෝකයේ ඇතැම් රටවල් තෙල් හා ගෑස් කැණීම් පවා ඉවත් වෙලා තියෙනවා.

වෙළඳපොළට තෙල් නිෂ්පාදනයන් අඩුවීමත් එක හේතුවක් වෙලා තියනවා; එසේ ම රුසියානු යුක්රේන යුද්ධය නිසා ලෝකයේ තෙල් ගෑස් උද්පාදනය අඩුවෙලා තියනෙවා.

ලෝකයට තෙල් ගෑස් උත්පාදනයේදී එම රටවල් හතරෙන් එකකට හිමිකම් කියනවා. ඒ නිසා පැහැදිලිව ම ලෝකයේ තෙල් ගෑස් සැපැයීමේ අඩුවක් තියෙනවා. මේ හේතුව නිසා තෙල් ගෑස් මිල වැඩි වෙනවා. ඩොලර් හිඟයකින් සහ ආර්ථිකමය ගැටලුවල ඉන්න අපි වැනි රටවල්වලට විශාල ලෙස බලපානු ලබනවා.

**3** හවුල්කාර පක්ෂ එකොළහක් කිව්වත් එයින් පක්ෂ හතරක් හැර අනෙක් පක්ෂවලට පාර්ලිමේන්තු නියෝජනයක් නැහැ. ඒ අයට මන්ත්‍රී තනතුරු ලැබෙන්නේ පොදුජන පෙරමුණින්. ඒ අයගේ ශක්තිය පිළිබඳව අපි ට තේරුම් ගන්න පුළුවන්.

ඒ වටා වාසුදේව නානායක්කාරගේ පක්ෂය, වමේ පක්ෂ වන සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය එකතුවෙලා තියෙනවා. මේ පක්ෂවලට පාර්ලිමේන්තු නියෝජනත්වයක් නැති වුණාට මේවා පැරණි පක්ෂ. අලුත් පක්ෂ දෙකක් වන ගම්මන්පිලගේ හා වීරවංශගේ පක්ෂ දෙකයි. පොදුජන පෙරමුණෙන් පත් කරපු මන්ත්‍රීවරුන් ඉන්නේ. ඒ අයට එතරම් බලයක් නැහැ.

එතන රටේ දේශපාලන පෙරළියක් කරන්න පුළුවන් දෙයක් වෙන්නේ නැහැ. පැරණි සමසමාජ පක්ෂ සහ කොමියුනිස්ට් පක්ෂය හැරුණු විට අනෙක් පක්ෂ තිබුණේ පොදු ජන පෙරමුණු පක්ෂයේ සෙවණේ. ඒ නිසා එය විශාල දෙයක් නෙවෙයි.

**4** එවැනි ප්‍රශ්න තියනවා. ඉතා කෙටි කාලයකින් ඒ ගැටලු විසඳාගත හැකියි. ඩොලර් සොයන්නත් ක්‍රමවේදයන් සහ තෙල් සංස්ථාවේ, විදුලිබල මණ්ඩලයේ පාඩුව ආවරණය කරන්න පුළුවන් ක්‍රමවේදයන් තියෙනවා. ඒ ක්‍රමවේදයන්වලට අපි යන්න අවශ්‍යයි.

විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් යම් විකල්ප තියෙනවා. තෙල්වලින් වෙන පාඩුව විදුලියෙන් වෙන පාඩුව පරිභෝගිකයන්ගෙන් අය කර ගත යුතුයි. එතකොට ඒ අය යම් අරපිරිමැස්මකින් පාවිච්චි කිරීමටත් හුරුවෙනවා. අදායම අනුව කළමනාකරණය කර ගත යුතුයි.

**5** අර්ථ සාධක අරමුදල්වලට කලින් ඉඳලාම 14% පොලියක් තිබුණා. අර්ථ සාධක අරමුදලට ලැබෙන පොලියට බද්දක් තිබුණා. නමුත් ඒ 14% අගය තිබුණා. 2015 දක්වාම 7%ක් විතරයි අය කළේ. ඒ නිසා 2014 වාර්ෂිකව අය වුණ ප්‍රමාණය මිලියන දොළොස් දහසක් විතර වෙනවා. 2018 වසරේ දි මේ බද්ද 18% දක්වා වැඩියෙන් අය කළා. ඒ නිසා ඊපීඑෆ් එකෙන් විශාල ලෙස බදු අය කළේ යහපාලන ආණ්ඩුව යටතේයි. එකතු කළ අගය මත බද්දක් මේ ආණ්ඩුවෙන් එකතු කළා. එයත් ඉවත් කරලා තියෙනවා. ඒ නිසා මේ යෝජනාව හොඳයි.



## මේ රටේ දැන් තියෙන්නේ රීලෝඩ් ආර්ථිකයක්

සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී
**පාඨලී චම්පික රණවක**

**1** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්බන්ධයෙන් ඇති විශාල ගැටලුව නම් ඔය යෝජනා බහුතර ඡන්දය මත තීරණය නොවීමයි. ඒවා තීරණය වෙන්නේ බලවත් රටවල වුවමනා එපාකම් මතයි. සරල උදාහරණයක් ගත්තොත් රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණයට විරුද්ධව රටවල් 141 ඡන්දය ලබා දුන්නා. අපේ රට ගැන වුණත් කියන්න තියෙන්නේ සියල්ල නියමාකාරයෙන් යුක්ති යුක්ත වෙන්නේ නැහැ කියන එකයි. යුරෝපා රටවල් තීරණයක් ගතහොත් අපිට ජීඑස්පී සහනය නවත්තන්න එමෙන්ම ඇමරිකානු එක්සත් ජනපදය තීරණය කළොත් ජීඑස්පී+ නවත්තන්නට එය ක්‍රියාත්මක කිරීමට පොදු මතය වැදගත් වෙන්නේ නැහැ. ඒ නිසා මෙවැනි දේවල් රාජ්‍ය තාන්ත්‍රික ජයග්‍රහණ කියලා උදම් අනන්න පුළුවන් දේවල් නොවෙයි. ලෝකයේ අපි කැමැති වුණත් අකමැති වුවත් බලවත් රටවල් මත ගොඩනැගෙන යම් රටාවක් තියෙනවා ඒ මතයි සියල්ල තීරණය වෙන්නේ.

**2** ලංකාවේ තෙල් සම්බන්ධ ගැටලුව ගත්විට ලෝක වෙළෙඳපොළේ මිල ඉහළපහළ යන ආකාරයට සාපේක්ෂව නොවෙයි. මේ තෙල් මිල තීරණය වෙන්නේ. ලංකාවේ එක්සයිස් ඩියුටි සහ පැල් යන ආකාරයට බදු යම් ප්‍රමාණයක් අය කරනවා. ඒ නිසයි මේ රටේ මිල ගණන් වැඩි වී තියෙන්නේ. ඕන කෙනකුට ගණන් හදාගන්න පුළුවන් ලෝක වෙළෙඳපොළේ මිල ඉහළ ගියා කියන කාරණාව සලකා බලද්දී ඊට සාපේක්ෂ ව ද මේ රටේ ඉහළ යන්නේ කියලා ඕන කෙනකුට ගනන් හදා ගන්න පුළුවන්. උදාහරණය ලෙස ඩීසල් බැරලයක මිල රුපියල් ඩොලර් සියයක් නම් එය රුපියල් දෙසිය තිහෙන් වැඩි කරලා එකසිය පනස් නවයෙන් බෙදුවාම ඩීසල් ලීටරයක මිල එනවා. ලංකාවේ මිල තීරණය වෙන්නේ ලෝක වෙළෙඳපොළේ ගණන් අනුව නොවෙයි. ලංකාවේ තියෙන්නේ බදු වැඩි කිරීම අනුවයි මිල තීරණය වෙන්නේ. යම් යුක්ති සහගත සූත්‍රයකට අනුව මේවා තීරණය කරන්න අවශ්‍යයි. එසේ නොමැති නම් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ තියන දූෂණ අක්‍රමිකතා අකාර්යක්ෂමතාවන්ගේ වන්දිය රටේ මිනිසුන්ට ගෙවන්න වෙනවා.

**3** ප්‍රශ්න එක් කොනකින් විසඳන්න බැහැ.මුලින් ඩොලර් ප්‍රශ්නය විසඳන්න අවශ්‍යයි. ඉන්පසුව තෙල් ප්‍රශ්නය විසඳුවොත් ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ භාණ්ඩ ප්‍රවාහනය වැනි ප්‍රශ්න විසඳෙනවා. මේක කීයක් හරි කොහෙන් හරි දාගෙන දුවන රීලෝඩ් ආර්ථිකයක්. එකක් ඉවර වුණාම ආයේ රට නවතිනවා. ආයේ කීයක් හරි හොයාගෙන ආයෙත් දුවනවා. රටේ ජනතාගේ ප්‍රශ්න ගැන ආණ්ඩුට අවබෝධයක් නැහැ. ආණ්ඩුව කරන්නේ එක වළක වැටුණාම තව වළක් කපලා කලින් වළ ගොඩ කරලා අලුතින් කපන වළේ ආයේත් වැටෙනවා. මේ රටේ දරුණු ප්‍රශ්නයක් තියෙන්නේ. ණය ආපසු ගෙවීම පිළිබඳ ප්‍රශ්නයට හේතුවත් ඩොලර් හිඟයයි. අපිට වාණිජ වෙළෙඳ ණය ගන්න බැරි තත්ත්වයට සියල්ල වැහිලා ගිහිල්ලා තියෙන්නේ. ඒ සඳහා යම්කිසි ප්‍රතිසංස්කරණයක් රටේ ඇති කළ යුතුයි. ලෝකයට, ආයෝජකයන්ට සහ මූල්‍ය වෙළෙඳපොළට දැනෙන ආකාරයේ වෙනසක් කළ යුතුයි. එසේ ප්‍රතිසංස්කරණයක් ණය ප්‍රතිව්‍යුහගත කිරීමක්, අයවැය කළමනාකරණයක් නොකොට මේ වගේ එක වළකින් බේරෙන්න තව වළක් හාර හාර යෑමෙන් කිසිදු ප්‍රතිඵලයක් නැහැ. තෙල් වළෙන් ගැලවෙන කොට ගෑස් වළේ වැටෙනවා; ගෑස් වළෙන් බේරෙනකොට ගල් අඟුරු වළේ වැටෙනවා. තවත් තාවකාලික වළක් කපලා ගොඩ එන්න බැරි වන තත්ත්වයට අප්‍රියෙල් වනවිට මෙ රටේ ලොකු ආවාටයක ඇතිවෙනවා.

**4** මේ දේවල් තීරණය වෙන්නේ ඒ අයගේ පහළ තියන සංවිධාන මට්ටම මතයි. මහජනයාගේ පැත්තෙන් ඒ අය පසුගිය ජනාධිපතිවරණයේදි මහමැතිවරණයේදී සිට පසුගිය මාසය දක්වා කියපු කරපු දේවල්වල අදවනවිට පරස්පරයන් දක්නට ලැබෙන්නේ. ඒ අය කියපු දේවල්ම ඇති ඒ අය ගැන තේරුම් ගන්න. මහජනයාට නම් විශේෂයෙන් කියන්න අවශ්‍ය නැහැ ඒ අය කරපු කියපු දේවල් සමාන්‍ය ජනතා අමතක වෙන්නේ නැහැ. කෙසේවෙතත් ඒ අයගේම අනුගාමිකයන් පිරිසක් ඉන්නවා නම් ඒ හරහා මේ අයට යම් බලයක් ගොඩනැගෙයි. මේ අය කරන දේවලින් ආණ්ඩුවටයි බලපෑමක් වෙන්නේ. කිසිසේත්ම විපක්ෂයට බලපෑමක් වෙන්නේ නැහැ. ජනතාව ආණ්ඩුව ගැන තිබුණ කලකිරීම තවත් වැඩිවීමයි මෙයින් සිදුවෙන්නේ. ජනතාව මඟ නතර වෙන්නේ නැහැ. මඟ හෙවණැලිවල මිනිස්සු නතර වෙන්නේ නැහැ. මේ වනවිට ආණ්ඩුව පෙරළල දාන්න මිනිසුන් තල්ලු වෙලා යනවා. එක්කෙනෙක්ට ගහලා තව කෙනෙක් බේරලා තව කෙනෙක්ට ගහලා අනෙක් කෙනා බේරගන්න වැඩ ජනතාවට දැන් හුරු නැහැ. මේ ආණ්ඩුව සමඟ දේශපාලනික විරෝධයක් ජනතාව මත ගොඩනැඟිලා තියෙනවා. ඒ නිසා මිනිසුන් පිළිගන්නේ නැහැ. ජනාධිපතිවරණ සමයේ සහ අද සිදුවන දෑ අතර ඉතාම බරපතළ පරස්පරය මිනිසුන්ට තියෙනවා. මිනිසුන් තීරණය කරලා ඉවරයි.

**5** අපිට ප්‍රධාන ප්‍රශ්නය වුණේ අහිංසක මිනිසුන්ගේ ඊපීඑෆ් ඊටීඑෆ්වලට ගහන්න හදපු එකනේ. ඇත්තටම 2019 දෙසැම්බර් 01වැනිදා ගෙනාව ආර්ථික පුනර්ජීවන පැකේජය හරහා මේ ආණ්ඩුව රටේ ආදායම් ටික නැති කරගෙන; ධන කුවේරයන්ට දැවැන්ත බදු සහනයක් දුන්නා. එයින් ආණ්ඩුවේ ආදායම නැතිවුණා විතරක් නොවෙයි; ලෝකයේ රටවල් ශ්‍රේණිගත කරන ඇතැම් සමාගම් අපේ රට පහතට දැම්මා. බදු සංඛ්‍යාතවලින් සී ශ්‍රේණියෙත් පහළට අපිව වැටුණා. මූල්‍ය වෙළෙඳපොළ අපිට වැහුණේ ඒ නිසයි. අඥාන වැඩ කරලා දැන් මොනවා කළත් වැඩක් නැහැ. ඉන් පසුව මිනිසුන්ට බදු ගහලා වැඩක් නැහැ. දැන් මේ ආණ්ඩුව වළේ වැටිලා ඉවරයි. ධනපතියන්ට බදු සහන දීලා ආණ්ඩුවේ ආදායමෙන් සියයට 40% නැති කරගත්තා. යහපාලන කාලයේ අපි හිටියේ බී ශ්‍රේණියේ. ඒනිසා නැවත හරවන්න බැහැ. එකම විසඳුම විධිමත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පැමිණිය යුතුයි. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ස්ථායීකරණයකටත් පැමිණිය යුතුයි. රටේ ප්‍රතිරූපයක් වෙනස් කරමින් පාර්ලිමේන්තුවේ භාරකාර පාලනයක් යටතේ මහ බැංකුවත්, මුදල් අමාත්‍යංශයත්, ලංකා විදුලි බලමණ්ඩලයත්, ජල සම්පාදනයත් වෘත්තීය පිරිසක් අතට බාර කිරීමයි සුදුසු ක්‍රියාමාර්ගය.



## මේ අර්බුදවලට තාවකාලික පැළැස්තර වැඩක් නැහැ

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී
**සුනිල් හඳුන්නෙත්ති**

**1** විශේෂ වෙනස්වීමක් වෙන්නේ නැහැ. හැමදාම මාර්තු මාසය වෙනකොට ඔය ප්‍රශ්නය එනවා. මේ ආණ්ඩුව කරන්නේ නුවරඑළියේ බල්ලෝ ගෙවල් හදනවා වගේ තමයි. ජිනිවා මානව හිමිකම් කොමිසමේ කටයුතුවලට ආණ්ඩුව ලැස්ති වෙන්නේ නුවරඑළියේ බල්ලෝ ගෙවල් හදනවා වගේ තමයි.

ජිනිවා මානව හිමිකම් කතාව කුමක් වුවත් අපේ රට ජාත්‍යන්තර දේශපාලන උගුලේ වැටිලා ඉවරයි.

චීනයටයි, ඉන්දියාවටයි ඕන විදිහටයි මේ රටේ දේශපාලනය තීන්දු වෙන්නේ. යුරෝපා සංගමය මොනවා කිවුවත් මේ ආණ්ඩුවටත් වැඩක් නැහැ. ජාත්‍යන්තර දේශපාලන බලපෑම් මේ අයට වැඩක් නැහැ. ආණ්ඩුව පොල්කට්ටෙන් ලංකාව වහන්න බලාගෙන ඉන්නේ.

**2** බරපතළම තත්ත්වය ඇතිවෙන්නේ බොර තෙල් මිල ඉහළ යද්දි අපි රුපියල පාවෙන්න හැරියා. එතකොට ගහෙන් වැටුණ මිනිහට ගොනා ඇන්නා වගේ වැඩක් අපිට වුණේ. නිදහස් කරන්න ඕන වෙලාවට නොවෙයි නිදහස් කළේ. මේවනවිට රුපියල පාවෙන්න හැරියාම ඩොලරයට ගෙවන්න තියෙන රුපියල් ප්‍රමාණය වැඩි වෙනවා.

බොරතෙල් මිල ලෝක වෙළෙඳ පොළේ වැඩිවන විට ලංකාවේ තෙල් මිලට මොකද වෙන්නේ. තෙල් මේ රටට ගෙනාවත් විකුණන්න බැරි තත්ත්වයට පත්වෙනවා.ලෝක වෙළෙඳපොළේ තෙල් ඉහළ යෑම රුසියාවේ යුදමය තත්ත්වය වගේම මෙරටේ ආර්ථිකයට බලපාන ප්‍රශ්නක්. ඊටත් වඩා පහත තත්ත්වයකට කොහොමත් අපි විදෙස් විනියමය අර්බුදයක හිටියා. ආණ්ඩුව මුලින්ම කළු කඩයක් විවෘත කළා; ඒක පෝෂණය කළා.

ඉන්පසුව ආණ්ඩුවේ කට්ටියගේ සල්ලි නිදහස් කරගන්න අවකාශය හදාදීමට අවශ්‍ය නිසා ඒවෙලාවේ රුපියල නිදහස් නොකර හිටියා. අවශ්‍ය නැති වෙලාවේ රුපියල විවෘත කරලා තියෙනවා.

**3** මැක්කන්ට බල්ලෙක් නැතුව ඉන්න බැරි නිසා මැක්කො පොකුරක් එකතු වෙලා බල්ලෙක් හොයනවා. අපි බලාගෙන එන්නේ මේ මැක්කො පොකුර ගන්න බල්ලා කවුද කියලා. අපේ රටේ දේශපාලන ඉතිහාසයේ මේ දේ වුණා. තොන්ඩමන්ලා, අෂ්රෝෆ්ලා මේ වගේ දේවල් කළා. ඒ සඳහා ජාතිවාදය පෝෂණය කළා.

ජාතිවාදයයි, ආගමයි කොමිසුයි මේ සියල්ල මත මේ දේවල් රඳා පවතිනවා. මේ අද වෙන්වෙලා ඉන්න අය 20 වැනි සංශෝධනයටත් අත ඉස්සුවා. රටේ ජනමතයක් තියෙනකොට විරෝධය පාලා අවසානයේ ඡන්දය දුන්නා. බලය තියෙන පැත්තටනේ මේ වගේ වැරදි දේවල් ඉවත් කරන්න බලය තියෙන්නේ. එදා විපක්ෂයෙන් තියෙන විරෝධය සමනය කරලා ඒකට නීත්‍යනුකූලභාවය අරන් දුන්නේ ඒ අය මතමයි.

මේ සියලු දෙනා දේශපාලනයෙන් අතුගාලා දාන්න ඕන පිරිසක්. ඒඅය හැමදාම දේශපාලන වාසි ගන්නයි ක්‍රියා කළේ. දේශපාලන වශයෙන් ආණ්ඩුව පිරිහෙන විට මේ අය දැන්ම පැන ගන්නවා.

**4** වැල යන පැත්තට මැස්ස ගහනවා වගේ; ආණ්ඩුව එන එන අර්බුදයන්ට එන එන වෙලාවට මුහුණ දෙනවා. ජනතාවට එයින් සිදුවන අහිතකර ප්‍රතිඵල අපි දන්නවා. එක එක වෙලාවට එක එක පෝලිමේ ජනතාවට ඉන්න වෙලා. ස්ථිරසාර විසඳුමක් නොවෙයි.

ආණ්ඩුවට වගකීමක් සහ සැලසුමක් තිබිය යුතු යි. රටේ ආහාර අවශ්‍යතාවට විසඳුම් නැහැ. දෙකෝටි විසි පන්ලක්ෂයකට කන්න දෙන්නයි මේ බැරිවයි දඟලන්නේ. එළවළු ටික, හාල් ටික, ආහාර ටික බෙදාගන්න බැරි ප්‍රශ්නයක් නම් මේ තියෙන්නේ කොයිතරම් ඛේදවාචකයක්ද? මොකටද ආණ්ඩුවක්. සැරින් සැරේ උත්තර හොයලා වැඩක් නැහැ. දැන් තියන අර්බුදයට තාවකාලික පැළැස්තර නැහැ . ඒ නිසා දේශපාලනික වශයෙන් උත්තර සොයන්න අවශ්‍යයි. ආර්ථික අර්බුදය වුණාට පිළිතුර දේශපාලනික විය යුතුයි.

ආර්ථික අර්බුදය ගැන උත්තර සොයන්න ජනතාව සමඟ ඇත්ත කතා කළ යුතුයි. අර්බුදයක් තියන බව ජනතාවට කියන්න අවශ්‍යයි. හෙට තෙල් එනවා කියලා බොරු කිව්වාම ජනතාව දවස් පහක් විතර පෝලිමේ ඉන්නවා. මේ තෙල් අර්බුදය සියලු පැතිවලට විසිරෙනවා. භාණ්ඩ ප්‍රවාහනයට බලපානවා. ගොවියාගේ එළවළු ටික ප්‍රවාහනයටත් බලපානවා. මේ දේවල්වලට රජයේ කිසිදු විසඳුමක් නැහැ. ආහාර බෙදාහරින්න කිසිදු පියවරක් නැහැ. තෙල් ගැටලුවලට සැලසුමක් නැහැ.

විදුලිජනන සැලසුමක් තියෙන්න අවශ්‍යයි. රටට තෙල් කොතරම් අවශ්‍යද කියලා තෙල් ඇමැති ප්‍රවාහන ඇමැති දැනගෙන ඉන්න ඕන. එයට අවශ්‍ය මුදල් ප්‍රමාණය මුදල් ඇමැති දැනගෙන ඉන්න ඕන. ප්‍රතිපත්ති සැලසුම් කතා කරන්නයි රටේ කැබිනට් මණ්ඩලය රැස්වෙන්න අවශ්‍ය වෙන්නේ. බලය රැක ගන්න විදිහ ගැන කතා කරන්න නොවෙයි. අදටවත් මේ කිසිදු අර්බුදයකට සැලසුමක් ආණ්ඩුවට නැහැ.

**5** මේ ආණ්ඩුව ගැසට් ගහනවා, රිවස් කරනවා. ආව දවසේ ඉඳලා කරන්නේ ඕකනේ. ගැසට් කීයක් දැන් ආණ්ඩුව ඉවත් කරගත්තද. ආණ්ඩුවේ නීති නිලධාරීන් දන්නේ නැද්ද මේ වගේ ගැසට් ගැහුවාම මේවා ජනතාවගේ අභියෝගයට ලක්වෙනවා කියලා.

මිනිස්සු අවධානයක් නැතුව හිටියා නම් කරගෙන යනවා. මේ ගැසට් ගහන්නේම ආණ්ඩුවේ අර්බුදය විසඳගන්න තාවකාලික විසඳුම් සොයන්නයි. රටේ නීතියක් තියෙනවා. එක එක්කෙනාගේ තියරිවලින් රටේ ප්‍රශ්න විසඳන්න බැහැ.

# ජොනී - හර්ෂ සතර කන් මන්ත්‍රණයක

**දේශපාලන ක්ෂේත්‍රය තව දුරටත් පසුගිය සතියේ උණුසුම් වූයේ විවිධ මාතෘකා සමඟිනි. ඩොලර් අර්බුදයට සහ කොවිඩ් සමඟ පැන නැඟුනු අනෙකුත් කාරණාවලට ආණ්ඩු පක්ෂය පිළියම් සොයමින් පිළියම් යොදද්දී විරුද්ධ පක්ෂ දිගින් දිගට ම චෝදනා කළේ එම පිළියම් සාර්ථක නොවන බවයි. පසුගිය සතියේ පාර්ලිමේන්තුව රැස්වීම නිසා දේශපාලන ක්ෂේත්‍රයේ බොහෝ උණුසුම් කතා බස් ද සිදු කෙරිණ.**

## විමල් හා ගම්මන්පිල ගැන බැසිල් කීවේ මොනවාද?

අමාත්‍ය බැසිල් රාජපක්ෂ සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන් අතර හමුවක් පසුගිය දා පැවැත්වුණි. බැසිල් රාජපක්ෂ, ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ ගාමිණී ලොකුගේ යන මන්ත්‍රීවරුන් ඇතුළු පිරිසක් මෙම හමුවට සහභාගී වූහ.

එහිදී මුලින්ම සාකච්ඡාව ආරම්භ කළේ ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මන්ත්‍රීවරයාය. "සර්ව මුණගැහෙන්න අපි වෙලාවක් ඉල්ලලා තිබ්බේ. ඒකට හේතුව තමයි සර්, මන්ත්‍රීවරුන් මේ දවස්වල මුහුණ දීලා තියෙන මේ විවිධ පීඩාකාරී තත්ත්වයන්, විවිධ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට." යනුවෙන් ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් පැවසීය.

ඒ අනුව බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා සාකච්ඡාව ආරම්භ කළේය. ඔහුගේ කතාවට මූලික ප්‍රධාන අංග දෙකක් අන්තර්ගත විය. විමල් සහ ගම්මන්පිල අමාත්‍යවරුන් දෙදෙනා ඉවත් කිරීම යන කාරණය සහ රටේ ආර්ථික තත්වය සම්බන්ධයෙන් වන කාරණා අන්තර්ගත විය. එහිදී විමල් සහ ගම්මන්පිල අමාත්‍යවරුන් පහුගිය සතියේ මාතෘකාව වුණ නිසා බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා ඒ ගැන මුලින්ම සාකච්ඡා කරන්න පටන් ගත්තේය. "විමල්, ගම්මන්පිල ඔය අමාත්‍ය ධූරවලින් ඉවත් කරන්න නෙමෙයි හිටියේ. හැබැයි ඔවුන්ගේ සාමූහිකත්වය තිබ්බේ නැහැ. කණ්ඩායමක් වුණාම කණ්ඩායම් හැඟීමෙන් වැඩ කරන්න ඕන. ඔවුන්ගේ ඒක තිබුණේ නැහැ. ඒ නිසා තමයි ඔවුන්ව ඉවත් කරන්න සිද්ධ වුණේ." යනුවෙන් බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා පැවසීය.

## ආර්ථික අභියෝගය ජය ගන්නා හැටි

ඉන්පසුව රටේ ආර්ථිකය ගැන සාකච්ඡා විය. "විදේශ ශ්‍රමිකයින්ගේ ප්‍රේශන පහුගිය අවුරුදු 2 ක තුළ නොලැබීම හේතුවෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 14 ක් විතර අහිමි වුණා. මේ නිසා ඇතිවුණ රික්තකය පුරෝගන්න නම් ලේසි වෙන්නේ නැහැ. ඉතාමත්ම අමාරුයි. හැබැයි මේ වර්තමාන තත්ත්වය කළමනාකරණය කරගෙන කොහොමහරි ඉදිරියට යන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. විදුලි අර්බුදයත් ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා. අපි බලන්න ඕනේ කොහොමහරි විදුලිය ඉතිරි කරගන්න. අපිට පුළුවන් නම් එක ලයිට් එකකින් අපේ ගෙදර කටයුතු කර ගන්න. අන්න ඒක වටිනවා. ඒ වගේම තමයි වීදී ලාම්පුත් නිවන්න ඕනේ. මේ වගේ තීරණ ගත්තොත් අපිට පුළුවන් ලොකු මෙගා වොට් ප්‍රමාණයක් ඉතිරි කරගන්න." යනුවෙන් බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා දිගින් දිගට ම මේ කරුණු දැක්වීම විනාඩි 45 ක් පමණ සිදු කෙරිණ.

## පාර්ලිමේන්තුවේ සතර කන් මන්ත්‍රණය

මේ අතර 10 වැනි බ්‍රහස්පතින්දා උදෑසන පාර්ලිමේන්තුව රැස්වීමට පෙර පාර්ලිමේන්තු සංකීර්ණයට මහජන නියෝජිතවරුන් ඇතුළුවන ප්‍රධාන දොරටුව ආසන්නයේ සතර කන් මන්ත්‍රණයක් සිදුවිය. මෙම සතර කන් මන්ත්‍රණය ආණ්ඩු පක්ෂයේ ප්‍රබලයෙකු හා විරුද්ධ පක්ෂයේ ප්‍රබලයෙකු අතර ඇතිවීම මේ ස්ථානයෙන් ගිය බොහෝ දෙනෙකුගේ අවධානයට ලක්විය. මෙම සතර කන් මන්ත්‍රණය සිදුවූයේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ සමගි ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා අතරය. පාර්ලිමේන්තු සංකීර්ණයට ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇතුළු වන විට ඒ සමඟ හර්ෂ ද සිල්වා ඇතුළු විය.

"ඉතින් කොහොම ද හර්ෂ" ජොනී කතාව ආරම්භ කළ අතර "ජොනී හම්බ වුණ එක හොඳයි. මං කතා කරන්න හිටියේ." යනුවෙන් හර්ෂ කතාව පටන් ගත්තේය.

මාතෘකාව බවට පත්වූයේ රටේ පවතින තෙල්, විදුලි සහ ගෑස් අර්බුද පිළිබඳවය. කතාව පටන් ගත් හර්ෂ එම අර්බුද ගැන දීර්ඝ වශයෙන් අදහස් දැක්වීය.

කොවිඩ් ලෝක වසංගතය සමඟ ලෝකයේ ඇති වී ඇති ආර්ථික අවපාතයට රටක් විදිහට මුහුණ දී ඇති ආකාරය සහ එම ගැටලුවලට කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ආණ්ඩුව ගෙන ඇති පියවර සම්බන්ධයෙන් කරුණු දැක්වීමට ජොනී පියවර ගත්තේය.

"මචං ජොනියා මට මාර වැඩක් වුණේ." හර්ෂ තම අත්දැකීමක් විස්තර කළේය."

"මොකක්ද, මොකක්ද?" මහත් උනන්දුවෙන් විමසුවේ ජොනීය.

"මචං පැය ගාණක් පෝලිමේ ඉඳලා ඉඳලා මගේ වාහනයට තෙල් ගහගන්න මම ෂෙඩ් එකට ගියා. තෙල් පොම්පය ළඟට යනකොටම මචං තෙල් ඉවර වෙලානේ. මට මාර පරිප්පුවක් තමයි කන්න වුණේ." යනුවෙන් මඳක් සිනහවෙමින් හර්ෂ තම අත්දැකීම විස්තර කළේය.

"මේ අර්බුදය ගැන අපි හොඳට ම දන්නවා. අර්බුදය විසඳන්න පුළුවන් හැම ක්‍රියාමාර්ගයක්ම ආණ්ඩුව ඉතාමත්ම ඉක්මනින් සිදුකරනවා. අපේ විතරක් නෙමෙයි ලෝකයේම මේ තත්ත්වය මෙහෙමයි. කොහොමහරි ඉතාම ඉක්මනින් මේ තෙල්, විදුලි සහ ගෑස් අර්බුදවලට විසඳුම් ඉතාම ඉක්මනින් ලබා දෙනවා." යනුවෙන් ජොන්ස්ටන් ප්‍රනාන්දු ප්‍රකාශ කළේය.

විනාඩි 10 ක් පමණ මෙම සතරකන් මන්ත්‍රණය සිදුවිය.



මෙම සතර කන්මන්ත්‍රණය දෙස ඕනෑකමින් බලමින් පොහොට්ටුවේ මන්ත්‍රීවරු පිරිසක් ඒ අසලින් යන්නට වූහ.

"ආ ඇමතිතුමා හර්ෂ මන්ත්‍රීතුමා සමඟ බර කතාවක් වගේ." කියමින් පැවසුවේය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාලයි.

"ආ මේ මුදල් රාජ්‍ය ඇමතිකම දෙන්න කතාකළේ." යනුවෙන් ජොන්ස්ටන් ප්‍රනාන්දු පැවසූ කතාවට සියල්ලෝම මහ හඬින් සිනහසුනහ.

## සිමෙන්ති කම්හලේ වැඩ ආරම්භ කිරීමට පෙර ජනපති කළ දේ

අපේ රටේ ප්‍රමුඛ ව්‍යාපාරිකයෙකු වූ නන්දන ජයදේව ලොකුවිතාන විසින් ආරම්භ කරන ලද දකුණු ආසියාවේ විශාලතම සිමෙන්ති නිෂ්පාදනාගාරය ලෙසින් විරුදාවලි ලැබූ "ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන්" (private limited) ආයතනය එදින උදෑසන ජනාධිපතිවරයාගේ හා අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත විය.

මෙම නිෂ්පාදනාගාරය විවෘත කිරීමේ උත්සවයට ජනාධිපතිතුමා පැමිණියේ අග්‍රාමාත්‍යවරයා පැමිණ ටික වෙලාවකට පසුවය. ඒ වන විට චමල් රාජපක්ෂ, පවිත්‍රා වන්නිආරච්චි, බන්දුල ගුණවර්ධන, ඩී.වී. චානක, අජිත් රාජපක්ෂ, තිස්ස කුට්ටිආරච්චි සමඟ ප්‍රාදේශීය දේශපාලනඥයෝ ද පැමිණ සිටියහ.

ජනාධිපතිවරයා පැමිණි පසුව මේ පිරිස මුලින්ම ගියේ ඊට යාබද ඉඩමේ වූ "යෝජිත වානේ කම්හල" සඳහා මුල්ගල් තැබීමේ අවස්ථාවටය.

"මේක ඇමරිකානු ඩොලර් මිලියන 400 ක ආයෝජනයක්. අපට 2024 වෙනකොට මෙහි වැඩ ඉවර කරන්න පුළුවන් වේවි." නන්දන ජයදේව ලොකුවිතාන කීවේ ය.

"අපි දැනට පිටරටින් වානේ ගෙන්වන්න විශාල මුදලක් වියදම් කරනවා. පුළුවන් ඉක්මනට ඒ මුදල රටට ඉතුරු කරල දෙන ව්‍යාපෘතියක් තමයි මේ වෙලාවේ අපිට ඕන." ජනාධිපති කීවේය.

## අගමැති සිමෙන්ති කම්හල පුරා ඇවිදියි

එම සරල කතාබහත් සමගම මුල්ගල තැබීමේ වැඩකටයුතු අවසන් විය. ඉන්පසුව සියල්ලෝම පැමිණියේ සිමෙන්ති කම්හලේ වැඩ කටයුතු දැකබලා ගැනීම සඳහාය. එහිදී අග්‍රාමාත්‍යවරයාට සිමෙන්ති නිෂ්පාදනාගාරය පුරා ඇවිදිමින් එහි ඉදිකිරීම් කටයුතු සිදු කරන ආකාරය නිරීක්ෂණය කරන්නට අවශ්‍ය විය. ජනාධිපතිවරයා උඩු මහලේ පිහිටි මෙහෙයුම් කාමරය වෙත ගියේ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ආකාරය ගැන අවබෝධයක් ඇති කරගැනීමට ය. එහි සිටි ඉන්දියානු හා ශ්‍රී ලාංකික ඉංජිනේරුවරු නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ හොඳ පැහැදිලි කිරීමක් කළහ.

අවශ්‍ය අමුද්‍රව්‍ය වරායේ සිටම යාන්ත්‍රික උපකරණ භාවිතයෙන් නිෂ්පාදනාගාරය වෙත ගැනීම සඳහා තාක්ෂණය භාවිතා කර ඇති ආකාරය ජනාධිපතිවරයාගේ පැසසුමට ලක් විය.

"මිනිස් ශ්‍රමය අවමයි. යන්ත්‍ර සූත්‍ර තමයි ඔක්කොම කරන්නේ. අපි තාක්ෂණය මෙහි දී උපරිමයෙන් භාවිතයට ගත්තා. පරිසරිය දූෂණය අවම වීම ගැන තමයි මේ වගේ කර්මාන්තවල දී අපි වැඩිපුර අවධානය යොමු කරන්න ඕන." ජනාධිපතිවරයා කීවේය.

"ආවරණය කරපු බෙල්ට් එකක තමයි වරායෙ ඉඳලා අමුද්‍රව්‍ය ගේන්නේ. දූවිලි පොදක්වත් පරිසරයට එකතු වෙන්නේ නෑ." ඉංජිනේරුවරු සහතික වූහ. නිරීක්ෂණ චාරිකාව නිමවා අගමැතිවරයා ද ඉහළ මාලයට පැමිණි පසු වැඩ ආරම්භ කිරීමේ බොත්තම එබීමේ කටයුත්ත ජනාධිපතිවරයා වෙත පැවරිණි.

රුවන් පතිරණ කියයි... edmediaunit@gmail.com

ජනාධිපතිවරයා බොත්තම එබීමට ඇඟිල්ල දිගු කරමින් නැවත හැරී මෙසේ ඇසුවේය. "ඔය යන්ත්‍ර සූත්‍ර ඇතුළේ එහෙම කවුරුවත් ඉන්නවද දන්නෑ. හොඳටම විශ්වාසයි නේද කවුරුවත් නෑ කියලා?"

"සේවකයෝ අවශ්‍ය නැහැ සර් ඒ තැන්වලට. ඔක්කොම ස්වයංක්‍රියව යන්ත්‍රානුසාරයෙන් සිදුවෙනවා." ඉංජිනේරුවරු එම සහතිකය දුන් පසු ජනාධිපතිවරයා බොත්තම ඔබා නිෂ්පාදන කටයුතු ආරම්භ කළේ සියලු දෙනාගේම අත්පොළසන් නාදය මධ්‍යයේය.

මුලින්ම නන්දන ජයදේව ලොකු ලොකුවිතාන පිළිගැනීමේ කතාව කරමින් ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් මේ රටේ සෞඛ්‍ය අංශවලටත් ප්‍රමුඛ ස්තුතිය පළ කළේ 2020 දී වැඩ ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කොවිඩ් ව්‍යසනය තදින් තිබුණ යුගයේ දී පවා අතරමග නතර කිරීමකින් තොරව පවත්වාගෙන යන්නට අවසර දීම සම්බන්ධවයි.

## දිනේෂ්ට දයාසිරිගෙන් ආරාධනාවක්

ආණ්ඩුවේ හවුල්කාර අනෙකුත් පක්ෂවලට ජනාධිපතිවරයා හමුවී සාකච්ඡා කිරීමට අවස්ථාවක් පසුගිය කාලයේ ලැබුණේ නැතැයි කියා චෝදනාවක් ද විය. පසුගිය දිනවල මේ පිළිබඳ සමාජයෙන් නොයෙකුත් කතා ඇති වුවත් ජනාධිපතිවරයා එය පිළිගත්තේ නැත. මන්ද ආණ්ඩු පක්ෂයේ වැඩ කටයුතුවලදීත් රටේ තීන්දු තීරණ ගන්නා කැබිනට් මණ්ඩලය වැනි තැන්වලදීත් එම පක්ෂ නියෝජිතයන්ට කතා කරන්නට හා යෝජනා ඉදිරිපත් කරන්නට සමාන අවස්ථා ලැබී තිබූ නිසාය.

"කැබිනට් එකේදී කතා කරන්න ඕන දේවල් කතා නොකර සද්ද නැතුව ඉන්නවා. ඊට පස්සේ එළියට ගිහිල්ලා මයික් හා කැමරා ඉස්සරහ වීරයෝ වගේ කෑගහනවා. ඕකද කරන්න ඕන." යන මතය ද ප්‍රබලව මතුවිය.

කෙසේ වෙතත් ආණ්ඩු පක්ෂයේ අනෙකුත් ප්‍රධාන පක්ෂවලට කතා කරන්නට වෙනමම අවස්ථාවක් ලබා දෙන්නට ජනාධිපතිවරයා පසුව කල්පනා කළේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජනාධිපති සමඟ සාකච්ඡා කරන්නට වෙනම අවස්ථාවක් උදා වූයේ ඒ අයුරිනි.

පසුගිය 08 වෙනිදා හවස ජනාධිපති කාර්යාලයේදී එම හමුවීම සිදුවිය.

එදා හවස නියමිත වේලාවටත් කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු ජනාධිපති කාර්යාලයේ උඩුමහලේ අමුත්තන්ගේ කාමරයට පැමිණ සිටියහ. රංජිත් සියඹලාපිටිය, මහින්ද අමරවීර, දයාසිරි ජයසේකර, නිමල් සිරිපාල ද සිල්වා, ෂාන් විජයලාල්, ලසන්ත අලගියවන්න ඇතුළු 13 දෙනෙක් මේ සඳහා පැමිණ සිටියහ. තේ පානය කර විවේකීව සිට ටික වේලාවකට පසුව සාකච්ඡාවට පැමිණ ඔවුන් ජනාධිපති අසුනට වම් පසින් වාඩි වූයේ පළමු ආසනය හිටපු ජනාධිපති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක මෛත්‍රීපාල සිරිසේන වෙත ඉතුරු කරමිනි.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන පැමිණියේ රැස්වීම ආරම්භ වෙන්නට ඔන්න මෙන්න තිබියදීය. ඊට පෙර අගමැති මහින්ද රාජපක්ෂ, මුදල් ඇමති බැසිල් රාජපක්ෂ පැමිණ සිටියහ. දිනේෂ් ආවේ මඳක් ප්‍රමාද වීය. ඔහු පැමිණ වාඩිවෙන්නට ගියේ වම් පස ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වෙන් කර තිබූ අසුන්වලය. ඉන් පසුව ආණ්ඩු පක්ෂයේ අය දකුණු පැත්තෙන් වාඩි වී සිටිනවා දුටු ඔහු ආයෙත් ඒ පැත්තට යන්නට සූදානම් වනවිට දයාසිරි කතා කළේය.

"එන්න එන්න මේ පැත්තට. ඔබතුමාත් ඉන්න ඕන අපිත් එක්ක තමයි. ඔබතුමා එන්න මේ පැත්තෙන් ඉඳගන්න." අමරවීරත් කීවේය.

"නෑ. නෑ. මේ පැත්තෙ ඉඳගන්න එක කොයිකටත් ආරක්ෂාවට හොඳයි." කියමින් දිනේෂ් අනිත් පැත්තෙන් වාඩි වූයේය.

මෛත්‍රීපාල සිරිසේන මහතා පැමිණි පසුව ටික වෙලාවක් සුහද කතාබහක් පැවති අතර ජනාධිපතිවරයා නිසි වෙලාවට පැමිණ සාකච්ඡාව පටන් ගත්තේය.

දෙපාර්ශ්වය අතර තිබූ බොහෝ අනවබෝධයන් හා අවිශ්වාසයන් ගැන මෙහිදී කරුණු කාරණා දීර්ඝ ලෙස සාකච්ඡාවට ලක්විය.

## රනිල්ට සිදු වූ අකරතැබ්බය

එක්සත් ජාතික පක්ෂ නායක හිටපු අග්‍රාමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මේ සතියේ වැඩි අවධානයක් යොමු කළේ පක්ෂය සංවිධානය කරන සාමාජික ප්‍රවර්ධන වැඩසටහන ගැන හා 25 දා පවත්වන සත්‍යග්‍රහයේ කටයුතු ගැන සොයා බැලීම වෙනුවෙනි. මෙම සතියේ සඳුදා සවස ද නායක රනිල් පක්ෂ ක්‍රියාකාරීන් අමතා මේ ගැන විමසූ අතර කාන්තා දිනයේ ලක්වනිතා සංවිධානයේ උද්ඝෝෂණය ගැන ද සොයා බලමින් අවශ්‍ය උපදෙස් දුන්නේය.

අඟහරුවාදා පාර්ලිමේන්තුවට ගිය රනිල්ට අපූරු අකරතැබ්බයකට මුහුණ පෑමට සිදුවිය. එනම් දකින දකින මන්ත්‍රීවරයා විසින් ජාතික ආණ්ඩුවක් සාදන බවට පළවන වාර්තා ගැන විමසන්නට වීම නිසාය. බැරිම තැන එ.ජා.ප. නායකයා අහන අහන මන්ත්‍රීවරයාට සිනාසෙමින් කීවේ ඔහුවත් ඇමති මණ්ඩලයට ගන්නවා යනුවෙනි.

"ඇත්තටම නායකතුමා මෙහෙම කතාවක් ඇති වෙන්න හේතුව මොකක්ද?" ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙක් විමසා සිටියේය.

"දන්නේ නෑ. ඔයාලා තමයි කියන්න ඕනේ." නායකයා ද පිළිතුරු දුන්නේය.

"කොහොමවුණත් ඔබතුමා හොඳ ආර්ථික දැක්මක් තියෙන අගමැතිධූරය දැරූ සෑම අවස්ථාවකදීම හොඳ ආර්ථික කළමනාකරණයක් පවත්වාගෙන ගිය කෙනෙක් කියන කාරණය රටම පිළිගන්නවා. ඒකත් මේ කතාව මෙහෙම පැතිරෙන්න හේතුවක් වෙන්න ඇති." තවත් පසුපෙළ මන්ත්‍රීවරයෙක් කීවේය.

"ජාතික ආණ්ඩුවක් හදනවට වඩා අවුරුදු 15 ක් 20 ක් යන ස්ථිර ජාතික ප්‍රතිපත්තියක් හදන්නයි පාර්ලිමේන්තුවේ 225 ම එකතු වෙන්න ඕනේ." නායකයා කී විට සියලු දෙනා හිස සලා එය අනුමත කළහ.

අඟහරුවාදා සවස රනිල් සිරිකොතට පැමිණ පක්ෂ ක්‍රියාකාරීන් කැඳවා 12 දා 13 දා පැවැත්වෙන සාමාජික ප්‍රවර්ධන වැඩසටහන ගැන විමසා සිටියේය. නියෝජ්‍ය නායක රුවන්, උපනායක අකිල, මහලේකම් රංගේ හා ජාතික සංවිධායක සාගල කැඳවා කොළඹ දිස්ත්‍රික්කයෙන් ආරම්භ වන සාමාජික ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කරනා ආකාරය ගැන උපදෙස් ලබා දුන්නේය. ඔවුන්ට කොටස් බෙදා දෙමින් එම වැඩසටහන් ආරම්භ කළ යුතු ආකාරය ද පැහැදිලි කර දුන්නේය.

## පාඩම් ඉගෙනගත් හැටි වජිර කියයි

"ඇත්තටම දැන් ජාතික ආණ්ඩුවක් ගැන කතා කරලා වැඩක් නෑ. එදා ජාතික ආණ්ඩු කරන්න ගිහිල්ලා අපි හොඳ පාඩමක් ඉගෙන ගත්තානේ. ආණ්ඩුව කරපු හොඳ ටික ඔක්කොම එයාලා අරගෙන වැරදි ටික ඔක්කොම එක්සත් ජාතික පක්ෂයට දැම්මා." සභාපති වජිර කීදේ සැවොම අනුමත කළේ එක හඬිනි.

"අනිත් එක ජාතික ආණ්ඩු හදලා අගමැතිකම් ගන්න වැඩක් නෑ. මොකද නායකතුමා දැන් අවස්ථා 5 ක් අගමැති වුණානේ. දැන් ඉතිරිවෙලා තියෙන්නේ නායකතුමා ජනාධිපති පුටුවේ වාඩි කරන එක විතරයි. ආයේ අගමැතිකම් වැඩක් නෑ. ආයේ ගන්නවා නම් නායකතුමාට ගන්න තියෙන්නේ ජනාධිපතිකම විතරයි." රුවන් කීවේ සැවොම හිස සලද්දීය.

"ආර්ථික අර්බුදය මතුවෙන කොට නායකතුමාගේ අගය රටටම දැනෙන්න ගන්නවා. ඒ නිසා තමයි මෙහෙම කතාවක් ගියේ. නායකතුමා අගමැතිකම් කරද්දී මිනිස්සු කාලා ඇඳලා හිටියා කියලා ඔවුන්ගේ හෘද සාක්ෂිය දන්නවා. අපේ එක මන්ත්‍රී ධූරයට තිබෙන අගය දැන් පැහැදිලියි." රංගේ ද කතාවට එකතු වූවේය.

ඉන් අනතුරුව "රට ගොඩනැඟීමේ ශක්තිමත් රාමුවකට සියලු දෙනා එකතු කිරීමේ සත්‍යග්‍රහය" ගැන උප නායක අකිල පිරිසට කරුණු පැහැදිලි කළේය. "දැක්ම" ලෙස මෙම සත්‍යග්‍රහය නම් කර ඇති බව ද ඔහු කියා සිටියේය. සැවොම සුදු ඇඳගෙන පැමිණිය යුතු බවට පණිවුඩයක් යවා ඇතැයි අකිල සඳහන් කරද්දී නායකයා කීවේ කොළඹ දිස්ත්‍රික්කයෙන් පමණක් ජනතාව මෙයට සහභාගී කරගන්නා ලෙසටය.

## ඩොලරය නිදහස් කිරීමට එ.ජා.ප. යේ මනාපය

"ඩොලරයේ අගය නිදහස් කරන්න දැන්වත් තීරණය කළ එක හොඳයි. නැතිනම් මහබැංකුවේ ඩොලර් සංචිත බිංදුවටම වැටෙනකම් මේ අය ඉන්නවා." සාගල රත්නායක කීවේ කනගාටුවෙනි.

"මහබැංකුව ඩොලරය නිදහස් කිරීමත් සමඟ වාණිජ බැංකු ඩොලරයේ අගය 260 ට ගෙනිච්චා. එය ඉතා හොඳ තීරණයක්. දැන් විදෙස් ශ්‍රමිකයන් වාණිජ බැංකු හරහා රටට ඩොලර් එවාවි." රුවන් ද කතාවට එකතුවිය.

## රනිල්, මෛත්‍රී සමඟ සිනමා ශාලාවක

"හැම තැනම දැන් ඉන්ධන පෝලිම්, ගෑස් පෝලිම්. ඉස්සරහට එන්න හදන්නේ ඖෂධ පෝලිම්. දැන් ඖෂධ හිඟයකුත් ඇති වෙන්න යන්නේ." සාගල පෙන්වා දුන්නේය.

"ඩොලර් ප්‍රශ්නයට විසඳුමක් සොයා ගන්නේ නැතුව කිසිදු ප්‍රශ්නයක් විසඳන්න බෑ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්නේ නැතුව වෙනත් විසඳුමක් ඇතැයි අපට නම් පේන්නේ නෑ. ආණ්ඩුවට තිබෙන විසඳුම ගැන කියන්නෙත් නෑ. අන්තිමට අමාරුවේ වැටෙන්නේ අහිංසක ජනතාව." රනිල් සඳහන් කෙළේය.

බදාදා සවස නායකයා "වන් ගෝල්ෆේස්" වෙත ගියේ සිනමා පඨයක් නැරඹීමට ලද ආරාධනාවකට අනුවය. බිරිඳ මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහත් තවත් මිතුරන් කිහිපදෙනෙකුත් සමඟ වන් ගෝල්ෆේස් ගිය නායකයා "ඩෙත් ඔෆ් ද නයිට්" චිත්‍රපටය නැරඹුවේය. චිත්‍රපටය නරඹා පිටතට පැමිණි නායකයා එහි සිටි ජනතාව සමඟ කතා බස් කිරීමට ද අමතක නොකළේය.

## පළාත් පාලන ඡන්දය ගැන ස.ජ.බ. තීරණය

සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම විපක්ෂ නායක සහ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාසගේ ප්‍රධානත්වයෙන් පසුගිය සතියේ දී රැස්වූයේ පාර්ලිමේන්තුවේදීය.

පාර්ලිමේන්තුවේ සතියේ වැඩ කටයුතු ගැන අවධානය යොමු කළ මන්ත්‍රී කණ්ඩායම රටේ පවතින දේශපාලන තත්වය ගැන ද අවධානය යොමු කළේය.

"පළාත් පාලන මැතිවරණයට මේ සංශෝධන ගේන්න හදන්නේ පොහොට්ටුවට මැතිවරණ දිනන්න බැරි බව දන්නා නිසයි. තමන්ට ඡන්ද දිනන්න අවශ්‍ය වෙන විදියට මැතිවරණ ක්‍රමයක් සංශෝධනය කරන එක තරම් තවත් කැත වැඩක් නෑ." ගයන්ත කරුණාතිලක මන්ත්‍රීවරයා කීවේය.

"මේක යටතේ කාන්තා නියෝජනය සහ තරුණ නියෝජනය පහළට වැටෙනවා. මේ ආණ්ඩුව ඉදිරියට යන වැඩ වෙනුවට රිවස් වෙන වැඩ විතරයි කරන්නේ" රෝහිණී කුමාරි කවිරත්න චෝදනා කළාය.

"මේ සංශෝධනවලට විරුද්ධව අපි සටන් කරන්න ඕන." එරාන් වික්‍රමරත්න මන්ත්‍රීවරයා කළ යෝජනාවට සියල්ලෝම කැමැත්ත දුන්හ.

## දිනේෂ්ගෙන් මැදුම් පිළිවෙතක්

රට තුළ ආර්ථික අර්බුදය සහ දේශපාලන වශයෙන් ගැටලු මතුවෙද්දී, මහජන එක්සත් පෙරමුණේ නායක, අධ්‍යාපන ඇමති දිනේෂ් ගුණවර්ධන, සිය පක්ෂයේ මධ්‍යම කාරක සභාව පසුගිය බදාදා සවස කැඳවා තිබිණි. පක්ෂ මූලස්ථානයේ පැවති මධ්‍යම කාරක සභා රැස්වීම දීර්ඝ වේලාවක් පැවැත්විණි.

"වර්තමාන තත්ත්වය ගැන මහජන එක්සත් පෙරමුණේ ස්ථාවරය බොහෝ අය විමසනවා" ම.එ.පෙ. උප සභාපති, රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි ප්‍රකාශ කළේය.

එහිදී පක්ෂ නියෝජ්‍ය ලේකම්, තරුණ සංවිධානයේ ප්‍රධානි, පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන කියා සිටියේ "අලුත් තත්ත්වය ගැන අපි මුලින් ම නිවැරදිව විග්‍රහ කරගත යුතුයි."

"ජනතා බලාපොරොත්තු ඉටු කිරීම වගේම ආණ්ඩුව සහ බලවේග ආරක්ෂා කිරීම ගැනත් අපි විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යයි."

දීර්ඝ පැහැදිලි කිරීමක් අරඹමින් දිනේෂ් සඳහන් කළේය.

රට මුහුණ දී ඇති ආර්ථික - දේශපාලන අර්බුදයේදී අන්තයකට බර නොවූ, මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ ඉදිරි දේශපාලන ගමනක් සඳහා, ම.එ.පෙ. මධ්‍යම කාරක සභාවේ එකඟතාව ලැබුණේ තවදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුවය.

## වජිර රුසියා තානාපති හමුවෙයි

එක්සත් ජාතික පක්ෂයේ නායක, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහගේ උපදෙස් මත එජාප සභාපති වජිර අබේවර්ධන පසුගිය සඳුදා දහවල් රුසියානු තානාපති කාර්යාලයට ගොස් රුසියානු ශ්‍රී ලංකා තානාපති H.E. Yury Materiy මහතා හමුවී විශේෂ සාකච්ඡාවක් පැවැත්වීය.

මෙම සාකච්ඡාවේ විශේෂ අවධානයක් යොමු වූයේ අධ්‍යාපන හා වෙනත් කටයුතු සඳහා රුසියාවට ගොස් සිටින මෙරට දරුවන්ගේ ආරක්ෂාව හා ඔවුන්ගේ ගැටලු සම්බන්ධවයි.

රුසියාවේ සිටින ශ්‍රී ලාංකික දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධව කිසිදු ප්‍රශ්නයක් මතු නොවන බවත් ඒ පිළිබඳව පූර්ණ අවධානය යොමුකරමින් ඊට අවශ්‍ය සියලු පියවර ගෙන තිබෙන බවත් දෙදෙනා අතර පැවැති දීර්ඝ සාකච්ඡාව අවසන් කරමින් තානාපති H.E. Yury Materiy මහතා වජිරට දැනුම් දුන්නේය.



එල්ලෙන පාලම කඩාවැටීමට පෙර

# මාතර රන් දූපතේ කඩා වැටුණු එල්ලෙන පාලමට අලුත් පාලමක්!



එල්ලෙන පාලම කඩාවැටුණු අවස්ථාව.

● **ජයසිරි පේදුරුආරච්චි,** ගන්දර සමූහ

**මාතර නගරයට සුන්දරත්වයක් ගෙන දුන් තවත් ස්ථානයක් වන්නේ කලක් කාක දූපත, පරෙයි දූපත (ගල් පර සහිත දූපත) ලෙසින් හැඳින්වූ "රන් දූපත" ය.**

ස්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වයේ උපෝසිථාගාරය පිහිටි මෙම මනරම් දූපත වර්තමානය වනවිට දේශීය හා විදේශීය සංචාරකයන්ගේ නෙත් සිත් පැහැර ගත් සුන්දරතම දූපතක් බවට පත්ව ඇත. දූපත මධ්‍යයේ ඉදිකර ඇති ශ්‍රී රෝහණ උපෝසිථාගාරය මහා විහාරයත්, එයට ගමන් කිරීමට ඉදිකර තිබූ අලංකාර එල්ලෙන පාලමත් දූපතේ අසිරිමත් බව නැංවීම සඳහා එක්කර තිබුණේ ඉහළ වටිනාකමකි.

කලක් කාක්කන්ගේ වාසභූමියක් වූ කලෑබද භූමියක්ව පැවති මෙම දූපත අත්තුඩාවේ සිරි රාහුල මහ නාහිමයන්ගේ උපදෙස් හා ඕමාරේ කස්සප නාහියන්ගේ මැදිහත්වීම මත එවක වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයාව සිටි මහින්ද විජේසේකර විසින් 2004 වසරේදී ශ්‍රී රෝහණ සංඝ සභා උපෝසිථාගාරය සහිත උපෝසිථාගාරය මහා විහාරය ඉදිකිරීමේ මූලිකත්වය ගත්තේ එතෙක් රෝහණ සංඝ සභාවට තිබූ අවශ්‍යතාවක් ඉටුකර දෙමිනි. මංගල සමරවීර ද ඒ සඳහා ඉහළ සහායක් ශාසනික අවශ්‍යතාවක් සම්පූර්ණ කර දෙමිනි.

"මෙම අලංකාර භූමිය එවකට මහ මුහුදින් වටවූ කලෑබද කුඩා උස් බිමක් ලෙසටයි තිබුණේ. අපේ මහ නායක හාමුදුරුවන්ගෙ අනුදැනුම මත මම මහින්ද විජෙසේකර අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර උපෝසිථාගාරය මහා විහාරය ගොඩනැගුවා. අපි මුලින්ම හැදුවේ වටදාගෙය සහිත චෛත්‍යය, උපෝසිථාගාරය සහ දෙපස සංඝාවාස දෙකයි. අපේ සංඝ සභාවේ උපසම්පදා විනයකර්ම මෙහි පවත්වන අතර තමයි අපේ නායක හාමුදුරුවෝ එදා පරෙයි දූපත ලෙසින් හැඳින්වූ මෙම භූමිය "රන් දූපත" ලෙසින් නම් කළේ" රන් දූපත උපෝසිථාගාරය මහා විහාරයේ ආරම්භය පිළිබඳ ඕමාරේ කස්සප නාහිමියන් එලෙස පැවසුහ. කස්සප නාහිමියන් රන් දූපතට යෑමට පාලමක් ගොඩනැගුණු ආකාරය තවදුරටත් මෙලෙස විස්තර කළහ.

"පසුගිය හතරවැනිදා කඩාගෙන වැටුණේ රන් දූපතට යන්න ගොඩනගා තිබූ තුන්වන පාලම. මින් පෙර පාලම් දෙකක් සාදා කඩා වැටුණා. මුල්ම එක හැදුවේ අපි. එය යකඩ කණු මත යකඩ බාල්ක දමා ඒ මත ලෑලි අතුරා සකස් කළ එකක්. පසුව කොන්ක්‍රීට් කණුමත තවත් පාලමක් ගොඩනැගුවා. එය මහා සුනාමියෙන් කඩා වැටුණා. ඉන්පසුව තමයි ඔය එල්ලෙන පාලම ගොඩනැගුවේ. මහින්ද විජේසේකර, මංගල සමරවීර, චමල් රාජපක්ෂ වැනි අය ඒ සඳහා මූලිකත්වය ලබා දුන්නා. වරාය අමාත්‍යාංශයෙන් තමයි පාලම සකස් කළේ. එය ඉතා අලංකාර හා කාගේත් සිත්ගත් පාලමක් බවට පත්වුණා. ඒ නිසාම අපේ විහාරස්ථානයට ඉන් තව තවත් අලංකාර බවක් හා වටිනාකමක් ඇතිවුණා"



අමාත්‍ය ඩලස් අලහප්පෙරුම අවශ්‍ය උපදෙස් ලබාදෙමින්.

මෙලෙස මාතර නගරයටත් මාතර ප්‍රදේශයටත් අභිමානයක් මෙන්ම අලංකාරයක් ද ගෙන දුන් රන් දූපත එල්ලෙන පාලම කාලයාගේ ඇවෑමෙන් හා මුහුදු ජලයේ හා සුළඟේ බලපෑම මත දිරාපත්ව අබලන් තත්ත්වයට පත්ව තිබුණේ අනතුරක පෙරනිමිති පෙන්වමිනි. ඒ නිසාම පාලම අබලන් තත්ත්වය හා අනතුරු සහිත තත්ත්වය රන්දූපත විහාරවාසී ස්වාමීන්වහන්සේලා දැන්වීම් පුවරු මඟින් ප්‍රකාශයට පත්කිරීමට ද කටයුතු කර තිබුණි.

පාලම දැඩි ලෙස අබලන්ව පැවතීම නිසා ඒ සඳහා කඩිනමින් නව පාලමක් ඉදිකිරීම සඳහා පසුගිය දිනක අමාත්‍යවරුන් වන ඩලස් අලහප්පෙරුම, රමේෂ් පතිරණ, කංචන විජෙසේකර යන අය හා පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක ද පාලම පිළිබඳ සොයා බැලීමට ද එක්ව සිටියේ එහි අවශ්‍යතාව දැඩිව දැනී තිබූ පසුබිමකය.

ඒ අතර පසුගිය 04 වැනිදා සංචාරකයන් කණ්ඩායමක් සමඟ පාලම හිටි හැටියේ කඩාවැටුණේ රටේම අවධානය ඒ දෙසට යොමු කරවමිනි. අනතුරින් දසදෙනකු පමණ සුළු තුවාල ලැබූ අතර කිසිවකුට හෝ ජීවිත හානියක් සිදු නොවීය. කෙසේ වෙතත් ඔවුන් බොහෝ දෙනකුගේ ජංගම දුරකතන පාවහන් හා අත් බෑග් මුහුදට වැටී ගසා ගෙන ගොස් තිබුණි.

"මම වඩේ බදිමින් ඉන්නවිට එක පාරටම මුහුද දෙසින් ලොකු ශබ්දයක් ඇසුණා. මම ඒ දෙස බලනවිට දැක්කා ලොකු පිරිසක් එක්ක පාලම මුහුදට කඩාවැටී ඇති ආකාරය. මම දී එතැනට දුවගෙන ගිහින් මුහුදට කඩා වැටුණු පාලමේ එල්ලී සිටි දරුවෙක් ඉක්මනට ගොඩට ගෙනාවා. නැවත ගිහින් තවත් දරුවන් දෙන්නෙක් ගෙනාවා. ඒ විදියට ළමයින් හත්දෙනකු සහ ආච්චිලා දෙන්නෙක් ගොඩට ගෙනැත් තියලා ආපසු ගිහින් ජංගම දුරකථන ගොඩාක් දමා තිබූ බෑගයක් ගෙනැත් අයිති නංගී කෙනකුට දුන්නා.





වමේ සිට ඕමාරේ කස්සප නාහිමි, මාතර දිස්ත්‍රික් ලේකම් වයි. වික්‍රමසිරි, පී. ඩී. රොෂාන්

අත්වැල් බැඳගෙන ගොඩට යමු කිව්වම තනි තනිව ගොඩට යන්න හැදුවා මිසක් සමහරු කණ්ඩායමක් ලෙස බේරෙන්න උත්සාහ කළේ නෑ. හරි පුදුම මිනිස්සු. මගේ කකුලේ ඉකිරි කටු ගොඩාක් ඇණුනා. ඒත් මම ඒවා ගණන් නොගෙන මිනිස්සුන්ට උදව් කළා"

අනතුරට පත් ජනතාව බේරාගැනීමට එක්වූ මාතර වෙරළේ වෙළෙන්දකු වූ පී. ඩී. රොෂාන් පැවසුවේය.

පාලම කඩාවැටීම සිදුවන විට උපෝසථාගාරයට ගොස් සිටි විදේශීය ජාතිකයන් ඇතුළු සංචාරකයන්ට පාලම කඩාවැටීම නිසා නැවත ගොඩබිමට ඒමට නොහැකිව පැයකට ආසන්න කාලයක් දූපත තුළ කොටු වී සිටි අතර පොලීසිය, යුද හමුදාව, නාවික හමුදාව හා ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ නිලධාරීන් පැමිණ ඔවුන් ගොඩබිමට රැගෙන ඒම සඳහා කටයුතු කළහ.

මාතර රන් දූපතේ විහාරාධිකාරී විටියල ඉන්දරතන ස්වාමීන් වහන්සේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් මෙසේ පැවසූහ.

"පාලම කාලයක සිට අබලන් වෙලයි තිබුණේ. එක්වරකට පාලමේ ගමන් කළ යුත්තේ පස් දෙනකු පමණක් බව දැන්වීමක් පවා ප්‍රදර්ශනය කර තිබෙනවා. එම අවවාදය නොතකා වන්දනා නඩ දෙකක් පාලමේ ගමන් කිරීම නිසයි මේ අනතුර සිදුවුණේ. මේ පාලම හදන්න රජයේ අවධානය යොමු වී තිබුණේ. ඉංජිනේරුවන් පවා පාලමේ ඇස්තමේන්තු හදන්න පැමිණියා. එවැනි තත්ත්වයක් තුළ මේ අනතුර සිදුවුණේ. එයින් ජීවිත හානියක් සිදු නොවීම ගැන සතුටු වෙනවා"

මාතර දිස්ත්‍රික් ලේකම් නීතිඥ වයි. වික්‍රමසිරි සිදුවීම පිළිබඳ මෙලෙස පැවසුවේය.

පාලම අබලන්ව පැවතීම නිසා එය නැවත ඉදිකරන්න සැලසුම් කර තිබියදි තමයි හදිසියේ පාලම කඩා වැටුණේ. එම සිදුවීමෙන් පසු අපි ක්ෂණිකව හා සැලසුම්ගත ලෙස ගතයුතු පියවර සියල්ල කඩිනමින් ගත්තා. ජනාධිපති තුමා විසින් නව පාලමක් මාස හයකින් ඉදිකරන්නට අවශ්‍ය උපදෙස් ලබාදී තිබෙනවා. එතෙක් තාවකාලික පාලමක් ශ්‍රී ලංකා යුද හමුදාවේ සහාය ඇතිව කඩිනමින් ඉදිකරන්නට කටයුතු කර තිබෙනවා. පූජ්‍ය ඕමාරේ කස්සප නාහිමියන්ගේ අනුශාසනා පරිදි උපෝසථාගාර විහාරස්ථානයේ කටයුතු සඳහා ගතයුතු කඩිනම් ක්‍රියාමාර්ගත් ගෙන තිබෙනවා.

පාලම කඩා වැටීමෙන් පසු ඒ ස්ථානයට පැමිණි ජනමාධ්‍ය අමාත්‍ය ඩලස් අලහප්පෙරුම ඇතිව තිබෙන තත්ත්වය පිළිබඳ සොයා බලා විසන්ධි වී තිබූ ජල හා විදුලි සැපයුම් කඩිනමින් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් අතර හදිසි ලෙස ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද අදාළ අංශ සඳහා උපදෙස් ලබාදීම සිදු කළේය.


**B හෝ O වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මනින් අවශ්‍ය කර තිබේ**

බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචි වයස අවු. 43ක දෙදරු පියෙක් සඳහා ඉතා ඉක්මනින් බද්ධ කිරීමට B හෝ O වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති අයෙක් වේ නම් පහත අංක වලට අමතන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

077948 7000 | 0773451885
0719945861

**කෝටිපතියෙකු වන්න නව දැනුමක් ගන්න**

**මැණික් පංති**

ආරම්භය : අප්‍රේල් 03 පෙ.ව. 9 ට (මාස 03)

ඉරිදා දින වල

ආචාර්ය ආර්. ජී. කරුණාතිලක (G.A.U.M)

විමසීම් : 0772 276 224 / 0714 043 436






No. 06, Ward Place, Colombo 07 | Islandwide Branches
Email: info@visioncaresl.com | Web: www.visioncare.lk
Hotline: 011 75 75 100 www.shop.visioncare.lk
VISION CARE OPTICAL SERVICES






# සොඳුරු බේරේ පාවෙන මනරම් අවන්හල




**මඟුල් ගෙයක්, උපන්දින සාදයක්, ප්‍රිය සම්භාෂණයක් හෝ සාමූහික හමුවීමක් සිදුවන ඕනෑම විටෙක සිනමන් ලේක් සයිඩ් හෝටලයට අයත් බේරේ වැවේ පාවෙන සුවිශේෂී අවන්හල හෙවත් 'Eight Degrees' මෙසේ සූදානම් කෙරෙයි.**

● ඉනෝකා පෙරේරා බණ්ඩාර

**මද්දහන දවා ලූ ගිනියම දැන් කෙමෙන් අඩු වී තිබේ. සිනමන් ලේක් බිමේ අතුපතර විහිදුණු මහා බෝ රුකක් මුල හිඳ මම 'අංශක අට' දෙස බලමි. බේරේ වැවේ කොළ පැහැ වැව් දියේ නැංගුරම් ලා, ඒ දිය කඳ මත හෙමි හෙමින් පැද්දෙන 'අංශක අට' මේ මොහොතේ මඟුල් ගෙදරක සිරි ගෙන තිබේ.**

මලින් සරසමින්, විදුලි බුබුළු එල්ලමින්, ලහි-ලහියේ තවත් පැයකින් හමාරකින් එළැඹෙන රාත්‍රියේ, මෙතැන සිදුවන්නට යන මංගල උත්සව-යට බොහෝ පිරිසක් එක්ව ඇ හැඩ වැඩ කරති.

මඟුල් ගෙයක්, උපන්දින සාදයක්, ප්‍රිය සම්භා-ෂණයක් හෝ සාමූහික හමුවීමක් සිදු වන ඕනෑම විටෙක සිනමන් ලේක් සයිඩ් හෝටලයට අයත් බේරේ වැවේ පාවෙන සුවිශේෂී අවන්හල හෙවත් 'eight degrees' මෙසේ සූදානම් කෙරෙයි.

කාර්ය මණ්ඩලය විසින් සිදුකරන මේ සූදානම් කිරීම් අතුරතුර කපි-තාන්වරයා ද, ජීවිත සියයක් පමණ සමඟ රාත්‍රියේ පැය දෙක තුනක් වැව් දිය මත යන ගමනට යාත්‍රාව සුදුසු තත්ත්වයේ පවතී දැයි පරීක්ෂා කරයි.

අමුත්තන්, සංගීත කණ්ඩායම් සහ කාර්ය මණ්ඩලය ගොඩ වී ආහාර පාන ඇතුළු අවශ්‍ය හැමදේම පටවා ගත් පසු ගමන ඇරැඹෙයි. කඹ ලෙහා යාත්‍රාව වතුරට නිදහස් කිරීමට ඩිංගි බෝට්ටුවේ කාර්ය මණ්ඩලය ද මේ වෙලාවේ විශාල කාර්යභාරයක් ඉටු කරයි.




සූපවේදී සංජීව ප්‍රමුඛ කණ්ඩායම

වැව් දිය මත උත්සවය පැවැ-ත්වෙන මුළු කාලය පුරාම ඩිංගි බෝට්ටුව ඒ අවට කැරකෙන්නේ කෙනෙකුට ගොඩබිමට යන්නට අවශ්‍ය වුවහොත් එය ඉටු කරන්නට ය. විටෙක ගොඩබිමට ගොස් හෝටල් කුස්සියෙන් මදි පාඩු රැගෙන එන්නට ය. මේ කාර්යයේ දී ඩිංගි බෝට්ටුව එහා මෙහා ගෙන යමින් බණ්ඩාර, දිසානායක සහ ප්‍රේමසිරි දවල්ටත් වඩා පරිස්සමට සිය රාජකාරිය ඉටු කරති.

'eight degrees' නම් මේ පාවෙන අවන්හල හෝටලයට එක් වූයේ, මීට වසර දහයකට පමණ පෙර කොළඹ සිනමන් ලේක් සයිඩ් හෝටලයේ සේවය කළ, නෙරෝයි මාසෝ නම්, සාමාන්‍යා-ධිකාරී වරයාගේ අදහසකට අනුව ය. ජාත්‍යන්තර තලයේ බෝට්ටු සහ යාත්‍රා නිපදවන නිල් මැරීන් සමාගම නිපදවා ඇති මෙම පාවෙන අවන්හල ඉතා උසස් තත්ත්වයේ නිමැවුමක් බව කපිතාන්, එච්. එම්. එස්. ජයවර්ධන පවසයි.

"අඩි 78ක් දිග, අඩි 28 ක් පළල මෙම යාත්‍රාව නිපදවා තිබෙන්නේ 'ට්‍රයි මැරීන්' ක්‍රමයට අනුව. එනම්, 'හල්' තුනකින් යුක්තව. මෙවැනි යාත්‍රාවක පාවීමේ සම්භාවිතාව වැඩියි. නිල් මැරීන් සමාගම තවමත් මාස දෙක තුනකට වරක් මෙහි නඩත්තු කටයුතු සිදු කරනවා. කොහොම වුණත් යාත්‍රාව දියත් කරන්න නම්, වතුර මට්ටම මීටර් තුනක්වත් උසට තිබිය යුතුයි. වැවේ වතුර මට්ටම වැඩි වුණොත් 'බේරේ බේසමෙන්' මුහුදට ගලා යනවා.



ආහාර පාන අංශයේ අධ්‍යක්ෂ කමල් අලහේන්ද්‍ර, සිනමන් ලේක් හෝටලයේ අලෙවි කළමනාකාරිනී බැන්ක්වට් නිමන්ති කොඩිතුවක්කු සහ කපිතාන්, එච්. එම්. එස්. ජයවර්ධන



ඩිංගි බෝට්ටුවේ කාර්යය මණ්ඩලයේ බණ්ඩාර, දිසානායක සහ ප්‍රේමසිරි

වරාය අධිකාරියෙන් සුද්ද පාවිච්චි කිරීම සඳහා ගේට්ටු ඇරියොත් නම්,වතුර මට්ටම අඩු වෙනවා. වැවේ වතුර මට්ටම, කාලගුණය සහ බෝට්ටුවේ තත්ත්වය කියන සියලු කාරණා හොඳින් සලකා බලලයි, යාත්‍රාව දියත් කරන්නේ.

නාවික හමුදාවේ විශ්‍රාමික කපිතාන්වරයකු වන මට, මේ අත්දැකීම තරමක් සුවිශේෂී යි. මේක සතු-ටත් එක්ක ගිහින් එන ගමනක්"

නැටුම්, ගැයුම්, වැයුම් සහ සතුට සිනහව අඩු නැති මේ පාවෙන අවන්හලේ ගෙවන හෝරා කිහිපය එය විඳින්නට එන බොහෝ දෙනාගේ සිත් ඇද ගන්නා සුළු අත්දැකීමකි. එනිසාම මේ අත්දැකීම විඳගන්නට ඔවුහු යළි යළිත් මෙහි එන බව සිනමන් ලේක් හෝටලයේ අලෙවි කළමනා-කාරිනී බැන්ක්වට් නිමන්ති කොඩිතුවක්කු පවසයි.

"ඒ නිසාම බොහෝ විට සිකුරාදායින් පටන් ගන්නා සති අන්තයේ eight degrees කවු-රුහරි කණ්ඩායමක් වෙන් කරගෙන. ඒ වෙන්කර ගැනීමේ දී අවම වශයෙන් 35 ක් වත් සිටිය යුතුයි. උපරිමය 100ක් පමණයි. එක් පුද්ගලයෙක් සඳහා රුපියල් 6,800 සිට 7,800 දක්වා වර්ග 4කින් මෙන්‍යූ පැකේජ ලබා ගන්නට පුළුවන්.

Upper deck හෙවත් උඩ කොටසේ තමයි උත්සවය පැවැ-ත්වෙන්නේ. lower deck හෙවත් යට කොටසේ තමයි, ආහා-රපාන ගන්නා අවන්හල. සම්භාෂණවලදී Upper deck එකේ 75ක් 100ක් එකවර ඩාන්ස් කරන අවස්ථාත් තිබෙනවා. ඒ සතුට විඳ ගන්නට ඉඩ හැර, ඔවුන්ගේ ආරක්ෂාව උදෙසා අපේ ඩිංගි බෝට්ටුව ඒ මුළු කාලය පුරාම ඒ අවට කැරකෙ-නවා. අමුත්තන් ආපසු යන්නේ ඉතාමත් තෘප්ති-මත් හැඟීමෙන්"

ජාත්‍යන්තර හෝටල් ක්ෂේත්‍රයේ 28 වස-රක අත්දැකීම් ඇති කමල් අලහේන්ද්‍ර, සිනමන් ලේක්සයිඩ් සිය ශ්‍රී ලාංකේය වෘත්තීය නවාතැන බවට තෝරාගෙන ඇත්තේ, එහි ඇති සුවිශේෂී ආකර්ෂණීය බව නිසාම ය.

eight degrees ඇතුළු බොහෝ අංශවල වගකීම ඇති ඔහු, සිනමන් ලේක් හි ආහාර පාන අංශයේ අධ්‍ය-ක්ෂවරයා ය.

"මම ලෝකයේ තරු හෝටල් ගණනාවක වැඩ කළ කෙනෙක්. ශ්‍රී ලංකාවේ දී මම සිනමන් හෝටලයේ නවාංග රුසක් දුටුවා. ඒවා ඉතාමත් ආකර්ෂණීයයි. අවුරුදු 28ක්ම ජාත්‍ය-න්තරයට වැඩ කරපු මම, ලංකාවේ සිනමන් හෝටලය තෝරා ගත්තෙත් ඒ නිසයි. eight degrees කියන්නේ, සුවිශේෂී අවන්හලක්. රාත්‍රියේ කොළඹ නගරයේ සුන්දර-ත්වය පැය දෙක තුනක් පුරා විඳිමින් සංගීතය සහ ප්‍රණීත ආහාරපාන රස විඳිමින් ගත කරන්නට ලැබෙන ඉතාමත් සුන්දර අවස්ථාවක්. ඒ වගේම, දේශීය-ත්වය සහ සේවකයන් පිළිබඳ සිතන ආයතන-යක් ලෙස සිනමන් හෝටලයට සේවය කරන්න ලැබීම මට සතුටක්..."


ඔහු සිය සේවා ස්ථානය පිළිබඳ සතුටිනි.

අටේ කණිසම පහු වී ඇත.

'අංශක 8' දැන්, මඟුල් ගේ සමඟ වැව් දියේ ඈතට යනු පෙනේ.

පුංචි විදුලි බුබුළුවලින් ආලෝකවත් ව, බේරේ වැවේ පාවෙමින් හෙමි හෙමින් ඇදී යන ඒ ගමන මේ රාත්‍රී අඳුරේදී පවා නෙතට රසඳුනක් ගෙනෙයි.

**ඡායාරූප - රංජිත් අසංක**





'Eight Degrees' යාත්‍රාව



'Eight Degrees' යාත්‍රාව උත්සවයක් සඳහා සරසා තිබූ අයුරු



'Eight Degrees' යාත්‍රාව ගුවනට දිස්වන අයුරු


නැඳුන්ගමුවේ රාජා මහනුවර ඇසළ පෙරහරේ අවසන් වරට සධාතුක කරඬුව වැඩම කළ අයුරු



# කරඬුව වැඩම කරවූ ඇත් රජ්ජුරුවෝ නික්ම ගියේ මිනිසුන් සිත් හඬවා දෝ


වෛද්‍යචාර්ය ධර්මවිජය ආගමික වතාවත් පැවැත්වීමට මහා සංඝරත්නයට ආරාධනා කළ අයුරු


රාජා රැකබලා ගත් 'කළු මාමා' රාජාට අවසන් ගෞරවය දැක්වූ අයුරු

## අඛණ්ඩව වසර 15ක් දළදා කරඬුව වැඩම කළා


රාජාට අවසන් ගෞරව දක්වන්නට නැඳුන්ගමුවේ නිවෙසට ඇදී ආ ජනතාව


ඇත් රජු වෙනුවෙන් ආගමික වතාවත් සිදුවන අයුරු නැරඹීමට පැමිණි ජනතාව

• අසේල කුරුළුවංශ

**ජාතියේ මහා පූජාගර්භ වස්තුවක් වන දළදාව වැඩම කරවීම ඉතා අසිරිමත්, පින්බර සංස්කෘතික මංගලයයකි. එබැවින් ඒ හා බැඳුණු සෑම අංගයක්ම බෞද්ධයන්ට පමණක් නොව සෑම ශ්‍රී ලාංකිකයකුටම අසිරිමත් සිදුවීමකි.**

දළදා සමිඳුන් වැඩ සිටින ශ්‍රී මාලිගයේ තැන්පත් කර තිබෙන පෙරහර කරඬුව දියවඩන නිලමේතුමා විසින් පිටතට වැඩම කරනු ලබන්නේ සුබ නැකතටය. හඳුන්කුඩම, පහතමාලය, අම්බරාව ඔස්සේ බෙර හා සක්හඬ මධ්‍යයේ පෙරහර කරඬුව වැඩමවාගෙන එන නිලමේතුමා එය මංගල හස්තිරාජයා මත ඇති රන්සිවිගේ තැන්පත් කරන්නේ සාධුකාර මාධ්‍යයේය. ඉන්පසු කරඬුව වැඩමවාගෙන ප්‍රධාන වාහල්කඩ අභියසට පැමිණෙන හස්තිරාජයා එහි සිට සඳගල දක්වා ඇති පඩිපෙළ බසින්නට පෙර මොහොතක් නැවතී හිස ඔසවා ගාම්භීර මෙන්ම ආඩම්බරකාර බැල්මක් හෙළන්නේය. මේ ගාම්භීරත්වය පිරි ආඩම්බකාර බැල්ම කල්ප කාලාන්තරයක් පෙරුම් පුරමින් පැමිණ ජීවමාන බුදුන් සේ සලකන දන්ත ධාතුන් වහන්සේ උදෙසා මේ භවයේදී ඉටුකරන්නට පැවරුණු උත්තුංග කාර්යයේ වගකීම ඉෂ්ටසිද්ධ කිරීම නිසා උපන්නක් දැයි සිතෙන තරමට තේජවන්තය. මංගල ඇතුගේ සම්ප්‍රාප්තිය බලාපොරොත්තුවෙන් දෑලේ ඇතුන් පත්තිරිප්පුව ඉදිරිපිට රැඳී සිටින්නේ සුවඳ සමන් මල් වට්ටි ඇතැතිව සිටින ශ්‍රී දළදා මාලිගාවේ රාජකාරි කරුවන් ද සමඟය. සධාතුක කරඬුවටත් මංගල ඇතුටත් උඩුවියන් අල්ලන්නට තවත් රාජකාරිකරුවන් අට දෙනෙක් පෙරමඟ බලා සිටිති. ප්‍රධාන වාහල්කඩ සිට සඳගල දක්වා වැටී ඇති පඩිපෙළ ස්වේත වර්ණ පාවඩයකින් වැසී ඇත. ඒ සධාතුක කරඬුව වැඩම කරන්නා වූ මංගල හස්ති රාජයාගේ පා පිළිගැනුමටය.

පඩියක් දෙකක් බැස යළිත් වරක් ඇත්රජු නතර වූයේ ඇයිදැයි කවුරුත් කල්පනා කරත්දී කරඬුව දරා සිටින මංගල හස්තිරාජයා පඩිපෙළ මතින් වැටී රැලි ගැන්වී තිබෙන පාවඩය හොඬවැලින් සකස්කර යළි ඉදිරියට පා තැබුවේය. අවට රැස්වූවෝ සාධුකර දුන්නේ "මගේ අම්මා බුදුන් දැක නිවන් දකිත්වා"යි පවසමිනි. මේ පසුගිය වසරේ මහනුවර ඇසළ පෙරහර මංගල්‍යයේ තිකිණි පුන් පොහෝ දින අවසන් රන්දෝලි මහ පෙරහර ගමන් ආරම්භ කළ මොහොතයි. නැඳුන්ගමුවේ රාජා නම් වූ මේ මහා ඇත් රජු, දළදා වහන්සේ වෙනුවෙන් ඉටුකරන්නට පැවරුණු වගකීම එදිනෙන් අවසන් කර කිසිදු නොයන ගමනක් මෙතරම් ඉක්මනින් යැතැයි එදා කිසිවෙකුත් නොසිතුහ. පෙරහර නිමාකර දළදා වහන්සේට වැඳ නමස්කාර කර මඟ දෙපස රැසී සිටි පිරිස වෙතින් වැඳුම් පිදුම් ලැබ සුපුරුදු ලෙස පාගමනින්ම ගම්පහ නැඳුන්ගමුවේ නිවෙසට ගිය රාජා, ඉන් මාස හයකට පසු එනම්, ඉකුත් මාර්තු මස 07 වැනිදා අලුයම හදිසියේම මෙලොව හැර ගියේ බෞද්ධයන්ගේ පමණක් නොව සෙසු ආගමිකයන්ගේ පවා දෙනෙතට කඳුළක් එක්කරමිනි.

බුදුන් උපත් දේශයේ ජන්මලාභය ලැබ ලක්දිවට පැමිණ ජීවමාන බුදුන් සේ සැලකෙන දන්ත ධාතුන් වහන්සේ උදෙසා පූජෝපාහාරයක් ලෙස වාර්ෂිකව පවත්වන පෙරහර මංගල්‍යයට පහළොස් වසරක් දායකත්වය දී නැඳුන්ගමුවේ රාජා මෙලොව හැරගියේ හැට නවවැනි වියේදීය. තිරිසන් සත්ත්වයකු ලෙස උප්පත්තිය ලැබුවත් රාජා මිය ගියේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගෙන් වැඳුම් පිදුම් ලබන්නට තරම් පින් කන්දරාවක් උරුම කරගත් භාග්‍යවන්තයකු ලෙසිනි. ගම්පහ නැඳුන්ගමුවේ සිට මහනුවර ඇසළ පෙරහරට සහභාගිවී වන්නට පමණක් එක වසරකදී රාජා කිලෝ මීටර 190 ක් පමණ දුරක් ඇවිද යයි. උසින් අඩි 10 1/2 ක් පමණ වන රාජාගේ තේජස දෙගුණ තෙගුණ වන්නේ අඩි පහක් පමණ දිග ස්වේත වර්ණ දළ යුගල නිසාය. එවන් හැඩකාර දළ යුගලක් ඇතෙකුට හිමිවන්නේ ඉතා කලාතුරකිනි.

රාජාගේ වත්මන් හිමිකරු වූයේ වෛද්‍යාචාර්ය හර්ෂ ධර්මවිජය මහතාය. ඔහු හා රාජා අතර ඇත්තේ අසීමිත බැඳීමකි. රාජා මෙතරම් ඉක්මනින් ජීවිතයට සමුදෙතැයි ධර්මවිජය මහතා කිසිවිටෙකත් නොසිතුවේය.ඔහු සැම විටම රාජාගේ සෞඛ්‍ය ගැන සැලකිලිමත් විය. රාජාට ආහාරපාන ලබාදීමේදී පවා නොයෙකුත් සීමා කිරීම් කරන්නට ඔහු කටයුතු කළේ රාජා අකාලයේ රෝගී වන්නට ඇති ඉඩ අහුරා දැමීමේ අරමුණිනි. එසේ වුවත් සියලු දේ අනිත්‍යය යැයි වදාළ බුදු වදන පසක් කරමින් රාජා මෙලොව හැර ගියේය.

රාජා, ඉන්දියාවේ සිට මෙරටට පැමිණ 'නැඳුන්ගමුවේ රාජා' වූ සැටි වෛද්‍යාචාර්ය හර්ෂ ධර්මවිජය මහතා මෙසේ විස්තර කළේය.

## රාජාට අවුරුදු 5දී ඉන්දියාවෙන් ගෙනාවේ

"ඉන්දියාවේ මයිසූර් ප්‍රාන්තයේ මහරාජා කෙනකුගේ ඥාතියකුට වැලඳී තිබූ දරුණු මානසික රෝගයක් ප්‍රකට තිලම්මහර වෙදපරපුරේ පිළියන්දල වෙද හාමුදුරුවන් විසින් සුවකර කරනු ලැබීමෙන් පසු සතුටට පත් මහරාජා හාමුදුරුවන්ට ඉන්දියාවට වඩින ලෙස ආරාධනාවක් කර තිබෙනවා. ලෙඩා සුවපත් කළ සතුට නිසා හාමුදුරුවන්ට කැමැති ඕන දෙයක් ඉල්ලන්න මම දෙන්නම් කියලා මහාරාජා කිව්වලු. හාමුදුරුවෝ ඇත් පැටවු දෙන්නෙක් ඉල්ලා තිබෙනවා. ඒ අනුව මහරාජාගේ ඇත්ගාලෙන් වයස අවුරුදු 05 ක් පමණ වෙන ඇත් පැටවු දෙන්නෙක් පූජා කරලා තියෙනවා. රාජාත් එක්ක එදා නැවෙන් ගෙනාපු අනිත් ඇත් පැටියා තමයි නවම්රාජා. ගංගාරාමයේ සිටි නවම්රාජා අවුරුදු කීපයකට කලින් මිය ගියා. හාමුදුරුවෝ ළඟ මේ ඇත් පැටව් දෙන්නා අවුරුදු 15 ක් විතර ඉඳලා තියෙනවා. ඒ දෙන්නව බලා කියා ගන්න කරදර නිසා උන්වහන්සේ එක් පැටියෙක් ඇඹිලිපිටියටත් අනෙක් පැටියා හොරණ උඩුව වලව්වටත් විකුණලා. පී. ඩී. පී ධර්මවිජය වෙද රාලහාමි කියන්නේ මගේ තාත්තා. 1978දී හොරණ වලව්වෙන් තාත්තා රාජාව අරන් තියෙන්නේ රුපියල් 75,000 කට. එදා සිට නැඳුන්ගමුවේ රාජා වූ ඇතාට මේ දක්වා කිසිදු අවස්ථාවක අපි ඉංග්‍රීසි බෙහෙත් දීලා නැහැ. පාරම්පරික වෙද පරම්පරාවකින් පැවත එන නිසා ඇතාට අවශ්‍යය බෙහෙත් අපිම හදලා දෙනවා. ඉඳලා හිටලා බඩේ අමාරුවක් ආවම මම කරන්නේ ඖෂධ කොළ කොටලා කවන එකයි. දැන් අවුරුදු 30ක විතර ඉඳලා රාජාගෙන් කිසිම වැඩක් ගත්තේ නැහැ. කිතුල් කොටයක් කන්න එයාම උස්ස ගත්තොත් මිසක් කිසිම කොටයක් අපි උස්සන්න දෙන්නේ නැහැ."

පෙරහර මංගල්‍යයන් සඳහා පාගමනින්ම යන රාජාගේ ආරක්ෂාව සඳහා වාහනයක් ද සමඟ පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පිරිසක් යොදවා තිබුණේ මේ ඇත් රජා ජාතික වස්තුවක් මෙන් ආරක්ෂා කළ යුතු බැවිනි.

රාජා රැකබලා ගත් විල්සන් කොඩිතුවක්කු ඇත්ගොව්වා සහ නැඳුන්ගමුවේ රාජා අතර බැඳීමට වසර 22කි.'කළු මාමා' ලෙස කවුරුත් දන්නා විල්සන් රාජාට විටෙක පියෙකි. තවත් විටෙක සහෝදරයෙකි. විල්සන්ගේ ඇස් අස්සේ සැඟවී සිට පිටතට කඩා පතින කඳුළු කැට ඔහුගේ සහ රාජාගේ බැඳීමේ ගැඹුර අපට කියාපායි.

"රාජාට අසනීපයක් තිබුණේ නැහැ. මේ දවස්වල එයාගේ කම්මුල් තෙමිලා හිටියේ. දවසක් විතර කෑම කෑවේ නැහැ. පාන්දර රාජා බිමට පාත්වුණා. ඊට පස්සේ නැගිට්ටේ නැහැ."යැයි කී කළු මාමාගේ හඬ ගොළු විය. තමා මෙලොව තනිකර රාජා මෙලෙස ඉක්මනින් ගිය ගමන විල්සන්ට රිස්සුම් දෙන්නේ නැති සෙයකි. ඒ නිසාම ඔහු හඬ අවදි කරන්නේ වචන අතර කාලයේ පරතරය දිග්ගස්සමිනි.

"පෙරහරට එන්න කලින් අපි පිරිත් කියලා ආශීර්වාද කරලා කැවුම් කිරිබත් කවලා සුබ වෙලාවකට තමයි රාජා පාරට ගන්නේ. රාජා එක්ක මාත් යන්නේ පයින්මයි. මම නැවතුණොත් ඇතත් නවතිනවා.දෙන්නට දෙන්නා නොදැක ඉන්න බැරිතරමට මගෙයි රාජාගෙයි අතර බැඳීමක් තිබුණා. නුවර පෙරහරට පයින් යත්දී නිට්ටඹුව පන්සලේ, දංඕවිට නිවසක, නෙළුම්දෙණියේ මොරවක නිවසක, රංවිල දුනුකොළ වලව්වේ සහ හිඟුල ගනේතැන්න මල්වතු විහාරයේ අපි නවතිනවා. දවසකට ඇවිදින්නේ කිලෝ මීටර 20ක් විතර වගේ දුරක් තමයි. පහුගිය පෙරහරට නුවර යන්න අපි පිටත් වුණේ අගොස්තු 02 වැනිදා. පෙරහරට දින දෙකක් තියලා 11 වැනිදා අපි නුවරට ආවා. පෙරහර අවසන් කරලා දින කිහිපයක් ඇතා විවේක ගත්තා. පස්සේ දළදා වැඳලා ගම්පහට එන්න පිටත් වුණේ සැප්තැම්බර් 01 වැනිදා. මම ගමක මිනිහෙක්. අද ලෝකයම මාව දන්නේ රාජා නිසා. මේ පින්වත් ඇත් රජාට බුදුන්දක නිවන් දකින්න ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා."

කළු මාමා කීවේ දෑසේ නළියන කඳුළු අතරිනි. බෙල්ලන්විල, කැලණිය, රත්නපුර සමන් දේවාලය ඇතුළු පෙරහරවලට සම්බන්ධ වෙමින් සිටි නැඳුන්ගමුවේ රාජා මහනුවර ඇසළ පෙරහරට මුල්වරට සම්බන්ධ වන්නේ 2005 වසරේදීය. ඒ දියවඩන නිලමේ ධූරයට එම වසරේ තේරීපත්වූ ප්‍රදීප් නිලංග දැලයන්ගේ ඇරයුමකිනි. එම වසරේ මහනුවරට පැමිණියත් රාජාට සධාතුක කරඬුව වැඩම කරවන්නට අවස්ථාව ලැබුණේ නැත. ඒ රාජා උසින් වැඩිවීම නිසා රන්සිවිගේ ශරීරයට තබා රැහැන් පටි බැඳීමේදී මතුවූ ගැටලුවක් හේතුවෙනි. එවර පෙරමුණේ ඇතකු ලෙස ගමන් ගත් රාජා සාධාතුක කරඬුව වැඩම කිරීමේ භාරදූර වගකීම බාරගත්තේ 2006 වසරේ සිටය. දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැලයන් ඒ මතක අවදි කරමින් මෙසේ පැවසුවේය.

"නැඳුන්ගමුවේ ඇතා හොඳ පරිණත තමන්ගේ වගකීම කුමක්ද කියලා නිවැරදිව තේරුම් ගත්ත ඇතෙක්. දිවයිනේ පෙරහර ගණනාවකට සම්බන්ධ වී ලබපු අත්දැකීම් සමඟ තමයි රාජා මහනුවර ඇසළ පෙරහරට සම්බන්ධ වුණේ. වසරින් වසර රාජා සාධාතුක කරඬුව වැඩම කරත්දී තමන්ගේ පරිණත බව ප්‍රදර්ශනය කළා. කවදාවත් පෙරහරේදී රජා කලබල කළේ නැහැ. වෙනත් ඇතෙක් කලබල කළොත් රාජා තමන්ගේ වගකීම තේරුම් ගෙන නිසොල්මන්ව හිටියා. දෑලේ ඇතුන් සමඟ කරඬුව වැඩම කරත්දී එක් අවස්ථාවක අලියෙක් කලබල වෙලා රාජා අසළටම ආවා.ඒ වෙලාවේ රාජා කලබල වුණා නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා. මිනිස්සු කලබල වුණත් රාජා නෙවෙයි කලබල වුණේ. රාජාට හොඳ හාම්පුතෙක් හිටියා. ඒ වගේම හොඳ ඇත්ගොව්වෙක් හිටියා. රාජා උපතින්ම ගෙනා ගතිගුණත් එක්ක මේ සංකලනය හොඳට පැහුණා. නැඳුන්ගමුවේ රාජාගේ අභාවයත් එක්ක ඒ මට්ටමේ පරිණත දළ ඇතුන්ගේ හිඟය තවත් උග්‍ර වෙනවා. දළදා මාලිගාවේ ඉන්දිරාජා හා රුහුණු කතරගම දේවාලයේ වාසනා මේ වන විට ඉතිරිව සිටින පරිණතම දළ ඇතුන් දෙදෙනායි. ඒ දෙන්නටම දැන් අවුරුදු හතළිස් පහට වැඩියි. තවත් අවුරුදු කිහිපයකින් පෙරහර මංගල්‍යය හා බැඳුණු චාරිත්‍ර ඉටු කිරීමේ ගැටලුවක් එනවා. සාධාතුක කරඬුව වැඩම කළ හැකි තත්ත්වයේ දළ ඇතුන් කිහිප දෙනෙක් දැන් සිටම පුහුණු නොකෙරුවොත් අනාගතයේදී අපේ සංස්කෘතිය හා බැඳුණු මේ පෙරහර මංගල්‍යයන් පවත්වන්න නොහැකි තත්ත්වයක් ඇතිවේවි."


ඇත් රජුගේ වියෝවින් කම්පාවටපත් අයෙකු අවසන් ගෞරවය දැක්වූ අයුරු


සංවේගයට පත් කුඩා දරුවකු රාජා වෙනුවෙන් බුහුමන් දැක්වූ අයුරු


රාජා ආදරය කළ කුඩා දරුවන් රාජාගේ සිරුර දැක බලාගනිමින්


රාජාගේ මරණය දැනගත් ප්‍රදේශවාසීන් සිරුර බැලීමට යන අයුරු

## ජාතික වස්තුවක් ලෙස නම් කර, සිරුර සංරක්ෂණය කිරීමට ජනපති උපදෙස්

නැඳුන්ගමුවේ රාජා දළදා පෙරහරේ සධාතුක කරඬුව වැඩම කරමින් සිදු කළ උදාරතර සේවය අගයමින් ජනපති ගෝඨාභය රාජපක්ෂයන් රාජා ජාතික වස්තුවක් ලෙස නම් කිරීමට තීරණය කළේය. ඒ වෙනුවෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් මහචාර්ය කපිල ගුණවර්ධනට ජනපතිවරයා උපදෙස් ලබාදී ඇත. අනාගත පරපුරට දැක බලාගැනීමට හැකි වන ලෙස රාජගේ සිරුර සංරක්ෂණය කිරීම ද මේවන විට ජනපතිවරයාගේ උපදෙස් මත ජාතික කෞතුකාගාර විසින් ආරම්භ කරනු ලැබ තිබේ.

නැදුන්ගමුවේ රාජා යළිත් මහනුවර ඇසළ පෙරහර හැඩ කරන්නට එන්නේ නැත. එහෙත් මංගල ලක්ෂණ සහිත ඇත් රාජයකු ලෙස පෙරහර මංගල්‍යයට සහභාගි වෙමින් ඉතිරි කළ මතකය සදා අමරණීයය. රාජා වැනි උත්තුංග දේහදාරී දිගු දළ යුගලකට හිමිකම් කියන ඇතුන් පහළ වන්නේ කලාතුරකිනි. දළදා වහන්සේ වෙනුවෙන් ඉටු කරන්නට පැවරුණු රාජකාරිය උපරිමයෙන් ඉෂ්ඨ සිද්ධකර නික්ම ගිය ඇත් රජුට නිවන් සුව අත්වේවායි පතමු.

• ඡායාරූප - පුෂ්පකුමාර මල්ලවආරච්චි, මීරිගම



● සංස්කරණය : අමිල මලවියුරිය

රටට සමාජයට වැඩදායක පුවත් සඳහා
ඔබ වෙනුවෙන් වෙන්වන සුවිශේෂ ඉඩකඩ ජනමඬල යි.
ඔබේ ගමේ, නගරයේ, පොදු අඩුපාඩු,
ඔබටත් සමාජයටත් යහපතක් සිදුවන දේ වෙනුවෙන්
සිළුමිණ ජනමඬල නිබඳව සූදානම්ය.
ඒ සඳහා ඔබේ ගැටලු හා අදහස්
අප වෙත පහත සඳහන් පරිදි යොමු කළ හැකිය.

සිළුමිණ ජනමඬල,
ලේක්හවුස් - කොළඹ 10
ෆැක්ස් - 011-242 9260
ඊමේල් - editor.silumina@lakehouse.lk

# කළමනාකරණ සේවා පත්වීම් අපටත් ඕනෑ

කළමනාකරණ සේවා නිලධාරී 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ 2019 (2021) සීමිත තරග විභාගයෙන් ලකුණු 100 ඉක්මවා සමත් වූ 1,470ක් පමණ අපේක්ෂකයන්ට උසස්වීම් පිරිනැමීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මේ වනවිට තීරණය කර ඇති බවට වාර්තා වේ.

ඊට අමතරව, මෙම තරග විභාගය සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් විෂයන් 2ටම ලකුණු 40ට වඩා ලබා ඇති අයදුම්කරුවන් සුළුතරයක් සිටින බව ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව පිළිබිඹු වේ. කෙසේ හෝ ලකුණු 100 ඉක්මවා ලකුණු ලබාගත් 1,470ක් පමණ අයදුම්කරුවන්ට පමණක් උසස්වීම් පිරිනැමීමට මේ වන විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තීරණය කර ඇතැයි වාර්තා වේ.

එහෙත් මීට පෙර අවස්ථා කීපයකදීම මෙම විභාගයට පෙනී සිට විෂයයන් දෙකටම ලකුණු 40 ඉක්මවා ලබාගත් කනිෂ්ඨ සේවක පිරිසට එකවර කළමනාකරණ සේවා නිලධාරීන් ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් උසස්වීම් ලබා දී ඇත.

මෙකී විභාගය 2021.03.27 වැනි දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද්දේ වසර 04ක් වැනි දිගු කලකට පසුවය. මෙම විභාගයට මුහුණ දුන් කනිෂ්ඨ සේවකයන්ට උසස්වීමක් ලබා ගැනීමට තිබෙන එකම නීත්‍යානුකූල ක්‍රමවේදය මෙම විභාගය සමත් වීම පමණකි.

කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු රාශියක් මේ වන විට රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුළ පවතින බැවින් විෂයයන් දෙකටම ලකුණු 40ට වඩා ලබා ගනිමින් විභාගය මෙවර සමත් වී ඇති සුළු සංඛ්‍යාවක් වන අයදුම්කරුවන්ට ද කළමනාකරණ සේවා නිලධාරී තනතුර පිරිනැමීම රජයට ඉතා පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි තීරණයක් ලෙස අප දකිමු.

නව බඳවා ගැනීම් ලෙස කළමනාකරණ සේවා නිලධාරීන් අලුතින් රාජ්‍ය සේවයට එක්කර ගැනීමට රජයට ඉතා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින්, දැනටමත් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මනා පළපුරුද්දක් හා අත්දැකීම් ලබා ඇති අප වැන්නන් එම කළමනාකරණ සේවා නිලධාරී තනතුරු සඳහා පත්කර ගැනීමෙන් රජයට පුහුණු නිලධාරී පිරිසක් මෙන්ම ඉතාම අල්ප පිරිවැයක් සහිතව වඩා කාර්යක්ෂම කළමනාකරණ සේවාවක් රාජ්‍ය සේවයට ලබා දිය හැකි බව ද කාරුණිකව අවධාරණය කර සිටිමු. එම නිසා අප වැනි සුළු පිරිසක් (විෂයන් දෙකටම ලකුණු 40ට වඩා ලබාගත් පිරිස) කළමනාකරණ නිලධාරීන් ලෙස උසස් කිරීමේ තීරණය ක්‍රියාත්මක කිරීම රජයට එතරම් අපහසු හා දුෂ්කර කාරණයක් ලෙස අපට නොපෙනේ. එම නිසා ජනාධිපතිතුමනි, අග්‍රාමාත්‍යතුමනි, මුදල් ඇමතිතුමනි, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමනි,

අප කෙරෙහි අනුකම්පාකොට වසර 05කට පමණ පසු පැවැත්වූ මෙකී විභාගයෙන් විෂයයන් දෙකටම ලකුණු 40 ඉක්මවා ලබමින්, තරග විභාගය සමත් වූ සියලු අයදුම්කරුවන්ට හට උසස්වීම් ලබා ගැනීමට හැකි වන පරිදි තීන්දු තීරණ ගෙන අපට සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉතා ගෞරවයෙන් හා කරුණාවෙන් ආයාචනා කර සිටිමු. අගතියට පත් විභාගය සමත් අයදුම්කරුවන් වෙනුවෙන්,

**එස්. එම්. විජයරත්න**
**කුලියාපිටිය**

# අර්ධ රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ටත් දීමනාවක්

මාසික විශ්‍රාම වැටුපත් නොලබන අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කර විශ්‍රාම ලැබූවකු වන මා ජීවත් වන්නේ වසර 35කට ආසන්න කාලයක් නියුතුව සිටි රැකියාවෙන් ලැබුණු සේවක අර්ථසාධක අරමුදල ස්ථිර තැන්පතුවක් ලෙස බැංකුවක තැන්පත් කර එයින් ලැබෙන පොලියෙනි. එම පොලි මුදල ද වසරින් වසර අඩුවන බවක් පෙනෙන්නට ඇත.

මා මෙන්ම අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කර විශ්‍රාම ලබා මේ වන විට ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් සිටින බොහෝ දෙනකු බෝ නොවන රෝග ඇතුළු විවිධ රෝගාබාධවලින් පෙළෙමින් සිටිමි. ඒ වෙනුවෙන් වෛද්‍ය පරීක්ෂණ සහ ඖෂධ මිලදී ගැනීම සඳහා විශාල මුදලක් මාස්පතා වැය කිරීමට සිදුව ඇත. ඊට අමතරව පවුලේ එදිනෙදා වියදම්, මාසික දුරකථන, විදුලි, වරිපනම් සහ ජල බිල් වැනි සියලු වියදම් පියවා ගන්නේ මාසිකව ලැබෙන සොච්චම් මුදලෙනි. මෙම තත්ත්වය මට පමණක් උරුම වූවක් නොව මා මෙන්ම අර්ධරාජ්‍ය ආයතනයන්හි සේවය කර විශ්‍රාම ලැබූවන් බොහෝ දෙනකු මුහුණ දෙන තත්ත්වයයි. ජනවාරි මාසයේ සිට රජය මඟින් රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට රුපියල් පන්දහසක දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇති අතර, පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වූවන්ට ද එම දීමනාව ගෙවන ලෙස දැනුම් දී ඇත. එහෙත් අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කර විශ්‍රාම ලැබූ අපට එම දීමනාව හිමි නැතිවා පමණක් නොව අප වෙනුවෙන් පෙනී සිටීමට වෘත්තිය සමිතියක ශක්තියක් හෝ නැත. එබැවින් අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ අපට ප්‍රාදේශීය ලේකම්වරයා සහ ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් දැනුම්වත් කොට අපගේ තොරතුරු එක්රැස් කර රජය මඟින් ගෙවන රුපියල් පන්දහසේ දීමනාව හා අමතර දීමනාවක් ලබාදීමට කටයුතු කරන ලෙස ජනාධිපතිතුමාගෙන් සහ අගමැතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.



**රංජිත් රාජපක්ෂ**
**විගඩ- බෙම්මුල්ල**

# ‘සතොස’ට ‘පණ’ දෙන්න

මෙරට විවෘත ආර්ථිකය දෝරගලා යැමත් සමඟ පොදු ජනතාවට සමීපව තිබූ සමූපකාරය වළ පල්ලට වැටුණි. පසුගිය යහපාලන සමයේදී ‘සතොස’ ද විනාශ කර ඊට ඇණ ගසා දැමූහ. මේ තත්ත්වය වෙනස් කර යළි ‘සතොස’ ප්‍රධාන ජනතා වෙළෙඳ ජාලය බවට පත්කිරීම කාලීන අවශ්‍යතාවක් වී ඇත.

අද වෙළෙඳ නගරවල ඇත්තේ ‘සතොස’ ශාඛා ස්වල්පයකි. ඒ හේතුවෙන් ‘සතොස’ක් සොයා කිලෝමීටර් දහයක් දොළහක් දුර යන්නට ජනතාවට සිදුව ඇත. අඩුම තරමේ කිලෝ මීටර් දෙකක් වැනි කෙටි පරතරයක්වත් ඇතිව කුඩා නගරවල ‘සතොස’ශාඛා පිහිටු වන්නේ නම් එය මහජනතාවට පහසුවකි. එමෙන්ම ඒවා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලින් පිරී තිබිය යුතුය.



ඇතැම් මහා පරිමාණ වෙළෙඳ ව්‍යාපාරවල ඉලක්කය වී ඇත්තේ සතොස, සමූපකාර සහ සාමාන්‍ය වෙළෙඳසැල් ක්‍රම ක්‍රමයෙන් පරිහානියට ලක් කිරීමය. එය රජය මැනවින් තේරුම් ගෙන සතොස නඟා සිටුවීමට ක්‍රියා කළ යුතුය.

විශේෂයෙන් සහල් ඒකාධිකාරය බිඳ දැමීමට මේ කන්නයේ සිට ජනතාවට අවශ්‍ය සහල් සාධාරණ මිලක් යටතේ බෙදාහැරීමට ‘සතොස’හරහා නිසි ක්‍රියාදාමයක් සකස් කළ යුතුය. ඒ සඳහා ජනතාවට සහන ලබාදීමට හැකි අවස්ථාව මගනොහරින ලෙස රජයෙන් ඉල්ලා සිටිමු.

**පියසිරි කොඩිතුවක්කු, මාතර**

# නිර්ණායක වෙනස් විය යුතු ‘කලාභූෂණ’ සම්මානය

‘කලාභූෂණ’ සම්මානය පිරිනමනු ලබන්නේ, ප්‍රාදේශීය මට්ටමින් විසිරී සිටින විවිධ කලා ක්ෂේත්‍රයන් තුළින් දක්ෂතා දක්වන ගමට - රටට විසල් මෙහෙවරක් ඉටුකරන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ටය. එය ජීවිතයේ එක්වරක් පමණක් හිමිවන ගෞරවනීය සම්මානයකි.

මීට දශක ගණනාවකට පෙර අප ප්‍රදේශයේ එම සම්මානය හිමි වූයේ, කෝලම්, රූකඩ, කැටයම්, නර්තන, සංගීත ශිල්පීන්, කවියන් සහ ලේඛකයන් වැනි විවිධ කලා ක්ෂේත්‍ර තුළින් දක්ෂතා දැක්වූ ප්‍රදේශයේ බොහෝ පිරිස් දැනහැඳින සිටි ගෞරවනීය කලාකරුවන් පිරිසකටය. එහෙත් අද එම තත්ත්වය ගිලිහී යමින් පවතී.

විවිධ දක්ෂතා ඇති කලාකරුවන් වර්තමානයේද විරල නැත. එහෙත් ඔවුහු සමාජයට ඒමට මැළිකමක් දක්වති. සිය කලා හැකියාවන් තුළින් ගමට - රටට මෙහෙවරක් කිරීමට ඔවුන් ඉදිරිපත් වන්නේ නැත. එය අපේ මෙන්ම රටේ ද අභාග්‍යයකි. අද ගමේ සමිති, සමාගම්වල සිය කැමැත්තෙන් නිලතල දැරීමට පවා අයවලුන් නැත. එදා ‘කලාභූෂණ’ සම්මානයෙන් පිදුම් ලැබුවෝද, එවැනි ක්‍රියාකාරි වයෝවෘද්ධ කලාකරුවෝය. එහෙත් අද තාක්ෂණයත් සමඟම බොහෝ පිරිස් වෙනත් සම්මාන කරා ඇදී යමින් සිටිති. එසේම ප්‍රදේශයේ පුද්ගලයන්ගේ මූල්‍ය ශක්තිය මත විවිධ මාධ්‍ය ඔස්සේ සම්මාන ලබාගන්නා තත්ත්වයකට ද බොහෝ පිරිසක් යොමුවී සිටිති.

එබැවින් මෙම අවාසනාවන්ත තත්ත්වයෙන් කලා ශිල්පීන් මුදා ගැනීම සඳහා ‘කලාභූෂණ’ සම්මාන පිරිනැමීමේ නිර්ණායක පවා කාලීනව වෙනස් විය යුතුව ඇත. එසේම ප්‍රදේශයේ සැඟවී සිටින විවිධ දක්ෂතා ඇති මෙම කලා ශිල්පීන් ප්‍රදේශයේ මෙන්ම රටේ ද අභිවෘද්ධියට යොමුකර ගත යුතුය. ඒ සඳහා රාජ්‍ය මට්ටමින් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් ද කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතුව ඇත.

**එස්. සමරනායක, අම්බලන්ගොඩ**

# නිවාඩු අඩු කොට වැඩියෙන් වැඩ කරමු

රටක සංවර්ධනය හා මිනිස් චින්තනය සමඟ සමීප සම්බන්ධතාවයක් පවතින වග අප සැම දෙනාම දන්නා කාරණයක් වුවද එම සම්බන්ධතාවය කෙසේනම් කළමනාකරණය කරන්නේද යන්න තවම ලාංකික ජනතාවට අවබෝධයක් නැත. එමෙන්ම මෙතෙක් කිසිම කෙනෙකු එය නිරාවරණය කර ද නොමැත.

ශ්‍රී ලංකාවට ආර්ථික හා ආධ්‍යාත්මික දියුණුව අවශ්‍යනම් මෙකී කරුණු ක්‍රියාත්මක කළ යුතුම වේ. නිවාඩු අඩු කරන්න - විචාර, සම්මන්ත්‍රණ සීමා කරන්න, වැඩියෙන් වැඩ කරන්න යනාදිය මන්ත්‍රීවරුන්ගෙන් ආරම්භ කර සැම පුරවැසියාම රට වෙනුවෙන් ආදායම් තත්ත්වය අනුව මූල්‍යමය පරිත්‍යාගයක් කිරීමටත් මසකට වරක් සැම ආයතනයක්ම ශ්‍රමදානයක් මඟින් පවිත්‍ර කිරීමටත් රාජ්‍ය තාන්ත්‍රික සැලැස්මක් සකස් කළ හැකි නම් ඉතා අගනේය.

නැවතත් සඳහන් කරනුයේ විචාරය - විවේචනය තම තමන්ටම සීමාකොට තමාගෙන් රටට ඉටුවිය යුතු උපරිම සේවාව ලබා දෙන ලෙසයි.

**අමුණුපුර පියරතන නාහිමි, අස්ගිරිය, මහනුවර**

# විදුලිය පිරිමසිමින් ජාතික වගකීමට උර දෙමු



මේ දිනවල නිතර කරන ඉල්ලීමක් වන්නේ එක් විදුලි ලාම්පුවක් හෝ නිවා දමන ලෙසටයි. ජනයා නිවෙසේ අනවශ්‍ය විදුලි පහන් නිවා දමන්නේ විදුලි බිල වැඩි වන හෙයිනි. එහෙත් ඇතැම්හු නිවෙස ඉදිරිපිට විදුලි කනුවේ බල්බය නිවා නොදමන්නේ එය ද විදුලිබල මණ්ඩලයට අයත් කාර්යක් දැයි වැරදි වැටහීමකින් විය යුතුය. එහෙත් එම බල්බය අක්‍රිය වූ විට නිලධාරින්ට දොස් කියන්නටත් අමතක නොකරති.

සමහර උද්‍යානවල දහවල - රාත්‍රී වෙනසකින් තොරව විදුලි බල්බ දැල්වී ඇති අවස්ථාවන් කොතෙකුත් දැක ඇත. නගරබද මෙන්ම ගම්බදද විදුලි කනුවල දිවා රාත්‍රී අඛණ්ඩව විදුලි බල්බ දැල්වේ. එය මෙවැනි විදුලි අර්බුදයක් පවතින අවස්ථාවක පමණක් නොව සැම විටෙකම ජාතික අපරාධයකි.

බොහෝ මහල් නිවාසයන්හි පවත්නා විදුලි සෝපාන එක් මහලකට යාමට ඒමට ද ඇතැම්හු භාවිත කරති. මෙවැනි අවස්ථාවක විදුලි සෝපානයන් අත්‍යවශ්‍යම අවස්ථාවකදී පමණක් භාවිතයට ගෙන ශරීර සෞඛ්‍යයට ද හිතකර තරප්පු පෙළ වෙත යොමු වීම සැමගේ වගකීමයි. එසේම තම සේවා ස්ථානයන්ගෙන් බැහැරට යද්දී අවට විදුලි පහන්, වායු සමීකරණ යන්ත්‍ර, විදුලි පංකා විසන්ධි කර යාමට ද සැවොම වගබලා ගත යුතුම සමයකි.

මේ මොහොතේ සැම පුද්ගලයෙකුම තම ජාතික වගකීම තේරුම්ගෙන රජයටත් වගකිවයුතු ආයතනවලටත් සවියක් වන ලෙස කටයුතු කළ යුතුම වේ. එසේම වගකිවයුත්තන් ද මේ දිනවල සිදුකරන විදුලි විසන්ධි කිරීම් වැනි දෑ ජනතාව අපහසුවට පත් නොවන ආකාරයෙන් නියමිත පරිදි දැනුම්වත්කොට සිදු කරනවා නම් මැනවි. ඇතැම් අවස්ථාවලදී දන්වා තිබෙන වේලාවට නොව වෙනත් වේලාවන්හිදී විදුලිය විසන්ධි කිරීම් නිසා ජනතාව විඳින දුක නම් අතිමහත්ය.

**ඇන්. කේ. පී. ප්‍රේමදාස ප්‍රනාන්දු**
**පයාගල**

# ජල නළ පිපිරීමෙන් කන්තලේ ජනතාව පීඩාවට

කන්තලේ නගරයේ ජල නළ නිතර නිතර පුපුරා යැම හේතුවෙන් ප්‍රදේශවාසිහු දැඩි අසීරුතාවට පත්ව සිටිති. ඒ සම්බන්ධ ආසන්නතම සිදුවීම වන්නේ, ඉකුත් 1 වැනිදා කන්තලේ නගරයේ වෙලින්ටන් හන්දිය අසල ත්‍රිකුණාමලය, කොළඹ මාර්ගයේ පොළොව යට ඇති ප්‍රධාන ජල නළයක් කැඩී යැමයි. ජලාපවහන මණ්ඩලයේ සේවකයන් කඩිනමින් පැමිණ එය පිළිසකර කළද පැය දෙකක් ඉක්ම යැමට මත්තෙන් යළි ජල නළය කැඩී ගියේය. මේ වනතෙක් එම නළයෙන් විටින් විට ගලා එන ජලය පොළොව මතුපිටට ඒමෙන් අසල කඩහිමියන් ඇතුළු මහා මාර්ගය භාවිත කරන කවුරුත් පාහේ අසීරුතාවට පත්ව සිටිති.

මෙසේ ජල නළ පුපුරා යැමට හේතුව ලෙස ප්‍රදේශවාසින් වන අප දකින්නේ එය ජලාපවහන මණ්ඩලයේ වරදක් නොවන බවයි. මාර්ගය කාපට් එළා සකස් කරන ලද කොන්ත්‍රාත්කරුවන් ජලාපවහන මණ්ඩලයේ නිලධාරින් සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙළකින් සහ කිසිදු විමර්ශනයකින් තොරව හිතුවක්කාරී ලෙස එම කාර්යය සිදු කිරීම මෙවැනි තත්ත්වයකට හේතු වී ඇති බව අපගේ අදහසයි.

මෙම ප්‍රදේශයේ ජල නළ එළා ඇත්තේ මීට වසර 40කට පමණ වන අතර, මේ වන විට එයට උඩින් එළා ඇති කාපට් මාර්ගය ජල කාන්දු හේතුවෙන් අවස්ථා සියයකටත් වඩා වැඩි ප්‍රමාණයකදී කැඩී ගොස් ඇත. මේ පිළිබඳ බලධාරින් විසින් වහා අවධානය යොමු කර ගැටලුවට විසඳුමක් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරමු.

**සුනෙත් ප්‍රියංග, කන්තලේ**

# මහජනයාට පදික වේදිකාවත් නැති වෙයිද?

මෙරට හැම නගරයකම පාහේ දැකිය හැකි සුලබ දසුනක් වන්නේ අනවසර වෙළෙඳ සැල්, පෙට්ටි කඩ අටවාගෙන තිබීමයි. ඇතැම් මිනිසුන් පෙට්ටි කඩ ගොඩනගාගන්නේ හුදෙක් වෙළෙඳාමටම නොව භූමි ප්‍රදේශය අල්ලා ගැනීමට බව ද පෙනී යයි. මාර්ග අසල ඇති අවසරලත් වෙළෙඳසැල් මෙන්ම නොයෙක් ව්‍යාපාරික ස්ථානවල තත්ත්වයත් මීට නොදෙවැනි නොවේ. ඔවුන් ද නිත්‍යානුකූලවම තමාට හිමි ඉඩම් කොටසෙන් ඔබ්බට ගොස් පදික වේදිකාව දක්වා වෙළෙඳසැල් පුළුල් කරගෙන සිටී.

අද වන විට කොළඹ ඇතුළු තදාසන්න සැම නගරයකම ඇති පදික වේදිකාව ජනතාවට අහිමි වී තිබේ. මේ තත්ත්වයේ භයානකම තත්ත්වය නම් මහජනතාව බහුල ලෙස රිය අනතුරුවලට ලක්වීමයි.

සැම ව්‍යාපාරිකයකුම නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී වගකිවයුතු බලධාරින් විසින් පදික වේදිකාව සඳහා වෙන්කළ කොටස ඔවුනට අයත් නොවන බව සඳහන් කරති. එහෙත් නගර සභා තුළ පළාත් පාලන ආයතන තුළ කුමන නීතියක් පැවැතියද එවැනි ව්‍යාපාරිකයන් එම නීති තඹ සතයකට මායිම් නොකර කටයුතු කිරීම බරපතළ ගැටලුවකි.

මේ නිසා මාර්ග දෙපස වෙළෙඳාම්හි නිරත ව්‍යාපාරිකයන්ගෙන් අප ඉල්ලා සිටිනුයේ මහජනයාට හිමි පදික වේදිකාව අවහිර නොකර තම කටයුතු කරගෙන යන ලෙසයි. එසේ නොකරන පුද්ගලයන්ට විරුද්ධව නීතිය දැඩිව ක්‍රියාත්මක කරන ලෙස ද ඉල්ලා සිටිමු.

**චන්දන වන්නිආරච්චි, දෙහිඅත්තකණ්ඩිය**

# කතරගම පොලිසියේ අවධානය පිණිසයි!

කතරගම වන්දනාවේ පැමිණෙන ඇතැම් බැතිමතුන් නවාතැන්පොළවල් තුළ පවත්වන මත්පැන් සාද හේතුවෙන් ප්‍රදේශවාසී ජනතාව මහත් පීඩාවට පත්ව සිටිති.

ඇතැම් නවාතැන්පොළවල්වල ලැගුම් ගන්නා වන්දනාකරුවන් මත්පැනින් සන්තර්පණය වී රාත්‍රිය පුරා සංගීත භාණ්ඩ වාදනය කරමින් කෑකෝ ගසමින් ඉතා අවිනීත අයුරින් හැසිරීම නිසා ප්‍රදේශවාසී සාමාන්‍ය ජනතාව දැඩි ලෙස පීඩාවට පත්වේ. එමෙන්ම බීමත්ව හැසිරෙන වන්දනාකරුවන් අතර ඇතැම් අවස්ථාවල ඇතිවන විවිධ ආරවුල් නිසා එම තත්ත්වය තවත් බරපතළ වන අතර එය ප්‍රදේශයේ සාමය කඩවීමට ද හේතුවකි. මීට පෙර කතරගම පොලිසිය විසින් රාත්‍රී 10න් පසුව මෙවැනි සෝෂාකිරීම් අවස්ථාවලට ඉඩ නොදෙන ලෙස නවාතැන්පොළවල් බාර කළමනාකාරීත්වය දැනුම්වත් කර තිබිණ. එබැවින් මේ පිළිබඳ වහාම අවධානය යොමු කර වන්දනාකරුවන්ගෙන් සිදු වන මෙම පීඩාකාරී තත්ත්වයෙන් ප්‍රදේශවාසීන් මුදවාගෙන ප්‍රදේශයේ සාමකාමී බව ආරක්ෂා කර දෙන ලෙස පොලිසියෙන් ඉල්ලා සිටිමු.

**එස්. කේ. ප්‍රියන්ත, කතරගම**

# පානීය ජල ගැටලුවට කඩිනමින් විසඳුමක් දෙන්න

ඌව පළාතේ, රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වරාපිටිය, වෙළන්ගොල්ල ගම්මානය අතිදුෂ්කරතා රැසකින් යුත් ගම්මානයකි. ප්‍රවාහන පහසුකම් ඉතාම දුෂ්කරය. මේ දිනවල එම ගම්මානය සහ අවට ගම් පෙදෙස්හි ජනයා ශීඝ්‍ර ලෙස ව්‍යාප්තව යන වකුගඩු රෝගී තත්ත්වයෙන් පීඩා විඳිමින් සිටී. වකුගඩු රෝගයට සෘජුවම පානිය ජලය බලපාන අතර, එම ගම්මානයේ සියලු ළිංවල ජලය අධික කිවුල් බවකින් යුක්ත වීම මීට ප්‍රධානතම හේතුවක් බව ගම්මු පවසති.

එසේ ළිං ජලය කිවුල් ගතියෙන් යුතු හෙයින් ප්‍රදේශයේ ජනතාව මේ දිනවල පානීය ජල ගැටලුවෙන් දැඩි පීඩාවකට පත්ව සිටී. එම ගම්මානයේ ජනයා දිනපතා කරත්තවල නැඟී සැතපුම් තුන හතරක දුර ගෙවා පානීය ජලය ගමට ගෙන අවට ගම් පීරමින් වෙහෙසෙති.

එම නිසා රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වෙළන්ගොල්ල ගම්මානයේ ජනයා උග්‍ර ලෙස පීඩා විඳින පානීය ජල ගැටලුවට කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස බලධාරින්ගෙන් ඉල්ලීමක් කරයි.

**වසන්ත රත්නායක, රිදීමාලියද්ද**

# වැලිගමට කරදර

වැලිගම නගරයේ පවත්වාගෙන ගිය ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි ඉංජිනේරු කාර්යාලයට දැනට වසර දෙකකට පමණ පෙර වැලිගම සිට කිලෝමීටර් 20ක් පමණ දුරක් ගෙවා යා යුතු අකුරැස්ස ප්‍රදේශයට ගෙන යැම තිබීම හේතුවෙන් විදුලිබල මණ්ඩලයේ වැඩිම පාරිභෝගික පිරිසක් සිටින වැලිගම ප්‍රදේශවාසීහු මහත් අසීරුතාවට පත්ව සිටිති. වැලිගම විදුලිබල මණ්ඩලයට වැඩිම ආදායමක් ලැබෙන ප්‍රදේශයක්ව තිබියදී, එම විදුලි ඉංජිනේරු කාර්යාලය අකුරැස්ස ප්‍රදේශයට ගෙන ගියේ කුමන අවශ්‍යතාවක් ඉටු කිරීමට දැයි විදුලි පාරිභෝගිකයෝ ප්‍රශ්න කරති. විශාල දුරක් ගෙවා එම කාර්යාලයේ සේවය ලබාගැනීමට යා යුතුව තිබීම හේතුවෙන් විදුලි පාරිභෝගිකයන් මෙන්ම එහි කාර්ය මණ්ඩලයේ සේවක සේවිකාවන් ද අසීරුතා රැසකට මුහුණ දී සිටිති.

එබැවින් මේ පිළිබඳ වගකිව යුතු බලධාරීන්ගේ අවධානය කඩිනමින් යොමුකර එම විදුලි ඉංජිනේරු කාර්යාලය යළිත් වැලිගම නගරයට ගෙන ඒමට කටයුතු කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

**වසන්ත ද සිල්වා, වැලිගම**

# කලාකරු හැඳුනුම්පතට කුඩම්මාගේ සැලකිලි

අපේ රටේ බලයට පත්වූ සැම රජයක් විසින්ම කලාකරුවන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කෙරිණි. එහෙත් එම හැඳුනුම්පත කිසිම රාජ්‍ය ආයතනයක පිළි නොගනී. එසේම එහි වැදගත්කම හා පිළිගැනීම ගැන ආයතන දැනුම්වත් කර නැත. කලාකරු හැඳුනුම්පත හිමි වනුයේ සමාජයේ ඉතා වැදගත් පිරිසකටය.

එහෙත් අපේ රටේ කලාකරු හැඳුනුම්පත කලාකරුවාට ලබා දුන් තවත් එක් ආභරණයක් වැනිය. හැඳුනුම්පත සාක්කුවේ රඳවාගෙන සිටීම හැර ඉන් ඉටුවන සෙතක් නැත. රාජ්‍ය ආයතනයකට ගොස් ගෞරවාන්විතව වැඩක් කරගැනීමට මේ හැඳුනුම්පත දිගු කළද පිළිගැනීමක් නැත. කලාකරුවන් සඳහා හැඳුනුම්පතක් හිමි බවවත් ඇතැම් රාජ්‍ය ආයතනවල නිලධාරිහු නොදනිති.

කලාකරුවා අසරණ වූ මොහොතක ඔහුට නැඟී සිටීමට හැකි බලගතු ආයුධයක් බවට කලාකරු හැඳුනුම්පත බලගැන්විය යුතුය. කලාකරු හැඳුනුම්පතටත් කිසියම් ආකාරයක සාධාරණ හිමිකාරීත්වයක් ලබා දිය යුතුය. රාජ්‍ය ආයතන මේ ගැන දැනුම්වත් කළ යුතුය. කලාකරු හැඳුනුම්පතටත් නිසි තැන ලබා දෙන ලෙස බලධාරින්ට දන්වා සිටින්නෙමු.

**කුරුකුලසූරිය,**
**මැදගෙදර, ගාල්ල**

# රාජකීය විදුහලේ පුංචි ඡන්දයෙන් එජාපයේ උපාලි ජය ගනී

**කුරුපිටියෙන් කොළඹට ආ උපාලි තම වැඩිහිටි අක්කලා දෙන්නා වන අනෝජා හා කල්‍යාණී සමඟ මුලින්ම පාසල් අධ්‍යාපනය සඳහා ගියේ කොළඹ කාන්තා විද්‍යාලයකටය. කාන්තා විද්‍යාලය කාන්තාවන්ට පමණක් වෙන්වුවත් හෝඩිය පන්තියේ පිරිමි ළමුන් කිහිප දෙනෙක් ඉගෙනීම කළහ. ගැහැනුන් පමණක් සිටි ගෙදරක එකම පිරිමි ළමයා වූ උපාලිට කාන්තාවන් පමණක් සිටි පාසලකින් ලැබුණු අධ්‍යාපනය ද අමුතු ස්වරූපයක් ගත්තේය. සෙල්ලම් කරන්නට ගියත් සිටින්නේ ගැහැනු ළමයින්ය. උගන්වන්නට සිටින්නේ ද ගැහැනු අයය. නැටුම්, ගැයුම් වැනි දේල් වලදී ද ගැහැනු අයයි. ඒ සියලුම දේ අතරින් සිය සිත ගිය එකම දෙය වූයේ මැහුම් ගෙතුම් පාඩමය.**

පන්තියේ මැහුම් ගෙතුම් ගුරුවරිය පුංචි උපාලිගේ සිත් ගත් ගුරුවරියක විය. ගෙතුම් කටුව හා වූල් කෙඳි ගෙන ගොතන්නට පුරුදු කරන අන්දම කදිම යැයි ඔහුට සිතිණ. ඔහුට අදහසක් පහළ විය. නිවාඩු දෙනතුරු ඔහු මඟ බලා සිටින්නේ කඹුරුපිටියට ගොස් ආත්තම්මා සමඟ එක්වීමටය. පාසල් දරුවකුට මෙන්ම ආත්තම්මාට ද පාසල් නිවාඩු දෙන දිනය හොඳින් මතකය. මුනුපුරාත් මිනිබිරියන් දෙන්නාත් රැගෙන ඒම තරම් විනෝදයක් හුරතලයක් තවත් නැත.

පන්තියේ මැහුම් ගෙතුම් පාඩම ඉගෙන ගනිද්දී උපාලිගේ සිත ගියේ ආත්තම්මාට ඇඳුමක් ගොතාගන යාමටය. ගෙදර සියලු දෙනාම වෙනත් වැඩක යෙදී සිටිද්දී පාසලින් උගත් ගෙතුම් වැඩට සිත යෙදූ ඔහු අත්තම්මාට ජර්සියක් ගෙතුවේය. පාසල් නිවාඩුවට තමන් කැටුව යාමට පැමිණි අත්තම්මාට තම අතින් නිමවූ ඇඳුම ඇන්දවූ අත්තම්මා බලා අපමණ සතුටක් වින්දේය. ආත්තම්මා පුංචි මුනුපුරාගේ හපන්කම් අසල්වැසි අය හා එක්ව කතා කළේ ආඩම්බරයකිනි.

කාන්තා විද්‍යාලයේ ඉගෙනුමට අමතරව දරුවන් තිදෙනාට හොඳින් සිංහල බස ඉගැන්විය යුතු බව විජයවර්ධන මාතාව කල්පනා කළාය. මේ කාලේ හොඳින් සිංහල ඉගැන්වීමට ප්‍රසිද්ධියට පත්වූ ඩී.එස්. ගුණසිංහ නම් ගුරු මහතකු බත්තරමුල්ලේ සිටින බව ආරංචි විය. ඔහු ඒ හැරෙන්නට සිංහල ගීත වෛද්‍ය ශාස්ත්‍රය ගැන පොත් ලියා පළකළ පුද්ගලයකු ද විය.

බත්තරමුල්ල පැලවත්ත හන්දියේ බෙහෙත් ශාලාවකට යාබද නිවෙසක පදිංචිව සිටි ඩී.එස්. මුණසිංහ හමුවීමට ගොස් ඒ අවධිය ගැන ද තොරතුරු විමසුවෙමු.

"මම ඒ දවස්වල පවුල් කීපයක දරුවන්ට සිංහල ඉගැන්නුවා. සේනානායක පවුල, ජයවර්ධන පවුල, අමරසූරිය පවුල ඉන් කීපයක්. දවසක් මට විජයවර්ධන මහත්තයගෙ ගෙදරිනුත් පණිවුඩයක් එවල තිබුණා. මම මුලින්ම ගිය දවසෙ ගෙදර ළමයි තුන්දෙනාටම සිංහල උගන්වන්න භාර දුන්නා. මුලින්ම මගේ අතට රුපියල් සියයේ කොළයක් දුන්න.

දරුවො තුන් දෙනාම ඉගෙන ගන්න දක්ෂයි. ඒ වුණත් උපාලි මහත්තය තරම් අක්කල දෙන්න දඟ නෑ. හැම වෙලාවෙම සෙල්ලමටමයි සිත. ඉඳල හිටල මගෙ කෝට් එකෙන් ඇදල සාක්කුවට අත දාල බලනව. ගෙදර ගිය හැටියෙ තේ දෙන එක ඒ ගෙදර පුරුද්දක්. උපාලි මහත්තය තමන්ගෙම අතින් මට තේ හදල දෙනවා. ගෙදර වැඩට ඉන්න අය ලවා තේ දෙන්න කවදාවත් උපාලි මහත්තය ඉඩ දෙන්නෙ නෑ.

මට මතකයි මම හදපු කවියක්. මම ඒක උපාලි මහත්තයටයි අක්කල දෙන්නටයි උගැන්නුවා. මම ඇත එනකොට උපාලි මහත්තය ඒ කවිය හයියෙන් කියවනවා.

පුංචි ඇටේ පැළ වෙතී
පුංචි පැළේ ගස වෙතී
පුංචි පුංචි නුවණැ තී
පුංචි ළමෝ පඬි වෙතී

මම දවසක් උපාලි මහත්තයගෙන් ඇහුව මේ කවිය ඉක්මනින්ම පාඩම් හිටියෙ කොහොමද කියලා."

"මේක ඇත්ත කතාවක් නෙ. ඒකයි නිකම්ම පාඩම් හිටියෙ." "උපාලි මහත්තය ඉගෙන ගන්න දක්ෂ වගේම දඟකාරකමත් තිබුණා. සමහරදාට පන්තියෙ වැඩ අතරමග නවත්තල සෙල්ලමට යනව. මම පස්සෙන් එනව දැක්කොත් තව හයියෙන් දුවනවා. කොහොම හරි අල්ලගෙන එනකොට කීකරු කමින් එනවා. කොච්චර හුරතල් දක්ෂ ළමයකු වුණත් මම ගිය අනෙක් පවුල්වල දරුවන්ට තිබුණු අහංකාරකම මේ දරුවො තුන්දෙනාගෙම දැක්කෙ නෑ."

කාන්තා විද්‍යාලයේ ඉගෙනගත් යුගය අවසන් වී රාජකීය විද්‍යාලයට උපාලි ඇතුළත් කළේය. ප්‍රාථමික අධ්‍යාපනය විසින් මෙහෙයවූ ගති සිරිත් ජීවිතයේ තරුණ විය ඉක්මවෙද්දීත් ඔහු කෙරේ විද්‍යමාන විය. විශේෂයෙන් පිරිස් සමූහ එකතු වී පවත්වන ප්‍රිය සාද ප්‍රතික්ෂේප කිරීම ඉන් එක පුරුද්දකි.

මිනිසුන් ගැහැනුන් එකතු වී හිනාවෙන් කථාවෙන් ඇරඹී මත්පැනින්, උසුළු විසුළුවලින් හා නැටුම් ගැයුම්වලින් කෙළවර වන සාදයන්ට සහභාගි වීම තම කාලය තේරුමක් නැති වැඩකට සම්බන්ධවීමක් ලෙස උපාලි සැලකීය. මෙයට වඩාත් බලපෑවේ, ඔහු දැඩි ලෙස පිළිකුල් කරන මස් මාංශ සහ මත්පැන් ප්‍රිය සාදවල අනිවාර්ය අංගයන් වන හෙයින් විය යුතුය.

මේ ස්වභාවය ඔහුගේ චරිත ලක්ෂණ හා සම්බන්ධ වන්නට බලපෑ ප්‍රධාන සාධකයක් සේ මතුවන්නට වූයේ පුංචිම අවධියේ ඔහු හැදුණු පරිසරයයි. පියාගේ අභාවයෙන් පසු ගෙදර පාලනය ගෙන ගිය මවත් මාමලාත් ආත්තම්මාත් ආගමික භක්තිය විසින් හා පරිත්‍යාගශීලී ගුණයෙන් දැඩි සේ හික්මවනු ලැබූ පිරිසක් වූහ.

තර්ස්ටන් පාරේ නිවසේ සිට රාජකීය විදුහලට ඇත්තේ යාර කීපයක දුරකි. මේ ගමන කළේත් ගෙදර රියැදුරු රෙජිනෝල්ඩ් සමඟ 8679 ෆියට් කාරයෙනි. දහවල ලැබෙන විවේක කාලයේදී ළමයි සැම දෙනාම නිවසින් කිරි ගෙන ඒම පුරුද්දක් විය. එහෙත් මේ කිරි විවේකයේ අනික් මිතුරන්ගෙන් සිනාවෙන් ගැළවීමට ඔහු පාසලේ කොතැනක හෝ සැඟවී මගහරින්නට විය. මේ කුළෑටිකම පුංචිම කාලයේ ඔහුට දැඩිව බලපාන්නට වූ හෙයින් විදුහල්පති ජයවර්ධන නිතර නිතර උපාලිට අවවාද දෙන්නට විය. පාසලේ පැවති සාමාන්‍ය දැනීම තරගවලින් සැමදාම ජය ගන්නට උපාලි සමත් විය. නිතරම පාසල් පොතපතින් බැහැරව වෙනත් පොත පත කියවීමට පුරුදු වූ නිසා මෙසේ ජය ගන්නට ඔහු සමත් වූ අතර ඒ නිසාම තව තවත් පොතපත කියවන්නට උනන්දු විය.

පොතපත කියවමින් දවසම ගෙදරට වී සිටින පුතා දුටු මෑණියන්ට තම දරුවා විනෝද ක්‍රීඩාවල යෙදවීමට අවශ්‍ය විය. මුලින්ම බයිසිකලයක් ගෙන්වා දුන් මව උපාලිට එයත් රැගෙන පාසල් වත්තට යන්නැයි කීවේය. පාසල් වත්තේ බයිසිකල් පැදීම ටික දිනකින් ඔහුට ලොකු විනෝදයක් විය. බයිසිකල් පැදීමෙන් දැඩි වෙහෙසට පත්ව එන ඔහු හෙමින් සීරුවේ බයිසිකලය පිස දමයි. ලොකු ඕනෑකමකින් බයිසිකලය ළඟට වී පුංචි සහෝදරයා කරන මේ දෙය කුමක්දැයි අක්කලා දෙන්නා හොරෙන් බලා සිටියහ.

"අද මගේ යාළුවට හොඳටම මහන්සි පාටයි. මම හෙට මෙච්චර වෙහෙසන්නෙ නෑ." බයිසිකලය සමඟ කරන කථාව අක්කලාට ඇසුණි. ඔවුහු මහ හඬින් සිනාසුනහ.

> “රස්සාවක් නොකර මම ලක්ෂපතියෙක් වෙනවා”





## උපාලි විජයවර්ධන විශ්වකර්ම මිනිසකුගේ කතාවක්

**ඔහු විශ්වකර්ම මිනිසෙකි.**
**දකුණු ලක උපන් හෙතෙම අධ්‍යාපනය ලැබුවේ කොළඹ රාජකීය විද්‍යාලයෙනි. ඩෙල්ටා ටොෆියෙන් ඇරඹි ව්‍යාපාර මෝටර් රථ නිෂ්පාදනය දක්වා උපාලි රැගෙන ගියේය. මැලේසියානුවන් චොකලට් රජ්ජුරුවෝ ලෙසද හැඳින්වූයේ ඔහුය. මේ, ඔහුගේ දිවි සැරියෙන් දිය දෝතකි. මෙවර පළ වන්නේ ඒ සංක්ෂිප්ත කතා මාලාවේ දෙවැනි කොටසයි.**

**නන්දසේන සූරියආරච්චි ලියයි**

නිවාඩු දිනවලත් සැම ඉරිදා දිනකත් බම්බලපිටියේ වජිරාරාමයට යෑම උපාලි නොකඩවා කළ සිරිතකි. බොහෝ දිනවල අම්මා සමඟ මේ ගමන සිදුවිය. වජිරාරාමයේ මහානාම හිමියන්ගෙන් ධර්ම කාරණා ප්‍රගුණ කරගත් ඔහුගේ සිත බෞද්ධ සමාජ සේවා කටයුතුවලට යොමුවීය.

මේ අවධියේ වළානේ ශ්‍රී සුධර්මදාන සමිතියෙන් ජාත්‍යන්තර බෞද්ධ සඟරාවක් වූ 'වෙසක් සිරි සර' සංග්‍රහය නිකුත් කරමින් තිබිණ. සිංහල - ඉංග්‍රීසි - දෙමළ භාෂා තුනෙන් නිකුත් වූ මෙම බෞද්ධ සංග්‍රහයේ වටිනාකම ගැන සිත් යොමු කළ පුංචි උපාලි මෙයට තමාත් සහභාගි විය යුතු යැයි සිතුවේය. මුදලින් මෙයට ආධාර කරන්නට ඉදිරිපත් වුවත් අතේ මුදල් නැති විය. නෑදෑයන් හා හිතවතුන් සමඟ කථා කළ ඔහු 1948 දී රුපියල් විසිඅටක් එකතු කර දුන්නේය. තවද 1949 වර්ෂයේදී රුපියල් පනහකින් ආධාර කළේය. මෙය මේ සංග්‍රහයට කුඩා දරුවකු විසින් ලබා දුන් වැඩිම මුදල විය.

රාජකීය ප්‍රාථමික විද්‍යාලය පළකළ 'ගේට් වේ' නම් සංග්‍රහයේ 1948 කලාපයේ උපාලි විජයවර්ධන නමින් පළකොට ඇති කවි පෙළ නම් කර ඇත්තේ "මගේ සැනසීම" යනුවෙනි. දස හැවිරිදි වියේ දරුවකු ලෙස එදා ඔහුගේ සිතුවිලි කුමන ආකාරයක පැවතියේද යන්නට ඒ කවි පෙළ හොඳම උදාහරණයකි.

මම මගෙ ගේ සරසන්නේ
වෙසක් එකට එළි දෙන්නේ
විදුලි පහන් දල් වන්නේ
ඉන්පසු මම සැන සෙන්නේ

හැම අංශයකම විහිද පැතිර ගිය දක්ෂතා ඇති පුද්ගලයකු ලෙස අනෙක් මිතුරන් අතරත් උපාලි ගැන හැඟීමක් ඇති වන්නට විය. ඉගෙනීමට හා ක්‍රීඩාව, සංගීතය, ශාස්ත්‍රීය කටයුතු අතින් උපාලි කැපී පෙනෙන්නට විය. හැරල්ඩ් ජෝන් හා උපාලි අතර පැවති මල්ලව පොර තරගයේදී පාසලේ අනෙක් සගයන් විස්මයට පත් කරමින් උපාලි ජය ගත්තේය. ඒ වන විට හැරල්ඩ් ජෝන් හැඩි දැඩි පුද්ගලයකු මෙන්ම උපාලිට වඩා බරින් රාත්තල් විසි අටක් වැඩි වූවෙකි.

***************

ශ්‍රී ලංකාවට නිදහස ලබන මොහොතේදී රටේ හැම තැනකම උත්සව පැවැත්වුණි. පුවත්පත්වල නිදහස හා සම්බන්ධ විවිධ ලිපි ලේඛන පළ විය. 1948 වසරේදී උපාලිගේ පන්ති භාර ගුරුවරයා වූ දයා බණ්ඩාරනායකට හොඳ අදහසක් පහළ විය.

"නිදහස ගැන කියා දෙන්න නම්, ප්‍රජාතන්ත්‍රවාදය ගැන හැඟීමක් ඇති කරන්න ළමයින්ට ඡන්ද ක්‍රමය උගන්වන්න ඕනෑ. අපි පන්තියේ ඡන්දයක් තියල මන්ත්‍රීවරයකු තෝරන්න ඕනෑ. මෙය පුංචි දරුවන්ට ලොකු විනෝදයක් ඇති කළ හැකියි. මන්ත්‍රීවරයා තෝරන්නේ දේශපාලන පක්ෂවලින්."

අපේක්ෂකයෝ ඉදිරිපත් වූහ. එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක ලෙස ඉදිරිපත් වූයේ උපාලි විජයවර්ධන ය. මන්ත්‍රී තෝරන්නේ රහස් ඡන්දයෙනි. ඡන්ද නිලධාරියා එකින් එක ගණන් කළේය. ප්‍රතිඵල ප්‍රකාශ විය. "උපාලි විජයවර්ධන එක්සත් ජාතික පක්ෂය, වැඩි ඡන්දයෙන් මන්ත්‍රී ධූරයට පත්වී තිබෙනවා." සියලු දෙනාම අත්පොළසන් දී නව මන්ත්‍රීවරයා පිළිගත්හ. 1948 රාජකීය ප්‍රාථමික පාසලේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයකු වූ උපාලි 1978 සිට 1983 කාලය තුළදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙතැයි බොහෝ දෙනා සිතුහ. සැක පහළ කළහ. බොහෝ දෙනා බියට පත්වූහ.

අකුරැස්ස ආසනයට තිබූ ඡන්ද විමසීමට දොස්තර වික්‍රමසිංහගේ බිරිය වූ ඩොරින් වික්‍රමසිංහ සමඟ උපාලිගේ මාමා වූ සරත් විජේසිංහ තරග වැදුණි.(දොස්තර වික්‍රමසිංහ සරත් විජේසිංහගේ මස්සිනා විය) මේ කාලයේ මිරිස්වත්ත වලව්ව ගම්වැසියන්ගෙන් පිරී යන්නට විය. ඡන්දය සමීපවත්ම මුළු දවස පුරාම හාල්ගෝනි කිහිපයක බත් මුට්ටි කුස්සියේ ඉදුණු හැටි උපාලිගේ සොහොයුරියන් දෙදෙනා සිහි කරන්නේ ලොකු විනෝදයකිනි.

මිරිස්වත්ත වලව්වේ මැද සාලේ ඇති දිග මේසය උදේ සිට සවස් වනතුරුම කෑම කන මිනිසුන්ගෙන් පිරී තිබිණ. කුස්සියේ වැඩ කිරීමට මිනිස්සු හතළිහක් පනහක් පමණ එක්වූහ. ගෙදරට පැමිණි ඡන්දදායකයන්ගෙන් භාගයක් සරත් විජේසිංහ මහතාට ඡන්දය දුන්නේ නම් නිසැකවම ජයග්‍රහණය කරන්නට තිබුණි. ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කරද්දී උඩින් ඇඳගෙන සිටි කොළපාට කමිසය ගලවා යටින් වූ රතුපාට කමිසය මතුවූ අයුරු ඔවුන්ට තවම මතකය. ඡන්ද ප්‍රතිඵලවලින් නිසැකවම තම මාමා ජය ගනු ඇතැයි සිතූ උපාලි පන්තියේ මිතුරන් සමඟ නිතර කතා කළේය. එක් මිතුරෙක් සරත් විජේසිංහ මහතා පැරදුණු බව ස්ථිරව කීවේය.

"මොනවද ඔට්ටු අපේ මාමා දිනනවා."

"රුපියල් දෙකක් ඔට්ටුයි. සරත් විජේසිංහ දිනන බවට උපාලි රුපියල් දෙකක ඔට්ටුවක් ඇල්ලුවේය.

උපාලිගේ රාජකීය විද්‍යාලීය ජීවිතය පිළිබඳ අමුතු තොරතුරු රැසක් අභාවප්‍රාප්ත ජන නායකයකු වූ එසේම රාජකීය විද්‍යාලයේ උපාලි සමඟ ඇසුරු කළ මිතුරකු වූ ලලිත් ඇතුළත්මුදලි මා සමඟ ප්‍රකාශ කළේය.

> මම මගෙ ගේ සරසන්නේ
> වෙසක් එකට එළි දෙන්නේ
> විදුලි පහන් දල් වන්නේ
> ඉන්පසු මම සැන සෙන්නේ

"උපාලි මට අවවාද කරල ලියුමක් එවල තිබුණා"උපාලි ගැන ලලිත් ඇතුළත්මුදලි මුලින්ම කීවේ එයයි. "මම එංගලන්තයට ගියේ උපාලිට වැඩිය අවුරුදු දෙකක් පහුවෙලා. උපාලි 1953 දී ගියා මම ගියේ 1955 දී. මම එංගලන්තයට ඉගෙන ගන්න යන බව දැනගෙන මට උපාලි අවවාද කරල ලියුමක් එවල තිබුණා. එංගලන්තය මේ වගේ රටක්, ලංකාවේ ළමයින්ට එංගලන්තයේ මේ වගේ ප්‍රශ්න තිබෙනවා. මෙහේ ආවම ඉන්න ඕන මේ විදියට කියලා ලොකු අවවාද ගොඩක් ලියුමෙ තිබුණා. ඇත්තටම ඒ අවවාද මට ලොකු උපදේශයක් වුණා. නොදන්නා රටකට ගිහින් ඉන්න ඕන විදිය ලියමනේ තිබුණා. අදත් උපාලි දුන් අවවාදවල වටිනාකම මම සිහි කරනවා. ඒ කාලේ මට මේ තරම් උපදේශයක් දෙන්න තරමට උපාලියි මමයි හිතවත් වුණේ අපේ පුංචිම දවස්වල ඉඳලා.

උපාලිට වැඩිය මම පන්තියක් ඉහළින් හිටියත් අපි හැමදාම එකතු වුණා. මගේ ගේ තිබුණේ ෆ්ලවර් ටෙරස්වල. උපාලිගෙ ගේ තර්ස්ටන් පාරෙ. මේ අතරෙ අද තියන පස්වන පටුමඟ එදා ගෙවල් නැති පාළු පැත්තක්. මෙතැන පිට්ටනියෙ තමයි අපි සෙල්ලම් කළේ. මම හැමදාම වැටෙන් පැනල එනතුරු උපාලි බලාගෙන ඉන්නවා. අපිට තවත් යාළුවො කීප දෙනෙක් හිටියා. කොච්චර සෙල්ලම සඳහා හිත ගියත් උපාලිට වැඩියෙන්ම හිත ගියේ අශ්වයන්ට. ඉඳල හිටල අපි එක්ක සෙල්ලම් කිරීම නවත්තල උපාලි රේස් කෝස් එකට දුවල යනවා.

"පුංචි කාලෙ අපි එක් එක්කෙනා ලොකු වුණාම කරන දේවල් ගැන කතා කළා. මම කිව්වා මම කවදහරි නීතිඥයෙක් වෙනව කියල. උපාලිගෙ වාරය ආවම උපාලි කල්පනා කරල කිව්ව, මම රස්සාවක් කරන්නෙ නෑ. මම ලක්ෂපතියෙක් වෙනවා."

ඒ කතාවට අපි ඔක්කොම හිනා වුණා. අපේ මිත්‍රයෙක් ඇහුවා වයස කීයෙදිද කියලා. අවුරුදු විසිහය වෙනකොට මම ලක්ෂපතියෙක් වෙනව කියලා උපාලි කිව්වා. ඒ අනාවැකිය හරියටම හරි ගියේය. එහෙත් වයස් සීමාව වසර කීපයකින් වෙනස් විය. අපේ යාළුකම මම හිතන්නෙත් උපාලි අපේ තාත්ත එක්ක තිබුණ හිතවත්කමයි. හැමදාම වගේ උපාලි අපේ ගෙදර එනවා - තාත්තත් එක්ක කථා කර කර ඉන්නවා. දවසක් උපාලි අපේ තාත්තට කිව්වා, රෝයල් එකෙන් අස්වෙලා ලන්ඩන් යන ගමනට අම්මා ටිකක් අදිමදි කරනව කියලා. උපාලිගෙ අම්මා උපාලිට හරි ආදරෙයි. පුංචි වැඩි නිසා එංගලන්තයට යවන්න බයක් තිබුණා. අපේ තාත්ත කිව්වා මම අම්ම එක්ක කථා කරන්නම් කියල. ඉන් පස්සෙ උපාලිට එංගලන්තයට යන්න ලැබුණා.



උපාලි විජයවර්ධනගේ සමාගමෙන් නිෂ්පාදනය කරන ලද 'උපාලි ෆියෙට්' මෝටර් රථය

උපාලි පුංචි කාලෙ සෙල්ලමට වගේ යාළුවො එක්ක ඉන්නත් හරි කැමැත්තක් දැක්වූවා. ඒ වුණත් කවදාවත් ඉදිරියට ගිහින් කැපිල පේන්න මතුවෙලා ඉන්න ආසාවක් තිබුණෙ නෑ. තමන්ගෙ පාඩුවෙ හෙමින් හෙමින් වැඩ කිරීම එයාට පුරුදු වූ ගතියක්. පසු කාලයේ උපාලි දේශපාලනයට එනව කියල ආරංචිය ලැබුණා. මම පුදුම වුණා.

ඉස්කෝලෙ සමිති සමාගම්වලට බැඳිල වැඩ කරන්නවත් ඒ තරම් කැමැත්තක් තිබුණෙ නෑ. ලොකු උනන්දුවක් තිබුණෙ ඡායාරූප සංගමයට. එතැනදි මමත් එයාට උදව් කළා. මම ඉදිරිපත්වූ හැම විටකම උපාලි මට උදව් කළා." ලලිත් ඇතුළත්මුදලි තම පැරණි හිතවතා ගැන දැඩි ඇල්මකින් කතා කළේය.

රාජකීය විදුහලේ ඉගෙන ගනිද්දී උපාලිගේ සිත තදින්ම බැඳගත් දෙයකි අශ්වයන් බැලීම. පාසලට අල්ලපු වත්තේ පිහිටි රේස් කෝස් එකේ දුවන අසුන් බලා සතුටට පත් නොවූ ඔහු වාර්ෂිකව ගාල්ලේ බූස්සේ රේස් බලන්නට ද ගියේ ය. එක් වරක් මිතුරන් ද පිරිවරා ගෙන බූස්සේ ගිය උපාලි රේස් නිමවූ විට අවට පළාත්වල ඇවිදීමට ගියේය. මේ කාලයේ සුදු ජාතිකයන්ට අයිති වූ නාකියාදෙනිය වත්ත මේ පිරිසගේ සිත තදින්ම ඇද බැඳගත් දර්ශනයක් විය.

පිළිවෙළකට වගා කළ නාකියාදෙනිය වත්ත අක්කර දහ අටදාහක් පමණ විය. ගාලු පළාතේ තිබූ හොඳම දර්ශනයක් වූ මෙය ලංකාවේ හොඳම වතු අතර මුල් තැනක් හිමිකර ගත්තක් විය. මෙය නැරඹීමෙන් ලොකු සතුටක් විඳි ඔවුහු එහි දිනක් ගත කළහ.

"මොකද බර කල්පනාවක වගේ."

නාකියාදෙනිය වත්තේ හැඩ වැඩ බලමින් සිටි උපාලිගෙන් එක් මිතුරෙක් ඇසීය.

"මම කවද හරි මේ වත්ත සල්ලිවලට ගන්නවා. ඒකයි මම කල්පනා කළේ." මිතුරෝ හඬ නඟා සිනාසුනහ.

එහෙත් එදායින් අවුරුදු විස්සක් යන්නට පෙර උපාලි නාකියාදෙනිය වත්තේ අයිතිකරු විය.

**තවත් කොටසක් ලබන සතියේ**




නුවරඑළියේදී 1981 පැවති තුරඟ තරඟයකින් ජයගත් උපාලි විජයවර්ධන

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි


## මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 90

## රුපියල් විසිපන්දහසක තෑගි

ගුරු චිත්‍රය



ගෝල චිත්‍රය








දෙවු ප්‍රවීණ චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මඟින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල් පත්වල පමණක් අලවා පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. තැපැල් පත් 2022 අප්‍රේල් 30 වැනිදාට පෙර ගුරුගෝල වෙනස 90, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10 ලිපිනයට එවිය යුතු ය. ගුරු ගෝල වෙනස ජයග්‍රාහකයන්ට රුපියල් 2,500 බැගින් මුදල් ත්‍යාග 09ක් පිරිනැමේ. ත්‍යාග පිරිනැමීම උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි. පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කර එවිය යුතුය.

මාධ්‍ය සම්බන්ධීකරණය
ගාමිණී රූපානන්ද - අනුරූ මාධ්‍ය සේවා

## වඩාත් විශ්වාසවන්ත සහ නව්‍යකරණය වූ මූල්‍ය සේවා සන්නාමය LOLC

බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයේ සිය විශිෂ්ටත්වය යළි තහවුරු කරමින් LOLC ෆිනෑන්ස්, 2021 ගෝලීය සම්මාන ප්‍රදානයේ (Global Brand Awards 2021) නමවන කලාපයේදී"වඩාත් විශ්වාසවන්ත මූල්‍ය සේවා සන්නාමය" සහ"වඩාත් නව්‍යකරණය වූ මූල්‍ය සේවා සන්නාමය"ලෙස සම්මාන දෙකකින් පිදුම් ලැබීය.



LOLC හෝල්ඩිංග්ස් පීඑල්සී හි ප්‍රමුඛතම මූල්‍ය හස්තය වන LOLC ෆිනෑන්ස්, මෙලෙස ගෝලීය - බැංකු නොවන මූල්‍ය සේවා අංශයෙන් 2021 වසර සඳහා තේමාවන් දෙකක් යටතේ ජයග්‍රණය ලැබූ ලංකාවේ එකම සහ අසමසම බැංකු නොවන මූල්‍ය ආයතනය ලෙස පිළිගැනීමට ලක්වීමෙන් සාඩම්බරයට සහ ගෞරවාදරයට පත්වේ.

LOLC ෆිනෑන්ස් දශක ගණනාවක් පුරා මෙරට මූල්‍ය සේවා වෙළෙඳපොළ අතික්‍රමණය කරමින් පරිපූර්ණත්වය ලබා තිබේ. අභියෝගාත්මක සමයන්හිදී පවා සමාගම විශිෂ්ට කාර්ය සාධනයක් වාර්තා කිරීමට සමත් විය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ලද මෙම ඇගයීම් සම්මාන තුළින්, විශිෂ්ටත්වය පිරිනමන විශ්වාසදායක සන්නාමයක් ලෙස සමාගමේ කීර්තිය නැවත වරක් තහවුරු කරයි.

Global Brands Magazine එක්සත් රාජධානිය කේන්ද්‍ර කොට ගත් ලොව විශාලතම සන්නාම ප්‍රකාශනයක් සහ සම්මාන ප්‍රදානය කරන ආයතනයක් වන අතර,කර්මාන්ත ක්ෂේත්‍රයන් හරහා අපක්ෂපාතී ලෙස සන්නාම තෝරා ගැනීම සම්බන්ධයෙන් සුපතළය.

## ටෝකියෝ සිමෙන්ති පරිසර හා සමාජ සත්කාර සේවා තානාපතිනිය 'මිස් ශ්‍රී ලංකා 2021' ෂාඩේ ග්‍රීන්වුඩ්



ටෝකියෝ සිමෙන්ති සමූහයේ සමාජ සහ පරිසර සත්කාර සේවා තානාපතිනිය ලෙස 2021 ලෝක රූ රැජින තරගාවලිය සඳහා ලංකාව නියෝජනය කරන මිස් ශ්‍රී ලංකා 2021 කිරුළ පලන් ෂාඩේ ෂාඩේ ග්‍රීන්වුඩ් මෙනවිය පත්කර ඇති බව නිවේදනය කරයි ටෝකියෝ සිමෙන්ති සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ එස් ආර් ඥානම් විසින් ෂාඩේ ග්‍රීන්වුඩ් හට මෙම පදවිය ප්‍රදානය කරමින් නොබෝදා අවබෝධතා ගිවිසුමක් හුවමාරු කරගන්නා ලදී.

## ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් රාජා ජුවලර්ස් පැරගන් දියමන්ති ආභරණ එළිදක්වයි

ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ කලාවේ ප්‍රමුඛයා රාජා ජුවලර්ස්, වෙතින් ජාත්‍යන්තර කාන්තා දිනය ට සමගාමීව You are a Diamond යන තේමාව රැගත් පැරගන් දියමන්ති ආභරණ එළිදැක්වීම පසුගිය දා සිදුවිය.



මෙම එළිදැක්වීම පිළිබඳව අදහස් දක්වමින් රාජා ජුවලර්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ අතුල එළියපුර මෙසේ පැවසුවේය. 'You are a Diamond යන තේමාව මූලික කර ගනිමින් මෙම විශේෂ 'පැරගන් දියමන්ති ආභරණ' හඳුන්වා දී තියෙනවා. විශිෂ්ට ලෙස සකසන ලද මෙම ආභරණ එකතුව අපගේ පාරිභෝගිකයින්ට ඔවුන් ගේ රුචිකත්වය අනුව තෝරා ගැනීමට ඉඩ සලසා දෙනවා. එමෙන්ම විශේෂ දිනයන් , විශේෂ අවස්ථා සැමරීම සඳහා විචිත්‍රවත් ආභරණ අපේක්ෂා කරන පාරිභෝගිකයින් සඳහා අපි ගුණාත්මක සේවාවන් ලබා දීමට නිරතුරු උත්සහ කරනවා.

පැරගන් දියමන්ති ආභරණ හුදෙක් සෞන්දර්යාත්මක අලංකාරයෙන් ඔබ්බට ගොස් ආදරය,සහ කැපවීම සංකේතවත් කරයි. මෙම දියමන්තියේ නම "ඇඩමස්" යන ග්‍රීක වචනයෙන් ව්‍යුත්පන්න වී ඇති අතර එය අනභිභවනීය යන අර්ථය ගනී.

රාජා ජුවලර්ස් හි දැනට පවතින මෝස්තර ,සඳහා නව පැරගන් දියමන්ති කොටස් ඇතුළත් වේ. පරිපූර්ත්වයෙන් යුතු අසමසම , අලංකාර මෝස්තර නිර්මාණ එකතුව අත්විඳීමට ස්වර්ණාභරණ ගනුදෙනුකරුවන්ට සුවිශේෂී අවස්ථාවක් ලැබේ.

රාජා ජුවලර්ස් හි ස්වර්ණාභරණ නිර්මාණකරුවන්ට මනා පළපුරුද්දක් ඇති අතර ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සඳහා කලාත්මක හා ආකර්ෂණීය ආභරණ නිර්මාණය කිරීමට ඉහළ හැකියාවක් ඇත. දියමන්ති, වටිනා ලෝහ, මැණික් ගල් සහ ස්ඵටික භාවිතා කර නව තාක්ෂණය යොදා ගනිමින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට ද රාජා ජුවලර්ස් කටයුතු කරයි.




# ප්‍රහේලිකාව නිවැරැදිව පුරවා

# රුපියල් 50,000ක මුදල් ත්‍යාග දිනන්න

### කොන්දේසි:

(1) කුසපත් ඇදීමෙන් තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10 ට එක් අයකුට රුපියල් 5,000 බැගින් මෙහි සඳහන් පරිදි රුපියල් 50,000 තෑගි මුදල හිමි වේ.

(2) තරගකරුවකුට විසඳුම් පත් ඕනෑම සංඛ්‍යාවක් යොමු කළ හැකි අතර ඒ සඳහා සිළුමිණ පුවත්පතේ පළවන මෙම කූපනය පමණක් එවිය යුතුය.

(3) සිළුමිණ පුවත්පතේ පළවන මෙම ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා එය ලියුම් කවරයක බහා, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 132 යනුවෙන් සඳහන් කර සිළුමිණ ප්‍රහේලිකාව 132, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2022 අප්‍රේල් 30 ට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් අංකයක් ඇත්නම් එයද ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළවී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය. තරගයේ අවසන් තීරණය ලේක්හවුස් ආයතනය සතුය.


### හරහට

(1) මාරතු 2දා ගුණ සමරනු ලබන සිංහල ජාතික වීරයකු ගේ නම.
(5) පොල් ගෙඩි යොදා ගෙන කරනු ලබන සිංහල ජන ක්‍රීඩාවෙකි.
(7) දණහිසින් පහළ කකුලේ ඇති මස් ගොබය මේ නම ගනී.
(8) බුදු දහමෙහි හැටියට සතර මඟ සතර ඵලයෙන් අවසන් ඵලය
(11) වැල් පෙනෙලවලට මේ නම ද යෙදේ.
(12) කැමැත්ත හෙවත් ආශාවට මේ පදය යොදා ගැනේ.
(13) ඇතැම් ගැමියෝ වැස්සට නොතෙමෙනු පිණිස මේවා නැති කල කෙසෙල් කොළ හබරල කොළ ආදිය ඉසලති.
(16) අයුතු ලෙස හොරෙන් ලාබ ලබා ගන්නවා හෝ ඔඩොක්කුවේ සඟවා ගන්නවා හෝ
(18) සතුන් ගේ ප්‍රධාන ම ඉන්ද්‍රිය පහෙන් එකකට මේ නම යෙදේ.

### පහළට

(1) සංඛ්‍යා කිහිපයක් ඉතිරි නැති ව බෙදෙන ඉතා ම කුඩා සංඛ්‍යාව ගණිතයේ දී මේ නමින් හැඳින්වේ.
(2) වෙසෙසින් ම වැස්ස අඩුවීමේ දී අඩුවීම හඟවනු පිණිස මේ වදන කියැවේ.
(3) වන්දිභට්ටයා හෙවත් ස්තුති ගී කියන තැනැත්තාට කියන නමකි.
(4) දාර හතරක් සහිත කරල් ඵල ගන්නා බහු වාර්ෂික බෝංචි වැල් විශේෂයකි.
(6) බෝතල ආදියේ කට තදින් ම වසනු පිණිස එම කටට හිරකරන ඇබයට මේ නම වැහැරෙයි.
(8) අනන්ත නම් නාග රාජයාට මෙන් ම විෂ්ණු දෙවියන්ට ද මේ නම යෙදේ.
(9) ඇවිදීමට හෝ පිහිනීමට හෝ හිටගෙන සිටීමට හෝ මේ අවයවය ප්‍රයෝජනවත් වේ.
(10) අලවංගුව නාරස්සනය යන නම් ද මේ උපකරණයට යෙදේ.
(14) කරන ලද සේවය වෙනුවෙන් සේවකයකු වෙත ගෙවනු ලබන දීමනාව.
(15) පවන් පත, විජිනි පත යන නම් ද මේ උපකරණයට යෙදෙයි.
(17) සාර ,අරටු යන අරුත දෙන පදයකි

### සිළුමිණ ප්‍රහේලිකා - අංක 132




නම :..........................................................

ලිපිනය : ..........................................................

..........................................................

දුරකථන අංක : ..........................................................

අත්සන : .................................... දිනය : 2022/ ..............................

ඔබේ නිවැරැදි විසඳුම්පත් ප්‍රහේලිකා අංක - 132, සිළුමිණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2022 අප්‍රේල් 30 වැනිදාට පෙර එවිය යුතුය.

විසඳන ලද ප්‍රහේලිකාව ලියුම් කවරයක බහා එවන්න

ප්‍රහේලිකා සැකසුම : ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදී - තිලක නවරත්න

# මනරම් දිය ඇලි නෙතින් බලා කඳු පසුකර යමු ඇල්ල බලා



මහනුවර සිට ඇල්ල දක්වා ධාවනය වන 'ඔඩිසි' නමින් හැඳින්වෙන S14 වර්ගයේ දුම්රිය


සුළං කපොල්ල (ඉදල්ගස්හින්න - හපුතලේ)


වමේ සිට, ප්‍රවාහන අමාත්‍ය දිලුම් අමුණුගම, දුම්රිය සාමාන්‍යාධිකාරි ධම්මික ජයසුන්දර සහ මහනුවර ප්‍රධාන දුම්රිය ස්ථානාධිපති ආර්. එම්. පී. රත්නායක

**චන්දිමා එදිරිමාන්න,** ඇල්ල සංචාරයකින් පසුව

**ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙසින් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව ඈත අතීතයේ පටන්ම විදේශිකයකයන්ගේ ආකර්ෂණයට ලක්වූ දිවයිනකි. ශ්‍රී ලංකාවේ සුන්දරත්වයෙන් වසඟ වූ විදේශිකයෝ අතීතයේ සිට මෙරටට පැමිණි බවට සාක්ෂි එමටය. විදේශිකයන් ලංකාවට පැමිණීමට හේතු අතර ස්වාභාව සෞන්දර්යෙන් අනූන වීමත් ආර්ථික,සංස්කෘතික හා දේශපාලනමය වටිනාකමින් යුක්ත වීමත් ප්‍රමුඛ කරුණු වේ.**

විදේශිකයන්ගේ ලංකාගමනය නූතනය වන විට ව්‍යාපාරයක් බවට පත්ව ඇත. ඒ අතරිනුත් ලංකාවේ පවතින සෞම්‍ය, සිහිලැල් දේශගුණය සහ අනන්‍ය වූ සුන්දරත්වය සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීමට ප්‍රබල සාධකයක්ව පවතී. විශේෂයෙන් ආධ්‍යාත්මික සුවය හා සරල ජීවිතය මෙන්ම ස්වාභාව සෞන්දර්යෙන් ආස්වාදය ලැබීමට කැමති සංචාරකයෝ ඒ සඳහා ශ්‍රී ලංකාව තෝරා ගැනීමට වැඩි කැමැත්තක් දක්වති.

එසේ මෙරටට පැමිණෙන බොහෝ සංචාරකයන් වැඩි කැමැත්තක් දක්වන්නේ ශ්‍රී ලංකාවේ කන්ද උඩරට හා ඒ අවට ඇති පරිසරයේ අසිරිය විඳගැනීමටයි. මේ ගමන් බිමන් සඳහා දුම්රිය තෝරා ගන්නේ ද එම පරිසරයේ සුන්දරත්වය මැනවින් දැකබලා ගැනීමටයි. විශේෂයෙන් මහනුවර අවට ඇති දියඇලිවල සුන්දරත්වය විඳගැනීමට මෙරටට පැමිණෙන සංචාරකයන් මේ වන තෙක් භාවිත කළේ උඩරට මැණිකේ පොඩි මැණිකේ ඇතුළු උඩරට මාර්ගයේ ධාවනය වන දුම්රියයි. මෙම දුම්රිය සියල්ලම පාහේ සෑම විටම විටම සංචාරකයන්ගෙන් පිරී ඉතිරී පවතින අතර, ලෝකයේ හොඳම දුම්රිය ගමන් 10 අතරට ඇල්ල - මහනුවර දුම්රිය ගමන නම් කර ඇත්තේ ද එම මාර්ගයේ තිබෙන පාරිසරික චමත්කාරය නිසාමය.

මෙරට සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ අරමුණෙන් මහනුවර සිට ඇල්ල දක්වා විශේෂ දුම්රිය ගමන් වාරයක් මහනුවර සිට පසුගියදා ආරම්භ කරන ලැබුවේ ශ්‍රී ලංකාවේ සුන්දරත්වය සොයා එන සංචාරකයන්ගේ පහසුව වෙනුවෙන්මය. මහනුවර සිට ඇල්ල දක්වා ඉකුත් මාර්තු 5 වැනිදා සිට මෙම විශේෂ සංචාරක දුම්රිය ධාවනය කිරීම ආරම්භ වූ අතර, සංචාරක ආකර්ෂණයක් ඇති කරවන අයුරින් මෙම ගමන සැලසුම් කර ඇති බව ද දැනගන්නට ලැබුණි.

ඇල්ල - බදුල්ල වෙත ගමන් කිරීමට එන සංචාරකයන්ට සාමාන්‍ය මගී ප්‍රවාහන දුම්රිය භාවිත කළ හැකි අතර, මෙම විශේෂ සංචාරක දුම්රිය උඩරට මාර්ගයේ සංචාරකයන් වෙනුවෙන්ම වෙන් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත. ඒ අනුව දිනපතා උදෑසන මහනුවර දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කරන එම දුම්රියේ ගමනාන්තය වන්නේ දෙමෝදර දුම්රිය ස්ථානයයි. ඒ අතරතුර හමුවන ප්‍රධාන සංචාරක ස්ථානවල නැවතී ගිමන් හරිමින් ආශ්වාදජනක ගමනාන්තයට සංචාරකයන් ද ගෙන යන ප්‍රථම දුම්රිය මෙය වේ.

මේ විශේෂ සංචාරය වෙනුවෙන් යොදාගෙන ඇත්තේ චීනයේ නිෂ්පාදිත 'ඔඩිසි' නමින් හැඳින්වෙන S14 වර්ගයේ දුම්රියකි. වායුසමීකරණ මැදිරි 4ක්, වායුසමීකරණ නොකළ මැදිරි 3ත් මෙන්ම භෝජනාගාරයකින් ද සමන්විත මෙම විශේෂ සංචාරක දුම්රිය, මහනුවර දුම්රිය ස්ථානයෙන් උදෑසන 7.00 ට ධාවනය ඇරඹෙන අතර, එය දෙමෝදර දුම්රිය ස්ථානය වෙත ළඟා වන්නේ පස්වරු 2.45ට පමණය. පේරාදෙණිය නාවලපිටිය පසු කරගෙන යන අතරතුර දී ශ්‍රී පාදස්ථානය ඉතා හොඳින්ම දිස් වන ස්ථානයක් හමුවන අතර එම ස්ථානයේ දුම්රිය විනාඩි දෙකක කාලයක් නවත්වා තබයි.

මනරම් පරිසරයකින් යුතු ග්‍රේට්වෙස්ටර්න් දුම්රිය ස්ථානයේත් මඳ වේලාවක් නවත්වන මෙම දුම්රිය එල්ජින් දිය ඇල්ල අසල ද විනාඩි 2ක කාලයක් නවතා තබයි. එමෙන්ම මෙම ගමනේදී 'අශ්වයාගේ වලිගය' නැමැති ස්ථානයත් ශාන්ත ක්ලෙයාර් දිය ඇල්ලත් සංචාරකයන්ට දැකබලා ගත හැකිය. එමෙන්ම ලංකාවේ උසින් වැඩිම දුම්රිය ස්ථානය වන පට්ටිපොළ දුම්රිය බිම්ගෙය නැරඹීමට මිනිත්තු කීපයක් ද වෙන්කර ඇත. ඇල්ල දුම්රිය ස්ථාන පසුකර දෙමෝදර වෙත ළඟා වන්නේ විශිෂ්ට බ්‍රිතාන්‍ය ඉංජිනේරු තාක්ෂණය යටතේ ඉදිකළ 'ආරුක්කු නමය' පාලමේ සුන්දරත්වය විඳීමට මිනිත්තු 15ක පමණ කාලයක් ලබා දෙමිනි.

දෙමෝදර, බණ්ඩාරවෙල වැනි දුම්රිය ස්ථාන ඓතිහාසික වටිනාකම හා සුවිශේෂි පාරිසරික වටිනාකමකින් යුක්ත වන අතර මේ සියලුම දුම්රිය නැවතුම්පොළවල් අතර පිහිටා තිබෙන කළුවර බිංගෙවල් සුවිශේෂී වේ. මෙම දුම්රිය ස්ථාන සියල්ල යටත්විජිත සමයේ ආරම්භ කෙරුණු ඒවා වන අතර, ඒවායේ යටත්විජිත ගති ලක්ෂණ අදටත් සජීවී ව දැකබලාගත හැකිය. එවැනි සුන්දර සහ වැදගත් ස්ථාන රැසක් පසුකරමින් දෙමෝදර කරා ළඟා වන මෙම දුම්රිය පස්වරු 3.40ට දෙමෝදර සිට ආපසු මහනුවර බලා ගමන් ආරම්භ කරයි. එය මහනුවර දුම්රිය ස්ථානය වෙත ළඟා වන්නේ රාත්‍රි 9.35ට පමණය.

සංචාරකයන්ට වඩා උසස් සහ ගුණාත්මක සේවයක් ලබාදීමේ අරමුණින් මෙම දුම්රියේ භෝජනාගාරය ද තරු 3 සහ 4 පන්තියේ ආයතනයට ටෙන්ඩර ලබා දීමට සැලසුම් කර ඇති බව දුම්රිය දෙපාර්තමේන්තුව පැවසීය. සංචාරක පැකේජ සහිතව මගීන් 350 කට අසුන් ගෙන ගමන් කළ හැකි මෙම දුම්රිය වායු සමීකරණ ආසනයක් සඳහා ප්‍රවේශපත්‍ර මිල වශයෙන් රුපියල් 5,000ක් ද වායුසමීකරණ නොකළ මැදිරි ආසනයක් සඳහා රුපියල් 4,000ක් ද අය කරයි. යම් සංචාරකයකු පැමිණි එම දුම්රියේම ආපසු මහනුවර හෝ නවත්වනු ලබන දුම්රිය ස්ථානයක් වෙත යන්නේ නම් ඒ සඳහා ගෙවිය යුතු වන්නේ පෙර ගෙවූ මුදලට අමතරව රුපියල් 1,000ක් පමණි.

මේ පිළිබඳව අදහස් දක්වමින් දුම්රිය සාමාන්‍යාධිකාරි ධම්මික ජයසුන්දර පැවසුවේ දුම්රිය ගමනාගමන ඇමති දිලුම් අමුණුගමගේ සංකල්පයක් මත ඌව පළාත් සංචාරක අමාත්‍යාංශය හා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හා මෙම විශේෂ සංචාරක දුම්රිය ධාවනය ආරම්භ කළ බවයි. මහනුවර- ඇල්ල දුම්රිය මාර්ගය ලෝකයේ ආශ්චර්යමත් දුම්රිය ගමන් මාර්ගවලින් දහයෙන් එකක් බව හඳුනාගෙන තිබුණද සංචාරකයන්ට සාමාන්‍ය දුම්රියකින් මෙම ආශ්චර්යය විඳගැනීමට පසුගිය කාලයේදී නොතිබූ අවස්ථාව මෙම විශේෂ දුම්රිය ගමන තුළින් දැන් හිමිවී ඇති බවත් ඔහු පැවසීය. මෙය සංචාරකයන් සඳහාම වෙන්වූ ඔවුන් වෙනුවෙන්ම කැපවූ දුම්රියක් බවද දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

ප්‍රවාහන අමාත්‍ය දිලුම් අමුණුගම සඳහන් කළේ දුම්රිය ගමන් හරහා සංචාරකයන් ප්‍රවර්ධනය කරන්නේ කෙසේද? විදේශ මුදල් උපයන්නේ කෙසේද යන්න සොයා බලා මෙම අදහස ක්‍රියාත්මක කළ බවයි. ඇල්ල - මහනුවර මාර්ගය පමණක් නොව ඉදිරියේදී හික්කඩුව හා යාපනයට ද මෙවැනි දුම්රිය ගමන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව ද ඔහු පැවසීය. මෙම විශේෂ දුම්රිය සේවාව පිළිබඳව අදහස් දක්වමින් මහනුවර ප්‍රධාන දුම්රිය ස්ථානාධිපති ආර්. එම්. ජී. රත්නායක පැවසුවේ මෙම විශේෂ සංචාරක දුම්රිය සඳහා ප්‍රවේශපත්‍ර මෙම දුම්රිය නවත්වන සෑම දුම්රිය ස්ථානයකින්ම ලබාගත හැකි බවයි. පේරාදෙණිය හන්දිය, ගෙලිඔය, නාවලපිටිය, හැටන්, ග්‍රේට් වෙස්ට(ර්)න්, නානුඔය, පට්ටිපොල, ඔහිය, ඉදල්ගස්හින්න, හපුතලේ, ඇල්ල සහ දෙමෝදර එම දුම්රිය ස්ථානයි. ඒ අනුව ඔබ මෙම දුම්රියේ ගමන් කිරීමට බලාපොරොත්තු වන දින සිට දින 30ක් ඇතුළත ප්‍රවේශ පත්‍ර වෙන්කර ගත හැකිය. වෙනත් දුම්රිය ප්‍රවේශ පත්‍රයකින් හෝ රජයේ සේවකයන්ට හිමි අවසර පත්‍ර මඟින් මෙහි ගමන් කළ නොහැකි බව ද මහනුවර ප්‍රධාන දුම්රිය ස්ථානාධිපති ආර්. එම්. ජී. රත්නායක පැවසීය.

උඩරට දුම්රිය මාර්ගයේ සුන්දර විනෝද චාරිකාවක් යෑමට මෙන්ම පාසල් දූ දරුවන්ට අපේ රටට ආවේණික උරුමයන් පිළිබඳ කරුණු රැසක් ඉගෙන ගත හැකි අවස්ථාවක් ලෙස මෙම විශේෂ සංචාරක දුම්රිය ගමන හඳුන්වා දිය හැකිය.

**ඡායාරූප- නිහාල් ජයවර්ධන, මධ්‍යම පළාත් සමූහ**

**අතරමඟදී සුන්දර ස්ථාන 9ක් දැකබලා ගත හැකියි**


ශ්‍රී පාද කන්ද


අංක 18 බිංගෙය

**ගමන් ආරම්භය දිනපතා පෙරවරු 7ට මහනුවරින්**


දෙමෝදර ආරුක්කු 9 පාලම

## මහනුවර- ඇල්ල විශේෂ සංචාරක දුම්රිය

| ගමන් ආරම්භය | ගමනාන්තය | ප්‍රවේශ පත්‍ර මිල | | නැරඹුම් ස්ථාන |
|---|---|---|---|---|
| | | පළමු පන්තිය | දෙවැනි පන්තිය | |
| මහනුවර | නානුඔය | රු. 2000/= | රු. 1500/= | • හොස්ටේල් දියඇල්ල<br>• ශ්‍රී පාද කන්ද<br>• ශාන්ත ක්ලෙයාර් දියඇල්ල<br>• එල්ජින් දියඇල්ල<br>• සමිට් ලෙවල්<br>• අංක 18 බිංගෙය<br>• සුළං කපොල්ල ඉදල්ගස්හින්න - හපුතලේ)<br>• කිතල් ඇල්ල<br>• ආරුක්කු 9 පාලම |
| මහනුවර | දෙමෝදර/ඇල්ල | රු. 5000/= | රු. 4000/= | |
| නානුඔය | දෙමෝදර/ඇල්ල | රු. 4000/= | රු. 3000/= | |
| ඇල්ල | නානුඔය | රු. 2000/= | රු. 1000/= | |
| ඇල්ල | මහනුවර | රු. 3000/= | රු. 1000/= | |
| නානුඔය | මහනුවර | රු. 1000/= | රු. 1000/= | |

- දිනපතා පෙරවරු 7.00ට මහනුවරින් ගමන් ආරම්භ කර පස්වරු 2.45ට දෙමෝදරට ළඟා වේ.
- පස්වරු 3.45ට දෙමෝදරින් පිටත් වී පස්වරු 9.35ට මහනුවරට ළඟාවේ.


විමසීම්: මොබිටෙල් දුරකථන අංක 365
ඩයලොග් දුරකථන අංක 444
මහනුවර දුම්රිය ස්ථානය - 081 2222271


කිතල් ඇල්ල දියඇල්ල


ශාන්ත ක්ලෙයාර් දියඇල්ල


එල්ජින් දියඇල්ල

සිළුමිණ
දීපානි
වෂී 2022ක් වූ මාර්තු මස 13 වැනිදා ඉරිදා



# කවියෙන් ජාතියක් අවදි කර තුන් කල් නම රැන්දූ යතිවරයාණෝ

## ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි

● සුමුදු චතුරාණී ජයවර්ධන

**කවියෙකි. දුකේදී සිනාසෙන්නටත්, සතුටේදී දෑසේ කඳුළු පුරවා ගන්නටත්, ජාත්‍යාලයෙන් ඔද වැඩෙන්නටත් කියා දෙන්නෝ කවියෝ ය. නව හා විවිධ රටාහි බස හසුරුවන්නට කවියාට ඇති අයිතිය අනුලංඝනීය ය. බස අවියක් කර ඒ අවියෙන් පෙළහර පාන කවීහු වෙති. ඔවුහු සිය යුතුකම් හා වගකීම් ගැන වගවීමෙන් තුන්කල් දැක වදන් පෙළහර පාති. කොළඹ යුගයේ පළමු පරපුර නියෝජනය කරමින් කවියෙන් ජාතියක් අවදි කර තුන් කල් නම රැන්දූ යතිවරයකු වෙයි. ඒ ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ය.**

කවි අවියෙන් සිංහල ජාතිය අවදි කළ උන් වහන්සේ විදේශිකයකු විය. ටිබෙටය හෝ ලෙප්චා ජාතිය වෙනුවට උන්වහන්සේ තෝරා ගන්නේ සිංහල ජාතිය ය. ලෝක ඉතිහාසයේ පවා එවැනි අවස්ථා හමු වෙන්නේ කලාතුරකිනි. ලෝඩ් බයිරන් ග්‍රීසිය ගැන ද ෂෙලී අයර්ලන්තය ගැන ද ලියූ කවි මේ අතරෙන් නිදසුන් දෙකක් පමණි. මේ සියල්ලන් අතර ද ඇස්. මහින්ද හිමිගේ වෙනසක් තිබේ. එය උන්වහන්සේගේ කවි මඟ පිරික්සන්නකුට පැහැදිලි වන්නකි. කිසිදු දේශප්‍රේමියකුට සිය සිතේ පැන නගින අපරිමිත ජාත්‍යාලය ලියන්නට හෝ සිතන්නටවත් උන් වහන්සේ කිසිවක් ඉතිරි නොකිරීම ඒ විශේෂත්වයයි.


**උස් තැන් කපා ඇද මිටි තැන් පිරවී ම**
**උස් මිටි දෙකම වඳ කොට සම කර ලී ම**
**උස් මනු දමකි! ගතියකි! යන පැවසී ම**
**උස් හඬ නඟා පතුරව්! සැම තැන දී ම**


මේ කවිය එන්නේ නිදහසේ දැහැනේ ය. මුළු ජීවිතයෙන් ම ගත් උපහැරණ ඔස්සේ නිවට නොවීමේ පාඩම උන් වහන්සේ ජාතියට කියන්නේ සමහර විට අප කවියෙන් බලාපොරොත්තු වෙන සුමුදු බවෙන් තොරව ය. නැළවෙන පද වෙනුවට එහි ඇත්තේ තර්ජනාත්මක බවෙකි; බල කිරීමෙකි. සමහර විචාරකයන් කියන්නේ කවියෙන් ඔවදන් දීම නොකළ යුතු බවෙකි. එහෙත් කවියා හෝ සමස්ත නිර්මාණකරුවා තමා ජීවත් වෙන සමාජයෙන් නිරන්තර අනුප්‍රාණය ලබන්නෙකි. තම පයට පෑගෙන වැලි කැටයේ සිට ගත පිසදා හමන සුළඟ දක්වා දැනීමෙන් යුතු සාහිත්‍යයක් අවැසි කාලවකවානු තිබේ. මහින්ද හිමි ගත කරන්නේ සමාජය විසින් එවන් අවදි කිරීමකට අනිවාර්යයෙන් ලක් විය යුතු සමයෙකි. ආධ්‍යාත්මික විමුක්තිය සොයන භික්ෂුව ස්වකීය මවුබිම හමුවේ වන අර්බුද හඳුනාගනිමින් කළ යුතු මෙහෙවර ආධ්‍යාත්මික විමුක්තියට පමණක් දෙවැනි වන බව උන්වහන්සේ ප්‍රකට කළහ. ඒ වෙනුවෙන් ගැළපෙන දිවිපෙවෙතක් ද ගත කළ උන් වහන්සේ සිය යුතුකම ඉටු කිරීමේ පරම ආධ්‍යාශයෙන් යුතු වූයේ භික්ෂුවකගේ සාමාන්‍ය චර්යාව පිළිබඳ අනවබෝධයෙන් නොවන බව එකල බෞද්ධාගමිකයෝ දැන සිටියහ. රට ජාතිය වෙනුවෙන් කළ කැපවීම අබියස අලගු තබන්නටවත් බැරි නායක ගිහියන්ට උන්වහන්සේ ප්‍රදීපස්ථම්භයක් සේ මඟ පෙන්වන්නේ ඒ නිසා ය.


සිංහල ව්‍යාකරණය නැංවීමට ජර්මනියෙන් ගයිගර් පඬිවරයාත්, බුදු දහම යළි ස්ථාපිත කිරීමට ඇමරිකන් ජාතික ඕල්කට්තුමාත් පැමිණියා සේ ඒ යුගයේ නිද්‍රාගත ව සිටි සිංහල ජාතිය යළි අවදි කිරීමට මූලික වුණු යතිවර කවියා මහින්ද හිමියන් ය. නිදහස ලැබීමේ කග පතක් වන් වූ කවි, ජාතික හා ආගමික පුනර්ජීවනය ඇතිකර ජනමන අභීතවත් කරන්නට අවැසි සහකම්පනය ඇති කළේ ය. සිංහලයන් ගැන සිංහලයන්ට නොතිබි කැක්කුමක් තිබුණේ උපතින් සිංහලයකු නොවූ උන්වහන්සේට ය. උන්වහන්සේගේ පිළිරුව හදන්නට මූලික වන්නේ මුස්ලිම් ජාතිකයකු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී වන ඉම්තියාස් බාකිර් මකාර් ය. නිවැරදි දේ කරන්නට ජාතිවාදී ලෙස ජාතිගැති නොවීමේ පාඩම මේ සියල්ලෙන් ම අපට පෙනෙන්නේ ය.

පෞද්ගලික පැතුමකට එහා ගිය පොදු සමාජීය පැතුමකින් සිය ජීවිතය හැඩගන්වා ගැනීම හැමෝට ම කළ හැකි කාරණයක් නොවේ. එනයින් බලන කල ඇස්. මහින්ද හිමියන්ගේ පරම ආධ්‍යාශය වූයේ පොදු ජනමාමක අභිලාෂයකි. එය හුදු ජාත්‍යාලය පමණක් යැයි ලඝු කළ හැක්කක් ද නොවේ. දේශය, දරු කැල මෙන් ම නිවට නැති සමාජයක වන බලාපොරොත්තුවේ ගිනිසිළු ද එහි විණි. දැක්මේ පුළුල් බව විසින් උන්වහන්සේගේ චින්තනය තියුණු කළේ ය. සරල හා අවධාරණාත්මක බස් වහර ඊට එක්කළ ආලෝකය අතිමහත් ය. උන්වහන්සේ සුලලිත බස වෙනුවට තෝරා ගත්තේ තියුණු උපහාසාත්මක බසක් වුව ද එය මනරංජනීය බසක් වූ බව වැටහෙන්නේ ජාතික සටන එයින් ලද අනුප්‍රාණය නිසා ය. හිස ආදරයෙන් අතගා මොළයට ම දැනෙන්නට අවැසි වෙලාවට අනින ටොක්කක් සේ ඒ කවි බස මුවහත් ය.

19- 20 සියවස් පුරා නැඟී ආ අධිරාජ්‍ය විරෝධි අරගලය වෙනුවෙන් ඇස්. මහින්ද හිමිගේ දායකත්වය කවියට පමණක් ලඝු



කරන්නේ නම් එය අභාග්‍යයකි. අනගාරික ධර්මපාලතුමන්ගෙන් ලද ජාතික නිදහස් චින්තනය මත පාදක වෙමින් උගතුන්ගේත්, සමාජ ක්‍රියාකාරීන්ගේත් සහායෙන් ඉදිරියට ආ ඒ නිදහස් අරගලයේ සක්‍රිය ක්‍රියාකාරීත්වයක මහින්ද හිමියෝ ද සිටියහ. සකල විධ සිංහල ජනයා යහපත් බවත්, සියලු සිංහල ජනයා රැකගත යුතු බවත් මහින්ද හිමියෝ කිසිතැනක පවසා ඇති බවක් නොපෙනේ. උන්වහන්සේට තිබුණේ පොදු චින්තාවකි; පොදු රැක ගැන්මකි. නිදහස් දැහැනේ දී මෙන්ම නිදහස් මන්ත්‍රයේදී ද මහින්ද හිමියෝ කියන්නේ සිංහලයා වුව පන්ති සතුරකු නම් විනාශ කළ යුතු බවෙකි.

**අපේ රටට පිළිමල් වන සතුරු මු ළ**
**අපේ අයම නම් බිඳිනෙමු උන්ගෙ බ ල**
**අපේ මුතුන් මිත්තන් මළ සොහොන් ව ල**
**පිජේ එවිට ජාතික අබිමාන ම ල**

දැඩි වාග් කාව්‍ය ප්‍රහාරයෙන් යුතුව ජාතිය වෙනුවෙන් පෙනී සිටින නිදහස් මන්ත්‍රය කාව්‍ය සංග්‍රහයේ එන ඇතැම් කවි සනාථ කරන්නේ නිදහස් සටනට බාධා කරන නායකයන් වුව මරා දැමීමට පසුබට නොවිය යුතු බවෙකි. සිය එක ම අරමුණ නිදහස් සටනට උර දීම යන්න මේ සියල්ල ඔස්සේ පෙනී යන්නකි.

**ජාතික වැඩට මරුඟුල් අටවමින් සි ට**
**නායක කමට දඟලන නිවටයන් හ ට**
**මේ ල ක එකම අමු සොහොනක් කරන්න ට**
**සාතික වෙන්න තරුණය! අද පටන් කො ට**

සාමාන්‍ය දුප්පත් ගැමියා ගේ සිට මධ්‍යස්ථ නාගරික මධ්‍යම පන්තිය දක්වා ජනතාව නිදහස් සටන වෙනුවෙන් පන්ති බේදයකින් තොර ව පෙළ ගැසිය යුතු බව උන්වහන්සේගේ කාව්‍යකරණයේ මුඛ්‍ය පරමාර්ථයයි. කවියා පෝරක හතක නොව දහසක වුව නගින්නට කැමැත්ත පළ කරන්නේ ධනපති පන්තියේ අයෝමය දෙපා යට මිරිකී සිටින සමස්ත දුගී ජනයාගේ හෙට දවසක් වෙනුවෙනි. එසේ කියන්නේ ද ජාතිවාදී ප්‍රවේශයකින් නොවීම විශේෂත්වයකි. දිනකට වරක් වත් බුදිනට බත් උලක් නැත්තේ සිංහල දුගියනට පමණක් නොවේ. එනිසා උන්වහන්සේ මේ කියන්නේ සිංහල, දෙමළ හා මුස්ලිම් ඕනෑම අයකුගේ සාගින්දර ගැන මිස සිංහලුන්ගේ පමණක් සාගින්දර ගැන නොවේ.

**කාමුක කුහක ලොකු අයගේ නපුරු කමින්**
**බාගෙට මැරී ඉන්නා දුගියාගේ නමින්**
**මාරක විපත් හැම එකට ම මුහුණ දෙමින්**
**පෝර ක හතක නො ව දහසක නගිමි පෙමින්**

ඇස්. මහින්ද හිමිගේ අප්‍රමාණ උදහසට ලක් වන්නේ ජාතික පුත්‍රයන් සේ පෙනී සිටිමින් හා ජනයාට මර උගුල් අටවමින් සබා මැද වැජඹෙන ජනයා ය. දිළිඳු ජනයා බඩවියත සරිකර ගන්නා ගොඩ- මඩ ඉඩම්, වංචාවෙන් අයිති කරගනිමින් දැඩි ආත්මාර්ථයෙන් යුතුව තමන් හා තම පවුල ගැන පමණක් සිතන ජනයා, බත් උලක් නැතිව බඩසයින් දැවෙන ජනයා සිටියදී ප්‍රීති උත්සව පවත්වන ජනයා මහින්ද හිමිගේ කාව්‍ය ප්‍රහාරයට ලක්වූවෝ වෙති. ජාතිවාදී ලේබලයෙන් වහන්නට උත්සාහ කරන බොහෝ දැ අතර උන්වහන්සේ මේ කවි අවියෙන් සටන් වැදුණේ සියලු ජාතීන් අතර ඇති පොදු සාම්‍යයක් වෙනුවෙනි. ඒ පීඩිතත්වයයි. එයට ජාති ආගම් කුලබේද නැත. ඇත්තේ එක ම දෙයකි. ඒ පීඩිත වීම පමණකි. දුප්පතුන්ගේ හෙවණැල්ලේ පවා ඇද දකින පරපුරක් වෙනුවට උන් වහන්සේ පැතුවේ නිදහස් රටක නිදහස් දැහැනකි; නිදහස් මන්ත්‍රයකි. නිදහසේ මන්ත්‍රයක් හදා කුඩා, තරුණ, වැඩිමල් සියල්ලෝ එහි එල ලබන්නෝ බවට පත් කිරීම එහි අග්‍රඵලය වෙති.



**තණකොළ මැරෙති මිනිහා පා තබන තැන**
**යන එක බසකි මහ කවියන් අතර එන**
**එනමුත් සමිඳ ඔබ වැනියන් සිටින තැන**
**රන් මිණිමුතු ද එයි පොළොවෙන් උඩට පැන**

සිරිලාල් කොඩිකාර ලියූ මහල්ලකුගේ හැල්ල කෘතියේ හරි අපූරු කතාවක් ඇස්. මහින්ද හිමි ගැන ලියා තිබිණි. එහි සඳහන් වන පරිද්දෙන් උන් වහන්සේ නිදහසේ දැහැන කවි ලියා අවසන ඒ අත්අකුරෙන් ලියූ කවි මහමඟ තැනින් තැන දමා ඇත්තේ ඒ කොළ අහුලාගෙන කියවා ජනතාව දැනුම්වත් වේ යැයි අපේක්ෂාවෙනි. ජනතාවගේ අධිරාජ්‍යවාදී හැඟුම් උත්සන්න කරවීම වෙනුවෙන් උන්වහන්සේ කැපවී ඇත්තේ එපරිද්දෙනි.

ලංකාවේ නිදහස් සටනට සමගාමී ව කවිය අවියක් කරගත් ඉන්දීය කවීහු ද මේ සමයේ සිටියහ. මෙහි පැහැදිලි ව පෙනෙන කාව්‍ය මාර්ග දෙකකි. එක් කොටසක් අවිහිංසාවාදී මාර්ගයෙන් නිදහස කරා යෑම අරමුණු කළ අතර තවත් පිරිසක් සන්නද්ධ විප්ලවයක් වෙනුවෙන් කවි ලියූහ. ලාංකේය කවීන් අතර ද මේ දෙපිරිස ම සිටියහ. ආවේගවත් ව ලියූ ශ්‍රී ලාංකේය කවීන් අතර මහින්ද හිමියන්ට ප්‍රමුඛත්වය ලැබේ. යම් සීමා මැද වුවත් සුභාෂ් චන්ද්‍රබෝස්ගේ උද්වේගකර බුද්ධි දැක්ම, රැඩිකල් දේශපාලන ක්‍රියාකාරීත්වය, සරෝජිනි නායිඩුගේ උද්යෝගීමත් රැඩිකල් කාව්‍ය ආමන්ත්‍රණය, මහත්මා ගාන්ධිගේ නායකත්වය, තාගෝර්ගේ ප්‍රඥාවන්ත පරිණත සටන්කාමී ජීවගුණය හා සමානව බැලූ කල මෙරට නිදහස් ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට අදාළ ව වැඩිදුරටත් උත්තේජනාත්මක හඬක අවශ්‍යතාව මහින්ද හිමියන්ට දැනෙන්නට ඇත. මෙකී ජාතික කර්තව්‍ය කවි ලිවීමෙන් නතර නොකළ උන්වහන්සේ ගම හා පන්සල එක් කරමින් ගොඩනැගූ සමාජ ක්‍රියාකාරීත්වය ද අප අවධානයට ලක් කළ යුතු ව ඇත. එක් අතකින් සංඝාවාස, ධර්මශාලා ගොඩනැඟීම ආදියෙන් පන්සල ශක්තිමත් කරන අතර ම තවත් පැත්තකින් දහම් පාසැල්, ඉංග්‍රීසි පාඨශාලා ආදියෙන් නැගී එමින් පැවැති බෞද්ධ ප්‍රබෝධයේ අවශ්‍යතා සම්පූර්ණ කර දීමක් ද සිදු කරන්නට ඇත්තේ එබැවිනි. මේ පිළිබඳ මනා විස්තරයක් මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින් රචිත 'මහින්ද ප්‍රබන්ධ' කෘතියේ සඳහන් ය. ගවමස් විරෝධය, අමද්‍යප ව්‍යාපාරය හා බෞද්ධ සංස්කෘතික නැගී සිටීම් ගැන එහි සඳහන් ය.

"1951 දක්වා පුරා වසර 15 ක් එහි මැවිසූ (පානදුරේ මහ බෙල්ලන ශ්‍රී සුධර්මාරාමය) මහින්ද හිමියන් පන්සල හා ගම සම්බන්ධ විශාල වැඩ කොටසක් ඉටු කර ඇති බව පෙනේ. සුධර්මාරාමයේ නව සංඝාවාසය, ධර්ම ශාලාව, ප්‍රාකාරය, නව ලංකා දහම් පාසල, ඉංග්‍රීසි පාඨශාලාව ඉන් කිහිපයකි. හතර පේරුවේ ගම් වලින් බෙහෙත් එක් රැස් කොට නොමිලේ බෙදා දෙන පිං බෙහෙත් ශාලාවක් පිහිටුවීම, ගව මස් කෑමෙන් ගම්මුන් වළක්වාලීම සඳහා සංවිධානය කළ ගව පෙරහැර, එල්. ටී. පී. මංජු ශ්‍රීගේ සූවිසි විවරණ සිතුවම් සහිතව, පුරා මාසයක් පැවැත්වූ සූවිසි විවරණ පූජාව හා ගිනි මල් පූජාව, විනයවර්ධනකාරයන් මර්දනය කිරීම සඳහා කළ පෙරහැර ගම්මුන්ට තවමත් මතක තිබේ. අමද්‍යප ව්‍යාපාරයේලා පුරෝගාමීව කටයුතු කළ මුන් වහන්සේ පානදුර තොටමුණේ උපසම්පදා භික්ෂු මණ්ඩලයේ ලේඛකාධිකාර ධුරය ද දැරූහ."

ඓතිහාසික කාර්යභාරයක් මුළුමනින් ම තමා පිට පටවාගත් යතිවර ලකුණක් ලෙස ඇස්. මහින්ද හිමියන් ඉතිහාසගත වන්නේ ඒ ඇයුරෙනි.

වැඩිහිටියන් වෙනුවෙන් තියුණු කස පහරවල් වැනි වදන් භාවිත කරන මහින්ද හිමියන් දරුවන් වෙනුවෙන් මවන්නේ චමත්කාර වදන් සිත්තමකි. දරුවන්ගේ ළමා ලෝකය එකලු කරන ඒ කවි වදන් වැඩිහිටි මනස ද සිය ළමා කාලයට කැඳවාගෙන යන්නේ කවිය ඔසුවක් කරමිනි. ළමා කවිය හැඩ කළ ආනන්ද රාජකරුණා, කුමාරතුංග මුනිදාස වැනි කවීන්ගේ කවීත්වයට නව හැඩයක් හා බලයක් එක් කළෝ මහින්ද හිමියෝ ය.

**මොනවද මුත්තේ මොකද කරන්නේ**
**මොකටද උඹ ඔය බිම හාරන්නේ**
**උඹටත් ළමයෝ නොපෙනේ නොසිතම්**
**අඹ ඇටයක් සිටුවන්නට හාරම්**
**දුක සේ සිටුවා අඹ ඇටයක් අද**
**එක අඹයක් වත් කන්ට ලැබේවිද**
**මම ළමයෝ මින් අඹයක් නොපතම්**
**යුතුකම පමණක් ඉටු කොට තබනෙම්.....**

සිය යුතුකම හා වගකීම කෙරෙහි වග වෙන පරම්පරාවක් නිර්මාණය කිරීම උන් වහන්සේගේ සිය වගකීමක් කර ගත්තේ එපරිද්දෙනි. වැඩිහිටියන් හා දරුවන් අතර වන සම්බන්ධය චමත්කාර කරන්නට මෙවැනි පද සමත් ය. දාර්ශනික හා සරල කවි අමතන්නේ දරුවන්ගේ ආත්මය ය. පරිසරයේ සුන්දරත්වයෙන් ළමා මනස ආලෝකවත් කරන්නට උන්වහන්සේ විරචිත වදන් හි සෞන්දර්ය හා ඒ පරිසරය දරුවන්ගේ මනස ඉදිරියේ මැවෙයි.

**සමන් පිච්ච මල් ඉහිරුණු**
**නිල් තණකොළ පිට්ටනියක්**
**වගෙයි අහස අන්න බලනු**
**කොච්චර ලස්සන ද රෑට**
**බකමූණෝ පියාඹති**
**අනික් කුරුල්ලෝ නිදති**
**බෝ අතුවල එල්ලීගෙන**
**මාවවුලෝ කෑගසති....**

ළමා කවි හා ගී රචනයේ උන්වහන්සේ දක්වන ලද්දේ විස්මයාවහ නිර්මාණ චාතුර්යයකි. දරුවන්ගේ ලෝකයට සාහිත්‍ය රස පෝෂණය ද, ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය ද, ඔවුන් සිතෙහි කුඩා අවදියෙහි සිට ම ජාතිකානුරාගය ඇති කිරීම ද යනාදී බොහෝ මාවත් ඒ කවි පද අතර සැඟවී තිබේ. මහින්ද හිමි විසින් රචිත ළමා පද්‍ය විසිනවය ම මාධූර්ය බසකින් හා දරුවන් වසඟ කරන ලාලාත්‍යවත් රිද්මයකින් යුතු විණි. මේ කාව්‍යාවේශයට කුමරතුඟු මුනිදසුන්ගෙන් බිහි වූ ළමා ගී කවි සාහිත්‍ය පෙර මඟ ලකුණු සපයන්නට ද ඇත.

මේ සියලු දෑ කරන්නට උන් වහන්සේට ලැබුණු කාලය ඉතා ක්ෂුද්‍ර වූවකි. වසර 38 ක් යනු කෙටි කලකි. ජීවිතයෙන් ගත් කල නාඹර වයසකි. එයින් ද බස උගෙන කවි ප්‍රතිභාව මතුකර ගැනීමට තවත් වසර 10ක් වත් ගත වුයේ නම්, සියලු කවි ගී ලියැවී ඇත්තේ වසර 28ක් වැනි කෙටි කාලයක් ඇතුළත විය යුතුය. කාව්‍ය ප්‍රබන්ධ කලාව උන්වහන්සේ සිත වැඩෙන්නේ දොඩන්දුවේ ශ්‍රී ජිනරතන නම් වූ හිමි නමකගේ ඇසුරෙන් බව කියැවේ. උන්වහන්සේ 1934-36 කාලය ඇතුළත කොළඹ මරදාන ආනන්ද විද්‍යාලයේ සිංහල, පාලි හා බුද්ධ ධර්මය ආදී විෂයයන් ඉගැන්වූ ගුරුවරයා ය. පාණදුර මහබෙල්ලන ශ්‍රී සුධර්මාරාමය නිත්‍ය සංඝාවාසය කොට ගත්තේ ද 1936 දී ය. මේ කාල පරාස බලන කල ඇස්. මහින්ද හිමියන්ට මේ සා විසල් කාව්‍ය ප්‍රමාණයක් රචනා කරන්නට ලැබුණු කාලය වසර 15ක් පමණ වන්නට ඇත. ආශ්චර්යයක් සේ පෙනෙන බොහෝ දෑ නිර්මාණය වෙන්නට බලපෑ හේතු සාධක ද විස්මයජනක ය.

ඇස්. මහින්ද හිමි ලියූ මේ කවියේ අරුත වඩාත් ම ගැළපෙන්නේ රට, ජාතිය හා ආගම වෙනුවෙන් කළ මෙහෙවර වෙනුවෙන් උන් වහන්සේ වෙනුවෙන් ම බැව් අවසන ලියා තබමි.

**තණකොළ මැරෙති මිනිහා පා තබන තැන**
**යන එක බසකි මහ කවියන් අතර එන**
**එනමුත් සමිඳ ඔබ වැනියන් සිටින තැන**
**රන් මිණිමුතු ද එයි පොළොවෙන් උඩට පැන**

### දිවිමඟ සටහන්

- උපත - 1901
- නම - එස්. කේ. තෂිනම්ගයල්
- භාවිත නාම - එස්. මහින්ද හිමි
- උපන් ස්ථානය - මධ්‍යම ආසියාවේ හිමාලය කඳුවැටියේ සීකිම් දේශයේ උතුරු සීමාවේ ටිබෙට්හි ගංටොක් නුවර
- පියා හා මව - තෂිනම්ගයල් කුඩා අවදියේ ඔවුන් මිය ගිය බව සඳහන් ය.
- සොහොයුරන් - තිදෙනෙකි. වැඩිමල් සොහොයුරා කල්කටා විශ්වවිද්‍යාලයෙහි ටිබෙට් භාෂාව පිළිබඳව කථිකාචාර්යවරයෙකි, දෙවැනි සොයුරා ටිබෙට් රජුගේ අගමැති ලෙස රාජ්‍ය පාලනයට එක් වී තිබේ. තුන්වන සොයුරු සීකිම් පුණ්නජි හිමි නමින් පැවිදිව කුඩා තෂිනම්ගල් හට රැකවරණ සපයා ඇත.
- ලංකාවට පැමිණියේ - 1912 වර්ෂයේදී
- වැඩවසා ඇත්තේ - දොඩම්දුවේ පොල්ගස්දූව ආරාමයේ
- අධ්‍යාපනය - මරදාන මාලිගාකන්ද විද්‍යොදය පිරිවෙන
- හැදෑරූ විෂයයන් - සිංහල, පාලි, සංස්කෘත ආදි භාෂාද බුදුදහම හා නක්‍ෂත්‍රය
- පැවිදි දිවියට ඇතුළත් වෙන්නේ - දොඩංදූව ශෛලබිම්බාරාමයේදී ටිබෙට් එස්. මහින්ද හිමි නමින් පැවිදි වෙයි
- 1930 ජුනි 16 - ශ්‍යාමෝපාලි මහා නිකායෙහි නැවත පැවිදි වීම
- 1934 - 1936- කොළඹ ආනන්ද විද්‍යාලයෙහි සිංහල, පාලි හා බුද්ධ ධර්මය උගන්වයි
- රචනා කළ පොත් සංඛ්‍යාව - 40 කි
- පළමු පොත - 'ඔවා මුතු දම'
- වඩාත් ප්‍රසිද්ධියට පත් වූ කාව්‍ය සංග්‍රහ- නිදහසේ දැහැන,නිදහසේ මන්ත්‍රය, ජාතික තොටිල්ල, අද ලක් මවගේ පුත්තු, විදේශිකයකුගෙන් ලක් මවට නමස්කාරයක්, සිංහල ජාතිය, ලංකා මාතා, නිදහස
- අපවත් වීම - 1951 මාර්තු 16




**ප්‍රවීණ, ආධුනික ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට තැපෑලෙන් පමණක් යොමු කළ යුතු වේ. කවි සිළුමිණ, ලේක්හවුස් - කොළඹ 10. දුරකථනය 011 2429265**

## තාත්තාගේ නික්මයාම

දහවල රය එකක් ම ගෙන හිසට
සතුට කඳුළ
එකක් ම ගෙන හදවතට
බර අඩි තබමින  සීරුවට පිය මැන

පැතුම් පොදි ගෙන
දරු ජය දකිනු රිසින
දරුවන්ගේ දරු සුරකින
නෙක කතා පොත පතින
තුරුලුව තුරුලු කරගෙන
සෙනෙහසේ අරුමය කියාදුන

ඉල්මහේ සඳ සැඟ වුණ
තරු හඬා සෝ බරින
පවන් රොද සොවී හඬින
සීත පිනි තෙමු කඳුළින
කියා නොකියා සැදෑ අඳුරින
තාත්තා සමුගෙන ගිය දුරින

බෙහෙත් නොපතා දරුගත ඇසුර
පැතුම සැපත එකම විය අවසන
කලින්ම නොකියා සංසාර ගමන
නෙත කඳුළු දෙනවා
සිහිකර නෙතින

**ජේ. එච්. සමන් අතුල කුමාර**

## කමතේදී

රැන් රැන් රැන් පිටින් කුඹුරට   වදිමින
කරල් නවා ඇට ගලවයි තුඩ තුඩ   තබමින
පඹයට මෙන් සොකඩයටත් ඔච්චං   කරමින
වී කුරුල්ලො පැහුණු ගොයම පාළුකරයි දින දින

කුරුණි දෙකයි වී වැපුරුවෙ මේ මහ   කන්නෙම
ඒකත් වැනසුනොත් නුඹල කන්නෙද කොහොම
පුතේ නුඹ ගිහිං රැක පං දවසෙම   ගොයම
මල්ලි එවන්නම් තනියට හෙට සිට   පැලටම

හිංසාවක් නොකරම උන් පලවලා   හරින්න
ගොයම් නෙළන විට කොටසක් උන්ට   තියන්න
ලෙඩ ඇදටම නොවැටුණි නම් අප්පච්චි   එන්න
තිබුණය මේ සියලු දෙයම කරලත්   දෙන්න

ණයට ගත්ත බිත්තර වී වෙන් කරලම   ගන්න
කමතේදීම අයින් කරල ගම ගෙදරටම   යවන්න
ගණන් බලල ඉතිරිය අටුවට   අර ගන්න
ඒව අරපරෙස්සමට ගන්න අම්මට ද   කියන්න

**පස්සර උබයරත්න වනසිංහ**

## පිබිදෙන කවි සිත

හිරු රද නැගෙන සඳ තෙද පා සියලු   අත
පෙරදිග අහස රන් පියවිලි එළනු   ඇත
සියොතුන් ගයන ගී නැඟ තුරු සිරස   මත
රස හච්චලින් සපිරෙයි කවියෙකුගෙ   සිත

නොපණත් පණත් කළ සැවුලන් මොහොත කට
එම කිස නතර කොට සපැමිණ   ඉදිරි යට
අබිමානයෙන් ජය සක් හඬ   නගන විට
රසවත් හැඟුම් ඇතිවනු ඇත   කවිය කුට

අලුයම් උදාවෙදි පිබිදෙන   තඹර වන
සියොළඟ දොවා සීතල පිනි   වතුර ගෙන
පවනින් සැලෙන විට අසිරිය   වඩව මින
නිම් හිම් නොමැත අදහස් කවි   සිතට එන

තඹ වතුරක පැහැය ගෙන එන   දෙගොඩ
තලාඅරුණලු කිරණ පරිසරයම   පුබුදු
කළා
සුන්දර බවින් පිරිපුන් මෙම   දසුන බලා
ඉන්නට හැකිද කවියකු හට   නිහඬ වෙලා

ළා හිරු රැසින් මහ පොළවම දිලෙනු   දැක
ගොවියන් තමන් සතු දිවි ගනු පිණිස   රැක
පියවර නඟන විට ගොවි බිම්වලට   නෙක
මතුවෙයි කවි සිතක රසමත නැතිව   සැක

## ඇත් රජුනි

සසර පුරා පාරමී දම් සපුරාන
දළදා කරඬු දැරුමට පින් පිරුණාම
දහසක් සිත් සතන් කරුණාවෙන් සනහාන
දෙව්ලොව විමන් හැරුණද ඇත් රජිදාට

දළදා පුද බිමේ නුඹෙ රුව මැවේවි
දහසක් දෙනා හෙට දිනයෙත් පින් දේවි
කරඬුව දැරූ අබිමානය සිහිවේවි
බෝසත් ඇත් රජුන් නිවනින් සැනසේවි

**දිස්නා කුමාරි අල්විස්**

## සෙව්වන්දි

සිත කලඹන මලක් දුටුවම
දෙපාරක් බලනවා නෙත් හැර
නුඹේ සුසුවඳ කොහොම ඇතිවද
කියා බලනවා සිඹ නිරන්තර

අතේ ඇතැඟිලි දෙතට හිරකර
පෙත්ත අල්ලා සිලිඳු බව දැන
පාට ටික දැන් ඇඟිලි අතරට
ගෑවුණා දැයි බලති විගහට

ආදරය වුව සෙව්වන්දියකට
හැමත බලලා කිසිත් නැති කළ
බෙල්ල අඹරා හිමින් අරගෙන
ඔබා ගන්නවා මල්ල ඇතුළට

ගසක් වැනෙනවා හමන සුළඟට
ලස්සනක් නැහැ මලක් නැති කළ
තවත් අය හට රස විඳින්නට
තිබූ මල නැහැ රටට ගිය කල

**සිරිල් සෙනෙවිරත්න**

## නොහඳුනන ආදරේ

පන්හිඳ අද්දර ඉකි බිඳිනා
නොනිමි කවක අරුතක් සොයමින්
මුමුනන සුන්දර පද අහුරක් වී
නුඹ ඇවිදින් සිත් කවුළුව අසලට

නොකියම ඇවිදින් නොකියම සමුගත්
අවිහිංසක ඒ මුව අග හසරැලි
බෝ පත් අතරේ ලියැවුනු සඳසක
අකුරක පැටලී ගැළපුණු කවියකි

කිසිදා කිසිවකු නොදකින නො අසන
සිතවත් නොදන්න ඒ පද අතරින්
සැඟවී ගිය ඒ අරුතක් නොසොයන
එයයි නොහඳුනන ආදරේ

**සුජීවා අබේසිංහ**

## සෙවණැල්ලක්

මසිත සිර කළ
ගනාන්ධකාරය
සෙව්වෙමි...

සිතිවිලි ගඟ අවදි කර
මා හැර ගිය නුඹව
දිටිමි,
වැසුණු
දිග කළු කබාය,

ගං ඉවුර කෙළවර
ඉකිබිඳින
වැළපෙන
සිනාසෙන
පාට ගිලිහුණු
සිතිවිලි
සෙවණැල්ලක්...

**කීර්ති කපුවත්ත**



## නිවන

කවුළුවෙන් එහා
බොහෝ දන යනෙන මාවත
කොහි යන්නෙද
කොහි සිට එන්නෙද
කිසිවෙකුදු නොදනී

සංසාරයට
එතෙර මෙතෙර යන
කිසිදාක නොනවතින
ජීවිතේ මාවත

හද පෙළන දුක දරා
නිහඬවම සැරිසරන
නවාතැන් සොයන මාවත

අප හැමට මඟහසර
හෙළි කරන නිබඳවම
කතරකින් කතරකට
ඇදෙන මාවත

සොයා යමු
මේ හැම අතර
නිමාවන මාවත
දිගු සසර ගමන
කෙටි කරන මාවත

**නයන්ත ජගත් පුංචිහේවා**

## හිතවත් මරුට

මරුව ඔබ
දිනෙන් දින
සුන් කරයි
මිතුරු කවයේ අරය

ඉඩ නොදී තව තවත්
පාළුවේ තනිවෙන්න,
රැගෙන යනු
මැද තිතද,
ඉක්මණින්
අද හෙටම

**රවීන්ද්‍ර ජයනන්ද**

## අම්මා

සේරුවක් හුණ්ඩුවෙන්
අඩු නැතිව මැනගන්න
මිටෙන් මිට මොළවලා
මිටි හාල් රැස් කළා
අවැසි විට අරගන්න!

නොහැකි විය හැඳි මිටෙන්
නුවණ නුඹෙ මැන ගන්න
හද ගැස්ම ඇනි ඇනී
පිරිමැස්ම හුරු කළාට
මතු දියුණ ලැබ ගන්න!

**නිමාලි පෙරේරා**

## නිවනින් නිවේවා!

මහනුවරදි උපත ලැබ අට'නු වසරක්
ගෙව මින් කලා ලොව වී දිදුලන තරුවක්
තුන් කට්ටුවෙ ඉතිරිවී තිබූ තව පුරුකක්
ගැලවී වැටුනි සඳහට නෙතු අග කඳුළක්

උප ගුරුවරයකුගෙ සේවය මුල් වරට
ඉන්පසු සෝදුපත් කියවන්නකු ලෙසට
සිංහල බොදු පතට පත්තර මහ ගෙයට
සලසා තිබේ සේවා නිසි ලෙස දිගට

විහිළු තහළු විනෝද සමයට උරදී
දිවිමඟ සත වරුසයට ළංවන විටදී
සිය අඹ යහළුවන් ගිය මඟටම පැහැදී
සමුගති දැයෙන් ඔබ මුළු දැයට ම දුකදී

ප්‍රහසනයෙන් සනසා සිත් නිසි කලට
අවිහිංසකව දිවිමඟ සරසා දුරට
බංඩා නගරයට එන තෙක් පෙර ලෙසට
පාලම යටට වී සිටිනෙමු හෙට දිනට

ඇසි - දිසි දෙමඟින්ම දස්කම් කරන ලද
අවසන් මොහොත දක්වා සිටි නොවිඳ වද
සෙනෙහස, ආදරය කරුණා පිරුණ හද
හෙට දින සැරද ගුණතිලකයො නිවන මැද

**තෙප්පනාවේ ගුණවර්ධන**

## අහිමි පෙම

වැහි බිඳුවක් නොදුටු කතරක් වූ සිතට
මල් වැහි පොදක් වී ආවා නුඹ දිනක
ඉන්පසු දළු දමා වැඩි පෙම තුරු හිසක
පිපුණා පෙම් මලක් ළබැඳියෙ නුඹ නමට

ඇස් මානයේ පිපුණත් නුඹ ළඟ පාත
බැරිවුණි නෙළාගන්නට දිග මදි දැත
හිමිකර ගන්න නොලැබෙන මුත් කිසිදාක
දුර සිට බලා සැනසෙන්නෙමි හැමදාට

මට හිමි නැතත් හොඳ කෙනෙකුට හිමිවේවා
මට වැඩියෙන් සෙනේ ඔහුගෙන් හිමිවේවා
ලොව ඇති සියලු සම්පත් ඔබ සතුවේවා
මිතුරෙක් විලස මා ඉඳහිට සිහිවේවා

**ලීනා කුමාරි**

## කළුවර වේ පුරවර

මහලු වනවිට දවස
අඳුර ඒ
කුර ගගා හෙමිහිට
අන් හඬක් නැත
ඉස්මතුව ඒ
කාකයන් රළ නගන 'කා' හඬ

ඇදෙති දන කුහුඹුවන් සේ
කඩිනමින් ගම් බිම් බලා
හිස්ව යන නගරයේ තනියට
හරිති නෙත් තැන තැන
පහන් කණු

දෙතොල්, කම්මුල් උලා ලතුයෙන්
ඔමරි පානා රෑ පුරගනන්
හිඳී තැන තැන ගොදුරු සොයමින්
ගැට ගසන දිවියේ සවියකට

ගේ දොරක් නැති අහිංසකයින්
සොයයි අහුමුලු ගුල්ව ඉන්නට
හෙටත් මෙලෙසම යැ'යි සිතා
තුරුලු කොට හඟන වූ පැතුම්

**සමන් හේරත්**

## අවාරේ කොවුල් ගී

ගඩා ගෙඩි නොලදමුත්
කුසගින්නෙ තැවෙද්දිත්
කෝකිල කෝකිලාවෝ
පුරුද්දට විතරක්ද
ගී සිංදු ගයන්නෝ?...

**සෙනරත් තෙන්නකෝන්**

## උඳුවප්

සීගතුවට
මහලු සිතක
ඉපිද
පැඟිරි සිහිනයක්

**එම්. චන්ද්‍රපාල**

## කලකිරීම

නොමැත දිරියක් මවෙත
පලඳින්න පා වැසුම්
යළිත් ඔබ ඉදිරියේ
මගේ අයියණ්ඩියේ

දෙපා නොමැති ඔබ
මදෙස බැලූ සඳ
දැනුණා මහත් වූ අපුලක්
මට මා ගැනම

නෙක වර්ණ පාවහන්
පැලඳ උජාරුවෙන්
ඔබ මොබ යන
අයුරු සිහිව...

**අංජලී චන්දිමා සිල්වා**

## වීදියේ කඳුළු

ඉපිදී ලොවක කඳුළැලි විසකටු   රැඳුන
පිපි මල් සුවඳ සුවබර දිවි   නොහඳුනන
රූපියල් සත ලොවකි ඉදිරියටම   ඇදෙන
අපි වීදියේ අපි නම් තවම   එකතැන

සරණා සියොත් පිබිදී අරුණ   උදයට
පුරවර දනන් නික්මෙයි දින   මෙහෙවරට
කරදර අපට මෙන් නැත ඒ   කිසිවෙකුට
පරසතු නොවෙයි වදමල් සුවඳයි   අපට

නිතියෙන් පුදති දෙවියන් සුවඳැති   අහරින්
බැති ගී ගයති හිඳ පුද බිම් මිහිරි   සරින්
ඇති තැනටම වඩිති දෙවියෝ සපිරි වරින්
නැති බැරි අපට ඒ කවුරුත් හිඳිති   දුරින්

බසයක දුම්රියක බෙරහඬ සමඟ   යෙදී
රසවත් ගී ගයා කහවණු පිණිස   යදී
ඇස අහිමි යැයි යන කනවැල සමඟ   ඇදී
අසරණ වීදියේ අප උරුම   මෙපරිදී

කවදත් සරල යන මඟ නොනිමි   කරදර
සුව සම්පත් අහිමි දුක් සදිසි   මහමෙර
පවතියි ජීවිතය නැති බැරි අය   අතර
ලොව දිනු අය සිටිති වීදිය   මහගෙදර

**ශාරිකා කරුණාතිලක**

## හිමියනි

මට ජීවිතය දුන් මව්පියො   හැරුණාම
ශක්තිය වුණා ජීවිතයට   හැමදාම
මෙය කිය යුතුය ලෝකයට ම   ඉඳුරාම
ඔබ දෙවි කෙනෙකු වැනි සැමියෙකි හැමදාම

රට ජාතියට ගුණ දහමට ගරු   කරන
දිනු මවුබිමේ වැදූ මවගේ ගුණ   දකින
මා හා මගේ දරු පැටවුන් නිති   රකින
ශක්තිය ඔබයි මතු මතු අප හට   සිටින

අදටත් වඩා හෙට සුබ වේ යැයි   සිතමි
සිරි සුබ උපන් දිනයක් ඔබ හට   පතමි
පහනක් වෙමින් මා ඔබ පසු පසම   එමි
තිස්තුන් කෝටියක දෙවි පිහිට ම   පතමි

**තනුජා මහේෂිකා ගුලවිට**

## විදෙස් කවිය

## ඉන්ද්‍රබීලයක් සේ නැඟී සිටිමි

තිත්ත බොරු ඇත්ත සේ අමුණා
ඔබ මා ගැන ඉතිහාසයේ ලියනු ඇති..
කිලිටි බිමෙහි දමා පාගා
අපහාසයෙන් මා රිදවනු ඇති
එහෙත්..දූවිල්ලක් සේ මම නැඟී සිටිමි..
මගේ උදාරම් බව ඔබව රිදවයිද..
නුඹ කිමද උරණව..
මගේ ගෙ තුළ තෙල් ළිඳක් ඇති ලෙසින්
උදාරම්ව මා ඇවිදිනු දැකීමෙන්ද..
සඳු සේම ,හිරු සේම
නැගෙනා උදම් රළ සේම
මම නැඟී සිටිමි..
මා බිඳ වැටී සිටිනු
හිස නමාගෙන බිම බලාගෙන
හැලෙන කඳුළු බිඳ මෙන් උරිස් හලාගෙන
දුර්වලව හඬමින් සිටින
මා දකින්නටද ,ඔබට අවැසි...
මගේ දැඩි බවද ඔබව පෙළන්නේ..
මගේ ගෙයි පිටුපස මිදුලේ
රන් ආකරයක් ඇති තරමේ
ආඩම්බරයෙන් හිස ඔසවා සිටීමද
ඔබව රිදවන්නේ...
නුඹේ හී සර වන් වදන් මා විද හලද
නුඹේ බැල්මෙන් මා කපා කැබලි කළද
නුඹේ වෛරයේ විෂෙන් මා මරා දැමුවද
වා රැල්ලක් ලෙසින් මම නැඟී සිටිමි...
මගේ අනුරාගී බව ඔබ නොඉවසයිද
මා දෙපා එක් වන තැන
දියමන්තියක් ඇති සේ අභිමානයෙන්
නර්තනයේ යෙදෙනු දැකීම
ඔබේ නෙත් වල කටු අනියිද..
ඉතිහාසයේ අවමන් කඩමලු තුළින්
මම නැඟී සිටිමි
නිදන්ගත වේදනාවන් පරයා
මම නැඟී සිටිමි
මම කළු සයුරක්මි- අනන්තය දක්වා පැතිරෙමි
නැගෙමින්, ඉදිමෙමින් උදම් දරා සිටිමි..
බියෙන්ද තැති ගැන්මෙන් ද පිරුණු රාත්‍රීන්
පසු කර නැඟී සිටිමි
පැහැදුල් හිරු කිරණින් සුපැහැදිලි
උදෑසනකට අවදි වෙමි
මගේ මුතුන් මිත්තන් දුන් තිළිණද රැගෙන
වහලා ගේ සැබෑවූ සිහිනයද,
ඉටු වූ පැතුමද වෙමින්
නැඟී සිටිමි...!!...

### මායා ඇන්ගලෝ ගේ Still I Rise කවියේ අනුවාදය

අමෙරිකාවේ අර්කන්සාස් හිදී 1928 අප්‍රේල් 04 වෙනිදා ඇය ඉපදුනේ මාර්ගරිට් ජොන්සන් ලෙසිනුයි. සාහිත්‍ය ලෝකයේදී ඇය මායා ඇන්ගලෝ නමින් ප්‍රකට විය. කිවිඳියක , ප්‍රබන්ධ කතුවරියක, නිළියක,නාට්‍ය රචිකාවක, මානව හිමිකම් ක්‍රියාකාරිනියක, නිෂ්පාදිකාවක, අධ්‍යක්ෂවරියක ලෙස භූමිකා රැසක නියැළි ඇය සාහිත්‍ය කටයුතු උදෙසා අමෙරිකාවේ පිදෙන පුලිට්සර් සම්මානය ඇතුළු සියලුම සම්මාන වලින් පිදුම් ලැබීය.

කළු ජාතිකයින් මුහුණ දුන් විවිධ අභියෝග හා අවමාන පිළිබඳව සිය නිර්මාණ වලින් නොබියව කථා කළ ඈ ඔවුනගේ වීරවරියක් ලෙසද සැලකේ. ඇමෙරිකානු ජාතික කවියා ලෙස සැලකෙන Robert Frost ගෙන් පසු, ජනාධිපති වැඩ භාරගන්නා උත්සවයේදී සිය කාව්‍ය නිර්මාණයක් කියවීමට අවස්ථාව ලද එකම කිවිඳිය ඇයයි. ඒ 1993 දී බිල් ක්ලින්ටන් ධුරය භාරගන්නා අවස්ථාවේදීයි. මේ ඒ කවියයි.

2014 මැයි 28 වැනි දින ඇය මිය ගියේ ඇමෙරිකානු සාහිත්‍යයේ පමණක් නොව ලෝක සාහිත්‍යයේ ද නොමැකෙන සටහන් රැසක් ඉතිරි කර තබමිනි.

**කුමුදිනී වේලාරත්න**

## සතියේ කවිපොත

**කෘතිය - පැහැනද පහන්**
**කර්තෘ - සුනන්ද කරුණාරත්න**
**මිල - රුපියල් 300/= පිටු - 66**
**විමසීම් - 071 4213466**
KBooks **ප්‍රකාශනයකි**

සුනන්ද කරුණාරත්නයන්ගේ තෙවන කාව්‍ය සංග්‍රහය පැහැනද පහන් නම් වේ. ඔහුගේ මුල්ම කාව්‍ය සංග්‍රහය වන්නේ 'දූවිලි මිනිසා'ය. එම කාව්‍ය සංග්‍රහය 2010 වසරේදී නිකුත් කරනු ලබන අතර සුනන්දගේ දෙවැනි කාව්‍ය සංග්‍රහය වන්නේ 'කන්‍යා දියවරට එළැඹ' ය. ඒ කාව්‍ය සංග්‍රහය නිකුත් කරනු ලබන්නේ 2012 වසරේදීය.

කල් වේලා අරගෙන වසර නවයකට පසු පාඨක දෝතට ඉදිරිපත් කරන පැහැනද පහන් කාව්‍ය සංග්‍රහයේ එන අපූරු කවි රැසක් අපට හමුවූ වේ.

අම්මා නැති ගෙදර පාළුය. ඇගේ අතින් හැඩවැඩ වූ නිවෙස ගෙමිදුල පාළුය. අප කුමක් කළ ද එය අම්මා කරන තරම් හැඩ නැත. ඒ අප කාටත් අපේ අම්මා ගැන මැවෙන සිතුවිලිය. කවියාට ද එසේය. ගෙමිදුලේ ලේනුන් කුරුල්ලන් සැර සැරුවේ එකලය. අම්මා අතින් ගෙමිදුලේ ගස් කරුවක තබන ලද ලැල්ලේ දැමූ බත් කන්නට එන කුරුල්ලන් දැන් එන්නේ නැත . බාල වියේදී අම්මා හා විඳි ඒ කුරුලු අත්දැකීම් දැන් විඳින්නට හැටියක් නැ. පර්චස් දහයක සැඳූ නිවෙස හා ගෙමිදුලේ ඉස්සර ගමේ දුටු අසිරිය දැකීමේ හැටියක් නැත. කවියා මිදුලට නිතර ආගිය කුරුල්ලන් ලෙහෙනුන් අතරින් සිහි කරන්නේ අම්මා හා බැඳුණු යටගියාවයි. අම්මාගේ ආදරණීය බවයි.


සුනන්ද කරුණාරත්න

මාතෘකාව කුරුලු බඳුන..
"එකල අම්මා ගෙවත්තෙහි
පිනි ජම්බු ගස් දෙබලක
ඉදිකොට කුරුලු බඳුනක්
හීල් බත් පිඩක් ඇතිරූ සඳ....",
එවිට කුරුල්ලන් රැනක් විත් ඒ වටා රොක් වෙයි.
ලේහෙනුන්ද එයි.
අම්මාගේ කරන දෑ දුටු ඔහු තම අලුත් නිවසේ මිදුලේ ගසක ටින් පියනක් සවිකර බලා හිඳින්නේ කුරුල්ලන් පැමිණෙ තුරුය. එහෙත් අම්මාට මෙන් තමාට අත්ගුණය නැතැයි ඔහු තැවෙයි. දැන් සියල්ල වෙනස්ය. ඔහුට දුකක් ද ඇනේ. ඔහු අවසානයේ මෙසේ කියයි.
"අම්මා සුරලොවින් බැස
මහගෙදර ඉස්තෝප්පුවෙහි සිට
මුව මඳහසක් රඳවා
පෙනෙයි බලනායුරු
හිස් කුරුලු බඳුනක්
අබියස හිඳින මා දෙස"
අම්මලා තරමට අපට දෙයක් තිරීමට ඇැම් විට හුරු නැත. අම්මා තුළ ඇති ආදරය දයාව කරුණාව අප තුළ නොතිබෙන්නට පුළුවන. එක්කෝ ඒ අම්මාගේ අත්ගුණයයි. අම්මාගේ අරුමය, සුවිශේෂී බව අපට දැනෙන්නට නම් ඇය අපෙන් ඈත් විය යුතුමයි. කතකයා මේ පවසන්නේ අම්මා නැති බැවින් කුරුල්ලන්ගේ පමණක් නොව තමන්ගේ ජීවිතය තුළ ඇති හිස්බවදැයි අපට සිතෙන්නේ කවිය අවසාය දක්වා කියවා විඳින විටය.

මාතෘකාව මං ත්‍රිවිල්කාරයා.. එය ද යම් අපූරු පද එකතුවකි. මෙහි ඇති බොහෝ පද අපට වර්තමානයේ ත්‍රිරෝද රථවල පිටුපස හෝ ඉදිරියේ ගසා තිබෙනු දැකිය හැක. කවියා කරන්නේ ඒ පද එකට එකතු කිරීමය.
දැන් කොළඹට වඩා අතීතයේ කොළඹ බොහෝ වෙනස්ය. හැමිල්ටන් ඇල එකල පියකරුය. කලක් එය නැති නාස්ති වීය. අද ට වඩා එදවස හොඳයැයි කියා සිතෙන කවියා එදා සොබා සොඳුරු කියයි. එමෙන්ම එකල හැමිල්ටන් ඇළේ කිඹුලන් සිටි බව පෙන්වන කතාවකි මේ. අපටත් වඩා එදවස තිබි ඒ වටපිටාව දැන් නැති බව අඟවන්නක් වැනිය මේ කව. මාතෘකාව ඒ කාලේ තමයි කාලේ.
"මතකද උඹට ඇළක් වැටෙනවා හැමිල්ටන් එකට
දැන් ලයිසියම් එක තියෙන හරියෙ වත්තල
ඒ කාලේ ඔය පැත්ත ම වගුර
ඕකෙ කිඹුලා ඉන්නවා මචං
ඒත් අපි නානව
අම්මලාට හොරෙං..."




කිඹුලාට බිලි වූ ගැහැනියගේ සිරුර සොයා ගැනිමෙන් පසු හැමිල්ටන් ඇළේ නාන්නට ගිය පිරිස අඩුවන්නට ඇත. මිනිසුන් තුළ බියක් ඇති වන්නට ද ඇත. නමුදු තරුණ ගැටවු ඇගේ නාන්නට ඇවිත් ඇත්තේ අම්මලාට හොරෙනි.
"අපි නම් නැවා ඊට පස්සෙත්
ඒ ඇළේ දිගටම
කිඹුලවත් එන්නේ නෑ මචං
ඒ කාලේ අපි වතුරට බැස්සාම....
"
සුන්දර දඟකාර අතිතයක් මේ කවියෙන් සිහිපත් කරන සුලුය. එමන්ම එදා මෙන් නොව ඒ පරිසරය දැන් වෙනස් ව ඇති බව කවියා කියන්නේ කවිය තුළ සඟවාය.


කවදත් නිවී සැනසිල්ලේ නිර්මාණ කරන සුනන්ද මෙවරද එසේම යැයි කිවාට කමක් නැත. ඔහුට කිසිදු හදිස්සියක් නැත.

තමන්ට අවශ්‍ය විට ලියන්නට නොව කවියට අවශ්‍ය විට ලියැවෙන්නට ඉඩ දෙන ගති ස්වාභාවයක් ඔහුගේ නිර්මාණ තුළින් අපට හැගේ. පරිවර්තන කවි කිහිපයක් ද පැහැනද පහන් කාව්‍ය සංග්‍රහයේදි අපට හමුවේ.

# යොවුන් පුවත්පත් රැල්ලේ නොමැකෙන නාමය

## ධර්මරත්න පෙරේරා





**ඔහු ගීත රචකයෙක් කවියෙක් කියා එකතැනකට සීමා කරන්නට බැරිය. ඒ ඔහු කවියෙන් පටන් ගෙන පුවත්පත් කතුවරයකු දක්වා ගමනක් පැමිණි අයෙකි. එපමණක් නොව ඔහු ගී පද රචකයෙකි. නවකතාකරුවෙකි. තනිතරුව, මේධාවී, සංසාරේ එක මොහොතක්, හැඩකාරි කවිකාරි ආදි වශයෙන් නවකතා ගණනාවක් ලියා ඇත. ග්‍රන්ථ රචකයකු වූ ඔහු පොත් ප්‍රකාශකයකු ද වේ. ඔහු ධර්මරත්න පෙරේරා නම් වන්නේය.**

● **ඉනෝකා සමරවික්‍රම**

**ධර්මරත්න පෙරේරා**
**ලීලාවතී මිරිගල්ල හා චාල්ස් පෙරේරා යුවළගේ එකම දරුවා වූයේ ධර්මරත්නය. ධර්මරත්න උපන්නේ 1948 මැයි මස 30 වැනිදාය. කොට්ටාව කොළඹ ප්‍රධාන මාර්ගය අද්දර සිය නිවස පිහිටා තිබුණ ද එකල ඒ ප්‍රදේශය බෙහෙවින් ග්‍රාමීය බවක් ඉසුලු බව ධර්මරත්නගේ අදහසය. තම සියාගේ මලණුවන්ගේ නිවෙස ද ඒ තම නිවෙස අද්දරම තිබුණ ද ඒ අහළ පහළකවත් වෙනත් දරුවන් නොසිටි නිසා ධර්මරත්නට සිය බාලවිය ගෙවා දමන්නට සිදු වුයේ හුදකලාවේමය.**

ඒ නිසාම ඔහුගේ වැඩි ඇල්ම යොමු වුයේ පොත පත කෙරෙහිය. එමෙන්ම සිය නිවෙස අවට ස්වාභාවික පරිසරය කෙරෙහිය. ඒ නිසාම ධර්මරත්න බාල වියේ සිටම කියවන්නට මෙන්ම ලියන්නද ආශා කළේය. ඒ ආශාව නිසාම ඔහු බාලවියේ සිටම තම සිතට දැනෙන දේ ලියන්නට හුරුවිය. ඒ සේ ලිවීම ආරම්භ කළ ඔහු කලක් මෙරට ජනප්‍රියම යොවුන් පුවත්පතක කතුවරයකු ලෙසින් කටයුතු කළේය. එමෙන්ම දශක කිහිපයක් තිස්සේ ගී පද රචනා ක්ෂේත්‍රයේ ජනප්‍රිය ගීතරචකයකු ලෙසින් ද කටයුතු කරන්නේය.

කුමරි යොවුන් පුවත්පතේ කතුවරයා මෙන්ම යුවති, යොවුන් පුවත්පතේ ආරම්භක කතුවරයා ද වන්නේය. ඔහු නම් වෙන කිසිවෙක් නොව ධර්මරත්න පෙරේරාය.

මෙයින් දශක දහයකට පමණ ඉහත මෙරට යෞවන යෞවනියන් අතර යොවුන් පත්තර පිළිබඳ එක්තරා උන්මාදයක් ඇති කිරීමට සමත් වූ 'කුමරි' නිසා ලේඛනයට පිවිසි පිරිස බොහෝය. මේ අතීතය හොඳින්ම දන්නා කිහිප දෙනා අතරින් කෙනෙකි අද අපේ කතානායකයා.

" පවුලේ එකම දරුවා නිසා මම බොහෝම හුරතලේට හැදුන කෙනෙක්. මම මුලින්ම ගියේ හෝමාගම ප්‍රාථමික පාසලට. ඉන් පස්සේ කොට්ටාව ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත්තා. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු උසස් පෙළ හැදෑරීම සඳහා හෝමාගම මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වුණා. මම උසස් පෙළට හැදෑරුවේ විද්‍යා විෂයන්. පාසලේ හිටපු කීකරුම විනීතම ශිෂ්‍යා මම. ගුරුවරු බලාපොරොත්තුවෙන් හිටියා මම ඉහළින් විභාගය සමත් වේවි කියලා. නමුත් උසස් පෙළ ප්‍රතිඵල සාර්ථක වුණේ නැහැ. මම පාසල් වියේ සිටම ගුවන් විදුලියට සවන් දෙනවා. කලාවට යොමු වෙන්න බලපෑ මූලික දේ තමයි මගේ හුදකලාබව. ඒ කාලේ ගුවන් විදුලියෙන් විකාශනය වූ ළමා පිටියට සවන් දෙනවා. නොවැරදිම ගුවන් විදුලියට සවන් දුන්නා. මම ප්‍රණීත් හම්බවෙන්න කැම්පස් එකට ගියා මිසක් ඉගෙන ගන්න නම් කැම්පස් යන්න ලැබුණේ නෑ මට. උසස් පෙළ ප්‍රතිඵලත් සාර්ථක නොවුණ නිසා මම නිවෙසටම වී සිටියා. ඒ කාලේ රස්සාවක් ගන්නත් අමාරුයි. පත්තර වලට ලිපි ලියලා යැව්වා ඒවා පළවෙන්නෙත් නැහැ. මේ කාලේ මට චිත්‍රපට ගැන උනන්දුවක් තිබුණා. මට අවශ්‍ය වුණා චිත්‍රපට ගැන හදාරන්න. ඒ කාලෙම තමයි මම ජනතා පුවත් පතට ලියන්න ගත්තේ. ලේක්හවුසියට මම ලියන කවි ලිපි තැපැල් කර යවනවා. 1970 අවුරුද්දේ දවසක මට තැපැල් පතක් ලැබෙනවා.

"ධර්මේ පැමිණ මා හමුවන්න."
"ධර්මසිරි ගමගේ"

මම ගියා ඔහු හමු වීමට ලේක්හවුසියට. ගිය ගමන් මට ලැබුණේ ඔහු ගෙදරින ගෙනැත් තිබු කොළකැඳ කෝප්පයක්. එදා ගමගේ මහත්තමයා මට කිව්වා යොවුන් ජනතා පුවත්පතට කවි තෝරා දෙන්න කියලා. ඒ කාලේ ගමගේ මහත්මයා හිටියේ ෆොන්සේකා පාරේ නිවෙසක. මම ඒ නිවෙසට සතියකට දවසක් යනවා. ගමගේ මහත්මයා මට ලියුම් මිටියක් දෙනවා 'මල්ලි මේ කවි බලලා ටිකක් තෝරලා දෙන්න කියලා. මම එය කළේ මට රස්සාවක් ලැබුණා වගේ තෘප්තියකින්. සීතක්කා අපට කැමෙන් බීමෙන් සංග්‍රහ කරනවා. මමත් ඒ පවුලේ කෙනෙක් වගේ මට දැනුණේ. ඒ වගේම ඊවා රණවීර මැතිනිය වනිතා විත්ති සඟරාවට කවි ලියා පළවී තිබෙනවා."

ඔහු පැමිණි ගමන දුෂ්කරය. නමුදු නැවතීමේ ගිමන් හරිමින් පැමිණි ඒ ගමන ඔහුට අලුත් පාරක් තනා දුන්නේය. මේ කාලයේ ධර්මේ සංකල්පනා නම් වූ සඟරාව තම අතින්ම ලියා සකස් කර අහල පහල මිතුරන්ට බලන්නට කියවන්නට දුන්නේය. ඒ සඟරාවේ චිත්‍රපට විචාරයක් ලියන්නට ද ධර්මේ පුරුදු වී සිටියේය. අතින්ම ලියූ සංකල්පනා සඟරාව කලාප තුනක් පමණ තම හිතවත්ම යාළුවන් අතරේ අතින් අත යවන්නට ඔහුට හැකි විය.

"විජය ධර්ම ශ්‍රී මගෙ යාළුවෙක්. ඒ කාලේ ඔහු වැඩ කළේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ. මම කොළඹ ගියොත් ඔහු හමුවන්න යනවාමයි. එහෙම ගිය දවසක ඔහු සමඟ ලුෂන් හමුවෙන්න ගියා. නමුත් එයත් අසාර්ථකයි. මම කොට්ටාවේ ඉඳලා යනකොට දකිනවා පෝස්ටර් ගහලා තියෙනවා මල්ටි ෆැක්ස් ආයතනයෙන් කුමරි පුවත්පත 9 සිට එනවා කියලා.

විජය මට කියනවා 'ලියන්න පුළුවන් මිනිහට හරියන්නේ පත්තරයක් තමයි' කියලා. ඔහු මට කියනවා 'මම ලියුමක් දෙන්නම් බන්දුලට ගිහින් හමුවෙන්න' කියලා. මම ගියා ඔහු හමුවන්න. ඒත් කාර්යාලයෙන් කිව්වා අද ඔහු එන්නේ නැහැ කියලා. එත් ගෙදර නම් ඇති කිව්වා. මම එදාම ඔහුගේ නිවෙසට ගියා. රත්මලානේ පිහිටි නිවෙසට ගියා. දොරට තට්ටු කරලා බලන් හිටියා. මම කවදාවත් ඔහුව දැක තිබුණේ නැහැ ඊට පෙර. ටිකකින් නිවෙසේ ඇරුණ දොරින් එළියට ආවේ ඔහු. මම කිව්වා මම පැමිණි කාරණය. බන්දුල මා සමඟ කතා කර මට කිව්වා විවිධ ලිපි ටිකක් ලියාගෙන සඳුදාට කන්තෝරුවට එන්න කියලා. එදා මම ගෙදර ඇවිල්ලා විවිධ ලිපි ලිව්වා. ලිපි 4ක් 5 ක් විතර ලිව්වා. සඳුදා ඒවත් අරගෙන මම කුමරි කාර්යාලයට ගියා. බන්දුල ඒ ලිපි ටික කියවලා 'ෂං' කියලා ලිපි ටික ගත්තා. මම ලිපි ටික දිලා කුමරි පත්තරයකුත් අරන් ගෙදර ආවා. 1979 මැයි 9දා තමයි කුමරි මුල්ම කලාපය පිට වුණේ. කුමරියේ මගේ ලිපි පළවුණා. ටික කලකින් පද්මි පිංදෙනිය ගුරුපත්වීමක් ලැබිලා ගියා. ඒ කාලේ කුමරියට තිබුණේ පුංචි ඉඩක්කඩක්. බන්දුල ප්‍රධාන කර්තෘ වුණාට හිටියේ පුංචි මේසයක. පද්මි ගියාට පස්සේ බන්දු මට කිව්වා "දැන් අපිත් එකක් සම්බන්ධ වෙලා ලියමු කියලා." එදා සිට මම කුමරියේ වැඩ. කවුරුහරි ආවාම අපි ඒ දවස්වල අපහසුවට පත්වෙනවා. බොහෝ වෙලාවට උපාලි නැගිටලා මට ඉඩදෙනවා. කලා ක්ෂේත්‍රයේ විවිධ අය එනවා අප හමුවන්න. පත්තර ජීවිතේ කුමරියේ ගතවුණේ ඒ විදිහට. මාස හතරක් වගේ ඔය විදිහට ගතවුණා. ඔය කාලේ කුමරියේ පළ වුණා 'ආදරණීය ඩොල්ෆින් පැටියෝ' කියලා ලිපියක් කොටස් වශයෙන්. එය ලිව්වේ ප්‍රණීත් අභයසුන්දර. ඔහු ඉඳහිට කන්තෝරුවට එනවා. ඉතාම කෙටි කලකින් මමයි ඔහුයි බොහෝම යාළුවුණා. අපි දෙන්නාගේ යාළුකම නිසාම දවසක් මම ලියපු කවි පොත කියවන්න ප්‍රණීත්ට දුන්නා. ඔහු ටිකකින් මට කතා කරලා කියනවා " ධර්මේ මේ තියෙන්නේ කවි නෙමෙයි. මේවා ඔක්කෝම ගීත" කියලා. එදාම ප්‍රණීත් මාව අනිල් මිහිරිපැන්න හමුවෙන්න එක්කගෙන ගියා. ප්‍රණීත් තමයි මට ඔහුව හඳුන්වා දුන්නේ. අනිල් මිහිරිපැන්න මට කිව්වා භක්ති ගීතයක් ලියාදෙන්න කියලා. මම එය ලිව්වා. ඒ ගීතය ගැයුවේ එඩ්වඩ් ජයකොඩි. එදා එඩ්වඩ් සිංදුව කියන වෙලාවේ ප්‍රණීත් මගෙ පපුවට අත තියලා බලනවා.



ධර්මරත්න පෙරේරා 1982දී

එක දැකපු එඩ්වඩ් අහනවා 'හදවත නැවතිලා ද?' කියලා. මගේ මුල්ම කවිය ගුවන් විදුලියේ ප්‍රචාරය කළේ ප්‍රණීත්ගේ පියා වූ විමල් අබයසුන්දර මහත්මයා. මගේ මුල්ම වචන ටික 'සුවහසක් තරු මල්' ගීතයක් දක්වා ගෙන ආවේ විමල් අබයසුන්දරයන්ගේ පුතු වූ ප්‍රණීත්." විසි තිස් වසරකට එහා අතීතය සිහිකරන්නේ එලෙසිනි.



ඔහුගේ ගී ලිවීමේ ආරම්භය එයයි. එතැනින් පසු ඔහු දිගටම ගීත ලීවේය. මේ ලියූ ගී අතර බොහෝ ජනප්‍රිය ගී රැසකි. එමෙන්ම ඔහු පරම්පරා කිහිපයකටම ගී ලියූ කෙනෙකි. ඔහුගේ මුල් පරම්පරාව වන්නේ මොහිදින් බෙග්, එච්. ආර්. ජෝතිපාල, මිල්ටන් මල්ලවආරච්චි, වික්ටර් රත්නායක, ගුණදාස කපුගේ නන්දාමාලනී, ආදි වු ගායක ගායිකාවෝ ඒ අතර වේ.



කුමරි පත්තරයේ වැඩත් කරන අතර තමයි සිංදුත් ලියන්නේ. ඒ කාලේ වන විට මම කුමරියේ නියෝජ්‍ය කර්තෘ හැටියට වැඩ කරන්නේ. මට මතක හැටියට පඩිය රුපියල් 750 යි. මේ යුගේ අපි පත්තරයට වෙනත් නම් වලිනුත් ලිව්වා. මම මගේ නමට අමතරව ලියපු නම තමයි දේවින්ද දසනායක. දවසක් අජන්තා රණසිංහයන් අපේ කන්තෝරුවට ආවා. ඔහු මගෙන් අහනවා කවුද දේවින්ද දසනායක කියන්නේ කියලා. මම කිව්වා දන්නේ නැහැ කියලා. ආයෙම දවසක අජන්තා එනවා බන්දුල හමුවෙන්න. එදා බන්දු තමන්ව හමුවෙන්න ආව තරුණයක් සමඟ කතාකර කර ඉන්නවා. අජනත්තා මගෙන් අහනවා කවුද ඒ "සිඟිති කවිය" කියලා. ධර්මරත්න අතීතය සිහිකර හිනැහෙයි.

ඒ යුගය වන විට ජනප්‍රිය ගී පද රචකයකු වන ධර්මේට වැඩි පඩියකට වෙනත් රස්සාවකට ආරාධනයක් ලැබෙයි. ඒ ස්වරණදාස හේරත්ගෙනි. එනම් ශ්‍රීමාලි ආයතනයට එන ලෙසය. ආරාධනය ගැන කල්පනා කළ ධර්මේ ඒ ගැන තම හිතමිතුරු බන්දුල පද්මකුමාරට දන්වයි.



පදනම් ආයතනයේ 2018 වසරේ මාර්තු 23 දා පැවැති ලිහිණින් රෑන කෘතිය පිටවූදා හිත මිතුරු බන්දුල පද්මකුමාරයන් සමඟ

කුමරි අතහැර ශ්‍රීමාලියට ගිය ධර්මේට කෙටි කලකින් යොවුන් පුවත්පතක් අරඹන්නට ආරාධනයක් ලැබෙයි. යුවති ඇරඹෙන්නේ ශ්‍රීමාලි නිවෙසිනි. නමුදු යුවති පුවත්පත ප්‍රකාශ වසර හතරකින් පමණ නතර වේ. නමුදු ධර්මේගේ ගී ලිවීම නතර වන්නේ නැත. පාසල් යුවතියකව සිටි චම්පා කල්හාරි ගී ගැයු කැසට් පට දෙකක් සඳහා ගීත ලියන්නට ඔහුට අවස්ථාව ලැබෙයි.

"දවසක් මම කුමක් හෝ දේකට එළියට ගියා. නිවසේ හිටියේ නැහැ. නැවත මම ගෙදර එන කොට දොර යටින් දාපු තුණ්ඩු කැල්ලක් තිබුණා. " හැකි ඉක්මනින් ලාල් වික්‍රමගේ හමුවන්න" එහි ලියා තිබුණේ එපමණයි. මම ඔහු හමුවන්න ගියා. ඒ වෙනකොට බන්දුල ලක්බිම පටන් ගන්න ඒ ආයතනයට ගිහිල්ලා. මම ආයෙත් කුමරියට ආවේ ඒ විදිහට. "කුමරි දැන් ඉස්සරටත් වඩා ලස්සනයි" එහෙම කියලයි, ලියලයි අපි කුමරි පටන් ගත්තේ. කුමරි වැහෙනතුරුම මම එතැන සේවය කළා."

- නම - ධර්මරත්න පෙරේරා
- උපන් දිනය - 1948 මැයි 30
- මවගේ නම - ලීලාවතී මීරියගල්ල
- පියාගේ නම - චාල්ස් පෙරේරා
- සහෝදර සහෝදරියෝ - නැත
- පාසල - හෝමාගම මිශ්‍ර පාසල, හෝමාගම මධ්‍ය මහ විද්‍යාලය. කොට්ටාව ආනන්ද විද්‍යාලය.
- මුල්ම රැකියාව - කුමරි පත්තරේ. (1979)
- යුවති පත්තරේ ප්‍රධාන කර්තෘ. (1984) යළිත් කුමරි ප්‍රධාන කර්තෘ ලෙස වැඩ භාර ගන්නවා.
- විවාහ වුයේ - 1983 ජුලි 14
- බිරිඳගේ නම - පුෂ්පා මාලනී කුලතුංග
- දූ දරුවෝ - පුතා රංග අරවින්ද ඔහු විවාහ වී ඉන්නේ තාරුකා අතාවුදහෙට්ටි සමඟ. දුව කිංකිනි මේධාවිණී. ඇය විවාහ වී ඉන්නේ ඉෂංක ගමගේ සමඟ
- මුණුපුරු මිනිබිරියෝ - තරුෂ යුවරංග, හිරුෂ මනුරංග, මහිම දම්සර, මුතුසරණී
- ලියූ ගීත සංඛ්‍යාව - 300කට වැඩි.
- ලියූ පොත පත - දාසියකගේ කඳුළු, වට වන්දනාවේ ගියදා අපෙ අම්මා, සුන්දරය සන්ධ්‍යාව යන කාව්‍ය සංග්‍රහ, තනිතරුව, තොටුපොල අද්දර, අපේ කාලේ නාරිලතා, සංසාරේ එක මොහොතක්, හැඩකාර කවිකාරි යන නවකතා, අන්තිම දා රෑ කෙටි කතා සංග්‍රහය හා නිල්වන ලද්දේ ගීත සංග්‍රහය

ගීතයට, පුවත්පතට ආදරය කළ ධර්මෙට ආදරණීය ඇය හමුවන්නේ කුමරියේ සේවය කරන කාලයේය. යෝජනාව ගෙන එන්නේ මාමා කෙනෙකු විසිනි. එහෙත් තරුණිය බලන්නට යන ගමන දිනෙන් දින කල් යනවා මිස ගමන යැවෙන්නේ නැත.

"මාමා මට මංගල යෝජනාව ගෙනාවේ බණ්ඩාරවෙලින්. මාමා අපේ ගෙදර උදේත් ගෙදර එනවා, හවසත් එනවා. එත් මට යන්න උනන්දුවක් තිබුණේ නැහැ. ටික කලක් ගිහිල්ලා මම මාමාගෙන් ඇගේ දුරකථන අංකය ඉල්ලා ගත්තා. අපි කතා කළා. හමු වුණා. ඒත් මාමා දන්නේ නැහැ. කලක් යන විට මාමාට වැඩේ අහුවුණා. පසුව අම්මා තාත්තා නැයෝ එක්ක මම බණ්ඩාරවෙල ගියා. මගෙ තාත්තා හැමදාම කියපු දෙයක් තමයි කොළඹ ළමයි එපා කියලා. සරත් ද අල්විස්, සමන් අක්කා ( බන්දුල පද්මකුමාරගේ බිරිඳ)අනිත් යාළුවෝ හැමෝම විවාහය දවසේ උදව් කළා.

අපි විවාහ වුණේ 1983 ජූලි මාසේ 14 වැනිදා. 1984 පුතා උපදිනවා. ඔහු රංග අරවින්ද . දුව උපන්නේ 1988 වසරේ ඇය කිංකිණි මේධාවිනි." ධර්මේ අතීතය සිහිකරන්නට වුයේ බොහෝ සතුටිනි.


කලක් කරගෙන ගිය කුමරි පත්තරයද වැසි ගිය පසු ඔහු තම මිතුරන්ගේ ආරාධනයෙන් රජිනි පුවත්පතට ද, සිරිකතට ද, දිවයිනට ද ලියන්නට විය.

ඔහු අද වන වන විට ටෙලි නාට්‍ය කිහිපයකට ම ගීත ලියා ඇත. කලක් නිල්වලා ආයතනයේ කැසට් පට සඳහා ද ගීත ලිව්වේය. ගීත ලිවිමෙන් අතීතයේදි තමන්ට හමු වූ ගායන ශිල්පින් ගැන ඔහුට ඇත්තේ සතුටකි. ඒ අතීතයේදී හමු වූ මොහිදීන් බෙග්, එච්. ආර් ජෝතිපාල ගැන ඔහු සිහි කරන්නේ ආදරයෙනි.



වමේ සිට තරුසර (මුනුපුරා), තාරකා (ලේලිය) හිරුසර (මුනුපුරා), ඉසංක ගමගේ (බෑනා), ධර්මරත්න පෙරේරා මහිම (මුනුපුරා), පුෂ්පා (බිරිඳ), ලීලා (මව),කිංකිණි මේධාවිනි (දියණිය), රංග (පුතා), මුතුසරණි (මිනිබිරිය) 2020 වසරේ දි ඡායාරූපයකට පෙනිසිටි අවස්ථාව

දවසක් ගීතයක් ලියාගෙන ගියා ඔහු ගීත පටිගත කරන්න එන ශබ්දාගාරයට. ඒ උදේ ජෝති නාලා බුදුන් වැඳලා තමයි ශබ්දාගාරයට ආවේ. නමුත් එදා ජෝතිට ගීත ලියනවා කිව්ව කෙනා ඇවිත් හිටියේ නැහැ. ස්වරණදාස මහත්මයා හිමින් සීරුවේ ඇහුවා මොකද කරන්නේ කියා. ජෝති කිව්වා මේ මල්ලිටයි, උපාලිටයි ඉතිරි සිංදු ටික දෙන්න කියා. මා එදා අරන් ගිය ගීතය කුල කුමරිය ගීතය ජෝතිට දුන්නා. ජෝති එය ගැයුවා. පසුව අපි එතැන උඩ කාමරයට ගිහින් ගිත ලිව්වා. ඒක නම් මට කවදාවත් අමතක නොව අත්දැකීමක්. එදා ජෝති ඒ ගීත වලට හරියට සතුටු වුණා. මම ලියන ලියන ගීතය ජෝති එවලෙම ගායනා කළා. ඔබ මගේ ස්වරණමාලි, මගේම නයනී, පැයූ නවම් සඳපානේ, මේ ජීවිතයම ශෝකේ, එදා ලියු ගීත. පටිගත කිරීම් අවසානයේ " උඹ ලංකාවේ හොඳම ගීත රචකයෙක් වේවා කියලා මාව බදාගත්තා. එදා සිට අපේ යාළුකම තව තවත් වර්ධනය වුණා. මුල් කාලේ නම් මම හින්දි තනුවලට ලියන්න කැමති වුණේම නැහැ. නමුත් මට එහෙම කරන්න වුණා.."




ස්වතන්ත්‍ර ගී පද රචනයේද දස්කම් පෙන්වන ධර්මේ ලියූ ගී රැසකි. සමුගෙන යාදෝ යළි හමුවේදෝ, ලිහිණින් රෑන, කන්දේ විහාරේ, ඉස්සර වාගේ හද ලස්සන නෑ ආදි ගී අදත් බෙහෙවින් ජනප්‍රියය. පරම්පර හතරකට ගී ලියා ඇති ඔහු අදද ඉල්ලීමක් ලැබේ නම් ගීත ලියන්නට සුදානම්ය. පුවත්පත් කලාවෙන් සමුගන්නා ධර්මේ පසුව පොත් ප්‍රකාශනයට පිවිසෙන්නේය. ඒ කිංකිණි පොත් ප්‍රකාශන ආයතනය ආරම්භ කරමිනි. කලක් කරගෙන ගිය එයත් අතර මඟ නතර කර දමන ධර්මේ දැන් විවේක සුවයෙන් ගත කරන්නේය. ඔහුට සිය බිරිඳගෙන් ලැබෙන සහාය අපමණය.

සිය දරු මුනුපුරන් ඇසුරේ දිවි ගෙවන ධර්මේ ජීවිත දෙස කවදත් සැහැල්ලුවෙන් බලන්නට හුරු වු අයෙකි.

මේ ඔහු ඔහු ගැනම ලියු කවියකි.

අප වෙන්විය යුතුය පරපුරකට ඉඩදී
හැමදා බබළන්න බැහැ ඉරහඳ පරිදී
සමුගත යුතුය අප සතු මෙහෙවර අගදී
යළි හමුවුණොත් හිනැහෙමු අපි අතහිත දී

- ඡායාරූප ගයාන් පුෂ්පික



# සුනිල් සරත් නම් විදග්ධ පරිසරවේදියා

● මහාචාර්ය සරත් කොටගම

**සුනිල් සරත් පෙරේරා ශ්‍රී ලංකාවේ පරිසර සාහිත්‍යයට මෙන්ම පරිසර සන්නිවේදනයට ද අනුපමේය මෙහෙවරක් කළ ප්‍රබල චරිතයකි. ඔහු තුළ ඇති නිර්මාණ ශක්තිය හා ලබා ඇති විශ්වීය ඥානය පරිසරය ගැන අලුත්ව සිතන යුගයක මෙරට පරිසර ක්ෂේත්‍රයට නවමු මඟ පෙන්වීමක් විය.**

සුනිල් සරත් පෙරේරා මා හොඳින් හඳුනාගත්තේ 1994 පරිසර අමාත්‍යාංශයට සම්බන්ධ වීමත් සමඟය. පරිසර සංරක්ෂණයට සාහිත්‍යාත්මක හා නිර්මාණශීලි යොමුවක් ඔහු විසින් ලබාදෙන ලදී.

මේ අතර සුවිශේෂ වන්නේ පරිසරය ගැන ප්‍රකාශයට පත්කළ "සොබා" සඟරාවයි. "සොබා" ඔහු විසින් යොදන ලද කදිම නමකි. ඓතිහාසික රියෝ සමුළුවට (එක්සත් ජාතීන්ගේ) සහභාගී වීමට ඔහුට අවස්ථාව ලැබිණ. මේ ඇතුළු ලෝක පරිසර සමුළු ගණනාවක දී ඔහු ලද නවතම පරිසර විශ්වීය දැනුම සොබා සඟරා මඟින් ද ධරණීය සංවර්ධනය, ජෛව විවිධත්වය, හා පාරම්පරික ඥානය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ නවතම දැනුම ඔහුගේ පතපොත මඟින් ද ලබාදුනි.

ස්ථානික පරිසර විඥානය ලබාදීම සඳහා එළිමහන් ගුවන් විදුලි හා රූපවාහිනී සජීවී වැඩසටහන් ඇත වස්ගමු වනපෙතේ ද සීත හෝර්ටන් තැන්නේ ද සංවිධානය කළේය. මීදුම, සීතල හා වැස්ස මැද එදා හෝර්ටන් තැන්නේ සිට අප කළ රූපවාහිනී විකාශනය මෙන්ම වස්ගමුව ජාතික උද්‍යානයේ සිට ද කළ සජීවී ගුවන්විදුලි වැඩසටහන ද කිසිදා අමතක නොවේ. ඔහු පරිසර සන්නිවේදනය පිළිබඳ පොතපත රාශියක් ලියා ඇත. උඩරට මැණිකේ පරිසර චාරිකා ග්‍රන්ථය නව ආකෘතියක පිහිටා කළ කෘතියකි. කොළඹ සිට උඩරටට ඇදීයන දුම්රිය ගමනක් උපයෝගී කරගනිමින් පරිසර පද්ධති හා සොබාදහමේ විචිත්‍රතාව මැනෙවින් විග්‍රහකරයි.

විශේෂ දුම්රියක්, පාසැල, පංතිකාමර වශයෙන් සකස්කොට මහනුවර දක්වා ගිය පරිසර චාරිකාව අලුත් අත්දැකීමක් විය.

වස්ගමු වනෝද්‍යානයේ සෞන්දර්යයයි වින්දනය ලබාගැනීමට ඔහුට මඟ පෙන්වූයේ මා බව ඔහු බොහෝවිට පවසයි. ඔහුගේ බොහෝ ගීතවලින් ගැඹුරු දාර්ශනික චින්තන මතුකරන්නේ සොබා දහම හා පරිසර සංසිද්ධීන් යොදා ගැනීමෙනි. අමරදේව, සනත්, නන්දසිරි සෝමතිලක ජයමහ, මර්වින් පෙරේරා, දයාරත්න රණතුංග, නීලා වික්‍රමසිංහ ගයන ගීතාවලිය තුළින් කොතෙකුත් නිදර්ශිත සොයාගත හැකිය. "ඕසෝන වියන" පිළිබඳ තේමා ගීතය මෙන් ම කාඩොලාන තේමා ගීතය ද දුෂ්කර ප්‍රබන්ධ වේ. නීලා වික්‍රමසිංහ ගයන "පරිසරය සිරිසරය" කදිම පරිසර වර්ණනාවකි.

ඔහු සොබාදහම හා විප්‍රලම්භ ශෘංගාරය එකවිට දනවමින් විරල ගණයේ ශ්ලේෂා අලංකාරය සහිතව නිර්මාණය කළ ගීතය අපූර්ව ප්‍රබන්ධයක් බව අප මිත්‍ර මහාචාර්ය විමල දිසානායක මහතා මෙන්ම හෙළහවුලේ නයූ ශ්‍රීනාත් ගණේවත්ත ද පෙන්වා දෙයි.

"ඇය යන්න ගියා මැකිලා" ගීතයේ "ඇය" යන පදය රූපකයක් වශයෙන් ගෙන එකම පදමාලාවක් ඔස්සේ අර්ථතල දෙකක් එක විට විස්තාරණය වීම මෙහි අපූර්වත්වයයි.

ඇය කාන්තාවක් වශයෙන් ද ඇය සොබාදහම වශයෙන් ද එක විට වර්නිතය. මේ ගීතය සුනිල් සරත් හැමවිටම සොයා ගිය සොබා දහමේ දර්ශනය ලෙස මම ද දකිමි.

ඇය යන්න ගියා මැකිලා

ඇය යන්න ගියා මැකිලා
වන සිරසක
තුරු සෙවණැලි අතරේ
ගී ගයමින් හිද
මා තුරුලේ...
ඇය යන්න ගියා මැකිලා
ඇය යන්න ගියා මැකිලා...
පිනි කඳුළක්
මල් පෙති අග තවරා
මිහිදුම් සළුවෙන්
මුහුණ වසා..
ඇය යන්න ගියා මැකිලා
ඇය යන්න ගියා මැකිලා..
නිල්ල නිලන නිල් කඳු වැලි අතරේ
සඳ එළියේ මං පෙතපාදා
රහසක් සඟවා ගොළු වූ හදකින්
යන්න ගියා මැකිලා -
ඇය යන්න ගියා මැකිලා...
යළි කවදාවත් හමු නොවෙනා බව
මඳ පවනක් හිස අත ගා කීව ද
අදහාගන්නට නොහැකිය කිසිදින
ඇය යළි නොඑතැයි
ගම්මානෙට පෙර ..





යමෙකු තුළ ඇතිකරන දේශානුරාගය හා සෞන්දර්යය වින්දනය පරිසර සංරක්ෂණයට ප්‍රබල උපාය මාර්ගයක් ලෙස සැලකිය හැකිය.

සුනිල් සරත් පරිසර වින්දනය සමඟම දේශානුරාගය මතුකරන අමරදේව ගයන "පියාසර කර ආමී" ගීතය එවන් පරිශ්‍රමයකි.

පරිසර සංරක්ෂණයේ දී පාරම්පරික ඥානයට ලෝක ප්‍රජාව මෙන්ම එක්සත් ජාතීන් ද වැඩි අවධානයක් යොමු කරති. එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්වය හා පාරම්පරික ඥානය පිළිබඳ සමුළු ගණනාවකට සහභාගී වී ඇති සුනිල් සරත් ඒවාට සවන්දීමේ ප්‍රතිඵලයක් යැයි සැලකිය හැකි භාෂා විද්‍යාගාර සංකල්පය මෙරටට හඳුන්වා දුන්නේය.

ඒ ඔහු ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සභාපතිව සිටි අවධියේය. පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව අංශයට වෙන් කළ මුදල් ප්‍රතිදාන වලින් භාෂා විද්‍යාගාරයක් කොත්මලේ ප්‍රජා ගුවන්විදුලියට සම්බන්ධ කලේ ඔහුගේ පරිපාලනමය සූක්ෂමතාව හා නිර්මාණ කුසලතාව නිසාය.

පරිසර ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී ධරණීය සංවර්ධන පදනම යටතේ සාධාරණී කිරීමේ මඟපෙන්වීම ඔහු පෙන්වා දී ඇත.

සුනිල් සරත් පෙරේරා දර්ශනයක් හා අරමුණක් ඇතිව කටයුතු කළ පුරෝගාමී විදග්ධ පරිසර වේදියෙකි.

# නම රැන්දූ පාසල් සගයන් ගැන පාසල් මිතුරකුගේ මතකාවර්ජනය

● බ්‍රිතාන්‍ය ඉංජිනේරු දෙව්සිරි ජී. හේවාවිදාන, ලන්ඩන් නුවර සිට ලියයි.

**සුනිල් මාධව ප්‍රේමතිලක හා බන්දුල පද්මකුමාර ආනන්දය නිර්මාණය කළ ඉහළම පෙළේ මාධ්‍යවේදීන් දෙදෙනෙකු යැයි මා කිවහොත් එයට කිසිවකු විරුද්ධ නොවනු ඇත. ශ්‍රී ලංකා පත්තර කලාව උඩු යටිකුරු කළ ආනන්දයේ මගේ සමකාලීනයන් දෙදෙනා එකම සතියක අපෙන් සමුගෙන යෑම බොහෝ දුක්මුසු සිද්ධියකි.**

බන්දුල පද්මකුමාර නැමැති විශිෂ්ට මාධ්‍යවේදියා පුංචි කාලයේ මුල් වරට මට හමු වූයේ එසේය. බන්දුල ඉන්පසු මට නැවත හමුවූයේ ආනන්දයෙදීය. බන්දුල ආනන්දයේ සිටියදීත් පත්තර වලට කවි හා ලිපි ලිවීමට සමතෙක් විය. ඉරිදා පත්තරවල පළ වූ ඔහුගේ පුංචි කවි හා ලිපි කපාගෙන සඟුදා පාසලට පැමිණ යහළුවන්ට ආඩම්බරයෙන් පෙන්වීම ඔහුගේ සිරිත විය. බන්දුලගේ සාහිත්‍ය දස්කම් ඔපවත් වූයේ ආනන්දයේ අපි සැමට සිංහල ඉගැන්නූ ගාල්ලේ බර්ටි විජේසිංහ සර් නිසාය.

බර්ටි සර්ගෙ තවත් හොඳම ගෝලයෙකු වූයේ සුනිල් මාධව ප්‍රේමතිලක ය. ආනන්දයේ අපි සුනිල් අයියට වැඩි ගෞරවයෙන් සැලකුයේ ඔහු එවකට සුප්‍රසිද්ධ කවියකු හා කර්තෘවරයකු වූ මීමන ප්‍රේමතිලකගේ පුතා වූ නිසාය. සුනිල් අයියා පුංචි කාලයේදීම ලස්සනට ලියන්න හැකියාව තිබූ සිංහල සාහිත්‍යයට තැගි පිට තැගි ගත් ළමා ලේඛකයෙකු විය.

බර්ටි විජේසිංහ සර් අනුශාසකත්වය දැරූ විද්‍යාලයේ සාහිත්‍ය සංගමයේ සභාපති වූයේ බන්දුල පද්මකුමාර අයියාය. සංගමය හරහා රචනා තරග හා කවි තරග පවත්වමින් පහළ පංති වල මල්ලිලා සාහිත්‍යයට වඩාත් නැඹුරු කිරීමට ඔහු සමත් විය.

ඒ කාලයේ ලංකාවේ ප්‍රසිද්ධතම ළමා පත්තරය වූ මිහිර ශත 25 ක් දී මිලදී ගැනීමට අප බොහෝ ළමුන්ට වත්කමක් නොතිබුණි. ඒ බව දැන සිටි බන්දුල අයියා කිරණ නමින් බිත්ති පුවත්පතක් ආනන්දයට හඳුන්වා දුන්නේ ය. විදුහල්පති රාජපක්ෂ මහතාගේ පූර්ණ ආශිර්වාදය ඇතුව ආරම්භ වුණ බිත්ති පුවත්පත ඉතා කෙටි කාලයකින් අතිශයින්ම ජනප්‍රිය විය. බ්‍රහස්පතින්දා උදේ පාන්දර බන්දුල අයියා පත්තරයට ලැබුණු ලිපි කවි හා චිත්‍ර තම අතින්ම ලියා හෝ ඇඳ තීරුව තීරුව බැගින් බිත්තියේ අලවන තුරු අපි බලා සිටියේ නොඉවසිල්ලෙනි. පාසල් දරුවකු වශයෙන් මගේ ලේඛන කලාව ඇරඹුණේ කිරණ බිත්ති පුවත්පතෙන් යයි කීම නිවැරදිය.

කිරණ ශ්‍රී ලංකාවේ පාසලක නිර්මාණය වූ ප්‍රථම බිත්ති පුවත්පත වීය. පුවත්පතේ ජනප්‍රියතාවය කොතරම් වැඩි වී ද කියනවා නම් සමහර දිනවල පාසල් කාලයෙන් පසුව ආනන්ද බාලිකාවේ බොහෝ සිසුවියන්ද කිරණ කියවන්නට පැමිණියහ. සාහිත්‍ය පොතක් ඇහින් නුදුටු අපේ බෝඩිමේ සමහර යාළුවෝ මේ ආරංචිය ඇසුවාට පසු බුරුතු පිටින් කිරණට කවි ලියන්නට වූහ.

කිරණ පුවත්පතට වසරක් පිරීම නිමිත්තෙන් බන්දුල අයියා ඕල්කට් ශාලාවේ ලොකු උත්සවයක් සංවිධානය කළේය. එහි ප්‍රධාන අමුත්තා වූයේ එවකට දිවයිනේ ප්‍රසිද්ධ ලේඛකයකු වූ පියසේන නිශ්ශංක මහතාය. වසරේ හොඳම කිරණ ලේඛකයා ත්‍යාගය නිශ්ශංක මහතා අතින් ලබාගත් ශිෂ්‍යයා වූයේ ඉම්තියාස් බකීර් මාකර්ය.

ආනන්ද නාලන්ද සමරු කලාපයට මම වරක් කවි පෙළක් ලියූවෙමි.

"මේක සමරු කලාපයට හොඳ වැඩියි දෙව්සිරි" බර්ටි විජේසිංහ සර් මට කීය. "මම ලියුමක් දෙන්නම් ඒකත් අරන් ලේක්හවුස් එකට හෙට ගිහින් සුනිල් මාධව අයියට මේ ලස්සන කවි ටික දෙන්න." සුනිල් අයියා එය ජනතා පත්තරේ අග පිටුවේ පළකළ දා මට ඇති වූයේ රට රාජ්‍යක් දිනුවා වැනි සතුටකි. මගේ නිර්මාණයක් මුල්වරට පුවත්පතක පළ වූයේ එදාය. මගේ තාත්තා ජනතා පත්තර 25 ක්ම අරගෙන යාළුවන්ට බෙදුවේ මහත් ආඩම්බරයෙනි.

සුනිල් මාධව අයියා මට උදව් කළේ එදා පමණක් නොවේ. මා අහම්බෙකින් චිත්‍රපට නළුවකු කළේ ද සුනිල් මාධව අයියාය. අපි අටවන පන්තියේ සිටින විට රංජිත් කුමාර, නිලවීර සහ රංජිත් ලාල් වැනි ලොකු අයියලා නිම්වළල්ල නමින් චිත්‍රපටයක් නිෂ්පාදනය කරන්නට වූහ. එහි සහාය අධ්‍යක්ෂක වූයේ බන්දුල පද්මකුමාර අයියාය. චිත්‍රපටයේ තිරපිටපත ලිව්වේ ජනතා පත්තරේ උප කර්තෘ වූ සුනිල් මාධව අයියාය.

චිත්‍රපටයේ දර්ශන බොහොමයක් ආනන්දයේ ලෙඩ්බීටර් දෙමහල් ගොඩනැගිල්ලේ සෙනසුරාදා රූගත කෙරෙනවා බෝඩිමේ අපි බලා සිටියේ මහත් උද්යෝගයෙනි. එවැනි එක් දවසක පන්ති කාමරයට ප්‍රධාන නළුවා ඇතුළුවන දර්ශනය රූගත කිරීම සඳහා පංතියේ වාඩි කරවීමට ළමුන් මදි බව අධ්‍යක්ෂකවරයාට තේරුම් ගියේය. " මල්ලි ඔය යාළුවත් එක්ක මෙහාට එන්න" යනුවෙන් ගාම්භීර හඬක් ඇසී මා හැරී බැලුවෙමි. "ආ ඔයා නේද අපේ ජනතා පත්තරේට කවි ලිව්වෙ". සුනිල් මාධව පෙර පුරිදිම මුව පිරුණු සිනාවෙන් පැවැසීය. "මෙන්න මේ ඩෙස්ක් එක ගාව වාඩි වෙලා සද්ද නැතුව ඉන්න." රූගත කිරීම ආරම්භ කෙරුණි. කැමරාවල ආලෝකයෙන් දෑස අන්ධ වූවත් අපි අධ්‍යක්ෂකතුමා කී විදියට නොසැලී රඟපෑවෙමු.

රූගත කිරීම් අවසන් වූ වහාම බන්දුල පද්මකුමාර අයියා මගේ පිටට පොඩි තට්ටුවක් දමා" වෙරි ගුඩ් මල්ල ගාමිණී ෆොන්සේකා කැලේ" යැයි මට විහිළුවක් ද කළේය. සුනිල් මාධව හා බන්දුල පද්මකුමාර අන්තිම වරට මට මුහුණට හමු වූයේ එදාය.

කාලය වේගයෙන් ඇදී ගියේය. මා එංගලන්තයේ කොටු වීය. එහෙත් බන්දුල හා සුනිල් මාධව යන විශිෂ්ට ආනන්දීය මිතුරන් දෙදෙනා ශ්‍රී ලංකා පුවත්පත් ක්ෂේත්‍රයේ ඉහළට ගමන් කරන අන්දම මා බලා සිටියේ මහත් අභිමානයෙනි. "අටවෙනි පිටුව " හා සත්‍යවාදියෙකුගේ දිනපොත, දිවයින පත්තරය තුළ වෙනම පත්තරයක් ලෙස බිහිවීය. අන්තර්ජාලය නොතිබුණු ඒ කාලයේ මම තැපෑලෙන් දිවයින ගෙන්වා ගත්තේ සුනිල් අයියාගේ "අටවෙනි පිටුව" කියවීමට ය. සුනිල් මාධව අයියට එක තැනක වැඩි කලක් වැඩ කරන්න බැරිකමක් තිබිණි. ඔහු පත්තර මාරු කළේ අපි සපත්තු මාරු කරන ගානටය. භීෂණ සමයේ ඔහු වැඩ කළේ ලක්දිව පත්තරේය.

මාධව අයියා ගැන තවත් රසවත් සිදුවීමක් මට හොඳින් මතකය.1991 වන විට ඔහු සිටියේ ලක්දිව පත්තරේ ය. එංගලන්තයේ වටිනා සිද්ධි ගැන මම වරින් වර ලක්දිවට ලියූ නිසා අපි නිතර ටෙලිෆෝනයෙන් කතා කළෙමු.

ලංකාවට වරක් නිවාඩුවට පැමිණ මනමාලියන් 50ක් පමණ බලන්න ගොස් ඔවුන්ගේ ගෙවල්වලින් බඩ පිරෙන්න කාපු බීපු හැටි මා විස්තර කරද්දී මාධව අයියා අසා සිටියේ ආසාවෙනි. "මම නම් මල්ලි මනමාලියො බලන්න යන්නේ නැහැ. මනමාලියො ගෙදරට ගෙන්න ගන්නවා."


"ඒ කිව්වේ"


"අපේ ඔෆිස් එකට කවි අරන් කෙල්ලෙක් එනවා. එයා හරි ලස්සනයි. කවද හරි මම බඳින්නේ එයාව"

" එයාගේ නම මොකක්ද අයියේ "

"මනෝරා"

ඉන් වසරකට පමණ පසු සුනිල් අයියා මනෝරා සමඟ විවාහ විය.





සුනිල් මාධව ප්‍රේමතිලක හා බන්දුල පද්මකුමාර

මේ අතර බන්දුල පද්මකුමාර ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ බලවත් පෙරළියක් ඇති කරමින් ස්වරණවාහිනියේ මුල් පිටුව" ඇරඹීය.

පුවත්පත් වෘත්තියට බැස්ස පසු ද ඔහු ජැන්ඩියට අඳින්නට සැලකිලිමත් ව සිටි බන්දුල "මුල් පිටුව" කරද්දී සතියේ දවස් හතට එකිනෙකට වෙනස් වර්ණවලින් ටයි පටි හා කමිස හතකින් සැරසී පාඨකයන් ඉදිරියට පැමිණීමට ඔහු වග බලාගත්තේය.

නමුත් සුනිල් මාධව අයියා හැඩට අඳිනවාට වඩා ජනතාව වැඩකරන්නය. සුනිල් මාධව බෙහෙවින් කළබලකාරීත්වයෙන් යුතු ආවේගශීලී පුද්ගලයෙකු වූයේ ය. බන්දුලගේ පුතා හිරු හා දියණිය මුතු ඇති දැඩි කිරීමේ තනි වගකීම බාර ගෙන සිටියේ පේරාදෙණියේ උපාධිධාරිනියක හා සුප්‍රසිද්ධ ළමා පොත් කතුවරියකු වූ බන්දුගේ බිරිඳ සමන්මලීය. එසේම සුනිල් මාධවගේ එකම පුතා සංජීවගේ ඉගෙනීමේ කටයුතු හා වගකීම් සියල්ලම ඉටු කෙළේ මාධවගේ බිරිඳ මනෝරාය. රටේ උන්නතිය සඳහා නිර්භයව දිවා රෑ පැන මෙහෙයවන්නට හැකි වූයේ ඔවුන්ගේ මේ සුන්දර බිරින්දෑවරු දෙදෙනා නිසාය.

අප විසින් පිහිටුවා ගන්නා ලද එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම හරහා කඹුරුපිටියේ පාසල් 16ක දරුවන්ට පුස්තකාල පොත්පත් අලුත් නවීන සපත්තු හා ලැප්ටොප් ලබාදෙමින් සිටින බව ආරංචි වූ බන්දුල පද්මකුමාර මට එක් දිනක ටැලිෆෝන් කළේය.

"මල්ලි බැරිද අපේ ඉස්කෝලෙටත් මොනවා හරි කරන්න." ඔහු ඒ කතා කළේ කඹුරුපිටියේ කහගල විද්‍යාලය ඔහුගේ පියා නමින් සුගතපාල ගොඩවත්ත විදුහල ලෙස නම් කළ පසුවය. කොරෝනාවට පෙර අවසන් වරට මා ලංකාවට ගිය වෙලේ සුගතපාල විදුහලට පා තැබුවේ ළමුන්ට පොත්පත් ක්‍රීඩා උපකරණ ප්‍රින්ටරයක් හා අයිස්ක්‍රීම් වැන් එකක් ද රැගෙනය. දැනට මාස කිහිපයකට පෙර බන්දුල අයියා උපන් ගමේ මාපලාන විදුහලට අපි අංග සම්පූර්ණ පුස්තකාලයක් පරිත්‍යාග කරන දවසේ එය විවෘත කිරීමට පැමිණෙන ලෙස මම ඔහුට ආරාධනා කළෙමි.

"එන්න නම් හරි ආසයි මල්ලි, නමුත් මේ ලෙඩේ නිසා සමන්මලී මට කොහේවත් යන්න දෙන්නේ නැහැනේ. එයා නැත්නම් මම මෙලහකටත් වළපල්ලට ගිහින්" යයි ඔහු කීවේ දුක හා සතුට මුසු ස්වරයෙනි.

මේ අතර සුනිල් මාධව අයියා ඔත්පළව ඉතා දුබලව සිටින බව මා දැනගත්තේ මෙයට වසරකට පෙර ප්‍රභාත් අත්තනායක මිතුරා මවුබිමට ලියූ ලිපියකිනි. .

බන්දුල පද්මකුමාර හා සුනිල් මාධව ප්‍රේමතිලක එකිනෙකාට වෙනස් ශෛලියක් හා භාෂාවකින් අප රටේ පුවත්පත් කලාවට අනුපමේය සේවයක් කළ මාධ්‍ය වේදීන් දෙදෙනෙකි.

# ලාංකේය විය යුතු 'ලාංකීයයෝ'

හරි වහර

● ශ්‍රීනාත් ගණේවත්ත



මේ දිනවල හරි වහරින් විමැසෙන්නේ ණ - න අකුරු දෙක යෙදෙන වදන් පිළිබඳ හරි වහර බව කියවන්නෝ දනිති. අයකු නැඟූ පැනය නම් නිවැරැදි වදන ලාංකීය ද, එනැතහොත් ලාංකේය ද යනු යි. ඉතා ම කාලීන ප්‍රශ්නයෙකි. කවර හෙයින් ද යත් මෙහි වැරැදි වදන ම බොහෝ විට ජනමාධ්‍ය මඟින් යොදනු ලබන හෙයිනි. මෙ තන්හි සේ ම අනෙක් බොහෝ තන්හි ද දැකිය හැකි පැහැදිලි කරුණක් නම් බස් වහරෙහි ඉතා ඉක්මනින් පැතිර යන්නේ වැරැදි වදන බව යි. එ ද යහපතට වඩා ඉක්මනින් අයහපත සමාජයේ පැතිර යන්නාක් මෙහි මිනිසුන් පිනට වඩා ඉක්මනින් පවට නැඹුරු වන්නේ ද මේ අයුරින් ම ය.

ලාංකීය, ලාංකේය යන දෙකින් ලාංකේය යන් ම නිවැරැදි යෙදුම වේ. එ වුව ද නිතර ම පුවත්පත් ආදියෙහි පොල් ගෙඩි අකුරින් දක්නා ලැබෙන්නේ 'ලාංකීය' යනු ම ය. ලාංකීය ජනයා, ලාංකීය සමාජය, ලාංකීය සාහිත්‍යය වැනි යෙදුම් නිරතුරු ව පුවත්පත් ආදියෙහි යෙදේ. එ මතුත් නො වේ. ශ්‍රී ලාංකීය යනුත් යෙදෙනු දැකිය හැකි ය. ශ්‍රී ලාංකීය අභිමානය ගැන දැන් නම් ඒ තරම් අසන්නට නො ලැබේ.

දැන්, මේ වදන් හි නිබැදියාව හෙවත් පද නිෂ්පත්තිය කෙසේ සිදු වී ද යනු විමසා බලමු. එ සේ විමසන විට පෙනෙනුයේ මෙය ලාංකේය යන්න - සිංහලයෙහි තත්සම වැ යෙදෙන සංස්කෘත වචනයක් බව යි. එය නිපැදෙනුයේ 'ලංකා' යන නාමයට (නාම ප්‍රකෘතියට) 'ඒය' යන ප්‍රත්‍යයය එක් වීමෙනි.

ලංකා + ඒය = ලාංකේය

ලංකා + ඒය නම් ලංකේය නො වේ දැ යි යමකු ඇසිය හැකි ය. සැබැවෙකි. විය යුතු එ සේ ම ය. එ වුව ද සංස්කෘතයෙහි 'ඒය' ප්‍රත්‍යයය යම් ප්‍රකෘතියක් හා එක් වන කල ඒ ප්‍රකෘතියෙහි මුල ම ඇති ස්වරය වෘද්ධි වෙති යි කියනු ලැබේ. වෘද්ධි වීම නම් වර්ධනය යි. එ නම්

'අ' ස්වරය 'ආ' බවට ද
'ඉ', 'ඊ' ස්වර 'ඓ' බවට ද
'උ', 'ඌ' ස්වර 'ඖ' බවට ද
'ඍ', 'ඎ' ස්වර 'ආර්' බවට ද
'ඒ' ස්වරය 'ඓ' බවට ද
'ඕ' ස්වරය 'ඖ' බවට ද
පත් වීම යි.

'ඒය' ප්‍රත්‍යයය සහිත වචන සිංහලයෙහි බහුල වැ නොයෙදෙන හෙයින් මේ සියල්ලට ම උදාහරණ සිංහල ව්‍යවහාරයෙන් දිය හැකි නො වේ. ලාංකේය යන්නෙහි දී වනුයේ 'ලංකා' යන්නෙහි 'ල' අක්ෂරයෙහි 'අ' ස්වරය 'ආ' බවට පත් වීම යි. තව ද මෙ සේ ('ඒය' ප්‍රත්‍යයය යෙදෙන වදන් නම්

ගඞ්ගා/ ගංගා + ඒය = ගාඞ්ගේය/ ගාංගේය
පර්වත + ඒය = පාර්වතේය
ශිලා + ඒය = ශෛලේය

ආදිය යි. මෙහි 'ඒය' ප්‍රත්‍යයයෙන් ලැබෙන අර්ථය නම් (යමක්) පිළිබඳ, සම්බන්ධ අයත් යනු යි. ඒ අනුව 'ලාංකේය'/ 'ලාඞ්කේය' යන්නෙහි අර්ථය නම් ලංකාවට සම්බන්ධ, ලංකාව පිළිබඳ, ලංකාවට අයත් යනු යි. ලංකාවෙහි උපන් යන අරුත ද එයින් ලැබේ.

එ හෙයින් මේ ලිපියෙහි මුල දී දැක්වුණු යෙදුම් 'ලාංකේය ජනයා', 'ලාංකේය සමාජය', 'ලාංකේය සාහිත්‍යය' යනුවෙන් නිවැරැදි විය යුතු ය. 'ශ්‍රී ලාංකීය' යනුත් 'ශ්‍රී ලාංකේය' විය යුතු ය.

මෙ සේ, ප්‍රකෘතියෙක ආදි (මුල්) ස්වරය වෘද්ධියට පත් කරන තවත් ප්‍රත්‍යය කිහිපයක් සංස්කෘත තත්සමවල යෙදෙනු දක්නා ලැබේ. ඉන් එකක් නම් 'ය' ප්‍රත්‍යයය යි. එය යෙදෙන විට ද

බහුල + ය = බාහුල්‍ය
සඵල + ය = සාඵල්‍ය
සුඛ + ය = සෞඛ්‍ය
උදාර + ය = ඖදාර්ය
සහිත + ය = සාහිත්‍ය

ආදි වශයෙන් ස්වර වෘද්ධිය වීම සිදු වනු පැහැදිලි වැ පෙනේ. මෙ බඳු වදන් වහරෙහි යෙදෙන්නේ විශේෂණ වශයෙනි. බාහුල්‍ය වෘත්තිය (බහුල ව යෙදීම, පැවැතීම), සාහිත්‍ය නිර්මාණය, සෞඛ්‍ය විද්‍යාව ආදි ලෙසිනි. ඒක වචනයෙහි වර නැගුණු කල වදනෙහි අගට තවද 'ය' යන්නක් එක් වේ.

බාහිල්‍ය + ය් + අ = බාහුල්‍යය (බහුල බව)
සාහිත්‍ය + ය් + අ = සාහිත්‍යය
සෞඛ්‍ය + ය් + අ = සෞඛ්‍යය

ආදිය මෙනි. මෙහි 'අ' ඒක වචන ප්‍රත්‍යයය යි. 'ය්' ආගම වන (අලුතින් පැමිණෙන) අකුරෙකි.

දැන් වැරැදි යැ යි, අප ව්‍යවහාරයකැ යි ඉවත දැමුණු ලාංකීය යනු විමසා බලමු. මෙහි යෙදෙන්නේ 'ඊය' ප්‍රත්‍යයය යි. එ ද සංස්කෘත තත්සමවල බෙහෙවින් දක්නා ලැබෙන, යට කියැවුණු 'ඒය' ප්‍රත්‍යයය හා සම අරුතින් ම යෙදෙන්නෙකි. නිදසුන් මෙ සේ ය.

සමාජ + ඊය = සමාජීය
විද්‍යාලය + ඊය = විද්‍යාලයීය
මණ්ඩල + ඊය = මණ්ඩලීය
වර්ධන + ඊය = වර්ධනීය

මෙ එක ද තැනෙක ආදි (මුල) ස්වරය වෘද්ධි වීමක් නොවන බව මනා වැ නිරීක්ෂණය කළ යුතු ය.

එ අනුව, 'ඊය' ප්‍රත්‍යයය එක් වීමේදී වචනයෙක මුල ඇති ස්වරය වෘද්ධි නො වේ. එය වෘද්ධි කිරීම වරදෙකි. ලාංකීය යනු වැරැදි යෙදුමක් වනුයේ එ හෙයිනි. සාමාජීය, මාණ්ඩලීය, වාර්ගීය ආදිය මෙ බඳු ම තවත් අපව්‍යවහාර වේ.

'ප්‍රාදේශීය' යනු ද මෙ බඳු වැරැදි යෙදුමෙකි. ප්‍රදේශ + ඊය = ප්‍රදේශීය විනා ප්‍රාදේශීය නොවේ. එහෙත් ප්‍රාදේශීය සභා පවතින තෙක් (රජයෙනුදු පිළිගත්) මේ වදන වෙනස් කළ නොහැකි වනු ඇත.

# කෙටිකතාව

# විල්සන්ගෙ ලෝකය

● නන්දසේන විතාරණ

**කා**ර්යාලයට දින දර්ශන රාශියක්ම ලැබී තිබිණ. ටයර් කොම්පැනියකින් නිකුත් කෙරුණු එම දින දර්ශනය ආකර්ෂණීය එකකි. කුඩා දරුවකුගේ රුවක් සහිත තවත් දින දසුනක් ද විය. ආකර්ෂණීය දින දසුන දෙස තරුණ ගුරුවරයාගේ සිත ඇදී ගියේය.

"ඉල්ලන්න ඕන, ලොකු සර් දෙයිද දන්නෙ නෑ."

ගුරුවරයා විමසුවේ ලේකම්ගෙනි. ආයතන ප්‍රධානීගේ සිත හොඳින් දත් ලේකම්වරිය,

"ළමයි ඉන්න එක නම් දෙන එකක් නෑ. අනිත්ව නම් දෙයි" යැයි පැවසීය.

අද දොරටු පාලකයෙකුව සිටින විල්සන්ගේ ජීවිතයම දරුවන් වෙනුවෙන් කැපවූවකි.

බිලිඳු දරුවකු නිසා අද විල්සන් මුහුණපෑවේ අකරතැබ්බයකටය. රථගාල හැසිරවීම ඔහුගේ රාජකාරිය විය. අතින් අවකාශයේ රවුම් ඇඳ, වංගු ඇඳ, ඉරි ඇඳ, තිත් කොමා, පෙරළි කොමා, ප්‍රශ්නාර්ථ, විශ්මයාර්ථ ඇඳ මුවින් නොබැන එහෙත් ඔහු මනාව රථ හැසිරවීම කරයි. මෙය දිවයිනේ ප්‍රධාන පෞද්ගලික රෝහලක රථ ගාලයි.

"ලෙඩක් හරි, ලෙඩෙක් හරි ඇති කෙනෙක්නෙ මෙතෙන්ට එන්නෙ. ඒක එයාලට ලොකු ප්‍රශ්නයක්. අපි පුළුවන් තරම් උදව් වෙන්න ඕනේ" විලසන් කියන්නේ එසේය.

ප්‍රශ්නය මොහොතකට පසෙක තබා සිනාසී, නලාව පිඹ, අතක් ඔසවා යාමට බොහෝ මහතුන් උත්සුක වන්නේ ඔහුගේ මම ප්‍රජාශීලී බව හේතුවෙනි. ගෙවනවාට වඩා ගෙවෙන සොච්චම් වැටුපට වඩා ඔහු සතුටු වන්නේ, "මිනිස්සුන්ට වැඩක් ඇති වැඩක් කරන්න තියෙන එකත් ලොකු දෙයක් නේ" යැයි කියමිනි.

රිය හැසිරවීමේදී දොරටුපාල දක්වන රංගනය කුඩා බිලිඳන්ගේ මනමෝහනය කරයි. ඔවුහු සිනාසෙති, අතවනති, ප්‍රතිචාර දැක්වීමට කිසිවකුට කිසිම අවසරයක් නැත. දොරටුපාල අසිරු ද්විත්ව රංගනයකට පිවිසෙන්නේ එබැවිනි. දරුවාට දක්වන ප්‍රතිචාරය රියදුරා වරදවා වටහා ගත්තොත් රිය නොමඟ යයි. සියල්ලටම ඇත්තේ සුළු මොහොතකි. සැබැවින්ම සිදුවූයේ ද එයය. දරුවාට අවධානය යොමු කළ මොහොතේ නොමඟ ගිය රිය කුලුනෙහි හැපුණි. බෙල්ට්ටුව සහිත බඳ පසාරු විය.

"කොහේද අයිසෙ අතවනන්නෙ, තමුසෙ දන්නවද ඩැමේජ් එකට කීයක් ගෙවන්න වෙයිද කියලා"

රියකරු වාහනය එසේම නවතා රියෙන් පිටුපසට පැමිණියේ යක්ෂාවේෂයෙනි. දොර වසා ඇති නිසා දරුවාට කිසිවක් නොඇසුනි. ඇය තවමත් දෙඅතම ඔසවා මුරකරු සමඟ රංගනයේ යෙදෙන්නේ සිනහමුසු මුහුණිනි. අලාභය ගැන සිතීමට මුරකරුට තවමත් අවකාශයක් නැත්තේ දරුවාගේ සිනහව හා රංගනය හේතුවෙනි.

"කවුද මගේ අලාබෙ ගෙවන්නෙ"

"සර් වැරදීම මගේ. මම ලොකු මහත්තයට සිද්ධිය දැනුම් දෙන්නම්. සර් දරු පැටියට බෙහෙත් ටික අරගෙන එන්න. වාහනෙත් මෙතන තියෙනවා, මමත් මෙතන ඉන්නවා."

මැදිවිය ඉක්මවූ මුරකරුවා පිළිතුරු දුන්නේ දැමුණු සිතින් යුතුවය. ආ කාරණය සිහිකරගත් රියකරු දරුවා ද කරපින්නාගෙන පඩිපෙළ නඟින්නට විය. ඉවසිලිවන්තව කළ ප්‍රකාශයෙන් රියකරු යම්දුරකට මෙල්ල වූ බවක් ද පෙනිණි. අධි සුඛෝපභෝගී නවීන මෝටර් රථයට සිදුවූ හානිය බරපතළ නැත. එහෙත් මුරකරුට ගෙවීමට සිදුවන මිල ඔහුට බරපතළ එකකි. කොම්පැනිය එය ගෙවා දමා තම සායම බේරාගනී. මුරකරු කොම්පැනියෙහි ණයකරුවෙක් හෙවත් සිරකරුවෙක් වේ. සොච්චම් පඩියෙන් ද කොටසක් මාස් පතා කැපී යයි. දැන් දැන් මුරකරුගේ ඉහමොළ රත්වන්නේ දරු පැටියාගේ මුහුණ අමතක ගොස් ඇති බැවිනි. "වරදක් කරල නම් කමක් නෑ." එහෙත් සිදුවූ අලාභය කවුරුන් හෝ ගෙවිය යුතුය.

රක්ත වර්ණ කැබලි ලෙස බිම පතිතව තිබෙන්නේ ටේල් ලයිට් කැබලි නොව තම ආත්මය යැයි මුරකරුට සිතුණි. ඔහු ඒ දෙස බලාගෙනම කල්පනා කරන්නට විය.

දරුවන්ගේ සිත් පිරිසිදු ජලය බඳුය. පැහැයක්, රසක්, ගුණයක්, අගුණයක්, සුගඳක් හෝ දුගඳක් ද නැත. රතු වර්ණය එක් කළහොත් ලේ පැහැගැන්වේ. සඳුන් කිරි පැන්, පිරිත් පැන් වන්නේ ද ජලයයි. සුවඳ එක් කළ විට සුවඳ වේ. දුගඳ එක් කළ විට දුගදය. රස එක්කල විට රසය, විස එක් කළ විට විසය. බඳුනක දැමූවිට බඳුනේ හැඩය ගනී.

දරුවා දෙමාපියනට මහමෙරකි. රටේ හෝ පවුලේ අනාගතය දරුවාය. සියල්ලෝම සියල්ල කරන්නේ දරුවන් වෙනුවෙනි. එම නිසා දරුවන් වෙනුවෙන් ඇපකැපව ගත කළ ජීවිතය සිහිපත් කිරීම විල්සන්ට සැපතකි. දින තුනකින් නොගැලවූ යුනිෆෝමයෙහි දුගඳ ඔහුටම දැන් දරාගත නොහැක. අද ගෙවන ජීවිතය දුෂ්කර එකකි. එහෙත් අතීතාවර්ජනයෙන් සතුටු වන විල්සන් සිනාමුසුව වර්තමානයට මුහුණ දෙයි.

නංගිලා මල්ලිලා නොමැති බඩපිස්සකු වීම ද, නිවසට අල්ලපු නිවසක්වත් නොතිබීම ද නිසා විල්සන්ගේ ළමාවිය ගෙවුණෙ හුදෙකලාවය. නවවන ශ්‍රේණියේදී මධ්‍ය මහා විද්‍යාලයට සුදුසුකම් ලැබීම නිසා මවගේ මුල් නිවසෙහි ලැගුම් ගත් විල්සන්ට කුඩා නැගණිය රැකබලා ගැනීම පැවරුණි.

පාසල පස්වරුවේ වීම නිසා විල්සන් පෙරවරුවෙහි නිවසෙහි සිටින්නට විය. බිලිඳු නැගණිය, නළවන්නේද, නහවන්නේද, කිරිපොවන්නේද, නිදිකරන්නේ ද විල්සන්ය. හේනට හෝ කුඹුරට ගිය නැන්දම්මා ඉරමුඳුන් වෙද්දී නිවසට පැමිණෙන විට විල්සන් යුතුකම් සියල්ල ඉටුකර අවසන්ය.

එදා නොදැනුණත් හොඳ සැමියෙක්, පියෙක් වෙමි යන සංකල්පය තම යටිසිතෙහි තිබෙන්නට ඇතැයි විල්සන්ට සිතේ. පසුව පාසල අසල කුඩම්මාගේ නිවසෙහි ලැගුම් ගත් විට එහිද කුඩා දියණියක් විය. "පොඩ්ඩී"ට විල්සන් අයියා නැතිව බැරිවිය.

විල්සන්ට තම ජ්‍යෙෂ්ඨ පුත්‍රරත්නය සිහිපත් විය. කුඩාකල ඔහුට චුට්ටි මාමා නැතිවම බැරිවිය. චුට්ටි මාමා විවාහ වීම හා රටහැර යෑම ආසන්න සිදුවීම් විය. මුහුදේ නෑමට ගිය විටක ඔහු ඇසුවේ හද පාරවන ප්‍රශ්නාවලියකි.

"තාත්තෙ මම මේ බෝතලේ මුහුදට විසි කළොත් චුට්ටි මාමා ඉන්න රටට යාවිද?"

ඔහු මුහුද දෙස බලා කල්පනා කර තිබුණේ මුහුදින් එතෙර සිටින චුට්ටි මාමා ගැනය. ඔහු ඊළඟට ඇසුවේ බියගන්වන සුලු ප්‍රශ්නයකි.

"තාත්තෙ මම මුහුදට පැන්නොත් චුට්ටි මාමා ඉන්න රටට යාවිද?"

මාමලාට චූටි දරුවන් අමතක වුවද ඔවුන්ගේ සිත්වලින් මාමලා ලෙහෙසියෙන් ඉවත්වන්නේ නම් නැත. ඒ ආසන්නම දිනක හිතවත් ගුරුවරයෙකු ගේ මංගලෝත්සවයකට අපි සහභාගී වීමු.

"ප්‍රදීප් මාමේ, රටින් යන්න එපා" ලොක්කා කීය.

ඔහු තේරුම් ගෙන සිටියේ විවාහයෙන් පසු සිදුවීම රටහැර යෑම ලෙස. මේ සිදුවීම් සිහිපත් වන විට විල්සන්ගේ දෑස් කෙවෙනි වලට කඳුළු බිඳු නැගේ.

දෙවැන්නාගේ බිලිඳු විය හා දියණියගේ බිලිඳු විය විල්සන්ට සිහිපත් විය. දෙවැන්නා සත්ත්ව කරුණාව ඇත්තෙකි. ඔහු වෙනුවෙන් මාළු ටැංකි දෙකක්ම විය. ඔහු වෙනුවෙන් ජලජ පැළෑටි සෙවීමේ කාර්යයෙහිද කලක් විල්සන් නියැළී සිටියේය.

පූසන් බල්ලන් නිවසෙහි ඇති කෙරුණේ ඔහු වෙනුවෙනි. සතෙක් මැරුණ හොත් වළ දමා මතකය තිබෙන තෙක් හඳුන්කූරු පත්තු කිරීම ඔහුගේ සිරිතය. සතුන් ඇති කිරීම තම බිරිඳ නොරිස්සුවකි. එහෙත් දරුවන් වෙනුවෙන් එය කළ යුතුම විය. කුරුල්ලන්ට වෙන් වූ කෑම ලෑල්ල ද විය. උදේම පැමිණෙණ කුරුලු රංචුව දැකීම දියණියට මහත් සැනසිල්ලක් ගෙන දෙන්නක් විය. බිරිඳ ඉක්මවා දරුවන් ගැන සැලකිලිමත් වීමේ හැකියාවක් විල්සන්ට තිබුණි. දරුවන් කෙරෙහි බිරිඳගේ අවධානය ප්‍රමාණවත් නොවේ යැයි ඔහු සෑමවිටම සිතීය. සමහර විටක බිරිඳ සමඟ බහින්බස් වීම් සිදුවූයේද මෙම සිතිවිල්ල නිසාවෙනි. පදිංචිව සිටි නිවස හැර වෙනත් නිවසකට යෑමට බඩු අස්කරන දිනයේ දෙවැනියා කළේ තකහනියේම මාළු පැටවුන් ෂොපින් බෑග් වලට දමා දොරෙහි එල්ලා තැබීමය.

කලෙක විල්සන් දැඩිව දේශපාලනයට ඇප කැපවී සිටියේය. ඔහු දරදිය සැපයූ අංකුර දේශපාලඥයෝ අද මැතිඇමතිවරුය.

"ඉතින් මොනවද කරගත්තේ" යි බොහේ අය අසති.

"ළමයින්ට නිදහසේ ජීවත් වෙන්න රටක් තියෙනව ඒ මදිද." විල්සන් කියන්නේ එසේය.

ධනය, නිලය, බලය සියල්ල ඔහු නිර්මාණය කරගත්තේ තනිවමය.

ලොක්කාට නම තබද්දීම ඔහු සාහිත්‍යධරයෙකු විය යුතුයැයි විල්සන් කල්පනා කළේය. ඔහු අට ශ්‍රේණියට පිවිසුනේ ප්‍රථම පරිවර්තන කෘතිය ප්‍රකාශයට පත් කරවමිනි. එවැන්නක් කළ ලංකාවේ ප්‍රථමයා ද ඔහුය.

විල්සන් දරුවන් වෙනුවෙන් පුළුල් අර්ථයෙන්ම කැපවූවා සේම දරුවන්ගෙන් සතුටුවීමේ වරමද ඔහුට ලැබුණි.

ක්‍රියාශීලී රිය හසුරුවන්නා දැන් මන්දගාමීය. බිම වැතුරුණු ටේල්ලයිට් කැබලි තවමත් එසේමය. සිද්ධිය සැලවීමෙන් පසු පැමිණි ප්‍රධානියා සැරවැර වූයේ නැත. ඔහු කලාව දනී. බණින්නට දෙයක් නැත.

"ෂේප් කරගන්න බලනව විල්සන්, නැත්නම් තමුසෙට ලොකු ගාණක් ගෙවන්න වෙයි."

මුහුණෙහි හා සිරුරෙහි නැගුන දහදිය බිඳු පහළට රූරා වැටෙනු විල්සන්ට දැනින. බැන්නා නම් හොඳය. නොඅසා සිටිය හැක. දුන් තීන්දුව භයානකය. එය ඉරණම තමාටම තීරණය කරගැනීමට දුන් අවසරයකි. විල්සන් රෝහල සිසාරා ඇවිද ගියේය.

ලෙඩුන් පෝලිමේ සිටි දරුවාගේ අතේ ප්ලාස්ටරයක් අලවා තිබේ. මුහුණෙහි දිස්වන්නේ හැඬූ බවට සලකුණකි. විල්සන් වෙත අත දිගහැර පෑ කුඩා දියණිය "ඇන්ටිල ඌව කරනවා, මාම කියන්න එපා කියලා" යැයි කීවේ බිඳුණු හඬිනි.

"නර්ස් ඇන්ටිල ඔහොමයි. මම කියන්නම් එපා කියල."

රියකරු විලසන් දෙස බැලුවේවත් නැත. "කමක් නෑ. වෙන දෙයක් වුණාවේ. දරුපැටිය වැරදිකාරය කරන්නයැ"යි විල්සන් කල්පනා කළේය.

"ෂේප් කෙරිලි බොරු." විල්සන් නැවතත් රථ ගාලටම පැමිණියේය.සිවු පදයක්වත් කියා නැති තරුණියෝ මවුපදවිය ලැබීමෙන් පසු නැළවිලි ගී ගයන්නේ විරිතටය. සැම මවක්ම ගායිකාකි.

කිසිම දරුවෙක් එය නාසා සිටින්නේ නැත. ළමයින්ට අවශ්‍ය විට විල්සන් චිත්‍ර ශිල්පියෙකු ද වේ. මේ පුතේ ඌරෙක්. ඔහු ඇන්ද චිත්‍රය දෙවෙනියාට පෙන්නුවේය. 'ඌ අල ගෙඩියක් ද තාත්තෙ කන්නෙ' දරුවා කී දෙය විල්සන්ට වැටහුණේ පසුවය. කටයැයි ඇඳි රවුම දරුවා දුටුවේ අලගෙඩියක් මෙන්ය.

කෙසේ වුවත් ප්‍රසිද්ධ ළමා පුවත්පතක තිබූ චිත්‍ර තරගවලින් තිදෙනාම සමත් කරවීමට විල්සන්ට හැකි විය. දෙවැන්නා ශිෂ්‍යත්වය ලියද්දී ඔහු ශිෂ්‍යත්ව ගුරුවරයා විය. 'ඔයා ඔයාගෙ වයසෙ ළමයි අතරෙ දෙසීයවැනියට වගේ ඉන්නව. ඒක තේරුම් අරන් ඉදිරියට ගියාම හරි' යැයි විල්සන් කීවේ මහත් සතුටිනි. බලාපොරොත්තු වූ පාසලට දියණිය ඇතුළත් කරගැනීමට විල්සන්ට නොහැකි විය. ඒ සඳහා මාස 6ක පමණ කාලයක් බලා සිටීමට සිදුවිය. ඒ කාලය විල්සන් අපතේ නොහැරියේය. විල්සන් දියණිය පාසල් දැරියක කළේය. උදයේම නැගිටුවයි, පිරිසිදු කරයි. කොණ්ඩය පීරා ඇඳුම් අන්දවයි. දැන් ඉස්කෝලෙ පටන් ගන්නවා.

"ආයුබෝවන්"

එක ශ්‍රේණියේ ගුරුතුමා වූයේද විල්සන්ය. පෙරවරු 10.00 පමණ වන තෙක් ඔහු දියණියට උගන්වයි. කෙසේ හෝ සියලුම විෂය නිර්දේශයන් මාස හයකින් අවසන් විය. මාස හයක ප්‍රමාදව පාසලට ගියත් දියණිය පන්තියේදී අපහසුතාවයකට පත් නොවූයේ විෂය නිර්දේශයන් ආවරණය කොට තිබූ බැවිනි.

> **රටේ හෝ පවුලේ අනාගතය දරුවාය. සියල්ලෝම සියල්ල කරන්නේ දරුවන් වෙනුවෙනි. එම නිසා දරුවන් වෙනුවෙන් ඇපකැපව ගත කළ ජීවිතය සිහිපත් කිරීම විල්සන්ට සැපතකි. දින තුනකින් නොගැලවූ යුනිෆෝමයෙහි දුගඳ ඔහුටම දැන් දරාගත නොහැක. අද ගෙවන ජීවිතය දුෂ්කර එකකි.**

"දැන් ඕන ට්‍රැක් එකේ ඉන්නවා. අම්මට තියෙන්නෙ ඉස්සරහට අරන් යන එක විතරයි" කියමින් විල්සන් තම සෘජු ග්‍රහණයෙන් දියණිය නිදහස් කරන්නේ 5 ශ්‍රේණිය පසු කළායින් පසුවය. ඉදිරි ඵල දකින්නට පෙර වයස 50 දී විල්සන් බරපතළ ලෙස රෝගාතුර විය. දරුවන්ගේ වගකීම් මවට පැවරුණි. යන්තමින් ජීවිතය පමණක් බේරාගත් විල්සන් යළි දිවිය ඇරඹූයේ මුරකරුවෙකු ලෙසයි.


ස්ථානභාර නිලධාරි ද කැටුව රථහිමියා පැමිණෙනු දුටු විල්සන් පියවි ලොවට පිවිසියේය. ඔවුන් දෙදෙනා කථා කිරීමට පෙර විල්සන්ම කථාව පටන් ගත්තේය.

"මහත්තය උදේ කෑගහද්දී මම අහගෙන හිටියෙ දරුව කාරෙක ඇතුළෙ හිටපු නිසයි. දැනුත් බණිනව නම් කරුණාකරල දරුව ඇතුළෙන් තියල, දොර හොඳින් වහල ඉන්න. වාහනේ ඩැමේජ් එක රෙපෙයාර් කරන්න පුළුවන්. මහත්තයගෙ වචන වලින් දරුවාගෙ මොළේට වන හානිය කිසි දවසක රෙපෙයාර් කරන්න බෑ. මමත් දරුවො හදපු තාත්ත කෙනෙක්." විල්සන් එක දිගටම කියාගෙන ගියේය.

බලාපොරොත්තු නොවූ කථාවෙන් රථහිමියා අන්දමන්ද විය. කීමට ආ කිසිවක් ඔහුට මතක් කරගැනීමට ද අපහසුය. රිය තුළ සිටි දැරිය මාමාට අත වනන්නට විය.

"OIC මගේ ඩැමේජ් එක ඉන්ෂුරන්ස් එකෙන් ගෙවනවා. මට ඕන වුණේ සිකුරිටි අංකල්ට පාඩමක් උගන්නන්න විතරයි. ඒත් මං ඉගෙන ගත්ත පාඩම ඊට වඩා වැඩියි."

රථය පිටත් විය. දැරිය නොපෙනී යන තෙක්ම අතවැනීය. උදේ සිට සාක්කුවේ සිරවී තිබූ බුලත් විට අතට ගත් විල්සන් පුටුවේ වාඩිවී එය සපන්නට විය.





මෙවර කෙටිකතාව ලියන්නේ විශ්‍රාමික විදුහල්පතිවරයකු වන නන්දසේන විතාරණ ය. බාලවියේ සිටම ලේඛනකලාවට ඇල්මක් දැක් වූ ඔහු විටින් විට පුවත්පත් වලට ලිපි රචනා ආදිය ලියා ඇත. ලේඛකයෙකු, දේශකයෙකු ලෙස මෙන්ම ප්‍රජා සත්කාර සේවයේද නියැළී සිටින නන්දසේන විතාරණ සමස්ත ලංකා පාඨක ලේඛක සංසදයේ ප්‍රධාන විධායක ද වේ.

"ආඩම්බරකාර පියෙකුගේ කතා ඇසුරෙන් ලියවෙන නව අධ්‍යාපනික ප්‍රතිපත්තියට පෙර වදනක්." ඔහු විසින් රචිත කෘතියකි.




## අමෙරිකා හයිකු කවි එකතුව - දිසි අදිසි

**ජ**පානයට ම අනන්‍ය වූ සාම්ප්‍රදායික අංග තිබේ. බෝනික්කන්, කරාතේ, කිමොනො, ගේෂා, සුමෝ, සෂිමි ඉන් කිහිපයකි. හයිකු කවි ද ඒ අතර වෙයි. මේ 'ජපන් බඩු' දැන් ලොව පුරා 'නිපැදවෙමින්' පවතින නමුත් ජනිත දේශය වන ජපානයේ ඒවායේ ආවේණික 'ජපන්කම' තවමත් පවතියි.

ජපන් හයිකු කවිවල එක් විශේෂ ලක්ෂණයක් වනුයේ ඒවා පේළි තුනකට සීමාවීමයි. මේ පේළි තුනේ තිබිය හැක්කේ වචන 17ක් පමණි. ඒ ඒ පේළිවල 5, 7, 5 ලෙස ඒවා පිහිටුවනු ඇත. අතීත් ජපන් කවිය පංතිවල ආරම්භක කවියේ ස්වරූපය එය විය. එය හැඳින්වුණේ 'හොක්කු' නමිනි. එය පසුව හයිකු නමින් වෙනස්ම ෂානරයක් බවට රූපාන්තරණය වී ඇත්තේ ඒ තනි කවියයි.

හයිකු කවිවල තවත් විශේෂිත කාරණයක් නම් ඒවායේ කවිය අයත් ඍතුව පිළිබඳ ඇඟැවෙන වචනයක් අන්තර්ගත වීමයි.

ඒවායේ තවත් විශේෂයක් වනුයේ සොබාදහමේ එසැණ සිද්ධියක් පමණක් ඉන් නිරූපණය වීමයි. දර්ශනයක් හෝ දිගු කතන්දරයක් ඒවායේ නොමැත. එහෙත් පාඨකයාගේ සිතේ මැවෙන දර්ශනය සවිස්තර එකකි.

හයිකු කවියේ පුරෝගාමියා ලෙස සැලකෙන මත්සුඕ බෂෝ (1644 - 1694)ගේ කවියක ඡායානුවාදයයි මේ.

පැරණි පොකුණක
ගෙම්බෙක් පනියි.
ජලයේ හඬ

මේ කරුණු ගැන සලකා බලන විට සිතෙන දෙයක් නම් ජපාන කවිය පිළිබඳ ව හැදෑරීමක් නොමැතිව, ජපන් කවියකුට පවා නියමාකාරයේ හයිකු කවි නිර්මාණය කළ හැකි ද යන්නයි.

එහෙත් අමෙරිකානුවෝ හයිකු කවි නිර්මාණය කරති. ඒවා 'අමෙරිකා හයිකු' ලෙස මෙහි විස්තර කෙරෙයි. මේ පොත ඇරඹුමේ හැඳින්වීම ලෙස ඇතුළත් 'ජපන් හයිකු හදවතින් ජීවනය ලද අමෙරිකා හයිකු' යන මැයෙන් යුතු සටහනේ මෙසේ සඳහන් ය.:


'ඇමරිකා හා ජපන් ජාතිකයන් නොවන හයිකු කවියනට සැබැවින් ම පරිපූර්ණ හයිකු රචනා කළ නොහැකි ය. , " An Anthologi of Contemporary North Ameriacn Haiku", කෘතියේ හැඳින්වීමෙහි ලා මේ පිළිබඳ ව අවධාරණය කරන එහි සංස්කාරක බෲස් රොස්, ජපන් සංස්කෘතික හෘදයෙහි පහළ වූ හයිකු කවිය ඊටම හිමි අන්තර්භාෂණ, මනෝභාව, සංකල්ප පද්ධති, නිශ්චිත මාත්‍රා සංකේත සහ ඉංගිතිවලින් සමන්විත සූක්ෂ්ම ආත්ම ස්වභාවයක් සහිත එකකි'යි පවසයි.

එබැවින් ලොව පුරා ඉංගිරිසි සහ අනේක භාෂාවලින් හයිකු රචනා කරන කවි කිවිඳියන්ට හැකි වනුයේ හයිකුවට හිමි සර්වකාලීන කාව්‍යෝචිත මූලෝපාය පිහිටාධාර කැර ගැනීම පමණි. එලෙස හයිකුවේ නිසර්ග සිද්ධ ආධ්‍යාත්මයට හැකි උපරිම ලෙස ප්‍රවේශ වීමේ සක්‍රිය ප්‍රයත්නයේ දැනුදු දහස් ගණන් අමෙරිකා හයිකු කවීහු ද කිවිඳියෝ ද නිරත ව සිටිති.

අමෙරිකාව ඇතුලු ඉංගිරිසි කතා කරන රටවල හයිකු කවියෝ එකී නිර්මාණ ප්‍රයාසයේ දී විශේෂිත නිර්ණායක කිහිපයක පිහිටා සිටිති. ඒ වනාහි හයිකුකරණයට එළැඹෙන ආධුනිකයනට පවා එහි රුව ගුණ දැන හැඳින යාමට මග පෙන්වන නිර්ණායකයෝ වෙත්. ඒවා සාම්ප්‍රදායික ජපන් හයිකු කාව්‍යයට අනන්‍ය ස්වභාව ලක්ෂණයන්ගෙන් පරිබාහිර ඉගැන්වීම් නොවේ. ඉන් පළමු වැන්න සිද්ධි වාචකය "මේ දැන්", "මේ මොහොතේ" එනම් ජීවමාන ක්ෂණයට අයත් විමයි.'

'දෙවැනි විශේෂිත ලක්ෂණය නම් හයිකු ව වර්තමානයට අයත් වුව ද එය වර්තමානයේ කැරෙන හුදු වර්ණනයක් හෝ ඊට අයත් සිදුවීමක් පමණක් නොවන බව ය. එය සවිඥානකත්වයේ, අභ්‍යන්තර ප්‍රතිවේදයේ, අභ්‍යන්තර ප්‍රතිවේදයේ, විස්මයේ හෝ ප්‍රීතියේ මොහොතයි. මේ කවරක් වින්දනයේ ගම්භීරත්වය සඳහා ආධාරක වන්නේ ද? උදාහරණයක් ලෙස කැටපිලරයක් මත දිලෙන පිනි බිඳුවක කෙටි ජීවිතය හෝ ශරත් සමයේ පත් පතිත විම ඇසුරේ මරණයේ අරුත දාර්ශනික ඇතුළු නුවණකින් නිරීක්ෂණය කිරීමක් ගැන සලකමු.

මෙකී නිරීක්ෂණයේ දී හයිකු කවියාගේ මමත්වයේ අවධාරණයට කිසිදු ඉඩක් නොවේ. "මම", "මා" වැනි සර්වනාමයක් අධිකව භාවිත කිරීම මගින් දැඩි චිත්තවේගයක් පළ විය හැකි ය. හයිකුවල " සංකල්පය" වනාහි අත්දැකීම වෙත මනස විවෘත කිරීම මිස කවියාගේ චිත්වේගවලින් හා හැඟීම්වලින් එය පුරවාලීම නොවේ. මෙය ද හයිකු කවිය අනෙක් කාව්‍යවිධිවලින් වෙනස් වන තවත් සාධකයකි.'




හයිකු කවිවල ආත්මීය ලක්ෂණ අමෙරිකානු හයිකු කවිවල ප්‍රකට බව ඉහත උද්ධෘතවලින් පැහැදිලි ය. එසේම අමෙරිකානු හයිකු කවීන් පෙන්වා දෙන කරුණක් නම් ඔවුන් පේළි තුන සහ 5 - 7 - 5 ද ඍතු පිළිබඳ ඇඟවුම ද යන මූලික ලක්ෂණ දේවභාෂිතයක් ලෙස පිළිගැනීමට සූදානම් නොමැති බවයි. එම අවශ්‍යතා සපුරාලීම කවියාගේ කැමැත්ත අනුව අවස්ථාවෝචිත පරිදි සිදු වනු ඇති බව ඔවුහු පෙන්වා දෙති.

සියවස් ගණනක් පැරණි ජපන් සංස්කෘතික උරුමය හා සසඳන කළ අමෙරිකානුවන්ගේ සංස්කෘතික උරුමය හිරු ඉදිරියේ කදෝකිමියකු බව අමුතුවෙන් කිව යුතු නැත.

දැන් අමෙරිකානුවන් තමන්ගේ කැර ගෙන ඇත්තේ ඒ සංස්කෘතියේ එක් අදීන අංගයකි. ඇකඩමියා වෙබ් අඩවියට .'John Ashberry's "37 Haiku" and American Haiku Ortodoxy (ජෝන් ඇශ්බෙරිගේ හයිකු කවි 37ක් සහ අමෙරිකානු හයිකු චිරස්ථාපිතය) යන හිසින් දීර්ඝ ලිපියක් සපයන තායිවානයේ තාම්කෑං විශ්ව විද්‍යාලයයේ මහාචාර්ය ඩීන් ඒ. බිරංක් මේ ගැන තුලනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරයි.

අමෙරිකානු හයිකු කවිය හදාරන්නට යොමුවන සිංහල පාඨකයාට මෙහි අන්තර්ගත කවි කියැවීමෙන් ඔවුන්ගේ කවියේ ස්වරූපය පිළිබඳ මනා වැටහීමක් ලැබෙනු නිසැක ය.

වසත්, ගිමත්, ශරත්, හිමත් යන ඍතු හතරට වෙන් කොට ඇති කවි 225ක් පමණ මේ කෘතියේ අන්තර්ගත ය. ඒවායේ නිර්මාතෘන්ගේ සංඛ්‍යාව 200 ඉක්මවයි.

දිසි අදිසි නන්දන වීරසිංහගේ කෘතියකි.

# කතන්දරවලට අසීමිත ව පෙම් බඳින ලේඛකයා

## කැලුම් වැලිගම



● සුමුදු චතුරාණී ජයවර්ධන

**පාවුලෝ කොයියෝ කියන්නේ සියලු නිධාන පවතින්නේ අප හදවත් ඇතුළත බව ය. ඒ නිධාන මතු කර ගැන්මට තරම් සියුම් බවක්, අවදි බවක් අප හදවතෙහි නැති බව ය. ඔහු ඒ බැව් කිව්වේ ලෝක පූජිත "The Alchemist" කෘතිය ලියමිනි. මෙය චූලානන්ද සමරනායක "සන්තියාගෝ නම් සැරිසරන්නා" නමින් සිංහලට නඟා තිබේ. අපේ ජීවිතයේ මඟ හැරෙන දේ නිසා අපට කොතරම් දේ අහිමි වෙනවාද යන්න ගැන ලියවුණු මේ වැනි දෑ දකින විට තවත් බොහෝ දෑ සිහිපත් වෙන්නේ ය.**

පාවුලෝ කොයියෝ අපූරු තාලේ ලේඛකයෙකි. මේ ලතින් ඇමරිකානු ලේඛකයා දිගින් දිගට ම සිය කෘති මගින් සියුම් ව ස්පර්ශ කරන්නේ මානව ජීවිතයෙහි වන දැක නොදැක යන සියුම් චින්තා ය. පාවුලෝ කොයියෝට ගණිකාවකගේ වතෙන් ද ආලෝකයක් පෙනෙයි. මිනිත්තු එකොළහ ඇතැති ව බොහෝ දෑ දකින්නට පාර පෙන්වන ඔහු අනෙකා දෙස අවබෝධයෙන් බලන්නට අපට ආරාධනා කරයි. එවිට මේ ලොව නරක මිනිසුන් ඔබට හමු නොවනු ඇත. හේතුව ඒ සෑම නරකක් පිටුපස ම කතන්දරයක් ඇති බැවිනි.

මේ සියල්ල ඔබට කියන්නට හිතුවේ හේතු කාරණාවක් නිසා ය. හොඳ නරක කියන්නට ඉක්මන් නොවී හිත සසල කළ පොතක් ගැන කියන්නට මම වේදිකාවක් සොයමින් සිටියෙමි. නිමැවුමක පෙරනිමිති ඒ සිතිවිල්ලට මනරම් ව පාර කැපුවේ ය. කෘතිය පර්සෝනා ය. කර්තෘ කැලුම් වැලිගම ය. ඔහු පර්සෝනා කෘතියේ එක්තැනක අපූරු කතාවක් කියන්නේ ය.

'ජීවිතය කියන විලාසිතා දැක්මෙදි ගැහැනිකට දිනන්න අවශ්‍ය නම් ශරීරයේ හැඩය 35%ක්, බුද්ධිය 30%ක්, පෞරුෂය 20%ක් සහ මුහුණේ ලස්සන 15%ක් යන අනුපාතයන්ගෙන් සකස් වෙන්න ඕන කියලා සෙලීනා හිතුවා'

ගැහැනිය ගැන අපූරු හා වෙනස් අයුරෙන් කියවා ගත් කෘතියක් ලෙස පර්සෝනා හැඳින්විය හැකි ය. කැලුම් දීර්ඝ කාලයක් තිස්සේ සන්නාම හා අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ කරන ලද පර්යේෂණමය ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙස මේ නවකතාවට සවිමත් හා වෙනස් පදනමක් නිර්මාණය කර තිබේ. කැලුම් පුද්ගල අභිප්‍රේරණ පර්යේෂකයෙක් හා දේශකයෙක් ද වෙයි. මේ වනවිට ඔහු කෘති 15 කට ආසන්න ප්‍රමාණයක් විවිධ ක්ෂේත්‍ර අරභයා රචනා කර තිබේ. කැලුම් ප්‍රබන්ධ කලාව දකින්නේ වෙනස් අයුරකිනි. එය නිර්මිත වන්නේ විවිධ කතාන්දර ඔස්සේ බව ඔහුගේ විශ්වාසයයි.

'මම දැඩි ව විශ්වාස කරන දෙයක් තමයි විශ්වය බිහිවුණේ පරමාණුවලින් වුවත් ලෝකය බිහිවුණේ කතන්දරවලින් කියන දේ. ඒ නිසා මිනිස් ලෝකය කතන්දරවලින් වෙනස් කරන්න; සුවපත් කරන්න වගේම සමහර කතන්දරවලින් මේ ලෝකය සිරකරලා තබන්න වගේම විනාස කරන්නත් අපට පුළුවන්. සමහරවිට ඉතිහාසය කියන්නෙම කතන්දරයක්; සමහර විට ආගමක් කියන්නෙම කතන්දරයක්. හැබැයි අපි විශ්වාස කරන කතන්දරයෙන් අපි සීමා වෙනව ද; විශිෂ්ට වෙනව ද; වෙනස් වෙනව ද කියන දේ සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙනවා. මගේ කෘති ඔස්සේ මම උත්සාහ කරනවා සංස්කෘතිය පුළුල් කරන, ජීවිතය පුළුල් කරන; සිතිවිලි රටාව පුළුල් කරන කතන්දර කලාවක් හඳුන්වා දෙන්න'

ලෝකය නිර්මිත වී ඇත්තේ විවිධ කතා එකතුවකිනි. සමහර කතාන්දර ශෝකාන්ත ය; සමහර කතා සුඛාන්ත ය. මොනවා වුවත් මේ සියල්ල ම විවිධ ලෙස ජීවිතය කියවා ගන්නා අනුපාන ය. පර්සෝනා බිහිවෙන්නේ කැලුම් සිටිනා මේ ආස්ථානයේ සිට බලද්දී මේ සියල්ලේ එකතුවකිනි; තවත් ලෙසකින් කියවා ගන්නේ නම් කැලුම් දුටු සෙවූ ලෝකයේ කතාන්දර මුතුපටක් සේ ඇමිණීමෙනි.

කැලුම්ගේ කෘති දෙස විමසිල්ලෙන් බලන්නකුට හසුවන ප්‍රධාන කතාවක් තිබේ. ඒ තැනින් තැන අහුලා ගත් විවිධ කතාන්දර ජීවිතයේ විවිධ අවස්ථා හා සුරු ව බද්ධ කිරීම ය. ඒ සඳහා ඔහු සරල බස් වහරක් යොදා ගන්නේ සියලු පාඨක කණ්ඩායම් නියෝජනය වන ලෙසට ය. ඒ සියල්ලට ගෝචර වෙන ආකාරයට ය. ඔහු කිසිම පොතක කර්තෘ අයිතිය පිළිබඳ සටහනක් ඇතුළත් නොකරයි. මේ කතා එකතුවල ඇත්තේ ඔහුගේ කතා නොවන බවත් ඒවා ඔබේ කතා බවත් ඔහු පවසයි. පර්සෝනා නවකතාවේදී පමණක් චරිතවල විශ්වසනීයත්වය වෙනුවෙන් නීතිමය ආරක්ෂාව පතා ඔහු අයිතිය තහවුරු කරන්නේ එය නවකතා ම ය සන්දර්භයක පිහිටන නිසා ය. ඕනෑ ම පොතක තියෙන්නේ කර්තෘට සෘජු හෝ වක්‍ර ලෙස සම්බන්ධ වූ අත්දැකීම් ගොන්නකි. එබැවින් අයිතිය ගැන ප්‍රශ්න කිරීම අයිතියක් නැති ක්‍රියාවක් සේ කැලුම් ලේඛකයා දකී.

'පර්සෝනා ලියැවෙන්නේ 2015-16 වසරවල. ඒ වෙද්දි මම පෞද්ගලික ආයතනයක සන්නාම හා අලෙවිකරණය සම්බන්ධ කළමනාකරුවකු ලෙස සේවය කළා. අද මම නිරත රැකියාවට වඩා වෙනස් රැකියාවක් ඒ කාලයේ කළේ. පොත නිකුත් වුණේ 2017 දී. ප්‍රබන්ධයක් කරද්දි ඒකට අදාළ චරිත, සිද්ධි හා අවස්ථා සාමාන්‍ය සමාජයෙන් තමයි ලේඛකයා උකහා ගන්නේ. අහුලා ගන්න සිද්ධියක හෝ චරිතයක තියෙන දෙයක් තමයි පසුකාලීන ව ලේඛකයා තමන්ගෙ නවකතාව ඇතුළෙ චිත්‍රණය කරන්නෙ. ලේඛකයා තමන් කැමැති ලෝකයක්, තමන් එළියට කියන්න කැමැති ලෝකයක් පොත ඇතුළෙ නිර්මාණය කළාට ඇත්තටම මේ චරිත ඇතුළෙ සැබෑ අය නැහැ කියල කියන්න බැහැ. සමහරවිට මේ ඇත්ත චරිත ලේඛකයාට සෘජු ව මුණ ගැහිලා නැතිව ඇති. වෙන විදිවලට ඒවා ලියවිලත් ඇති.

පර්සෝනා ප්‍රධාන චරිතය ගැන ගොඩක් අය මගෙන් අහනවා. සෙලීනා සමන්ති සින්ක්ලෙයාර් කියන කාන්තාව ටිකක් වෙනස් විදියෙ චරිතයක්. වෙනස් විදියේ ප්‍රේමයක් බලාපොරොත්තු වෙන, වෙනස් විදියේ ලිංගික නැමියාවක් තියෙන, වෙනස් චින්තනයක් තියෙන කෙනෙක් කියලා ඇය ගැන බොහෝ අය කියනවා. ඇය අල්ෆා විදියේ කාන්තාවක්. ගොඩක් අය මගෙන් අහනවා මේ විදියේ කාන්තාවක් හමුවෙලා තියෙනවද, ඇසුරු කරලා තියෙනවද කියලා. මට නැහැ කියලා කියන්න බැහැ. ඒවැනි හිතවත්කම් තිබිලා තියෙනවා. ඒ හිතවත්කම්වල තිබුණු දේවල් මේ කතාවට යම් යම් ආකාරවලට බලපෑම් කරලා තියෙනවා. මගෙන් අහලා තියෙනවා ලක්ෂ 50ක ඔරලෝසුවක් බඳින කෙනෙක් ඔබට හමු වෙලා තියෙනවද කියලා. ඇත්තට ම මට හමු වෙලා තියෙනවා සහ ඒවගේ අය ලංකාවේ ඉන්නවා. අනිත් දේවලුත් එහෙමයි.'

ලේඛකයෝ බහුතරයක් තමාගේ අත්දැකීම් ලියති. අනුන්ගේ අත්දැකීම් ද ලියති. වෙනයම් ප්‍රවේශයකින් අත්දැකීම් ලබාගත්තේ වුව ලියද්දී තමාගේ අත්දැකීම් ඊට එකතු වීම වැළැක්විය නොහැකි ය. එය සිතා මතා එකතු වෙන්නක් නොවිය හැකිය. නමුත් ඒ එබිකම් කිරීම වැළැක්වීම අසීරු ය. තමා මුළුමනින් ම ඉවත් වී යමෙක් ලියන්නේ යැයි කීවොත් එය අර්ධමය සත්‍යයක් යැයි කෙනකුට සිතුණොත් එය පුදුමයක් නොවේ.

'පර්සෝනා පොතේ තියෙන බොහෝ චරිත මා ඇසුරු කළ, හමු වුණු චරිත. මේ සමහර චරිත මම ළඟින් නිරීක්ෂණය කරලා තියෙනවා; සමහර චරිත දුරින් නිරීක්ෂණය කරලා තියෙනවා. ඒ වගේම මම ඉගෙන ගත් විෂයය අලෙවිකරණය හා සන්නාමකරණය මට මේ කෘතියට බලපෑවා. ඒ වගේ ම රටේ ඒ කාලයේ තිබුණු දේශපාලන වාතාවරණයත් යම් බලපෑමක් කළා. මනුෂ්‍යයෙක් විදියට මගේ හොඳ නරක සහ මා දිහා හැරී බැලීමකුත් මෙහි තිබෙනවා'

ප්‍රබන්ධයක් කියන්නේ ඇත්තක් පෙන්වන බොරුවකි. චරිත, සිද්ධි, ස්ථාන ප්‍රබන්ධ විය හැකිය; නමුත් ප්‍රබන්ධයේ කතාව ඇත්තකි. ඒවාට මුහුණ දෙන මිනිස්සු යම් යම් මට්ටම්වලින් සිය නැණ පමණින් ඊට මුහුණ දෙති. මේ සියල්ල ඇත්තකි. නමුත් ඒ වෙනුවෙන් ගොඩනඟන කතා වින්‍යාසය වෙනස් විය හැකිය.

'විලාසිතා ලෝකය සහ ව්‍යාපාර ලෝකය අතර ඇති සම්බන්ධය මෙහි ප්‍රධාන කොටසක්. සෙලීනා නිර්මාණය කරනවා සුවඳ විලවුන් වර්ගයක් ලිංගික කටයුතුවලදී භාවිත කරන. මේවා ගැන එච්චර දැනුමක් නොතිබුණු යුගයක වුණත් මට හිතුණා මේ වගේ දේවල් ඇති කියලා. අද මේවා ජනප්‍රියයි. ලේඛකයෙක් හොඳ නරක කියන මායිමෙන් එහාට ගිය චින්තනයක් පාඨකයාට ඇති කළ යුතුයි කියලයි මම හිතන්නෙ. හරි වැරැද්දෙන් එහා ගිය සීමාවේ සිට ජීවිතය දෙස බලන්න කියලයි මම ආරාධනා කරන්නේ. සෙලීනා වගේ කාන්තාවන් ලංකාවෙත් ඉන්නවා. ඒ චරිත හරි ද වැරදි ද කියන කාරණය වැදගත් නැහැ. ව්‍යාපාරික ලෝකයේ ඒ වගේ කාන්තාවන් මට මුණ ගැහිලා තියෙනවා. සමහරු අතීතයේ තමන්ට වූ අඩුපාඩුකම් ආවරණය කරගන්නත් මේ වැනි දේ කරනවා. හැම වීරයෙක් පිටුපස ම ඛේදවාචකයක් තියෙනවා'

කැලුම් වැලිගම විවිධ කතාන්දර ඔස්සේ ජීවිතයේ විවිධ මනෝභාව විශ්ලේෂණයේ ලා නිමග්න වෙන්නේ කලක පටන් ය. ඔහුගේ ලෝකයේ සිටින පාඨකයන් වෙනස් වීමට කැමැති, වෙනස් සිතිවිලි ඇත්තන් වීම හේ නිරන්තරයෙන් අපේක්ෂා කරයි. කැලුම් නිර්මාණකරණයේ යෙදෙන්නේ ම ඒ වෙනුවෙනි. ඔහු ඒ සඳහා පාඨක මනස සැකසීමේ විවිධ උපක්‍රම භාවිත කරයි. 'ෂර්ලොක් හෝම්ස් වගේ හිතන්නෙ කොහොමද' එකී වෙනස් නිරීක්ෂණයක ප්‍රතිඵලයකි. අලෙවිකරණය පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමෙන් හා ඉන් බාහිරව න්‍යායික හා ප්‍රායෝගික භාවිතයේ නිපුන් ඔහු නිරීක්ෂණයේ වැදගත්කම මැනවින් දනියි. මේ ක්ෂේත්‍රවලට අමතර ව ලේඛකයකු වීමෙන් ඔහු ලද පරිචයත්, පුද්ගල සංවර්ධන වැඩමුළුත් ඔහුගේ භාවිතය වඩාත් සුබනම්‍ය කර ඔපමට්ටම් කළේ ය.

'මම වැඩියෙන්ම මහන්සි වුණු පොත මොකද්ද කියලා කවුරුහරු ඇහුවොත් ඒ තමයි 'ෂර්ලොක් හෝම්ස් වගේ හිතන්නෙ කොහොමද'කියන පොත. ෂර්ලොක් හෝම්ස් ලෝකය පුරා ජනප්‍රිය චරිතයක්. මේක ෂර්ලොක් හෝම්ස් ප්‍රබන්ධ චරිතය පාදක කරගෙන ලංකාවේ බිහිවුණු ප්‍රථම ප්‍රබන්ධ නොවන කෘතිය. වෙන රටවල බිහිවුණා. මේක රසවත් අත්හදා බැලීමක්. මේක කිසිසේත්ම පරිවර්තනයක් නොවෙයි. මිනිස්සු එක්ක ආශ්‍රය කරද්දි දැනුණු දෙයක් තමයි මිනිස්සු වෙනස් කරන්නෙ, මිනිස්සු කවුද කියලා තීරණය කරන්නෙ ඒ මනුස්සයා හිතන විදිය විසිනුයි කියන දේ. හිතන විදිය අතිශය වැදගත්. අපි හිතන විදිය වර්ධනය කරන, වෙනස් කරන දෙයක් මට ලියන්න ඕන වුණා. හිතන විදිය කියන්නෙ අධ්‍යාපනයෙන් ගත යුතු දෙයක්. විශ්ලේෂණාත්මක සිතීමක් අවශ්‍යයයි. මේ වගේ චරිත මට ව්‍යාපාර ලෝකයේදී හමු වුණා. ඒ අය හිතන විදිය නැවුම් සහ වර්ධිතයි'

කැලුම් දැඩි සේ විශ්වාස කරන දෙයක් තිබේ. ඒ කතන්දර ඔස්සේ මිනිස් ආධ්‍යාත්මය සුවපත් කළ හැකිය යන්න ය. ඔහු තම ජීවිතයේ වඩාත් ම කැමැති දේ කුමක් දැයි කෙනෙක් ප්‍රශ්න කළහොත් ඒ කතන්දර එකතු කිරීම යැයි කියන්නට පැකිළෙන්නේ නැත.


'තරඟයේ වීරයා කෘතිය බොහෝ පාඨකයන් සෙනෙහසින් වැළඳ ගත් කෘතියක්. මේ පොත ලියන්න මම කාලයක් තිස්සේ ව්‍යාපාර මාධ්‍යවේදියෙක් ලෙස වැඩ කිරීම බලපෑවා. ලංකාවේ වගේම වෙනත් රටවල ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන් ඇසුරු කරන්නට මට අවස්ථාව ලැබුණා. ඒ වගේම මම විදේශීය පොත් බොහෝ පරිශීලනය කළා. මිනිසුන්ගේ පුද්ගල සංවර්ධනයට කතානුසාරයෙන් යමක් ඉදිරිපත් කළ යුතු ය කියන සිතිවිල්ල මට ආවා. එයට හොඳ ම ක්‍රමය ලෙසයි මා මේ කෘතිය රචනා කළේ. පුද්ගල සංවර්ධනයේ දී නිරන්තර කතා වෙන දෙයක් තමයි ධනාත්මක චින්තනය හා අභිප්‍රේරණය.


නමුත් මට ඕන වුණා මේ දෙකෙන් එහාට ගිහින් ජීවිතයේ වැඩ කරන්නෙ කොහොමද කියල කියන්න. උපක්‍රම, විධික්‍රම හා චින්තන රටාව අන්තර්ගත පොතක් ලිවීම එයට හොඳම පිළියම ලෙස මා සිතුවා. පොත ලියද්දි මාවත් සංවර්ධනය වුණා; වෙනස් වුණා. වරක් එඩ්මන්ඩ් හිලරිගෙන් මාධ්‍යවේදියකු අහනවා එවරස්ට් තරණය කරලා ඉවර වුණාට පස්සෙ මොකද්ද ඔබට දැනුණෙ කියලා. ඔහු කියනවා මම තරණය කළේ කන්දක් නොවෙයි මාවමයි කියලා. ඉතින් පොතක් එක්ක අපි තරණය කරන්නේ අපිවමයි. මේ පොතේදී මාව වෙනස් වුණා. මේ දේවල් දිහා පුළුල් දැක්මකින් බලන්න පුළුවන් විදියේ මානසික තත්ත්වයක් මට නිර්මාණය වුණා. මට ඇත්ත අත්දැකීම ලැබුණේ මට ඇසුරු කරන්නට ලැබුණු විවිධ මට්ටමේ ව්‍යාපාරිකයන්ගේ ජීවන අත්දැකීම් ඇසුරෙන්'


ලේඛකයාට ඔබ වෙනුවෙන් සටහන් කරන්නට ඔබේ සිත් කියවා ගන්නට අවකාශ විවර වන්නේ කෙලෙස ද? එය නිශ්චිත ව මෙතැනින් මේ ලෙසටයි ලෙස වර්ග කර පැවසිය නොහැක්කේ ලේඛකයා ලියන කියන දෑ හමුවන තැන ලේඛකයාවත් නොදන්නා බැවිනි. එබැවිනි සිතන, පතන, පය තබන, නික්ම යන ඕනෑ ම තැනක නිර්මාණකරුවාට වස්තුබීජ තිබිය හැකි යැයි පැවසෙන්නේ. මේ වස්තුබීජ හමුවන්නේ ලේඛකයන්ට පමණක් නොවේ; ඔබට මට අප සැමදෙනාට ම මේ සිදුවීම්, මේ හැඟීම් පහළ වීම නියතියකි. එකම දෙය අප බොහෝදෙනා මේවා නොදැකම, නොදැනීම නික්ම යෑම ය. සියුම් දෑ අතරත් සියුම් දෑ හමුවන්නේ ඉසියුම් මනසකට, ඉසියුම් දෙනෙතකට පමණි. ඔබේ මගේ පයේ හැපුණ ද, අතටම ගෙනැවිත් දුන්න ද සමහර දෑ අපෙන් මඟ හැරෙන්නේ ඒ නිසා ය. ඒ සියුම් දෑ එක්කාසු කර ලියන දෑ කියවා හමාර වූ විට අපට දැනෙන සංවේදනාව තාන්තුවාවක් වැනි හැඟීමක් ය. ඔබ එය අත්විඳ ඇතුවාට සැක නැත.


කැලුම් වැලිගම ලේඛකයා ලියන්නේ ද ඔහු ඇසුරේ තිබුණු සමාජීය කියැවීම් ය. ඒවායේ ඇති කතන්දර ය. නැතිනම් ඔහුගේ සිත සියුම් කළ කල්පනා ය. ඒ වෙනසක්, දියුණුවක් හා වර්ධනයක් අවැසි පාඨක ප්‍රජාවක් වෙනුවෙනි.

> **සියුම් දෑ එක්කාසු කර ලියන දෑ කියවා හමාර වූ විට අපට දැනෙන සංවේදනාව තාන්තුවාවක් වැනි හැඟීමක් ය. ඔබ එය අත්විඳ ඇතුවාට සැක නැත.**




### නිමැවුමක පෙරනිමිති

---

# ලොකු අක්කා




නිමල්ට සිය ලොකු අක්කා තරම් ළෙන්ගතු වෙනත් අයකු මේ මිහිපිට නැත. අම්මා වුව තමන්ට නියම ආදරයක් නැතැ'යි වරෙක ඔහුට සිතෙයි. තාත්තා කොහොමටත් ඔහුගේ හිස අතගාන්නේ නැත. හොඳ පුතා යැයි කියන්නේ ද නැත. ඔහු ඔරොවාගෙන බලා සිටී. තාත්තාගේ මුහුණ දෙස බැලීමත් අප්‍රසන්න සිද්ධියකි. පොඩි අක්කා කමකට නැති තැනැත්තියකි. ඇය හැරුණු හැරුණු අතට ඇනුම්පද කියයි. ගතු - කේළාම් කියයි. රණ්ඩු අල්ලයි. ගැටුම් උත්සන් වූ ඇතැම් දිනෙක ටොකු පහර කන්නට හෝ පා - පහර කන්නට හෝ නිමල්ට සිදුවෙයි.

ලොකු අක්කා හොඳ ම - හොඳයි, පොඩි අක්කා කැත ම කැතයි යනු නිමල්ගේ සටන් පාඨයකි. ඔහු මහා හයියෙන් එම පාඨය කියවන දාට පොඩි අක්කා අතට හසුවන ඕනෑම දෙයකින් දමා ගසන්නට පුරුදු ව සිටියා ය. පොඩි අක්කා එක් දිනෙක තම බත් පිඟානෙන් නිමල්ට පහර දුන් අතර පිඟන් කටුවක් ඇනී පාදයකින් ලේ ගලන්නට විය. පොඩි අක්කා සිනාසෙමින් කියා සිටියේ මෝඩයාට හොඳ ම - හොඳ වැඩේ යන්න ය.

ලොකු අක්කා එහෙම නැත. ගෙදර සියල්ලන්ට ම වඩා වෙනස් ය. ඈ අපේ මල්ලියා යැයි නිමල් අමතන්නීය. ඒ වනාහී ළෙන්ගතුකම උතුරා යන අපූරු යෙදුමකි. සුරතට තැඹිලි තෙල් හලා ගන්නා ලොකු අක්කා ඒවා නිමල්ගෙ හිසෙහි උළා සෙමෙන් හිස පිරිමදියි. ඒ අතර උපදේශන සපයයි. "අපේ මල්ලියා සතියකට වරක්වත් තැඹිලි තෙල් ටිකක් ඔළුවට දාන්ට ඕනෑ!" ලොකු අක්කා ඇගේ දිගු අතැඟිලිවලින් නිමල්ගේ හිස පිරිමදින විට අමුතු සනීපයක් දැනෙයි. එවිට ඔහු ලොකු අක්කා දෙසට වඩාත් නැඹුරු වන අතර ඇගේ චීත්ත ගවුමේ සුවඳ ඔහුට දැනෙයි. නාන ළිඳ ළඟදී ලොකු අක්කට හසුවුවහොත් නිමල්ට බේරුමක් නැත. ඇය නිමල්ගෙ සකල ශරීරයේම කුණු අතුල්ලන්නී ය. එබඳු එක් දිනෙක සිදුවූ සංවාදයක් නිමල්ට තාම මතක ය.

**"ඉළන්දාරිය වෙන්නෙ නැතිව ගලෝනව ඔය කළිසම!"**
**"එහෙ කුණු නෑ!**
**කළිසම ගලවන්ට**
**ඕනෙ නෑ!"**

**"බලනව! කිහිලි කළු ම කළු පාටයි!**
**ඉකිලිවල කුණු ලඩ ඇති!**
**හ්ම්! ගලෝනව! ගලෝනව!"**

ලොකු අක්කා ඉතා කැමැත්තෙන් ම නිමල්ගේ කුණු ලඩ අතුල්ලා වතුර බාල්දියක් වත්කොට ඒවා ශුද්ධ කර හරී. ඊළඟට සබන් තවරා නැවත - නැවත ශුද්ධ කරයි. අන්තිමට ඈ කියන්නේ අපේ මල්ලියා දැන් සුදු ම - සුදුයි කියාය. ඒ කියමනට නිමල් කොහොමත් කැමැති ය. කළු නම් කැත ලෙසත්; සුදු නම්; ලස්සන ලෙසත් ඔහු තේරුම් - බේරුම් කරගෙන සිටියේ ය. පොඩි අක්කා කළු නැතත් ඇය කළු බව හඟවන්නට නිමල් කැමැති ය. සුදු - කළු භේදය මත පත්තු වන රණ්ඩුවල දී ලොකු අක්කා ගන්නේ නිමල්ගේ පැත්ත ය.

**"පොඩ්ඩී, මල්ලියත් එක්ක**
**ඔය හැටි රණ්ඩු අල්ලන්ට එපා!**
**ඌ පොඩි එකානෙ බං!"**
**"ඌ පොඩි එකෙක් නෙමෙයි!**
**මහා එපා කරපු එකෙක්!**
**කතා කරන්ටවත් දන්නෙ නෑ!"**
**"ඒ අපේ මල්ලිනෙ බං!**
**ඌට තව තේරුමක් නෑ!"**
**"ලොක්කි තමයි ඌ නරක් කරන්නෙ!**
**හිටපංකො මං තාත්තට කියන්නම්!"**
**"තාත්තට කිව්වට කාරි නෑ!**
**මල්ලියට ගහන්ට එප!"**

ලොකු අක්කා නිමල් වෙනුවෙන් පෙනී සිටින සෑම අවස්ථාවකම ඔහුගේ දෑසට කඳුළු උනයි. වහා ම ලොකු අක්කා ළඟට දුවගෙන යන නිමල් ඇගේ ඇඟට හේත්තු වී ඉකිබිඳ හඬයි. එවිට ලොකු අක්කා ඔහුගේ හිස අතගාමින් "මල්ලියා අඬන්ට එපා" යැයි කියයි. ලොකු අක්කා පිළිබඳ මතකය අවුස්සන්නට නිමල් කැමැති ය. හුදෙකලා වන හැම අවස්ථාවකම ඔහුගේ සිතෙහි නළියන එක ම චරිතය ලොකු අක්කා පමණි. එහෙත් හිටි හැටියේ ම සියල්ල වෙනස් විය. පාසල නිමවා නිවසට පැමිණි නිමල් වහා ම ලොකු අක්කා සොයා ඇගේ කාමරයට ගියේ ය. එකවර ම එතැනට කඩා වැදුණු අම්මා නිමල්ට ටොක්කක් ඇන මීට පස්සෙ ලොකු අක්කාගේ කාමරයට එන්ට එපායැයි කියමින් නිමල් එළියට ඇද දැම්මා ය. එතැන් සිට ලොකු අක්කා අනුගමනය කළේ නිහඬ පිළිවෙතකි. අක්කා ඇගේ කාමරයට කොටු කර තැබූ අතර ගෙදර විවිධ වෙනස්කම් ඇති විය. මේ කිසිවක් නිමල්ට අදහාගත නොහැකි ය.

අම්මා හා තාත්තා අතර රහස් සාකච්ඡා පැවැති අතර ඒ දෙස බලා සිටින නිමල්ට බැණුම් අසන්නට සිදු විය. "උඹ මොකද කට දිහා බලාගෙන ඉන්නෙ! ගිහින් තමන්ගෙ වැඩක් බලා ගනිං!" තාත්තා සැර විය. "ලොකු අක්කගෙ කාමරේට හෙම යනව නෙවි!" අම්මා යළිත් තරවටු කළා ය. මේ ගෙදර නිමල්ගේ තනියට සිටියේ ලොකු අක්කා පමණි. දැන් ඇයත් වෙනස් වී ඇත. නිමල්ට මහා ශෝකයක් ද තනිකමක් ද දැනෙන්නට විය.

වරෙක ඔහුට සිතුණේ ලොකු අක්කාට කුමක් හෝ භයානක රෝගයක් වැලඳී ඇති බව ය. නිමල් අගුව පැත්තෙන් ගොස් ලොකු අක්කාගේ කාමරයේ ජනේලයෙන් එබී බැලුවේ ය. ඇය නිදාගෙන සිටි අතර කොට්ටය යට දැකැත්තක් ඇති බව නිමල් දුටුවේ ය. එය අමුතු දසුනකි. නිමල් 'ෂූ' ශබ්දයක් නඟා ලොකු අක්කා ඇහැරුවේ ය. දැස ලොකු කොට නිමල් දෙස බලා සිටි ලොකු අක්කා වහා ජනේලය ළඟට පැමිණ එය වසා දැමුවා ය. ලොකු අක්කාගේ වෙනස්වීම නිමල්ට දරාගත නොහැකි ශෝකයකි.

නිමල්ගේ වයස අවුරුදු හතකි. පොඩි අක්කාගේ වයස අවුරුදු දහයකි. ලොකු අක්කාට වයස අවුරුදු දහතුනකි. අම්මා ඒ වයස් පරතර ගැන වැඩිහිටියන් සමඟ කතා කරනු නිමල්ට ඇසේ. දහතුන හොඳා! තව පරක්කු වුණා නම් තමා නරක උඩහ ගෙදර නැන්දා කියනු ඇසෙයි. වයස දහතුන එතරම් හොඳ නැතැ'යි නිමල්ට නිකමට මෙන් සිතිණි. ලොකු අක්කා කාමරයෙන් එළියට එන්නේ කවදා ද? ඇය වෙන දා මෙන් තමා සමඟ කතා නො කරන්නේ මන් ද? ගෙදර මේ හැටි කලබලයක් මොක ද? වැනි ප්‍රශ්නාවලියක් නිමල්ගේ සිත තුළ කැකෑරෙයි. එකකටවත් විසැඳුමක් නැත. ඒ අතර පොඩි අක්කා නිමල්ට ඔරොවාගෙන උජාරුවට ඔබ - මොබ ඇවිදියි.

තාත්තා ගෙදර මකුළු දැල් කඩා ශුද්ධ පවිත්‍ර කළේය. ගමේ ගැහැනු දෙතුන් - දෙනෙක් පැමිණ කැවිලි හදන්නට පටන් ගත්හ. ඒ සෑම තැනකදීම නිමල් ප්‍රතික්ෂේප විය. "පිරිමි ළමයි ගිහින් තමන්ගෙ වැඩක් බලා ගන්නවා!" හැමදෙනා ම නිමල්ට අණ කරන්නට පටන් ගත්හ. කුස්සියට ගියත්, සාලයට ගියත්, ලොකු අක්කාගේ කාමරය ළඟට ගියත් නිමල්ට අසන්නට ලැබෙන්නේ අප්‍රසන්න වචන ය. පොඩි අක්කාට ඒ කිසි දෙයක් නැත. ඇය නිදහසේ හැසිරෙයි. වරින් - වර ලොකු අක්කාගේ කාමරයට ද යයි. එවිට නිමල්ගේ ශෝකය හා භීතිය තවත් වැඩිවෙයි. මින්පසු ලොකු අක්කා පොඩි අක්කාගේ පැත්ත ගනු ඇතැ'යි ද තමන් තවදුරටත් හුදෙකලා වනු ඇතැ'යි ද ඔහුට සිතිණි.

දින කිහිපයකින් ගෙදර උත්සවයක් පැවැත්විණි. ගැහැනු මිස පිරිමි එහි දක්නට නො වූ හ. එහි සිටි එක ම පිරිමියා වූයේ තාත්තා පමණි. ලොකු අක්කා අලුත් ගවුමකින් සැරසී වැඩිහිටියන් ඉදිරියේ දණ ගසා වඳින ආකාරය නිමල් දුටුවේ ය. ලොකු අක්කා ලස්සන වී ඇත. ඇගේ ගමන සන්සුන් ය. බැල්ම පවා වෙනස් ය. එකිනෙකා අතර කැවිලි - පෙවිලි හුවමාරු වුව කිසිවකු නිමල්ට කතා කළේ නැත. ඔහු මිදුල කෙළවරෙහි වූ අඹ ගස යටට වී ගැඹුරු කල්පනාවක නිරත විය.

වෙනදා ගෙදර උත්සව අවස්ථාවක් වූයේ නම්; ලොකු අක්කා පැමිණ තමන්ට කැවිලි - පෙවිලි දෙන ආකාරය නිමල්ට මැවී පෙනෙයි. පොඩි අක්කා නිමල්ට ප්‍රදර්ශනය කරමින් කොකිස් කමින් සිටී. ඔහුට ඉබේ ම මෙන් සුසුමක් පිට විය. ලොකු අක්කා යළි කිසි දිනෙක තමන්ට කතා නොකරනු ඇතැ'යි නිමල්ට සිතිණි.

මේ සන්තෑසිය ලොකු අක්කාට නො වී, පොඩි අක්කාට සිදුවූයේ නම්; කොච්චර හොඳ දැ'යි අවසන් ලෙස නිමල්ට සිතිණි.

# අපල සපල



## සතියේ චන්ද්‍ර නැකැත්

14 සඳුදා උදේ 06.27 - 06.52 දක්වා දකුණ බලා
16 බදාදා උදේ 06.24 - 06.51 දක්වා උතුර බලා
17 බ්‍රහස්පතින්දා උදේ 06.27 - 06.47 දක්වා උතුර බලා
19 සෙනසුරාදා උදේ 07.14 - 07.42 දක්වා නැගෙනහිර බලා

| දිනය | රාහු කාලය |
|---|---|
| | 2022.03.13 සිට 2022.03.19 දක්වා |
| 13 ඉරිදා | සවස 04.51 - 06.22 දක්වා අලුයම 04.48 - 06.18 දක්වා |
| 14 සඳුදා | උදේ 07.48 - 09.19 දක්වා රාත්‍රී 07.51 - 09.21 දක්වා |
| 15 අඟහරුවාදා | සවස 3.20 - 04.51 දක්වා අලුයම 03.18 - 04.48 දක්වා |
| 16 බදාදා | දහවල් 12.19 - 01.50 දක්වා අලුයම 12.19 - 01.48 දක්වා |
| 17 බ්‍රහස්පතින්දා | දහවල් 01.49 - 03.21 දක්වා අලුයම 01.48 - 03.18 දක්වා |
| 18 සිකුරාදා | දහවල් 10.48 - 12.19 දක්වා රාත්‍රී 10.49 - 12.19 දක්වා |
| 19 සෙනසුරාදා | උදේ 09.16 - 10.47 දක්වා රාත්‍රී 09.19 - 10.49 දක්වා |

**ශුභාරම්භ සුබ මුහුර්ත**

13 ඉරිදා උදේ 07.21 - 07.47 දක්වා දකුණ බලා, 14 සඳුදා උදේ 06.21 - 06.50 දක්වා දකුණ බලා, 15 අඟහරුවාදා උදේ 07.32 - 07.57 දක්වා නැගෙනහිර බලා, 16 බදාදා උදේ 06.27 - 06.42 දක්වා උතුර බලා, 17 බ්‍රහස්පතින්දා උදේ 06.24 - 07.43 දක්වා උතුර බලා, 18 සිකුරාදා උදේ 07.27 - 07.51 දක්වා උතුර බලා, 19 සෙනසුරාදා උදේ 07.32 - 07.57 දක්වා නැගෙනහිර



# සොඳුරු යුග දිවියකට මේ වත් පිළිවෙත් සපුරන්න

● වල්පොල සද්ධානන්ද හිමි

**විවාහයට බලපාන අපල දෝෂ දුරුකරවා ගැනීම සඳහා පෙර ලිපියේ සඳහන් කළ පරිදිම මෙම ලිපියේත් සඳහන් වන නපුරු විපත් සදන ග්‍රහ දේවතාවන් සඳහා පහත දක්වා ඇති පුද පිළිවෙත් ඉටුකර ගැනීම යහපත්වේ.**

පුද පූජාවන් කොපමණ සිදුකළත්, යන්ත්‍ර මන්ත්‍ර කර්ම ග්‍රහ පූජා සිදු කළත් කුසල පක්ෂය බලවත් නොවේ නම් ඉහත කී සියල්ලෙන්ම ප්‍රතිල ලබා ගැනීම දුෂ්කර වේ. මින් අටමහා කුසල් ප්‍රධාන වෙයි. යාචක දාන, ග්‍රහදාන, කිරිඅම්මා දාන, අභයදාන පින්කම්වල බලය ද ශක්තිය ද සෙනසුරු, රාහු, කේතු, කුජ, සිකුරු අපලවලට විශේෂයි.

ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයටම සඳුගේ ගමනේ බලපෑම් ද ඇතිවිය හැකි බැවින් ඒ සඳහා ද සුදුසු පිළිවෙත් ඉටුකළ යුතුයි.

මෙසේ සිදුකරගන්න පින ඉතා බලවත්වේ. එතුළින් ඔබගේ දෝෂ හා ඒරාෂ්ටක විපත් ජන්ම මාරක විපත් වලින් ජීවිත හානි වලින් වැළකී සාර්ථක ජීවිතයක් ගතකිරීමට අවස්ථාව උදාවෙයි.

යම්කිසි අයෙකුට විවාහයෙන් පසුව ගත කළ යුතු යුගදිවියට උපදෙස් කීපයක් ද මෙහි දක්වා ඇත. සිකුරු, කුජ, සෙනසුරු අපලවලට ද පිළිවෙත් දක්වමි.

## සිකුරු අපලවලට පිළිවෙත්

සිකුරාදා උදේ 6.00ත් 7.00ත් අතර හෝ රාත්‍රී 8.00ත් 9.00ත් අතර දින 21ක් අඛණ්ඩව නිර්මාංශව නැගෙනහිර දිශාව බලා බෝධි පූජාවන් පැවැත්වීම කළ යුතුයි.

සුවඳවත් මල් වර්ග හැකි තරම් පූජා කරන්න.

සමන්පිච්ච මල් සේපාලිකා මල් විශේෂයි.

පිරිසිදු සුදු හඳුන්, එළඟි තෙල්, ගිතෙල් මිශ්‍රකර කිරිබතක් නොයිදුල්ව පිළියෙල කොට ත්‍රිවිධ චෛත්‍යයන් උදෙසා පූජා කළ යුතුයි.

භික්ෂූන් වහන්සේලාට අටපිරිකර පූජා කිරීම, කන්‍යා ස්ත්‍රීන්ට, ගර්භණී මවුවරුන්ට, රෝගාතුර වූ කාන්තාවන්ට ආහාර පාන, ඇඳුම් පැලඳුම්, ඖෂධ, සුදු හෝ රෝස පාට වස්ත්‍ර, සුවඳ විලවුන් අලංකාර කුඩ පරිත්‍යාග කිරීම ඉතා බලවත් ක්‍රියාවන් වේ.

ජිනපඤ්ජර පිරිත 1100 වරක් පිරිත්කර සෑදූ යන්ත්‍රය හෝ මහා අභිසම්භිදානය 332 වරක් පිරිත්කර සෑදූ යන්ත්‍රය පැලඳීම හොඳයි.

රනින් හෝ රිදියෙන් කළ මුදුවක් දියමන්ති ගලක් අල්ලා පිරිත්කොට සුලැඟිල්ලේ පැලඳීම යහපත්වේ.

## ස්නානයට මෙම ඔසු භාවිතා කරන්න

- ඉරිවේරිය, එන්සාල්, පුෂ්පකර මල්, කොකුම් පොතු, විලඳ, බැබිල, කලාදුරු, අබ, දේවදාර තම්බා ස්නානය කිරීමෙන් සියලු ග්‍රහ දෝෂ සමනය වේ.

**හීමකුන්ද මෘණලාභාතං -**
**දෛත්‍යාන පරමං ගුරුම්**
**සර්ව ශාස්ත්‍ර පුවත්තාරං -**
**භගීවං ප්‍රණමධ්‍යහම්**
**හිම කොඳ නෙලවු දැලි පැහැ සමඟ -**
**අසුරයනට ගුරුවූ**
**සියලු ශාස්ත්‍ර ප්‍රකාශ කරන -**
**භර්ගව නම් වූ භාගු මම වඳිම්**

කරඳ පැළයක් සිටුවා පෝෂණය කරන්න. විෂ්ණු දෙවියන්ට හා පත්තිනි මෑණියන්ට සෙත් කවි කීම හා පින් අනුමෝදන් කිරීම සිදුකොට පිහිට පැතීම ශුභයි.

උදේ 6ත් 7ත් අතර ගිතෙල් පහනක් දල්වා ඉහත සඳහන් ගාථාව 3 වරක් ගායනා කොට සිකුරු දෙවියන්ගේ ආශිර්වාදය හා පිහිට පතන්න.

## කුජ අපලදෝෂ සඳහා පිළිවෙත්

සියලු පුද පූජාවන් පැවැත්විය යුත්තේ අඟහරුවාදා දිනවලදීය.

උදේ 6.00ත් 7.00ත් අතර රාත්‍රී 8.00ත් 9.00ත් අතර දින 7ක් හෝ 21 දිනක් නොකඩවා නිර්මාංශව බෝධිපූජා පැවැත්විය යුතුයි.

රතු නෙළුම් මල් 84ක් හෝ රතු අරලිය මල් 108ක් හෝ රත්මල්, රතඹලා මල් වැනි රතුවන් පැහැ සියලු මල් වර්ග පූජාවේ විශේෂයි. ත්‍රිවිධ චෛත්‍ය උදෙසා රත්සඳුන් හා හල්දුම්මල වලින් දුම් අල්ලන්න. (ධූම පූජා කරන්න)

රතු කැකුළු කිරිබත්, රතුබත් සමඟ නිර්මාංශ ව්‍යංජන 5ක්, රතුපාට කැවිලි හා රතුපාට පලතුරු වර්ග බෝධි පූජාවේදී බුද්ධ පූජාව වශයෙන් උදේ, දවල්, සවස පූජා කරන්න.

රතුපාට වස්ත්‍ර දන් දෙන්න. අසරණ රෝගීන් හට රුධිරය දන් දෙන්න. ඒරාෂ්ටක මාරක අපල යෙදී ඇත්නම් මරණයට කැපවූ ගවයන් හා මාළුවන් නිදහස් කරන්න.

අභිසම්භිදාන යන්ත්‍රය 1000 වාරයක් පිරිත්බල පුරවා තුන්දොස් කපා පැලඳීම ඉතා හොඳයි. අන්තරාය නිවාරණ පිරිත (යන්ත්‍රය) රන් හෝ තඹ සුරයේ පැලඳීම ඉතා හොඳයි.

රිදී මුදුවකට කොරල් හෝ රතු මැණිකක් බැඳ පිරිත් කර වෙදැඟිල්ලේ පැලඳීම හොඳයි.

## ස්නානයට ඔසු

කොහොඹ කොළ, නාමල් රේණු, බෙලිකොළ, සුදුහඳුන් කුඩු, බැබිල, රත්මල්, කලාදුරු, අබ, දේවදාර තම්බා එම ජලය ස්නානය කිරීම අපල දුරුවීමට හේතුවේ. ග්‍රහ දෝෂ සමනය වේ.

සැමවිට මෛත්‍රී භාවනා කිරීම ඉතා හොඳයි.

ධරණී ගර්භ සංභූතං - විද්‍යුතකාංති සම්ප්‍රභම්

කුමාර ශක්ති හසතගව - මංගලං ප්‍රණමාම්‍යහම්

කොලොන් වෘක්ෂයක් සිටුවා එයට ජලය පොහොර යොදා පෝෂණය කිරීම, ඒරාෂ්ටක, මාරක යෙදුන අවස්ථාවක නම් විෂ්ණු, කතරගම දෙවි නමට සෙත් කවි කීම, පින් අනුමෝදන් කිරීම හොඳයි. අඟහරුවාදා දිනවලදී උදේ 6.00ත් 7.00ත් අතර තැඹිලි තෙල් පහනක් දල්වා ඉහත ගාථාව 7 වරක් ගායනා කොට අඟහරු දෙවියන්ගේ පිහිට පැතීම ඉතා හොඳයි.

ජීවත්වන ගෙදර ඇස්වහ කටවහ ඉවත්වීමට

'ඕ සර්ප කට කට මුඛ කට කට' මන්ත්‍රයෙන් 1008 වරක් පුහුලක් මතුරා ගෙයි පිටත මුඳුන් ලීයේ එල්ලනු.

**ගෙදර යක්ෂ ප්‍රේත දෝෂ කොඩිවින දුරුවී දියුණුව සතුට එකමුතුකම නිරෝගී බව ඇතිවීමට මන්ත්‍රයක්**

"ඕං නන්ඥානු බොජ්ජංග තපසා
නන්ඥාතු ඉන්ද්‍රිය සංවරා
නාන්ඤත්‍ර සබ්බ නිස්සග්ගා
සොත්ථිං පස්සම් පාණිනං
ඒතේන සජ්ජ වජ්ජේන භූත
දෝසෝ විභජ්ජතෝ
ඕම් ශ්‍රීන් වම් සරවන භවාය නමං"
යන මන්ත්‍රය උදේ සවස කියන්න.

## සඳ බැලීමේ පලාපල

අමාවක ගෙවී පුර පක්ෂයේ නැඟී එන අලුත් සඳ බැලීමෙන් දියුණුව ධනය සතුට කීර්තිය සම්පත ප්‍රශංසා ආදි නිරෝගී බව ලැබී පූර්ණ ආයුෂ ලැබීමට හේතුවේ.

**ඉරිදා සෞභාග්‍ය**
**සඳුදා ධනහානි**
**අඟහරුවාද බිය සැක**
**බදාදා ශෝක කරදර**
**බ්‍රහස්පතින්දා සෙත**
**සිකුරාදා යහපත**
**සෙනසුරාදා අසනීප**

නව යුවළට බෝධිපූජා තබන හැටි

**1.බෝමළුව අතුගා පිරිසිදු කරන්න. පරවූ මල් හඳුන්කූරු පහන් තිර අළු ඉවත් කර මල් ආසන පිරිසිදු කරන්න.**
**2.කිලුටු ඇඳුම් ඇඳ මත්පැන් බී, දුම් බී, කිලි සහිත දේ ඉඳුල් කර මස් මාළු නොකන්න.**
**3.පිරිසිදු වතුර කළ 7කින් බෝධිය නාවන්න.**
**4.දෙදෙනාගේ නම් කොඩි දෙකක ලියා විවාහ ජීවිතය සාර්ථක වේවායැයි සිතා බෝ අත්තක එල්ලන්න.**
**5.මල් පහන් සුවඳ දුම් නියමිත තැන්වල පත්තු කර පූජා කරන්න.**
**6.ගත සිත සංවර කර ගන්න.**
**7.පංච ශීලය ගෙන බුදුන් දහම් සඟුන් වැඳ, මෛත්‍රී භාවනාව වඩන්න.**
**8.සියලුම දෙවිවරුන්ට මිය ගිය ඥාතිවරුන්ට භූත ප්‍රේතාදීන්ට පින් වඩන්න.**
**9.රතන සූත්‍රය, ජය පිරිත, දස දිසා පිරිත කියන්න.**

තරග විභාග සමත් වීමට

"ඕං සිද්ධි බුද්ධි සනපති ඒස්වාහක් යන ගාථාවෙන් 108 වරක් පිරිසිදුව වතුර වීදුරුවකට මතුරා එය පානය කර විභාගයට, සම්මුඛ පරීක්ෂණවලට යනු.

**අමාං මේඝා සුරනනි විශ්ව රූපා හිරණ්‍ය වර්ණා ජගති ජගම්‍යා**
**උර්ජස්වති පයසා පිනව මනා සමාං මේධා සුපුනිනා ක්ෂුතාම්"**

යන ගථාවෙන් නිතර කීමෙන් මතක සිටී. විභාගද සමත් වේ.

**"ඕං තිල සරස්වතීනාශි අවතාර ලක්ෂ්මී ශ්‍රී මුඛ ආවේසුං**
**බන්ධ පුටිටු නමක්"** යන ගාථාවෙන් තමා පාඩම් කරනා පොතට මතුරා පාඩම් කරනු.

රැකී රක්ෂා හා වෙළෙඳ ව්‍යාපාර දියුණුවට

ඕං චෙං හීන් ශ්‍රීන් ධනං කුරු කුරු ඒස්වාහක් ගාථාවෙන් 1008 වරක්

අගිල්, ගුගුල්, සුදුහඳුන්, රත්හඳුන්, ජටාමාංෂ, සැවැන්දරා, වදකහ, තුවරලා, සමන්පිච්ච, ටී ටී සාම්බ්‍රානි කුඩුවලට මතුරා උදේ සවස දුම් අල්ලන්න. ගෙදරට මඩුමාළු, මෝරමාළු, ගවමස්, ඌරුමස් ගන්න එපා.

පොරොන්දම් නොගැළපීම් ඇති අයගේ විවාහය, අනාගත, බලාපොරොත්තු ඉටු කරගන්නේ කෙසේදැයි පිළිවෙත්, සඳහන් කොට ලියූ ලිපි මාලාව අවසානයි.

## ජ්‍යොතිෂ ලේඛකයන්ට ආරාධනයයි

**ඔබත් පළපුරුදු ජ්‍යොතිෂ ලේඛකයකු නම් සිළුමිණ මෙම පිටුව ඔබ සඳහා ද විවෘතය. ඔබගේ ජ්‍යොතිෂ ලිපි පැහැදිලිව ලියා දුරකථන අංකයද සමඟ පහත ලිපිනයට හෝ විද්‍යුත් තැපැලට යොමු කරන්න.**

**සිළුමිණ - අපල සපල**
**ලේක්හවුස්**
**කොළඹ 10**
**දුරකථන අංකය - 0112 429261**
**ෆැක්ස් - 0112429260**
**විද්‍යුත් තැපෑල - editor.silumina@lakehouse.lk**




## මේෂ - දේපළ හිමිකම්

මේෂ ලග්නයට අනුව ඔබට කිසියම් දේපළ හිමිකමක් පෙනෙන්නට තිබේ. චන්ද්‍රයා 03, 04, 05, 06 යන ස්ථානවල ගමන් කිරීමට අනුව එය සතිය පුරා බොහෝ සුබඵල ගෙන දෙන තත්ත්වයකි. නිවාස - වාහන ප්‍රතිලාභ ද වාසනාවන්ත දරු සම්පත් ද හිමි ය. ඉගෙන ගන්නා වයස් අයකු උසස් අධ්‍යාපන ප්‍රතිඵල ද හිමි ය. ආගමට වැඩි නැඹුරුවක් ඇති කරගන්න.

● අය - 08, වැය - 07, ජය අංකය - 04, ජය වර්ණය - කහ, සුබ දවස - බදාදා

## වෘෂභ - හදිසි ධන ලාභ

වෘෂභ ලග්නයට අනුව මෙම සතිය ඔබට හදිසි ධන ලාභයක් සමඟ ආරම්භ වේ. කිසියම් හිතවතකු මගින් ඔබට හිමිවන මුදලක් තම හිතසුව පිණිස පරිහරණය කිරීමට අවස්ථාව උදාවන අතර ඒ සඳහා ඔබගේ අධිෂ්ඨානශීලී වාසනාව මතු කෙරෙනු ඇත. තමාට කලක් කරදරයක්ව තිබූ නීති ගැටලුවක් නිරාකරණය වනු ඇත. නිවසේ ආගමික මුහුණුවරක් උසුලන අතර ඒ වෙනුවෙන් වැඩි කාලයක් ගත කිරීමට ද හැකිවනු ඇත.

● අය - 07, වැය - 04, ජය අංකය - 07, ජය වර්ණය - දුඹුරු, සුබ දවස - සිකුරාදා

## මිථුන - සිතට සතුට අභිවෘද්ධිය

මිථුන ලග්නයට අනුව චන්ද්‍රයා 01,02,03,04 යන ස්ථානවල ගමනට අනුව සුබයි. සිතේ සතුට ගෙන දෙන වාසනාවන්ත සතියකි. තම සිතැඟි පරිදි සෞන්දර්යාත්මක කටයුතු නිර්මාණශීලී කටයුතු මල්පල ගන්වා ගැනීමට හැකිවේ. සමාජයේ කැපී පෙනෙන අන්දමේ කටයුතුවල නියැළීමට අවස්ථාව උදාවනු ඇත. නමුත් තමා ඇසුරු කරන පුද්ගලයන් පිළිබඳ මනා අවබෝධයක් තබා ගත යුතු ය. නැතහොත් ඒ අය ඔබගෙන් අවස්ථානුකූල ප්‍රයෝජන ගැනීමට පෙලඹේ.

● අය - 04, වැය - 05, ජය අංකය - 02, ජය වර්ණය - රෝස, සුබ දවස - සිකුරාදා

## කටක - පිටරට ගමන්

කටක ලග්නයට අනුව ඔබට මෙම සතිය ප්‍රබල විදේශ යෝගයක් උදා කෙරෙන සතියකි. පිටරට සිටින අයකු මගින් ඒ සඳහා අනුග්‍රහය හිමි වනු ඇත. තම දින චර්යාවට අනුව කළයුතු වැඩ කොටසක් සීමා වන අතර එදිනෙදා ගෘහ ජීවිතයේ ගැටලු මතු කෙරේ. සතියේ වැඩි දින ගණනක් නිවසින් බැහැරව සිටීමට සිදුවන අතර ඇවිදීම අධික කෙරේ. පාදයේ වළලුකර ආශ්‍රිත හදිසි ආපදාවකට හේතු විය හැකියි කල්පනාකාරීවන්න.

● අය - 03, වැය - 06, ජය අංකය - 05, ජය වර්ණය - නිල්, සුබ දවස - සෙනසුරාදා

## සිංහ - ව්‍යාපාර පල

සිංහ ලග්නයට අනුව නව ආදායම් මතු කෙරේ. ව්‍යාපාර පල උදාවේ. තමාට ලැබෙන්නට තිබී ප්‍රමාද වූ ණය මුදලක් හිමි වනු ඇත. කෙනෙකු සමඟ පැවැති ආරවුලකට විසඳුම් හිමිවේ. ඒවා සමථයකට පත් කෙරෙන අන්දමේ පිරිසක් ඔබ වටා එක් රොක් වනු ඇත. ආර්ථිකය යහපත් වේ. තමා වෙනුවෙන් කෙනෙකු වියදම් පැත්ත භාර ගන්නා නිසා අලුත් අලුත් ආදායම් මාර්ග දියුණුකර ගැනීමට හැකිවේ.

● අය - 07, වැය - 06, ජය අංකය - 09, ජය වර්ණය - ළා නිල්, සුබ දවස - සඳුදා

## කන්‍යා - සමාජයෙන් පැසසුම්

කන්‍යා ලග්නයට අනුව ඔබට ඔබගේ රැකියා ආදායම වැඩිවේ. වෘත්තීය මට්ටමේ උසස්වීම් පෙන්වයි. රැකියා ස්ථානගතව තිබූ සතුරු බලවේගයක් අවසන් වනු ඇත. තම දූ දරුවන්ගේ දක්ෂතා හෙළි වන සමාජයේ පැසසුමට ලක්වන සතියකි. චන්ද්‍රයා 10, 11, 12, 01 යන ස්ථානවල ගමනට අනුව නිවසේ අලංකාරය සඳහා වැඩි කැපවීමක් කිරීමට සිදුවේ. ඒ සඳහා සෙසු අයගේ ඇප උපකාර හිමිවනු ඇත.

● අය - 07, වැය - 06, ජය අංකය - 06, ජය වර්ණය - රතු, සුබ දවස - ඉරිදා

## තුලා - සිතේ සතුට උදාවේ

තුලා ලග්නයට අනුව චන්ද්‍රයා මේ සතියේ 09, 10, 11, 12 යන ස්ථානවල ගමන ඔබට පෙර පිං මහිම මතු කරයි. ඉඩකඩම් නිවාස දේපළ හිමි වනු ඇත. කිසියම් ආකාරයක සිතේ සතුට අභිවෘද්ධිය උදාවේ. තම ළඟම ඥාතියකුගේ අභාවයක් නිසා කාලය, ශ්‍රමය, ධනය කැප කිරීමට සිදුවනු ඇත. නමුත් තම අභිලාෂයන් මුදුන් පත් කර ගැනීමට දැඩි උත්සාහයක යෙදෙන සතියකි. වෙහෙසේ තරමට ප්‍රතිඵල අත්වේ.

● අය - 08, වැය - 06, ජය අංකය - 09, ජය වර්ණය - කහ, සුබ දවස - බ්‍රහස්පතින්දා

## වෘශ්චික - බාධක රැසකි

වෘශ්චික ලග්නය හිමි ඔබට මෙම සතිය බාධක රැසකි. සිතේ කණස්සල්ල මතු කෙරෙනු ඇත. තුනටියේ ආපදාවක් නිසා අපහසුතා විඳින්නට සිදුවේ. තම අසල්වැසි අයගේ අප්‍රසාදයට භාජනය වීමේ අවදානම ඇත. නිවසේ හෝ ඉඩමේ තිබූ භෞතික වටිනාකමක් ඇති දෙයක් තවත් පිරිසක් විසින් සොරා ගැනීම නිසා අසහනකාරී සති අන්තයක් ගෙවා දැමීමට ඔබට සිදුවේ. කෑම අජීර්ණයක් හෝ වස විස වීමකට ඉඩ ඇත.

● අය - 04, වැය - 07, ජය අංකය - 03, ජය වර්ණය - ළා දුඹුරු, සුබ දවස - බ්‍රහස්පතින්දා

## ධනු - මංගල යෝජනා ගලා එයි

ධනු ලග්නයට අනුව ඉතා සුබයි. අවිවාහක අයට මංගල යෝජනා ගලා එන සතියකි. විවාහ අපේක්ෂක තරුණ තරුණියන්ට කාර්යය බහුල සතියකි. තම නිවසේ අලංකාරය සඳහා කැපවනු ඇත. තම නිවෙසේ උත්සවශ්‍රීයක් උසුලනු පෙනේ. තම ඥාති හිතෛෂී අයකුගෙන් මූල්‍යමය පරිත්‍යාගයක් හිමිවීම නිසා නව ආයෝජන කටයුත්තකට අත ගසනු ඇත. තමාට එන ඕනෑම අභියෝගයක් සඳහා නොබියව මුහුණදී ජය ගන්නා සතියකි.

● අය - 04, වැය - 06, ජය අංකය - 08, ජය වර්ණය - තැඹිලි, සුබ දවස - බ්‍රහස්පතින්දා

## මකර - විදෙස් ගමන් බලාපොරොත්තු ඉටු වේ

මකර ලග්නයට අනුව ඔබට මෙම සතිය බාධක සතියකි. යටි බඩ ආශ්‍රිත සිදුවන උවදුරක් නිසා සතියේ මුල් දින දෙක තුන අපහසුතා විඳීමට සිදුවේ. තම අභිලාෂයන් අනුව කටයුතු කිරීමට නොහැකි වනු ඇත. සැලසුම් කරගෙන සිටි රාජකාරියක් අතපසු වනු ඇත. විදෙස් ගමන්, විදෙස් රැකියා අපේක්ෂාවෙන් සිටි අයගේ බලාපොරොත්තු ඉටුවේ. නිවසට පැමිණෙන නන්නාඳුනනා අයකුගේ වංචනික කටයුත්තකට ඔබ හසුවීමට ඉඩ ඇත. ප්‍රවේශම් වන්න.

● අය - 04, වැය - 06, ජය අංකය - 04, ජය වර්ණය - දුඹුරු, සුබ දවස - අඟහරුවාදා

## කුම්භ - නව ආයෝජනයකට ඉඩ

කුම්භ ලග්නයට අනුව ඔබට මෙම සතිය සුබයි. චන්ද්‍රයා 05, 06, 07, 08 යන ස්ථානවල ගමන වාසනාවන්ත දරු උපත්වලට හේතුයි. තවද අධ්‍යාපනය හදාරන වයසේ දරුවන් සිටින අයට සිය දූ පුතුන්ගේ ජයග්‍රහණ හිමි වන සතියකි. දේපළ ඉඩකඩම් මෙන් ම නවතා දමා තිබූ ව්‍යාපාර යළි ආරම්භ කිරීමට අවස්ථාව උදාවනු ඇත. තමා කෙනෙකුට දී තිබූ ණය මුදලක් කාලයකට පසු තමාට හිමිවනු ඇත. ඒ තුළින් නව ආයෝජනයකට මඟ සැලසේ.

● අය - 07, වැය - 06, ජය අංකය - 01, ජය වර්ණය - තැඹිලි, සුබ දවස - ඉරිදා

## මීන - වෙහෙසේ තරමට ප්‍රතිලාභ

මීන ලග්නයට අනුව ඔබට මෙම සතිය ඉතා සුබයි. චන්ද්‍රයා 04, 05, 06, 07 යන ස්ථානවල ගමන් කිරීමට අනුව නව වාහන, නව නිවාස, ප්‍රතිලාභ සහිතයි. එදිනෙදා ජීවිතය කාර්ය බහුල වුව ද වෙහෙසේ තරමට ප්‍රතිලාභ හිමිය. තම වෘත්තීය මට්ටම ද ඉහළ යන අතර තම පෞද්ගලික ජයග්‍රහණ අතර හදිසි ධන ලාභ ලොතරැයි ජය හිමිවීමේ වාසනාව ඇත.

● අය - 09, වැය - 06, ජය අංකය - 07, ජය වර්ණය - නිල්, සුබ දවස - බ්‍රහස්පතින්දා

○ **මාර්තු 13 ඉරිදා**
13 ඉරිදා 20.05 තෙක් පුනාවස නැකැත යි. සුදුසු අකුරු කෙ, කො, හ, හි

○ **මාර්තු 14 සඳුදා**
13 ඉරිදා 20.05 සිට 14 සඳුදා 22.07 තෙක් පුස නැකැත යි. සුදුසු අකුරු හු, හෙ, හො, ඩ

○ **මාර්තු 15 අඟහරුවාදා**
14 සඳුදා 22.07 සිට 15 අඟහරුවාදා 23.32 තෙක් අස්ලිස නැකැත යි. සුදුසු අකුරු ඩි, ඩු, ඩෙ, ඩො

○ **මාර්තු 16 බදාදා**
15 අඟහරුවාදා 23.32 සිට 16 බදාදා මුළු දවස පුරාම පවතින්නේ මා නැකැත යි. සුදුසු අකුරු ම, මි, මු, මෙ

○ **මාර්තු 17 බ්‍රහස්පතින්දා**
17 බ්‍රහස්පතින්දා 00.20 තෙක් මා නැකැත යි. සුදුසු අකුරු ම, මි, මු, මෙ

○ **මාර්තු 18 සිකුරාදා**
මාර්තු 17 බ්‍රහස්පතින්දා 00.20 සිට 18 සිකුරාදා 00.33 තෙක් පුවපල් නැකැත යි. සුදුසු අකුරු මො, ට, ටි, ටු

○ **මාර්තු 19 සෙනසුරාදා**
මාර්තු 18 සිකුරාදා 00.33 සිට 19 සෙනසුරාදා 00.17 තෙක් උත්‍රපල් නැකැත යි. සුදුසු අකුරු ටෙ, ටො, ප, පි. එදිනම 00.17 සිට 23.37 දක්වා හත නැකැත යි. සුදුසු අකුර පු. ඉන් පසු ඉරිදා 22.39 තෙක් සිත නැකැත යි. සුදුසු අකුරු පෙ, පො, ර, රි.

## බිලිඳු නමට අකුරු

● සමන්ති අහුබුදු

**මාර්තු 13 සිට මාර්තු 19 දක්වා**

**මෙහි වේලාව දක්වා ඇත්තේ පැය 24 ඔරලෝසුව අනුව යි.**

වෂී 2022ක් වූ මාර්තු මස 13 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

සිළුමිණ சிழுமின The Silumina
# ශිල්ප සෙවණ
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අතිරේකය
☎ : 0112 429 339, 0777 270 076

# බ්‍රිතාන්‍ය සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර කළමනාකරණයේ විශිෂ්ටයකු වන්නට IIT සමඟ එක්වන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට මුහුණ දුන් අපේක්ෂකයකුගේ ඊළඟ සිහිනය වන්නේ උසස් අධ්‍යාපනය ලැබීමයි. එමගින් අනාගතයේ උසස් රැකියාවක තියැලීමයි. එය සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් පෙළට මුහුණ දුන් ඔබ පා තැබිය යුතු වන්නේ අතිශය තරගකාරීත්වයෙන් යුතු වූ සමජයකටය. ඔබේ ඉලක්කයන් සපුරා ගැනීමට නම් අන් කවරදාටත් වඩා නොදෙවෙනිව මේ තරගකාරී සමාජය තුළ ඔබ කටයුතු කළ යුත්තේ ඉතා බුද්ධිමත් තීන්දු තීරණ ගනිමිනි. උසස් පෙළ අවසන් කළ ඔබ එහි ප්‍රතිඵල පැමිණෙන තුරු නොසිට ඔබ වඩාත් ප්‍රියකරන සහ දෙස් විදෙස් රැකියා වෙළෙඳපොළෙහි ඉතා ඉහළ ඉල්ලුමක් ඇති විෂය ක්ෂේත්‍රයක් ඔස්සේ උසස් අධ්‍යාපන කටයුතු අරඹන්නට මේ කාලසීමාව භාවිතා කළ යුතුයි. සැබවින්ම මේ ඊට සුදුසුම කාලයයි. තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර කළමනාකරණය යනු ඔබව ජයග්‍රාහී මාවතකට ගෙන එන්නට සමත් වන එවන් විෂය පථයන්ය. දශක 03ට අධික කාලයක් තිස්සේ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර අධ්‍යයනය යන විෂයන් සම්බන්ධ බ්‍රිතාන්‍ය උසස් අධ්‍යාපනය මෙරට සිසුන් වෙත ලබාදෙන ප්‍රමුඛතම ආයතනයක් වන්නේ Informatics Institute of Technology (IIT) ආයතනයයි. එය ඔබට ඇති කදිම තෝරා ගැනීමකි. දෙස් විදෙස් නවෝත්පාදකයින්, ව්‍යවසායකයින් සහ ව්‍යාපාරික නායකයින් බවට පත්වීමට උපාධිධාරීන් බල ගැන්වීම මගින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රතිනිර්මාණය කර විප්ලවීය වෙනසක් සිදු කර තිබෙන IIT ආයතනයේ අලෙවි ප්‍රධානී Ashwaq A.Ahmed මහතා IIT ආයතනයේ සුවිශේෂීත්වයන් පිළිබඳ සාකච්ඡා කිරීමට අප සමඟ සම්බන්ධ වූයේ මෙලෙසයි.



Mr Ashwaq Ahamed
Head of Marketing at IIT

### IIT ආයතනය මෙරට ආරම්භ කරන්නේ කුමන අරමුණක් ඇතිව ද?

තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර කළමනාකරණය යන විෂයන් ඉතා ශීඝ්‍රයෙන් ලොව පුරා ප්‍රචලිත වෙමින් පවතින යුගයක, එනම් 1990 වර්ෂයේ දී IIT උසස් අධ්‍යාපන ආයතනය ආරම්භ කරන්නට කටයුතු කරනවා. එහි සභාපති ආචාර්ය ගාමිණී වික්‍රමසිංහයන් ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් මේ සඳහා දිරි ගැන්වීමේ පරමාර්ථයෙන් මෙම IIT ආයතනය මූලික වශයෙන් පිහිටුවනු ලැබුවා. පසුගිය වසර 30 පුරා තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා බ්‍රිතාන්‍ය උපාධි පාඨමාලාවන් ක්‍රියාත්මක කරමින් අප ආයතනය විශිෂ්ට වූ කාර්යභාරයක් ඉටු කර තිබෙනවා. මේ වන විට IIT ආයතනය බිහි කළ උපාධිධාරීන් 5000 අධික සංඛ්‍යාවක් ලොව පුරා විවිධ වෘත්තීන්වල නියැලෙමින් සුවපහසු ජීවිත ගත කරනවා. බොහෝ IIT ආදි සිසුන් John Keells, Unilever, Aitken Spence, IBM, Hatton National Bank, Informatics, Millenium IT, Fonterra, Zone 24 x 7, WSO2, Brandix, Industrial and Financial Systems (commercial Banks) ඇතුළු ප්‍රමුඛතම වෙළඳ සමාගම්වල සේවය කරනවා. NDB, Vanik සහ Virtusa මෙම සමාගම් බොහොමයක් වාර්ෂික IIT වෘත්තීය දිනයට සහභාගී වන අතර එමගින් IIT සිසුන් සහ උපාධිධාරීන් බඳවා ගැනීමට ශ්‍රී ලංකා සමාගම්වලට අවස්ථාව සලසා දෙයි.

### උසස් පෙළ විභාග ප්‍රතිඵල අපේක්ෂකයන් තම උසස් අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීමේදී විශේෂ අවධානයට යොමු කළ යුතු කරුණු මොනවා ද ?

උසස් පෙළට මුහුණ දුන් සිසු දරුවන් පළමුවෙන් ම වටහා ගත යුතු කාරණයක් තමයි, උසස් අධ්‍යාපනය යනු ඔබ මෙතෙක් කල් මුහුණ දුන් තරගකාරී විභාගයක් නොවන බව. උසස් අධ්‍යාපනය සඳහා ඔබ තෝරා ගන්නා විෂය ක්ෂේත්‍රය සමඟ ඔබ ඉදිරි ජීවිත කාලයම ගෙවා දැමිය යුතු බවත් සිහියේ තබා ගනිමින් කටයුතු කළ යුතුයි. එහිදී ඔබ යම්කිසි විෂය ක්ෂේත්‍රයක් තෝරා ගත යුතුයි. ඒ තීරණය ඔබ ඉතාමත් ප්‍රවේශමෙන් ගත යුතු තීරණයක් වනවා. ඊට වැඩිහිටියන්ගෙන් ලැබිය යුත්තේ මගපෙන්වීමක් මිස බලපෑමක් නොවේ. ඔබේ කැමැත්ත මත උසස් අධ්‍යාපන කටයුතු වලට ප්‍රවේශවීමේ දී අන්තර්ජාල මාධ්‍ය ඔස්සේ කරුණු සොයා බලන්නට පුළුවන්. ඔබ තෝරාගත් විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කරන්නට වඩාත්ම සුදුසු ස්ථානය තෝරා ගැනීමයි ඉන්පසු ඔබ කළ යුතු වන්නේ. අධ්‍යාපනය අනාගතය උදෙසා සිදුකරන ආයෝජනයක්. එනිසා එය සහතිකයකට පමණක් සීමා නොවන සුදුසුකම් ලබාගනිමින් අදාළ විෂය ක්ෂේත්‍රයේ නිපුනයෙක් වන්නටත් දෙස් විදෙස් රැකියා වෙළඳපොළට පිවිසෙන්නටත් සහය දක්වන ජාත්‍යන්තරය පිළිගන්නා උසස් අධ්‍යාපන ආයතනයක් තෝරා ගැනීමට ඔබ බුද්ධිමත් විය යුතුයි.

### නූතන රැකියා වෙළෙඳපොළෙ හි තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර කළමනාකරණය යන විෂයන් හැදෑරීමේ වැදගත්කම සහ ඊට පවතින ඉල්ලුම කෙබඳු ද?

තොරතුරු තාක්ෂණය යනු දිනෙන් දින දැනුමෙන් හා තාක්ෂණයෙන් සන්නද්ධ වන විෂය ක්ෂේත්‍රයක්. පසුගිය කාලය පුරා මුළු මහත් ලෝකය ම covid 19 වසංගතය හේතුවෙන් අඩපණව කටයුතු කළත් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සියලුම ක්ෂේත්‍ර සක්‍රිය ලෙස පැවතුණා. ශ්‍රී ලංකාවේ මෙන්ම අන්තර්ජාතික රැකියා වෙළෙඳපොළ තුළ තොරතුරු තාක්ෂණ විෂය ආශ්‍රිත උපාධිධාරීන්ගේ හිඟයක් පවතිනවා මිස තොරතුරු තාක්ෂණය හැදෑරූ අයෙක්ට රැකියා සොයා ගැනීමේ අපහසුතාවයක් නැහැ. ඕනෑම සාර්ථක ව්‍යාපාරයකට නිසි කළමනාකාරීත්වයට සහ පරිපාලනය ඉතා වැදගත් වනවා. ඒ සඳහා අවශ්‍ය ක්‍රම ශ්‍රම ශක්තියෙන් අවම බවක් වර්තමානයේ දී දකින්නට පුළුවන්. අද පවතින්නේ මීට වසර 10 පෙර පැවති ව්‍යාපාර නොවෙයි. අද ලෝකයේ පවතින්නේ තාක්ෂණය සමඟ බද්ධ වූ නව ව්‍යාපාරික ක්ෂේත්‍ර. එවැනි ව්‍යාපාර සඳහා උසස් රැකියා අවස්ථා ඕනෑ තරම් දේශීය සහ විදේශීය වෙළෙඳපොළ තුළ දැකගන්නට පුළුවන්.

### ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බොහොමයක් උසස් අධ්‍යාපන ආයතන අතුරෙන් IIT හි සුවිශේෂීතාවයන් මොනවා ද?

අපගේ අධ්‍යාපන ආයතනයේ කටයුතු කරන්නේ, මේ ක්ෂේත්‍රයේ ප්‍රවීණ මෙන් ම හසල අත්දැකීම් සහිතව ක්ෂේත්‍රයේ අදටත් නියැලෙන ආචාර්ය මණ්ඩලයක්. අපගේ සියලුම උපාධි පාඨමාලාවන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කුසලතා සංවර්ධනය කරන්නත් ඔවුන්ට ඕනෑම වෘත්තීය ක්ෂේත්‍රයක කටයුතු කරන්නත් මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කුසලතා සංවර්ධනය කර ගනිමින් ඕනෑම වෘත්තීමය ක්ෂේත්‍රයක විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමේ පන්නරය ලබා දීමයි අපගේ උපාධි පාඨමාලාවන් හි අඩංගු තවත් සුවිශේෂී ලක්ෂණයක් වනුයේ. අප ආයතනය මගින් ලබා දෙන අනිවාර්යය එක් අවුරුදු රැකියා පුහුණුවත් සුවිශේෂී වනවා. උපාධි පාඨමාලාව හදාරන අතරතුර සිසුන්ට මෙයින් ප්‍රායෝගික පුහුණුවක් හිමිවෙනවා. සාර්ථක වෘත්තීය ජීවිතයක් සඳහා වැදගත් වන අත්‍යවශ්‍ය නිපුණතාවන් මෙන්ම අදාළ වෘත්තීය ක්ෂෙත්‍රය පිළිබඳව දැනුවත් වීම සඳහා බහු ජාතික සහ දේශීය සමාගම් දෙසීයකට අධික සංඛ්‍යාවක් විසින් මේ පුහුණුව සඳහා අවස්ථාව උදා කොට දී තිබෙනවා. මෙම රැකියා පුහුණුව ඔස්සේ උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව රැකියාවක් ලබා ගැනීම පිළිබඳව 100%ක් විශ්වාසය තබන්නට පුලුවන්.

### මේ අනුව ශ්‍රී ලාංකික සිසු දරුවන් වෙනුවෙන් IIT ආයතනය හඳුන්වා දී ඇති උපාධි පාඨමාලා මොනවා ද?

තොරතුරු තාක්ෂණ විෂය ආශ්‍රිතව එංගලන්තයේ (Westminster) විශ්විද්‍යාලයේ Software Engineering, Computer Science සහ Robert Gordon විශ්වවිද්‍යාලයේ Artificial Intelligence and Data Science යන ගෞරව උපාධි පාඨමාලා 3 අපේ දරුවන් වෙනුවෙන් පවත්වනු ලබනවා. ව්‍යාපාර කළමනාකරණ විෂය ආශ්‍රිතව Business Information Systems,
Business Management, Business Data Analytics යන ගෞරව උපාධි පාඨමාලා පවත්වනු ලබනවා. Artificial Intelligence and Data Science උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේ ගණිත විෂය ධාරාව යටතේ උසස් පෙළට මුහුණ දුන් සිසුන් පමණක් වන අතර ඕනෑම විෂය ක්ෂේත්‍රයක් යටතේ උසස් පෙළට මුහුණ දුන් සිසුන් ට අපගේ අනෙකුත් උපාධි පාඨමාලාවන් හා සම්බන්ධ වන්නට පුළුවන් කම ලැබෙනවා. මේ සියලුම උපාධි පාඨමාලා වසර හතරක් වැනි කාලයක් සමඟ එක් වසරක රැකියා පුහුණුවක් අන්තර්ගත පාඨමාලායි. එලෙසම සිසුන්ගේ කැමැත්ත හා අවශ්‍යතාවය මත උපාධියේ පළමු වසර ශ්‍රී ලංකාවේ සම්පූර්ණ කර ඉතිරි අධ්‍යයන වර්ෂයන් සඳහා විදෙස් ගත වන්නට වුවත් හැකියාව පවතිනවා.

### න්‍යායික දැනුමෙන් ඔබ්බට ගොස් මේ පාඨමාලා හදාරන සිසුන්ගේ නිර්මාණශීලීත්වය ඔප් නැංවීමට IIT ආයතනය කටයුතු කර තිබෙනවා ද?

IIT ආයතනය තුළ උසස් අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා බාහිර ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාවට නැංවෙනවා. මේ සිසුන් අධ්‍යාපනයෙන් පමණක් නොවෙයි බාහිර ක්‍රියාකාරකම්වලින් වගේම නිර්මාණශීලීත්වයෙන් ඉහළයි. මේ සිසුන්ගේ විවිධ නිර්මාණශීලී හැකියාවන් එළිදැක්වීම සඳහා අප ආයතනය වාර්ෂිකව වේදිකා ප්‍රසංගයක් පවත්වනු ලබනවා. මේ වේදිකා ප්‍රසංගය Stage Craft - Annual Talent Show) මගින් දරුවන්ගේ සෞන්දර්යාත්මක කුසලතා ඉදිරිපත් කෙරෙනවා. Cutting Edge ප්‍රදර්ශනය මගින් සිසුන්ගේ නවතම සංකල්ප හා නවෝත්පාදන අංගයන් පිළිබිඹු කෙරෙනවා. වාර්ෂික රැකියා දිනය Annual Carrers Day අප ආයතනය තුළ දී පවත්වන අතර මෙමගින් තරුණ උපාධිධාරීන්ට දේශීය මෙන්ම විදේශීය සමාගම්වලදී සේවා පුහුණුව ලැබීමට අවස්ථාව හිමි කර දෙනවා. මීට අමතරව IIT ආයතනයේ සිසුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා රොටරැක්ට් (Rotract) සංගමය, Toastmaster, IEEE, WIE වැනි ශිෂ්‍ය සංගම් ස්ථාපිත කර තිබෙනවා. ඊට අමතරව IIT සිසුන් Rugby, Basket ball, Cricket, NetBall යන ක්‍රීඩාවන් වල ද නියැලෙනවා.

### මෙවර උසස් පෙළට මුහුණදුන් දරුවන්ට ඔබතුමා දෙන පණිවිඩය කුමක් ද?

IIT හි අප කරන සෑම දෙයක්ම මෙහෙයවනු ලබන්නේ විශිෂ්ටත්වය ලබා දීමෙන්. එනිසා ලොව පිළිගත් තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර කළමනාකරණ උපාධි ලබා ගැනීම සඳහා තෝරා ගත යුතුම ආයතනය වන්නේ IIT ආයතනයයි. ඒ සඳහා අප ආයතනය සතුව පවතින ජාත්‍යන්තර සම්බන්ධතා, විශිෂ්ට කාර්ය මණ්ඩලය, ආයතනික පහසුකම්, ඉහළ ගුණාත්මක භාවයකින් යුත් උසස් අධ්‍යාපන කටයුතු පෙන්වාදිය හැකියි. එලෙසම IIT ආයතනය නිසැකවම වෘත්තිය පුහුණුව ද සමඟ උසස් අධ්‍යාපනය ලබමින් අනාගත ලොව ජයගන්නට ඔබත් සමඟ නිරන්තරයෙන් බැඳී සිටිනවා. එනිසා නොපමාව අප IIT අයතනය හා එක්වන්නැයි මම මේ අවස්ථාවේ දී ශ්‍රී ලාංකික සිසු දරු දැරියන්ට ආරාධනා කර සිටිනවා. අපගේ පාඨමාලා පිළිබඳ වැඩිදුර තොතුරු සඳහා www.iit.ac.lk වෙබ් අඩවියට පිවිසිය හැකියි. නැතහොත් අංක 57, රාමක්‍රිෂ්ණ පාර, කොළඹ 6 දරන ස්ථානයේ පිහිටි IIT ආයතන ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන් ලබාගත හැකියි.

- තුෂාරි නේරංජා



INFORMATICS INSTITUTE OF TECHNOLOGY
30 YEARS OF EDUCATIONAL EXCELLENCE - 1990 - 2020 -

උසස්පෙළින් පසු
සාර්ථක අනාගතයකට
ශක්තිමත් පදනමක් සඳහා
IIT සමඟ එක්වන්න




පදනම් පාඨමාලාව
Foundation Certificate in Higher Education Business
Foundation Certificate in Higher Education IT
එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවකි
තෝරාගත් උපාධි පාඨමාලාවට ඉක්මනින් ප්‍රවේශ වීමට ඇති මගකි

උපාධි පාඨමාලා
Business School
BA (Hons) Business Management
BSc (Hons) Business Information Systems
BSc (Hons) Business Data Analytics

School of Computing
BSc (Hons) Computer Science With Specialization Options
BEng (Hons) Software Engineering
BSc (Hons) Artifcial Intelligence and Data Science

එක් වසරක රැකියා පුහුණුව සමඟ පූර්ණ කාලීනව වසර 4ක්

100% දක්වා ශිෂ්‍යත්ව
මැයි 2022 ප්‍රවේශය දැන් විවෘතයි
දැන්ම අමතන්න...
0766 760 760

IIT CAMPUS
Informatics Institute of Technology
නො.57, රාමක්‍රිෂ්ණා පාර, කොළඹ 06.
admissions@iit.ac.lk
0112 360 212
www.iit.ac.lk
iitsl

www.nsbm.ac.lk

NSBM GREEN UNIVERSITY TOWN

නිපුණතා සංවර්ධන,
වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව
නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය



උසස් පෙළින් පසු

# එන්න ඉගෙනගන්න - ඔබේ බලාපොරොත්තු ජයගන්වන්න!

ඉගෙන ගන්නවා කියන්නේ හඳුන ගන්නවා කියන එක. අසීරු කාලවලත් සීරුවෙන් ඉදිරියට යන ක්‍රමය තේරුම් ගන්නවා කියන එක. අභියෝග ඉදිරියේ නිර්භීතවීමේ දිරිය සොයා ගන්නවා කියන එක. නිවැරදි විකල්ප තෝරාගෙන ඒ තුළින් නොනැවතීමේ බලය ආදේශ කරගන්නවා කියන එක. පොත්පත්වල ඇති දැනුම මෙන්ම ප්‍රායෝගික කුසලතාවන්ගේ ආශ්චර්යය ජීවිතයට එකතු කරගන්නවා කියන එක. ඒ ලබාගත් දැනුම, කුසලතා අනිත් අය සමඟ බෙදාගන්නවා කියන එක.

ඉගෙන ගන්නවා කියන්නේ දැනුමේ සහ කුසලතාවන්ගේ උපරිම අගය උපදවා ගෙන පිරිපුන් පුද්ගලයෙක් බවට පරිවර්තනය වෙනවා කියන එක. එන්න ඉගෙන ගන්න, ඔබේ බලාපොරොත්තු ජයගන්වන්න!

# 2022 මාර්තු කණ්ඩායම සඳහා ලියාපදිංචිය ඇරඹුණා

## FACULTY OF BUSINESS

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

BSc in Business Management (Human Resource Management) (Special)
BSc in Business Management (Logistics Management) (Special)
BSc in Business Management (Project Management) (Special)
BSc in Business Management (Industrial Management) (Special)
BM (Honours) in Accounting & Finance
BM (Honours) in International Business
BA in Business Communication
BBM in Tourism Hospitality and Events

**UNIVERSITY OF PLYMOUTH – UNITED KINGDOM**

BSc (Honours) International Management & Business
BSc (Honours) Accounting & Finance
BSc (Honours) Marketing Management
BSc (Honours) Operations & Logistics Management
BSc (Honours) Events,Tourism & Hospitality Management
BSc (Honours) Business Communication

**VICTORIA UNIVERSITY – AUSTRALIA**

Bachelor of Business: Banking and Finance & Financial Risk Management
Bachelor of Business: Management and Innovation & Supply Chain and Logistics Management

## FACULTY OF ENGINEERING

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

Bachelor of Science Engineering Honours in Mechatronic Engineering
Bachelor of Science Engineering Honours in Electrical and Electronic Engineering
Bachelor of Science Engineering Honours in Computer System Engineering

## FACULTY OF SCIENCE

**UGC APPROVED DEGREE PROGRAMMES- OFFERED BY NSBM**

BSc (Honours) in Biomedical Science
BSc (Honours) in Public Health and Nutrition

## FACULTY OF COMPUTING

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

BSc in Management Information Systems (Special)
BSc (Honours) in Software Engineering
BSc (Honours) in Computer Science
BSc (Honours) in Computer Networks
BSc (Honours) in Data Science

**UNIVERSITY OF PLYMOUTH – UNITED KINGDOM**

BSc (Honours) Software Engineering
BSc (Honours) Computer Networks
BSc (Honours) Computer Security
BSc (Honours) Computer Science

**VICTORIA UNIVERSITY – AUSTRALIA**

Bachelor of Information Technology (NBIT):
Major in Web and Mobile Application Development

## DESIGN STUDIES

**UGC APPROVED DEGREE PROGRAMMES – OFFERED BY NSBM**

Bachelor of Interior Design
BSc in Multimedia

**UNIVERSITY OF PLYMOUTH – UNITED KINGDOM**

BA (Honours) Interior Design
BSc (Honours) Quantity Surveying

## FOUNDATION PROGRAMME FOR BACHELOR'S DEGREE

Complete the one year NSBM foundation programme and advance to any foreign degree programme

AACSB
The highest standards in business education

UNIVERSITY OF PLYMOUTH
VICTORIA UNIVERSITY MELBOURNE AUSTRALIA
Affiliated exclusively to top-ranked universities

THE UNIVERSITY OF WESTERN AUSTRALIA
Transfer to Australia

NSBM හරිත සරසවිය, මාහේන්වත්ත, පිටිපන, හෝමාගම.
ඊමේල් : inquiries@nsbm.ac.lk /nsbm.lk

## දැන්ම අමතන්න!

**011-544-5000**
**071-244-5000**

www.nsbm.ac.lk අන්තර්ජාලය ඔස්සේ ද ලියාපදිංචි විය හැක

සිළුමිණ සිழுமின The Silumina

# ශිල්ප සෙවණ

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අතිරේකය ☎ : 0112 429 339, 0777 270 076

# සාර්ථක විභාග ප්‍රතිඵලයක් ළඟා කරගන්නේ කෙසේ ද?

**'විභාගය' යන වචනය ඇසූ පමණින් ම දරුවන්ගේ සිත් තුළ ඇති වන භය, චකිතය එදා මෙන් අදටත් තවමත් එසේම ය. කුඩා කල සිට දරුවන් විභාග පිට විභාගවලට මුහුණ දුන්නත්, සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගැනීම විටෙක සිහිනයක් පමණක් වන්නේ ඇයි? ඔබ ඒ පිළිබඳ සිතුවා ද? විභාගයකට හොඳින් සූදානම් විය යුත්තේ කෙසේද, විභාගයට යහපත් මානසිකත්වයකින් මුහුණ දෙන්නේ කෙසේ ද , එසේ ම සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගන්නේ කෙසේ ද යන කරුණු පිළිබඳ කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය A.G. අමරසිංහ මහතා සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් මෙම ලිපිය සැකසිණි.**



කොපමණ විභාග සංඛ්‍යාවකට අප මේ වන විට මුහුණ දී තිබෙන්නට ඇති ද? කෙතරම් විභාග ප්‍රමාණයකට අප සහභාගී වී තිබුණත්, තවමත් අපි අතරින් බහුතරයක් දෙනා විභාගයක අරමුණ ,වැදගත්කම නො දන්නවා විය හැකිය. දරුවකු විභාගයකට සහභාගී කරවීමේ අරමුණ හා වැදගත්කම පිළිබඳ විමසීමේ දී දරුවා විසින් අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු පහක් පෙන්වා දිය හැකිය. ඉන් මූලික අරමුණ වන්නේ ශිෂ්‍යයන්ට ඒ ඒ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ඇති දැනුම, ආකල්ප හා කුසලතාවයන්ගේ ස්වභාවය මැන බැලීම ය. එහිදී දරුවාට විෂය අධ්‍යයනය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වීම තුළින්ම සාර්ථක ප්‍රතිඵලයකට මගපෑදේ. විභාගය, ඉතා සුභදායි හා ධනාත්මක සංකල්පයක් වන්නේ එයින් ලැබෙන ප්‍රතිඵලය දරුවාගේ ජීවිතය යහපත් දිශානතියකට යොමු කරන නිසාවෙනි. විභාගය යනු දරුවාට විෂය අධ්‍යයනය කෙරෙහි යොමු කරවන ප්‍රබල පෙලඹුම් කාරකයක් වීම විභාගයක ඇති අනෙක් වැදගත්කමය. විභාගයක් පැවැත්වෙන කාලසීමාවට පෙර වෙනත් බාහිර කටයුතුවලින් දරුවාට වෙන්කර අධ්‍යයන කටයුතු සඳහාම සිය අවධානය යොමු කරවීමේ හැකියාව විභාගයක් සතුවේ. දරුවාට තමන්ගේ දැනුම,හැකියාව,කුසලතා පිළිබඳ ස්වයං තක්සේරුවක් ඇතිකර ගැනීමට විභාගය ඉවහල් වන අතර බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා දෙන තක්සේරුවට සීමා නොවී තමාගේ කුසලතා මැන බැලීමට තමාටම අවස්ථාව උදා වීම විභාගයක ඇති තවත් වැදගත්කමකි. දරුවාගේ අනාගතය තීරණය කිරීමේ අයිතිය හා හැකියාව දරුවාටම හිමි කරදීමේ ප්‍රජාතන්ත්‍රවාදී හා සාධාරණ ක්‍රමය විභාගය වේ. එකම වර්ගයක බීජ කුඹුරක පැළ කළත් ඒ සියලු බීජ එක හා සමානව සාර්ථකව හොඳින් දලු ලා නොවැඩෙන්නාක් මෙන් පන්ති කාමරය ද විවිධ බුද්ධි මට්ටම්වලින් යුතු දරුවන්ගෙන් සමන්විත වේ. එක් දරුවකු විභාගයෙන් හොඳ ප්‍රතිඵල ලබා ගනිමින් විශිෂ්ටයකු විය හැකි අතර තවකෙක් අවම ප්‍රතිඵල ලබා ගත හැක.විශිෂ්ටයින් ඇගයීමටත්, අවම ප්‍රතිඵලලාභීන් දිරිමත් කිරීම හා ඔවුනට නැවතත් විභාගයට මුහුණ දීමට අවස්ථාව ලබා දීමත් විභාගයක හඳුනාගත හැකි තවත් වැදගත්කමකි. දරුවන්ට තමන් වඩාත් දක්ෂ විෂය පථය හඳුනා ගැනීමට හා ඒ ඔස්සේ ඉදිරි අධ්‍යාපන කටයුතු සිදු කිරීමට අඩිතාලම දමන්නේ විභාගයයි. විභාගයෙන් ලැබෙන ප්‍රතිඵලය තුළින් තමන් වඩාත් දක්ෂ හා කැමති විෂය ධාරාව තෝරා බේරා ගෙන උසස් අධ්‍යාපනය හැදෑරීමට හා ඉදිරියේ තමා නියුතු වන වෘත්තීය ක්ෂේත්‍රය හඳුනාගැනීමට විභාගය වැදගත් වේ. පුරුද්දට විභාග ලියනවා වෙනුවට විභාගයක අරමුණු හා වැදගත්කම හොඳින් අවබෝධ කරගෙන විභාගයට සූදානම් වීම තුළින් දරුවාට විභාගයකින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය පදනම නිර්මාණය වේ.

40 පිටුවට...

OXFORD BROOKES UNIVERSITY

Think Ahead ACCA

Are you awaiting your A/L Results?

Obtain ACCA Professional qualification + BSc (Hons) degree within 2 ½ years.



With ACCA you can obtain a BSc (Hons) degree in applied accounting from Oxford Brooks university and ACCA professional qualification within two and a half years without doubling your workload and investment.

Oxford Brooks University:

- Is the only UK university ranked in the QS world rankings of top 50 institutions under 50 years old (QS, 2021)
- Is among the world elite in 13 subjects (QS, 2020),
- Currently ranks 2nd in teaching in the Times Higher Education (THE) Young University Rankings

Registration open for A/L students from any stream.
Contact ACCA Sri Lanka on 0773874247/ 0112424801 to register or for more information.

ACCA Sri Lanka. Block "A" 18th Floor, #33, Parkland, Park Street, Colombo 02

# ගණකාධිකරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිම්වළලු පුළුල් කළ ACCA

Think Ahead ACCA

තරගකාරී උසස් පෙළ විභාගයෙන් පසු බොහෝ දූවා දරුවන් එළදායී අධ්‍යාපනයක නිරත නොවී නිවසේ විනෝදයෙන් කාලය ගත කිරීමට හුරු වී තිබේ. නමුත් ජාත්‍යන්තරයේ පිළිගත් ප්‍රකට අධ්‍යාපන ආයතනයක් වන ACCA (වරලත් සහතිකලත් ගණකාධිකරණ ආයතනය) සමඟ සම්බන්ධ වී මාස හතරක් වැනි ඉතා කෙටි කාලයක් තුළ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සුදුසුකමක් ලබා ගැනීමේ අවස්ථාව මේ වන විට සළසා දී ඇති අතර එය උසස් පෙළ විභාගයෙන් පසු සිය ජීවිත සාර්ථක කර ගැනීම සදහා සුදුසු අවස්ථාවන් පිළිබද විමසිල්ලෙන් පසු වන දූ දරුවන්ගේ ඉදිරි රැකියා ජීවිතයට මනා පිටිවහලක් වනු නොඅනුමානය.

උසස් පෙළ විභාගයෙන් පසු විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ වරම් හිමි වුවත්,නොවුවත් කල් ඇතිව වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට ACCA වෙතින් පහසුකම් සපයා ඇත. වෙළඳ ලෝකයේ ගණකාධිකරණ රැකියා සඳහා වෘත්තීය සුදුසුකම් ලබාගැනීමට ACCA වෙතින් ඔබට අනගි අවස්ථාවක් මේ වන විට ලැබී ඇත.

ලෝකයේ පුළුල් රැකියා පරාසය තුළ ගණකාධිකරණය පිළිබඳ නිසි වෘත්තිය සුදුසුකම් ලබාගත හැකි පාඨමාලාවක් ලෙස ACCA හඳුන්වා දිය හැකියි. සත්‍ය වශයෙන්ම ACCA යනු ගණකාධිකරණ ක්ෂේත්‍රයේ නිම්වළලු පුළුල් කළ සුදුසුකමකි.

ACCA වෙත දීර්ඝ ඉතිහාසයක් තිබේ. එනම් ACCA ආරම්භ වූයේ 1904 වර්ෂයේ දීය. ACCA මේ වන විට ලෝක ව්‍යාප්ත ආයතනයක් ලෙස වෘත්තිමය ගණකාධිවකාරවරුන්ට ඉතා හොඳ ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා දෙමින් සිටී. ACCA හි වර්තමාන සාමාජිකත්වය 219,000කි. මේ වන විට ලෝකය පුරා ශිෂ්‍යයන් 527,000ක් සිටින අතර ACCA ලෝකයේ රටවල් 179ක ව්‍යාප්ත ව තිබේ. මේ වන විට ලෝකය පුරා ACCA කාර්යාල රැසක් පිහිටුවා තිබෙන අතර ACCA ශාඛා ආයතන 7400කින් සමන්විත ය.

වෘත්තීය ගණකාධිකාරීවරුන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට ACCA වෙතින් සපයා ඇති පහසුකම් අපමණය. එපමණක් නොව සෑම විටම නවීනත්වය හඹා යැමේ සංකල්පයකින් හෙබි ආයතනයක් ලෙස හඳුන්වා දිය හැකි ACCA නිරන්තරයෙන් කාලීන ප්‍රවණතා පිළිබඳව ද සැළකිළිමත් වෙමින් ගණකාධිකාරීවරුන්ට ගැලපෙන නීතිරීති හඳුන්වා දෙන අතරම නොයෙක් පර් යේෂණ අධ්‍යයනයන් සිදුකරමින් ගණකාධිකාරිවරුන්ගේ වෘත්තීය දැනුමට අවශ්‍ය නව ක්‍රම හා නව අදහස් හඳුන්වා දීමට වගකීමකින් යුතුව කටයුතු කිරීම ප්‍රශංසනීයය.

ACCA ආයතනය හා එම පාඨමාලාව පිළිබදව වැඩි විස්තර www. accaglobal.com වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

ACCA SRI LANKA APPROVED LEARNING PROVIDERS (ALP) AND COMPUTER BASED EXAM CENTERS (CBE).

Approved Learning Providers

* Achievers London Business School
* Icon Business School
* Alpha Business School (Pvt) Ltd
* Premier Partners
* Wisdom Institute for International Studies (Pvt) Ltd
* Onlineaccounting Learning (Pvt) Ltd

Computer Based Exam Centers

* Achievers Lanka Business School
* Alpha Business School
* G A Academy (Pvt) Ltd
* Icon Business School (Pvt) Ltd
* Premier Partners Institute of Management
* Wisdom Institute for International Studies

සිළුමිණ The Silumina

# ශිල්ප සෙවණ

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අතිරේකය

☎ : 0112 429 339, 0777 270 076

SLTC
SRI LANKA TECHNOLOGICAL CAMPUS
ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය
இலங்கை தொழில்நுட்ப பல்கலைக்கழகம்

# ශ්‍රී ලංකාවේ පළමු පර්යේෂණ විශ්වවිද්‍යාල අත්දැකීම ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය SLTC



**ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලයේ නිර්මාතෘ මෙන්ම එහි වත්මන් ප්‍රධාන විධායක නිලධාරී ධූරය හොබවනු ලබන්නේ රංජිත් ගංගනාත් රූබසිංහ මහතායි. ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ කීර්තිමත් ආදි සිසුවෙකු වන ඒ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු උපාධිය ලබා ගත් අතර මොරටුව විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධිය ද, කොළඹ විශ්ව විද්‍යාලය වෙතින් ව්‍යාපාර කළමණාකරණය පිළිබඳව පශ්චාත් උපාධිය ද හිමි කර ගන්නා ලදී. දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා ටෙලිකොම් හි සේවය කළ ඔහු මොබිටෙල් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ධූරය ද හෙබ වූ අතර මේ දක්වා ම ශ්‍රී ලංකා ටෙලිකොම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සාමාජිකයකු ලෙස කටයුතු කරයි. මීට අමතරව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) උප සභාපතිවරයකු ලෙස කටයුතු කරමින් ඉතා ප්‍රශංසනීය මෙහෙවරක්ද ඔහු ඉටු කළ අතර TRACE ආයතනයේ සභාපතිවරයා ලෙස ද ඒ මහතා මේ වන විටත් කටයුතු කරමින් සිටියි.**

මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශේෂ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කළ විශ්ව විද්‍යාලයක් ලෙස ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය (Sri Lanka Technological Campus - SLTC) හැඳින්විය හැකි වේ. ශ්‍රී ලාංකික තාරුණ්‍ය වෙනුවෙන් ඉහළ ප්‍රමිතියකින් යුත් උසස් අධ්‍යාපනයක් සඳහා ඇති ඉල්ලුම සපුරාලීමට ගත් පියවරක් ලෙස මෙම විශ්ව විද්‍යාලය ආරම්භ වූ බවට සඳහන් වන අතර ශ්‍රී ලංකා ටෙලිකොම් හි අනුබද්ධිත ආයතනයක් ලෙස 2014 වසරේදී එය ආරම්භ වී තිබේ. මේ වන විට එහි ප්‍රධාන විශ්ව විද්‍යාල මණ්ඩපය පාදුක්කේ අක්කර 37ක භූමි ප්‍රදේශයක් පුරා ස්ථාපිත පැරණි චන්ද්‍රිකා මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටා ඇත. ඉතාමත් සුවපහසු වටපිටාවක නේවාසික පහසුකම්, විද්‍යාගාර, දේශනශාලා, ශ්‍රවණාගාර, පුස්තකාල වැනි අත්‍යවශ්‍ය පහසුකම් සියල්ලෙන්ම මෙම විශ්ව විද්‍යාලය සන්නද්ධය.

ප්‍රධාන වශයෙන්ම ඉංජිනේරු ක්ෂේත්‍රයට අවැසි පරිපූර්ණ වෘත්තිකයින් බිහි කිරීමේ අරමුණින් මෙම විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමට කටයුතු යෙදුණු අතර ඉංජිනේරු සහ තාක්ෂණ විෂය ධාරාවන්හි ගුණාත්මක උසස් අධ්‍යාපනයකට ඇති හිඩැස පුරවමින් ඊට අදාළ උපාධි පාඨමාලා රැසක්ම එම විශ්ව විද්‍යාලය මගින් හඳුන්වා දෙන ලදී. ඒ අනුව විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලා යටතේ මෙකැට්‍රොනික්ස්, සිවිල් ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂණ, ජෛව පද්ධති යන පාඨමාලා ද තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලා යටතේ කෘෂි තාක්ෂණය, පාරිසරික තාක්ෂණය හා මූල්‍ය තාක්ෂණය යන පාඨමාලා ද එසේ හඳුන්වාදී තිබේ.

මේ වන විට මෙම ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය ඉංජිනේරු, තාක්ෂණ, වෘත්තීය අධ්‍යයන, ව්‍යාපාර සහ කළමනාකරණ, තොරතුරු තාක්ෂණ හා පරිගණක, සංගීත වැනි අධ්‍යයන පීඨ හයකින් සමන්විතව සිය උපාධි පාඨමාලා හඳුන්වා දී ඇති අතර පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ද එහි ක්‍රියාත්මක වේ. මෙම සියලුම අධ්‍යයන පීඨ මගින් රැකියා වෙළෙඳපොළට ගැළපෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගන්නා උපාධි පාඨමාලා 25ක් පමණ පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර සෑම අවස්ථාවකදී ම න්‍යායාත්මක, ප්‍රායෝගික හා විශ්ලේෂණාත්මක දැනුමක් තම සිසු සිසුවියන් වෙත ලබා දීමට ඔවුන් කැපවී සිටියි.

පර් යේෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, සිසුන් කේන්ද්‍ර කරගත් සහ ප්‍රතිඵල මූලික කරගත් ඉගෙනුම් ක්‍රමවේද භාවිතා කරන මෙරට ප්‍රථම විශ්වවිද්‍යාලය මෙම ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලයයි. මෙම විශ්වවිද්‍යාලය මගින් පාඨමාලා සම්පූර්ණ කරන සිසු සිසුවියන් හට උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉක්මණින්ම රැකියා ලබාගැනීමේ වැඩි අවස්ථාවක් ද උදාවේ. සිසුන්ගේ පෞද්ගලික හා බුද්ධිමය වර්ධනය වෙනුවෙන් කැප වී ක්‍රියාකරන ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය ඔවුන්ගේ පුළුල් පරිකල්පනයත්, විශ්ලේෂණාත්මක චින්තනයත්, කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමේ හැකියාවත් දියුණු කර ගැනීමට උචිත වටපිටාවක් ද නිර්මාණය කර දී තිබීම විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණාවකි.

40 පිටුවට...









SRI LANKA TECHNOLOGICAL CAMPUS
Non scholae sed vitae discimus

## ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය
இலங்கை தொழில்நுட்ப பல்கலைக்கழகம்
SRI LANKA TECHNOLOGICAL CAMPUS

## 2022 වර්ෂය සඳහා නවක සිසුන් ලියාපදිංචිය
2022 ஆம் ஆண்டிற்கான மாணவர் பதிவு
2022 INTAKE STUDENT REGISTRATION

### ඉංජිනේරු පීඨය
பொறியியல் கற்கைபீடம்
School of Engineering

**BSc ගෞරව ඉංජිනේරු**
**BSc (Hons) Eng.**

- ඉලෙක්ට්‍රොනික් සහ බලශක්ති පද්ධති (Electronics & Power Systems)
- ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ (Telecommunication)
- ඉලෙක්ට්‍රොනික් හා ඉංජිනේරු කළමනාකරණය (Engineering Management)
- තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු (Software Engineering)
- සිවිල් ඉංජිනේරු (Civil)
- මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු (Mechatronics)

**අයදුම් කිරීම සඳහා :**
උසස් පෙළ භෞතික විද්‍යා අංශයෙන් අවම වශයෙන් S සාමාර්ථයන් 3ක් ලබාගත යුතුය.
(*රසායන විද්‍යාව වෙනුවට තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) හෝ Higher Maths හැදෑරූ සිසුන්ට ද අයදුම් කළ හැක)
- IESL පිළිගැනීම සඳහා අවමයෙන් C 2 ක් හා S 1 ක් (ජාතික) හෝ B 2 ක් හා C 1 ක් (ජාත්‍යන්තර) ලබාගත යුතුය.

### තාක්ෂණ පීඨය
தொழில்நுட்பம் கற்கைபீடம்
School of Technology

**BTech ගෞරව තාක්ෂණ**
**BTech (Hons)**

- ඉලෙක්ට්‍රොනික (Electronics)
- කෘෂිකාර්මික තාක්ෂණය (Agricultural)
- පරිසර තාක්ෂණය (Environmental)

**BSc ඇඟළුම් තාක්ෂණ පාඨමාලා**
**BSc Textile Technology**

- ඇඟළුම් තාක්ෂණය†
- විලාසිතා සම්බන්ධීකරණය හා කළමනාකරණය† (Merchandising)

**අයදුම් කිරීම සඳහා :** උසස් පෙළ භෞතික විද්‍යා/ තාක්ෂණ/ ජීව විද්‍යා/තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) අංශයෙන් අවම වශයෙන් S සාමාර්ථයන් 3ක් ලබාගත යුතුය.

### ව්‍යාපාර පීඨය
முகாமைத்துவம் கற்கைபீடம்
Business School

**BBM ගෞරව**
**BBM (Hons)**

- මූල්‍ය හා ගණකාධිකරණය (Accounting & Finance)
- මානව සම්පත් කළමනාකරණය (HRM)
- අලෙවිකරණය (Marketing)
- සැපයුම්දාම කළමනාකරණය (Operations)
- මෙහෙයුම් කළමනාකරණය (Supply Chain)

**BSc ගෞරව**
**BSc (Hons)**

- ඊ- සංචාරක හා ඩිජිටල් අලෙවිකරණය (E-Tourism and Digital Marketing)

**අයදුම් කිරීම සඳහා :** ඕනෑම විෂය ධාරාවක් යටතේ උසස් පෙළ සමත් වීම.

### පරිගණක සහ තොරතුරු තාක්ෂණ පීඨය
கணனியியல், தகவல் தொழில்நுட்பம் கற்கைபீடம்
School of Computing & IT

**BSc ගෞරව | BSc (Hons)**

- මෘදුකාංග ඉංජිනේරු (Software Engineering)
- වලාකුළු පරිගණනය (Cloud Computing)
- සයිබර් ආරක්ෂණය (Cyber Security)
- දත්ත විද්‍යාව (Data Science)
- ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය† (Bachelor of Applied Information Technology) (BAIT)

**අයදුම් කිරීම සඳහා :** ඕනෑම විෂය ධාරාවක් යටතේ උසස් පෙළ සමත් වීම.

### සංගීත පීඨය
சங்கீதம் கற்கைபீடம்
School of Music

සංගීතවේදී ගෞරව පාඨමාලාව
Bachelor of Music Honours
**අයදුම් කිරීම සඳහා :** ඕනෑම විෂය ධාරාවක් යටතේ උසස් පෙළ සමත් වීම.

### විද්‍යා පීඨය
விஞ்ஞான கற்கைபீடம்
School of Science

BSc ගෞරව ජෛව පද්ධති ඉංජිනේරු (Bio Systems)
**අයදුම් කිරීම සඳහා :** උසස් පෙළ භෞතික විද්‍යා අංශයෙන් අවම වශයෙන් S සාමාර්ථයන් 3ක් ලබාගත යුතුය.

Online අයදුම් කිරීමට QR කේතය Scan කරන්න

✂ - - - - - - - - - - - - - - - - - - - -

මුලකුරු සමඟ නම | பெயர் (முதல் எழுத்துடன்) | Name with Initials :..........

ඔබ හැදෑරීමට කැමති පාඨමාලාව | உங்கள் விருப்பமான பாடத்திட்டம் | Your Preferd Programme :..........

ස්ත්‍රී පුරුෂ භාවය | பால் | Gender :.......... උපන්දිනය | பிறந்த திகதி | Date of Birth :..........

ජාතික හැඳුනුම්පත් අංකය | தேசிய அடையாள அட்டை இல | NIC No :.......... පළාත | மாகாணம் | Province :..........

ලිපිනය | முகவரி | Postal Address :..........

දුරකථන | தொலைபேசி இல | Telephone - නිවස | நிரந்தர இல | Home :.......... ජංගම | கைத்தொலைபேசி | Mobile :..........

විද්‍යුත් තැපෑල | மின்னஞ்சல் முகவரி | Email :..........

අ.පො.ස. උසස් පෙළ වසර | க.பொ.த உயர் தர (வருடம்) | GCE A/L Year :..........

විභාග අංකය | சுட்டெண் | Index Number :..........

Z අගය | Z பெறுபேறு | Z-score :..........

පාසල | பாடசாலை | School :..........

මාධ්‍යය | மொழி மூலம் | Medium :..........

අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල | க.பொ.த உயர் தர | GCE A/L Results
අපේක්ෂිත ප්‍රතිඵල සමඟ අයදුම් කරන්න

| විෂය \| பாடம் \| Subject | ශ්‍රේණිය \| பெறுபேறு \| Grade |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. ඉංග්‍රීසි \| பொது ஆங்கிலம் \| General English | |
| 5. සාමාන්‍ය පොදු පරීක්ෂණය \| பொது அறிவு \| Common General Paper | |

ඉහත සඳහන් සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත් ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලයට අනුකූල වූ සියලු නීති හා රෙගුලාසින්ට මම අවනත වන බවටත්, යම් අවස්ථාවක දී ඉහත සඳහන් කිසිවක් වැරදි බවට ඔප්පු වුවහොත් එම අවස්ථාවේදීම ලියාපදිංචිය හා ශිෂ්‍ය භාවය අවලංගු වන බවත් තදින් අවධාරණය කර ගතිමි.

..........
අයදුම්කරුගේ අත්සන | விண்ணப்பதாரியின் கையொப்பம் | Applicant Signature

SLTC RESEARCH UNIVERSITY | SRI LANKA TECHNOLOGICAL CAMPUS
ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය
இலங்கை தொழில்நுட்ப பல்கலைக்கழகம்

අනුමැතිය ලත් | அரசினால் ஏற்றுக்கொள்ளப்பட்டது | APPROVED — අධ්‍යාපන අමාත්‍යාංශය | கல்வி அமைச்சு | Ministry of Education
පිළිගත් | இலங்கானல் அங்கீகாரம் கொண்டது | RECOGNIZED — University Grants Commission | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC)
පර්යේෂණ පදනම් කරගත් අධ්‍යාපනය | ஆராய்ச்சியை அடிப்படையாகக் கொண்டது | RESEARCH ORIENTED — ORIS OFFICE OF RESEARCH & INNOVATION SERVICES
අති විශිෂ්ට ආචාර්ය මඩුල්ල | தலைசிறந்த கல்விப்பீடம் | FACULTY PAR EXCELLENCE — 1:12 ගුරු සිසු අනුපාතය | 1:12 Staff : Student Ratio
මහා නේවාසික පහසුකම් | பல்கலைக்கழகத்தில் தங்குமிட வசதி | ON CAMPUS ACCOMMODATION — SLTC Hub
තරුණ විශිෂ්ටත්ව ශිෂ්‍යත්ව | இளம் கல்வியாளர்களின் சிறந்த வெளிப்படுத்தலுக்கான புலமைப் பரிசில் | YOUTH EXCELLENCE SCHOLARSHIP — ENTECH YOUTH EXCELLENCE SCHOLARSHIP
ඕනෑම දවසක | ඕනෑම වේලාවක | எந்த நாளும் | எந்நேரமும் | ANY DAY | ANY TIME — 24/7 OPEN
තාක්ෂණය පාදක කරගත් ක්‍රියාකාරී ඉගෙනීමක් | தொழில்நுட்பம் உள்ளார்ந்த கற்கைநெறி | TECHNOLOGY ENABLED ACTIVE LEARNING — TEAL

*Sri Lanka Technological Campus is a registered trademark of SLT Campus ( Pvt ) Ltd

Sri Lanka Technological Campus is in partnership with RMIT University Australia/Vietnam, Lancaster University UK, Deakin University Australia and Lincoln University & Auckland University New Zealand for collaborative degree programmes.

ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය, ඉංගිරිය පාර, පාදුක්ක.
www.sltc.ac.lk | ඊ මේල් : admissions@sltc.ac.lk | විමසීම් : 0112 100 500

සිළුමිණ The Silumina

# ශිල්ප සෙවණ

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අතිරේකය

☎ : 0112 429 339, 0777 270 076

## Saegis Campus උපාධිධාරීන්ට වැඩි රැකියා අවස්ථා පිරිනැමීමට Virtusa සමඟ අවබෝධතා ගිවිසුමකට

**කොළඹ පිහිටි මෙරට ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයක් වන Saegis Campus, සිය උපාධිධාරීන්ට ඉහළ මට්ටමේ රැකියා අවස්ථා පිරිනැමීම අරමුණු කරගනිමින්, මෙරට ඩිජිටල් නවෝත්පාදන ඉංජිනේරු අංශයේ ප්‍රමුඛයකු වන Virtusa පුද්ගලික සමාගම සමඟ පසුගියදා විශේෂ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය.**



Saegis Campus උප කුලපති මහාචාර්ය නාලක ජයකොඩි සහ Virtusa ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ සම්පත් ත්‍රිමාවිතාන යන මහත්වරු අවබෝධතා ගිවිසුම හුවමාරු කරගන්නා අයුරු

ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය මේ වනවිට ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අතර, JLL Sri Lanka සහ ICTA එක්ව මෑතක දී එළිදැක්වූ වාර්තාවකට අනුව එම කර්මාන්ත ක්ෂේත්‍රය හරහා මේ වසර අවසානයේ දී ඩොලර් බිලියන 1.8ක පමණ ආදායමක් රටට හිමිවනු ඇත. මෙම ආදායම 2024 වසර වන විට ඩොලර් බිලියන 3 සීමාවට ළඟාවනු ඇතැයි ද එම වාර්තාව පුරෝකථනය කර තිබේ. 150,000ක පමණ ශ්‍රම බලකායක් සමග 2021 වසරේ දෙවැනි කාර්තුවේදී එම ක්ෂේත්‍රය 7%ක වර්ධනයක් පෙන්නුම් කර ඇති බව Sri Lanka IT-BPM කර්මාන්ත වාර්තාව පෙන්වාදෙයි.

එවන් පසුබිමක, Virtusa ආයතනය සමඟ ඇතිකරගත් සහයෝගීතාව මඟින් Saegis Campus උපාධිධාරීන්ට හිමිවන ප්‍ර යෝජන රැසකි. තාක්ෂණය මත පදනම් වූ වර්තමාන ලෝකයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා අවස්ථාවක් ලබාගැනීමට ඔවුන්ට අවස්ථාව උදාවීම ඒ අතුරින් විශේෂිත වේ. ඊට අමතරව, දැනුම සහ කුසලතා අතර පවතින පරතරය අවම කරගැනීමේ අවකාශය ද ඔවුන්ට හිමි වේ. තව ද, ජා ත්‍යන්තර වශයෙන් ජනප්‍රිය තොරතුරු තාක්ෂණ කර්මාන්තයක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම කරා යන ගමන සඳහා දායක වීමට ද හැකියාව ලැබේ.

Saegis Campus නියෝජනය කරමින් එහි උප කුලපති මහාචාර්ය නාලක ජයකොඩි මහතා සහ Virtusa ආයතනය නියෝජනය කරමින් එහි ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ සම්පත් ත්‍රිමාවිතාන යන මහත්වරු මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

Saegis Campus මඟින් අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගැනීම ලත්, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) – (BSc (Hons)), මෘදුකාංග ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව), සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව), සහ තොරතුරු තාක්ෂණවේදී (BIT) යන ක්ෂේත්‍රවලට අදාළ විශේෂවේදී විද්‍යාවේදී (ගෞරව) – (BSc (Hons)) සහ තොරතුරු තාක්ෂණවේදී (BIT) යන උපාධි පාඨමාලා පිරිනැමෙයි. අපොස උසස් පෙළ විභාගය සාර්ථකව නිම කළ සිසුන්ට මෙම උපාධි පාඨමාලා සඳහා එක්වී උසස්ම මට්ටමේ අධ්‍යාපනයක් ලබාගත හැක. ඊට අමතරව, Pearson BTEC හරහා මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විශේෂ අවධානයක් සහිත පරිගණක විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ද Saegis Campus හඳුන්වාදී ඇත.

Saegis Campus හි අධ්‍යාපනය ලබන සිසුන්ට තාක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළ දක්ෂ සහ ප්‍රසිද්ධ ආචාර්යවරුන්ගේ දේශන තුළින්, කාලීන සහ වර්ධනය වෙමින් පවතින විෂය ධාරාවලට අයත් උසස් තත්ත්වයේ ඉගෙනුම් අත්දැකීමක් ලබාගැනීමට හැකි අතරම, WiFi පහසුකම්, නවීන තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය, භාෂා විද්‍යාගාරය, පුස්තකාලය, ශිෂ්‍ය විවේකාගාරය, වඩාත් ඉඩකඩ සහිත වායු සමීකරණය කළ ඩිජිටල් දේශන ශාලා, ක්‍රීඩා සහ විෂයාශ්‍රිත ක්‍රියාකාරකම්, ඉඩකඩ සහිත ආපනශාලාව, Leo Club සහ Rotaract Club ආදී පොදු පහසුකම් රැසක් ද සිසුන්ට හිමි වේ. මේ සියල්ල තුළින්, සාර්ථක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කෙරෙන අතරම, අනාගත උපාධිධාරීන් වෙනුවෙන්ම නිර්මාණය කළ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් ද සංවිධානය කෙරේ.

## සාර්ථක විභාග ප්‍රතිඵලයක් ළඟා...

36 පිටුවෙන්

විභාගයකින් සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා දරුවකු කෙසේ සූදානම් විය යුතු ද යන ප්‍රශ්නය බහුලව අසන්නට දකින්නට ලැබෙන ගැටලුවකි. කෙතරම් මේ පිළිබඳව සාකච්ඡා කළත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ දී ප්‍රතිඵල අවම වන්නේ, විභාගයට සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට අදාළ යාන්ත්‍රණය හා ක්‍රමවේදය පිළිබඳ වැඩි සැලකිල්ලක් නොදක්වන නිසාවෙනි. මෙහිදී අප විසින් අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු තුනකි. ඉගෙන ගැනීම යනු කුමක්දැයි තේරුම් ගැනීම, ඉගෙන ගැනීමේ ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම සහ ඉගෙන ගැනීමේ ක්‍රියාවලියට අදාළ පසුබිම් සාධක අවබෝධ කර ගැනීම හා ඒවා සකසා ගැනීම යන කරුණු පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගැනීම හා ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගත හැකි වේ. මෙහිදී මූලිකවම අධ්‍යයනය හා අධ්‍යාපනය යන වචන ද්විත්වයේ වෙනස වටහාගත යුතුය. අධ්‍යයනයෙන් අදහස් වන්නේ තමන් විසින් සිදු කරන හැදෑරීමයය. අධ්‍යාපනය ලෙස හඳුන්වන්නේ ඉගෙන ගැනීමට පහසුකම් සැලසීමයි. ඉගෙන ගැනීම හෙවත් අධ්‍යයනය යන පදය සංස්කෘත භාෂාවේ ‘ධ්‍යානය’ යන පදයෙන් උපන් වචනයකි. ‘ඉදිරියට යෑම’, ‘උසස් තත්ත්වයකට පත් වීම’ යන අර්ථය සහිත ධ්‍යානයෙන් සිදු වන්නේ සිතින් සැලසුම් කිරීම, ගැඹුරු අධ්‍යයනයක යෙදීම, සිතිවිලි සාන්ද්‍රණය කිරීමයය. බුදු දහමට අනුව මෙම ධ්‍යානය කොටස් පහකින් සමන්විත වේ.ප්‍රථම ධ්‍යානය (විතර්කය), ද්විතිය ධ්‍යානය (විචාරය), තෘතීය ධ්‍යානය (ප්‍රීතිය), චතුර්ථ ධ්‍යානය (සුඛය) හා පංචම ධ්‍යානය (ඒකාග්‍රතාවය) යන ධ්‍යානයේ කොටස් පහ අවබෝධ කොටගෙන අධ්‍යයනයේ යෙදීම තුළින් විෂය කරුණු හොඳින් අවබෝධ කර ගැනීමට හා ඕනෑම අවස්ථාවක දී සන්සුන් මනසකින් කටයුතු කිරීමට හැකියාව ලැබේ. ඉගෙනුම–ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක වීමට හා විභාගයට සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නම් ගුරු–ශෝල දෙපාර්ශ්වයම විසින් ධ්‍යානයට සමවැදී අවබෝධයෙන් සිය ඉගෙනුම්–ඉගැන්වීම් ක්‍රියාව සිදුකළ යුතුවේ. මනා අවබෝධයකින් තොරව හුදෙක් විෂය කරුණු මතකයේ තබා ගැනීමෙන් පමණක් සාර්ථක ප්‍රතිඵලයකට ළඟා වීමට හැකියාව නොලැබේ. විභාගයට සාර්ථකව පිළිතුරු ලිවීමට හා ඒ තුළින් සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගැනීමට නම් දරුවන් විසින් විෂය කරුණු මතක තබා ගැනීමට අමතරව ඒවා තේරුම් ගැනීම, භාවිතය, විශ්ලේෂණය, සංස්ලේෂණය හා ඇගයීම යන පියවර හයම නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ.

වර්තමානයේ රටේ සෑම ක්ෂේත්‍රයකටම ප්‍රබලව බලපා ඇති කොවිඩ් 19 තත්ත්වය, දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි ද අතිශය ප්‍රබල බලපෑම් එල්ල කර ඇත. සාමාන්‍යය අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරව මාර්ගගත අධ්‍යාපන ක්‍රමයකට යොමු වීමට දරුවන්ට සිදු වී ඇති අතර, මාර්ගගතව පැවැත්වෙන විභාගවලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නම් දරුවන් කෙසේ කටයුතු කළ යුතු දැයි විමසා බැලීම අනිවාර්යයෙන්ම සිදු කළ යුත්තකි. එහිදී දරුවන්ට මුහුණදීමට සිදුවන අභියෝග, අපහසුතා මෙන්ම යම් වාසි සහගත තත්ත්වයන් කිහිපයක්ම හඳුනා ගත හැක. දරුවන්ට නිවසටම වී අධ්‍යාපන කටයුතුවල නියැළීමට සිදු වීම නිසා ලැබී ඇති අතිරික්ත කාලයෙන් හා නිදහසින් උපරිම ප්‍රයෝජන ලබමින් ස්වයං අධ්‍යයනයේ යෙදීමට අවකාශය හිමි වී ඇති අතර ඒ තුළින් ධ්‍යානගතව මනා අවබෝධයකින් යුතුව විෂය ග්‍රහණය කර ගැනීමට ඉඩ ප්‍රස්තාව ලැබී ඇත. මේ හරහා සාර්ථක විභාග ප්‍රතිඵලයක් ලබා ගැනීම අරමුණු කරගෙන අධ්‍යයන කටයුතුවල යෙදීමට දරුවාට වැඩි ඉඩකඩක් හිමි වී ඇත. මාර්ගගත අධ්‍යාපනයේ දී දරුවන්ට බහුල වශයෙන් මුහුණ දීමට සිදුවන ගැටළුවක් වන්නේ තාක්ෂණික වශයෙන් ඇති පහසුකම් අවම වීමයි. තාක්ෂණික වශයෙන් මෙන්ම මානසික වශයෙන් දරුවන්ට ඇති වී ඇති යම් යම් අපහසුතා හැකි උපරිමයෙන් මගහරිමින් කටයුතු කරීම සඳහා දරුවාට ගුරුවරුන්ගෙන්, මාපියන්ගෙන් මෙන්ම මිතුරන්ගෙන්ද උපරිම සහයෝගයක් ලැබීම ප්‍රබලව බලපායි. මාපියන් විසින් දරුවාට අධ්‍යාපනයට සුදුසු වටපිටාවක් නිර්මාණය කර දීම හා ඊට අදාළ පහසුකම් හැකි උපරිමයෙන් සැපයීම තුළින් දරුවාට හොඳින් අධ්‍යයන කාර්යයෙහි දීමට හැකියාව ලැබේ. මාර්ගගත ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා නිරන්තරයෙන් ද්විපාර්ශ්වවීය අධ්‍යයන ක්‍රියාවලියක් පවත්වා ගැනීම හරහා ඵලදායී අධ්‍යයන වටපිටාවක් නිර්මාණය කළ හැකිවේ. මාර්ගගත විභාගයන්ගෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මාර්ගගත අධ්‍යාපනයේ ඇති අවාසි සහගත තත්ත්වයන් මගහරිමින්, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් ස්වයං අධ්‍යයනයේ යෙදීම තුළින් විභාගයට හොඳින් මුහුණදීමට හැකියාව දරුවාට ලැබෙන බව පූර්වෝක්ත කරුණු දෙස බැලීමෙන් පැහැදිලි වේ.

වර්තමාන කොවිඩ් 19 තත්ත්වය හමුවේ දීර්ඝ කාලයක් නිවසට වී මාර්ගගත අධ්‍යාපනය ලැබූ දරුවන් හට විභාගයට සහභාගී වීමට පමණක් විභාග මධ්‍යස්ථානයකට යාමට සිදු වීම හා සාමාන්‍ය ලෙස විභාගයට මුහුණ දීමට සිදු වීම තුළ දරුවාගේ මානසිකත්වය හා හැසිරීම කෙසේ විය යුතුද යන ගැටලුවට මතු වේ. විභාගය යනු දරුවාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් වන නිසාවෙන් හා දරුවාගේ අනාගතය තීරණය කරන සාධකයක් වන නිසාවෙන් විභාගය වෙනුවෙන් දරුවා තුළ ඉතා හොඳ සූදානමක් තිබිය යුතු වේ. ඒ සඳහා දරුවාට ලැබෙන අතිරික්ත කාලයෙන් ප්‍රයෝජන ගනිමින් විභාග ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම හොඳින් ප්‍රගුණ කළ යුතු වේ. ප්‍රශ්න පත්‍රයේ ඇති උපදේශ පිළිපදිමින් කාලය කළමනාකරණය කර ගැනීමට දරුවාට පෙර පුහුණුවක් තිබිය යුතුමය. අධ්‍යයන කටයුතුවලින් පරිබාහිරව දරුවා නිරන්තරයෙන් සිය ශරීර සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කරමින් යහපත් සෞඛ්‍ය පුරුදු පිළිපැදීම තුළින් නිරෝගී සෞඛ්‍ය තත්ත්වයකින් හා මානසික තත්ත්වයකක් ඇති කර ගැනීමට හා පවත්වා ගැනීමට උනන්දු විය යුතුයි. ඒකාකාරී බවින් මිදෙමින් විභාග මධ්‍යස්ථානයකට ගොස් සාමාන්‍ය අයුරින් විභාගයකට මුහුණ දෙන දරුවා සිය හැසිරීම පාලනය කර ගනිමින් යහපත් මානසිකත්වයකින් යුතුව විභාගයට මුහුණදීමට හැකි පෞරුෂයකින් හෙබි විය යුතුය. විභාගයකින් ලබා ගන්නා සාර්ථක ප්‍රතිඵලය දරුවාගේ අනාගතය පැහැබර කරයි. මේ නිසාම සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා දරුවාට අවශ්‍ය දැනුම,අවබෝධය හා අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් හා වටපිටාව සැලසීම මාපියන්ගේ, ගුරුවරුන්ගේ මෙන්ම ඔබෙත් මගෙත් වගකීමකි. යුතුකමකි.

**MKT නවාංජනා**
**මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය**
**ජන සන්නිවේදන අධ්‍යයන අංශය**
**සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය**

## ශ්‍රී ලංකාවේ පළමු පර්යේෂණ විශ්වවිද්‍යාල...

39 වන පිටුවෙන්...

එපමණක් ද නොව රාජ්‍ය විශ්ව විද්‍යාල හැරුණු විට මෙරට තුළ ක්‍රියාත්මක එකම නේවාසික විශ්ව විද්‍යාලය ද මෙම ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලයයි. මෙහි ආචාර්ය මණ්ඩලයේ විෂය ප්‍රවීණයින් 170ක් පමණ කටයුතු කරන අතර ඔවුන්ගෙන් 40කට වැඩි පිරිසක් පශ්චාත් උපාධි සම්පූර්ණ කර ඇති අය වෙයි. සිසු සිසුවියන්ගේ කටයුතු වලට විවිධාකාරයෙන් සහය වීම සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 70කට වැඩි පිරිසක් ද සේවය කරනු ලබයි.

මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා ඇතුළත්වීමේ ප්‍රධානතම සුදුසුකම වන්නේ අ.පො.ස උසස්පෙළ විභාගයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) 03ක් ලබා ගැනීමයි. සෑම පාඨමාලාවක් සඳහාම ඉතාමත් සාධාරණ ගාස්තු හඳුන්වා දී ඇති අතර අ.පො.ස උසස්පෙළ විභාගයේ දී ලබා ගත් ප්‍රතිඵල අනුව පූර්ණ ශිෂ්‍යත්ව මෙන්ම අර්ධ ශිෂ්‍යත්ව ලබාගැනීමේ අවස්ථාව ද සිසු සිසුවියන් වෙත ලබා දී ඇත. මෙහිදී උසස්පෙළ විභාගයේ දී A සාමාර්ථ 03ක් ලබාගන්නා සිසු සිසුවියන් වෙත පූර්ණ ශිෂ්‍යත්වයක් හිමි කර ගත හැකි අතර සෙසු ශිෂ්‍යයින්ට එක් A සාමාර්ථයක් වෙනුවෙන් 30% ගාස්තු සහනයක් ද එක් B සාමාර්ථයක් වෙනුවෙන් 20%ක් හා එක් C සාමාර්ථයක් වෙනුවෙන් 10%ක් බැගින් ද ගාස්තු සහන හිමිවේ.

ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය විසින් මේ වන විට සිය විශ්ව විද්‍යාලය මඟින්ම පිරිනමනු ලබන අභ්‍යන්තර උපාධි පිරිනමන අතර ලොව පිළිගත් විශ්ව විද්‍යාල හා සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර ප්‍රමිතියේ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි පිරිනැමීමට ද කටයුතු යොදා ඇත. ඒ අනුව එක්සත් රාජධානියේ ලැන්කැස්ටර්, ඕස්ට්‍රේලියාවේ ඩීකින්, ඕස්ට්‍රේලියාවේ ආර්. එම්. අයි.ටී, නවසීලන්තයේ ඕක්ලන්ඩ්, මැලේසියාවේ ලින්කන්, සිංගප්පූරුවේ ජේම්ස්කුක් යන විශ්ව විද්‍යාල සමඟ සහයෝගීතාවයෙන් ද උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා මෙහි පවත්වන අතර අවශ්‍ය අයට එම විශ්ව විද්‍යාලයන් හි පළමු අධ්‍යයන වසර දෙක ශ්‍රී ලංකාවේ පිහිටි මෙම විශ්ව විද්‍යාලය මඟින් අධ්‍යාපන කටයුතු හදාරා උපාධිය සම්පූර්ණ කිරීම සඳහා එම ජාත්‍යන්තර විශ්වවිද්‍යාල වෙත ඇතුළත් වීම සඳහාද පහසුකම් සළසා තිබේ.

ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය දෙස් විදෙස් සම්මාන රැසකින්ද පිදුම් ලබා ඇති අතර දකුණු ආසියානු කලාපයේ නැගී එන හොඳම අධ්‍යාපනික ආයතනය ලෙස ද 2019 වසරේදී ඔවුන් සම්මාන ලැබීය. දකුණු ආසියානු ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී එම සම්මානය හිමිව ඇති අතර එම වසරේදී ම ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී ද මෙම විශ්ව විද්‍යාලය වෙත සම්මානයක් පිරිනමන ලදී.



එපමණක් නොව CPM Sri Lanka ආයතනය විසින් 2022 වසරේ දී හොඳම කළමනාකරණ ව්‍යුහයන් භාවිතා කරන ජයග්‍රාහී ආයතන 10ක් අතරට ද මෙම විශ්ව විද්‍යාලය නම් කර ඇත.

මේ වන විට මෙම විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් 3000කට වැඩි පිරිසක් අධ්‍යාපනය හදාරන අතර එම අය අතර විදේශීය සිසු සිසුවියන් කීප දෙනෙකු ද සිටීම ඉතා සුවිශේෂී කාරණාවකි. ඉදිරියේදී 6000කට වැඩි සිසු සිසුවියන් පිරිසකට අධ්‍යාපන කටයුතු සඳහා අවස්ථාව ලබා දෙමින් ලොවම පිළිගත් ප්‍රමුඛතම විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම ට ද අපේක්ෂා වී ඇති අතර. ඊට සහය ලබා දීම සඳහා නව ආයෝජකයින් හා සම්පත් දායකයින් රැසක්ම ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය සමඟ අත් වැල් බැඳ ගෙන ඇති බව ද කිව යුතුය.

**එරන්ද එදිරිමාන්න**
**ඡායාරූප-සුදත් නිශාන්ත**











## දැන්වීම් අතිරේක අංශය

☎: 0112 429 339,0777 270 076

සම්බන්ධීකරණය - **එරන්ද එදිරිමාන්න**
පිටු සැකසුම - **කේ. උදයකුමාර්**

සිළුමිණ The Silumina

# ශිල්ප සෙවණ

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අතිරේකය

☎ : 0112 429 339, 0777 270 076

# රටේ දරුවන් ජාත්‍යන්තරයට ගෙන යන NIBM



NIBM අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.ඒ. කුලසූරිය

දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම්, රැකියා ලෝකයේ උපාධිධාරියකු ගේ පිළිගැනීමට ප්‍රබල බලපෑමක් ඇති කරන හේතු සාධක වේ. තරඟකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ ඉහළ කාර්ය සාධනයක් ඇති කිරීමට අත්‍යවශ්‍ය වන විවේචනාත්මක, සක්‍රිය කුසලතා සහිත, අගය පදනම් කරගත් ගුණාත්මක උපාධිධාරීන් නිර්මාණය කිරීමට මඟ පෙන්වන සහ එහි සියලුම ඉගෙන ගන්නන් විචිත්‍රවත් ඉගෙනුම් පරිසරයක් තුළ පෝෂණය කරවන ගැඹුරු මුල් බැසගත් සංස්කෘතියක් තිබේ නම්, ඒ ඉගෙනුමට තෝතැන්නක් බඳු සාර භූමියකි.

NIBM යනු, එකී සංස්කෘතියෙන් සහ සාර භූමියෙන් පොහොසත් උසස් අධ්‍යාපන ආයතනයකි. ව්‍යාපාර නායකයින් බිහි කරන දේශයේ තවත් සරසවියකි.

National Institute of Business Management හෙවත්, NIBM අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.ඒ. කුලසූරිය මහතා සමඟ මේ කතාබහ පෙළ ගැසෙනුයේ, ශ්‍රී ලාංකේය සිසු පරපුරට ඉන් ලබාගත හැකි විපුල ඵල පිළිබඳ, විමසනු සඳහා ය.

## NIBM... යනු, කිනම් පසුබිමක් ඇති උසස් අධ්‍යාපන ආයතනයක් ද...

1968 වසරේ ආරම්භ කළ මේ ආයතනය රජයට අනුබද්ධව ක්‍රියාත්මක වන, ස්වාධීන උසස් අධ්‍යාපන ආයතනයක්. එලෙසම, එය වර්තමානයේ ද ක්‍රියාත්මක වන්නේ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ යි.

ඒ වගේම, ලාංකේය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශේෂී වෙනස්කම් රැසක් ඇති කළ ආයතනයක්. පරිගණක විද්‍යා ක්ෂේත්‍රය මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීමේ පුරෝගාමී ආයතනයක් ලෙසත්, 1976 සිට NIBM ක්‍රියාත්මක වනවා. රටේ පුද්ගලික හා රාජ්‍ය අංශයේ ව්‍යාපාරික ලෝකයට අදාළ වෘත්තිකයන් වැඩි දියුණු කිරීමටත්, ඔවුන්ගේ ඵලදායිතාව වර්ධනය කිරීමට දැනුමෙන් දායක වීමටත් පුරෝගාමීව කටයුතු කළ ආයතනයක්.

ඒ ආරම්භක අවධිය වූ 1976 වසරේදී අයර්ලන්තයේ Dublin විශ්වවිද්‍යාලය හා එක්ව පරිගණක ක්ෂේත්‍රය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් මෙරට ක්‍රියාත්මක කළා. ඒ වන විට, ILO ව්‍යාපෘතියක් විදියට ආරම්භ වී පසුව ස්වාධීන ආයතනයක් ලෙස පවත්වාගෙන යැමට පසුබිම සකසා, ඔවුන් NIBM වෙතින් ඉවත් වුණා.

එම පසුබිමත් සමග ඒ මුල් අවධියේදීම මේ රටේ ඉතාමත් දක්ෂ පරිගණක දැනුමැති කණ්ඩායම් බිහි වුණා. ඔවුන්ගෙන් බොහෝ පිරිසක් දැනටත් මේ රටේ සහ ජාත්‍යන්තරයේ පරිගණක සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඉතා ඉහළ තැන්වල සිටිනවා.

## පවතින තත්ත්වයත් සමඟ ඉදිරියට යෑමට NIBM සිදු කර ඇති වෙනස්කම් මොනවාද...

ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වඩාත් ජනප්‍රිය සහ සාර්ථක අංගයක් වී තිබෙන Outcome Based Learning (OBL) හෙවත්, ප්‍රතිඵල පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමවේදය අප ආරම්භ කළා. ඒ අනුව සිසුන්ගේ හැකියා සහ කුසලතා වර්ධනය කර, විවිධ අංශවලින් සමාජගත වන විට තිබෙන ව්‍යාපාරවලට දායකත්වය දක්වන්නත් අලුත් ව්‍යාපාර ආරම්භ කරන්නත්, ඵලදායි පුද්ගලයකු ලෙස සමාජගත වන්නට වඩ වඩා ඉඩ හසර සාදන පුළුල් අධ්‍යාපන ක්‍රමයක් වූ OBL ක්‍රමවේදය මේ වසරේ සිට අපේ අධ්‍යාපන ක්‍රමයට අපි එක් කළා.

මේ ක්‍රමයේදී අප බලාපොරොත්තු වන්නේ, ඔවුන්ගේ හැකියා සහ කුසලතා නැංවීමටයි. රාජ්‍ය ආයතන හෝ පුද්ගලික අංශයේ හෝ ව්‍යාපාර ක්ෂේත්‍රයේ හෝ සාර්ථකව ක්‍රියාත්මක ව ඉදිරියට යන්න නම් පොතේ පතේ දැනුම සහ විභාග සමත් වීම පමණක් සෑහෙන්නේ නැහැ. හැකියා සහ කුසලතා ඉදිරියට ගෙන ඒම, මේ සමාජ ක්‍රමයේ ඉදිරියට යෑමට අත්‍යවශ්‍ය අංගයක්.

ඒ නිසා ලෝකයේ බොහෝ විශ්වවිද්‍යාල මේ වන විට OBL ක්‍රමවේයට ගිහින් තිබෙනවා. ඒ අනුව නව සොයාගැනීම්, නව නිර්මාණ, විවිධ භාණ්ඩ හා සේවා නිපදවීම්, නව නිපැයුම්, ප්‍රදර්ශනය කිරීම් සහ ඉදිරිපත් කිරීම් ඔස්සේ ඔවුන් ඉදිරියට ආ සිසුන් පිරිසක් බවට පත්වනවා. ඉදිරියේදී NIBM වෙතින් බිහිවෙන සිසුවකු හට රැකියාවක් ලබා ගැනීමේ අවස්ථාව රැකියා වෙළෙඳපොළේ 99,% ක් දක්වා ඉහළ යැමේ පරිසරයයි, NIBM නිර්මාණය කරන්නේ.

ඒ මඟින් නායකත්වය, ගැටලුවලට විසඳුම් සෙවීමේ හැකියාව, හදිසි අවස්ථාවන්ට මුහුණ දීමේ හැකියාව, මනුෂ්‍යත්වය පිළිබඳ වටිනාකම, විවේචන දරා ගැනීම, ව්‍යාපාරික ගුණාංග වර්ධනය කරගැනීම, සහභාගිත්වය, නවෝත්පාදන, නව නිර්මාණ, තාක්ෂණය ග්‍රහණය කර ගත හැකි වීම, උසස් තත්ත්වයන් පවත්වාගෙන යැම, ස්ථාවර බව... ආදී ප්‍රායෝගික ජීවිතයට අත්‍යවශ්‍ය සාධක රැසකින් මේ OBL අධ්‍යාපනය හරහා සිසුන් බල ගැන්වෙනවා. සංවර්ධනය කෙරෙනවා. ඒ මඟින් සිසුන් පුරුදු වෙනවා, හේතුවක් ඇතිව තමන්ගේ අධ්‍යාපන කටයුතු හදාරන්න.

බොහෝ සිසුන් තවමත් අවබෝධ කොට ගෙන නොමැති, 'ඇයි මම ඉගෙන ගන්නේ...' කියන ප්‍රශ්නය ප්‍රායෝගිකව සහ විද්‍යාත්මක ව සිතන්නටත්, විසඳුම් සොයන්නටත් පුළුල් අවස්ථාවක් මේ OBL අධ්‍යාපන ක්‍රමය හරහා හැකියාව ලැබෙනවා.

## මොනවද, NIBM ක්‍රියාත්මක කරන පාඨමාලා...

පාසල් අධ්‍යාපනය හමාර කර NIBM වෙත එන සිසුවකු සිය උසස් අධ්‍යාපනයට පා තබන්නේ, NIBM සහතික පත්‍ර පාඨමාලාවෙන්. එතැන් සිට උසස් සහතික පත්‍ර පාඨමාලාව, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි... දක්වා පාඨමාලා 150ක්



පමණ ක්‍රියාත්මකයි. එයින් 30 කට වැඩි ප්‍රමාණයක් උපාධි පාඨමාලා. ඒ ඔස්සේ තමන් කැමැති අධ්‍යාපන ක්ෂේත්‍රයක් තෝරා ගැනීමේ අවස්ථාව සිසුන්ට උදකර දී තිබෙනවා.

නිදහස් අධ්‍යාපනයේ සැබෑ අරුතට අනුව සිසුවා කැමැති දේ ඔස්සේ ඉහළට යන්නයි, NIBM අධ්‍යාපනය සකසා තිබෙන්නේ. කැමති දෙයින් ඉදිරියට යැමට අත දීම, NIBM විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථයක්.

## NIBM සමග ඒකාබද්ධව වැඩ කරන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මොනවාද...

එක්සත් රාජධානියේ Coventry සහ, මැලේසියාවේ Limkokwing විශ්ව විද්‍යාලවල උපාධි පූර්ණ කාලීනව ශ්‍රී ලංකාවේ සිටම සම්පූර්ණ කරන්නට පුළුවන්. ඊට අමතරව, ඕස්ට්‍රේලියාවේ Deakin සහ Griffith යන විශ්වවිද්‍යාලවලින් උපාධි පාඨමාලාවල මුල් අවුරුදු දෙක ශ්‍රී ලංකාවේ හදරා, ඊළඟ වසර දෙක එම විශ්වවිද්‍යාලවලට යැමට පුළුවන්. ඒ වගේම, මේ උපාධි පාඨමාලා ශ්‍රී ලංකාවේ සිට හැදෑරීමේදී සිසුන්ට රුපියල් ලක්ෂ 80 ක් පමණ දක්වා මුදල් ඉතිරි කර ගන්නට හැකි යි.

මේ ආකාරයට අපි ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වී තිබෙනවා. ව්‍යාපාරික ක්ෂේත්‍රය සමඟ සම්බන්ධ වී තිබෙනවා. පාසලින් එළියට එන දරුවන් සමඟ සම්බන්ධ වී තිබෙනවා. ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල අධ්‍යාපන ක්‍රියාකාරකම් සහ ක්ෂේත්‍රයේ අත්දැකීම් ඔවුන්ට ලැබෙනවා. NIBM උපාධි පාඨමාලා සෑම අතින්ම පරිපූර්ණ වන්නේ, මේ සංකලනය නිසා. අනික, NIBM උපාධි පාඨමාලා සහ විෂය නිර්දේශ සැකසෙන්නේ ඒකාබද්ධව වැඩ කරන එම ජාත්‍යන්තර විශ්වවිද්‍යාල එක්ක සම්බන්ධ වීමෙන්.

## NIBM ආචාර්ය මණ්ඩලය ගැනත් කියන්න...

අපේ සමස්ත කාර්ය මණ්ඩලය 240ක් සිටිනවා. ඉන් දේශකවරු ප්‍රමාණය 80ක්. ඊට අමතරව, බාහිර දේශකවරුන් ද ඇතුළත් වූ විට, 500ක පමණ කාර්යමණ්ඩලයක් NIBM බිම් වෙත දායක වී සිටිනවා. දේශකවරුන් තෝරාගැනීමේ දී අවම වශයෙන් පළමු පෙළ සාමාර්ථයක් සහිත පශ්චාත් උපාධිධාරීන් පමණයි, අප තෝරා ගන්නේ. අපි ලාභ ලබන ආයතනයක් නොවන නිසා, අපිට අවශ්‍ය දරුවන්ගේ උසස් අධ්‍යාපනයට නිවැරැදි සහ නිසි මඟ පෙන්වීම ලබා දෙන්නයි. රජයට බදු ගෙවන, රජයෙන් කිසිවක් නො ලබන එනමුත් රජයෙන් නියාමය වන උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස NIBM තව තවත් ඉදිරියට යන්නේ මේ ගුණාංග නිසා.

## සිසුන්ට තිබෙන වෙනත් පහසුකම් මොනවාද...

පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවීමේ හැකියාව තිබෙනවා. සුව පහසු දේශන ශාලා, උසස් තත්ත්වයේ භෞතික පුස්තකාලයක් සහ ඊ- පුස්තකාලයක් අප සතුයි. පසුගිය වසංගත සමයේ අපි E-Hub කේන්ද්‍රස්ථානයක් පිහිටෙව්වා. එයින් තවමත් පාසල් අධ්‍යාපනය ලබන සහ NIBM සිසුන්ට වගේම, මේ රටේ සියලුම වෘත්තිකයන්ට අවශ්‍ය උසස් ගණයේ පොත් දහස් ගණනක් එහිදී පරිශීලනය කරන්නට හැකියාව තිබෙනවා. එය අපට සම්බන්ධ වන සියලු දෙනාට ලබා දෙන පහසුකමක්. ඒ වගේම, එය ජාත්‍යන්තර මට්ටමේ පුස්තකාලයක්. උසස් පෙළ දරුවන්ට NIBM E- Library වෙත පිවිසීමෙන් මේ පහසුකම ලබාගන්න පුළුවන්. දැන් බොහෝ දෙනා අතර මේ NIBM ඊ- පුස්තකාලය ඉතාමත් ප්‍රචලිත යි.

## NIBM හි වර්තමාන ස්වභාවය පැහැදිලි කරන්න...

ලෝකයේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් සමග අපිත් අංශ කිහිපයක් වැඩි දියුණු කළා.

නාරාහේන්පිට පිහිටි, ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය ඊට හොඳම උදාහරණයක්. භාෂාව, නිර්මාණාත්මක, fashion designing, interior designing... වැනි පාඨමාලා හඳුන්වා දුන්නේ ඒ අනුවයි. නවීන පරිගණක අංශයේ data science සහ ව්‍යාපාරික ක්ෂේත්‍රය හා බැඳුණු මනෝවිද්‍යාත්මක හැදෑරීම් සඳහාත්, විශේෂයෙන් ලෝකයට ඉතා වැදගත් වන අංශවල හැදෑරීම් කිරීම සඳහාත්, පාඨමාලා හඳුන්වා දෙන්නට අප කටයුතු කළා. ඒ අනුව පරිගණක, භාෂා,ව්‍යාපාරික, designing ,මානව විද්‍යාව... ආදී අංශ ගණනාවක් යටතේ පාඨමාලා ක්‍රියාත්මක කොට තිබෙනවා.

## බඳවා ගන්නා ඉලක්කගත කණ්ඩායම් කවුරු ද...

අප කණ්ඩායම් දෙකක් යටතේ බඳවා ගැනීම් සිදු කරනවා. විවිධ ක්ෂේත්‍ර යටතේ දැනට නියැළී සිටින වෘත්තිකයන් එක කණ්ඩායමක්. ඒ අනුව NIBM



සිසුන්ගෙන් 50%ක්ම සිටින්නේ වෘත්තිකයන්. ඊළඟට, පාසල් අධ්‍යාපනය නිම කර උසස් අධ්‍යාපනය බලාපොරොත්තුවෙන් සිටින සිසු පිරිස. අපගේ 12,000ක් වන සිසුන්ගෙන් ඉතිරි 50% එම පිරිසයි. මේ අත්දැකීම් ඇති වෘත්තිකයන් සහ පාසලින් පිටවන සිසුන් අතර සංකලනය තමයි අපේ පාඨමාලාවල සාර්ථකභාවය සහ රහස. ඒ වගේම,NIBM විශේෂත්වය ත් එයයි.

එසේම වසංගතය දරුණුවට පැවති සමයේ වුවත් NIBM ආයතනය තාක්ෂණයෙන් දියුණුව පැවති නිසා, අපේ සිසුන් බොහෝ ඉදිරියෙන් සිටියා. ඒ වගේම, NIBM ඩිජිටල් කැම්පස් එකක් ආරම්භ කර තිබූ නිසා මේ 12,000ක් වන සිසුන්ගේ අධ්‍යාපන කටයුතු ඔන්ලයින් ක්‍රමයට නිම කර උපාධි ප්‍රදාන උත්සවය පවා පවත්වන්නට හැකියාව ලැබුණා.

## රටපුරා කොයි තරම් ශාඛා ප්‍රමාණයක් තිබෙනවා ද...

ප්‍රධාන විශ්වවිද්‍යාලය තිබෙන්නේ කොළඹ 7 විද්‍යා මාවතේ. ඊට අමතරව, ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා. ඒ වගේම, ගාල්ල මාතර නුවර සහ කුරුණෑගල ශාඛා 7ක් තිබෙනවා. මේ ඔස්සේ, දුර බැහැර දරුවන්ටත් NIBM පහසුකම් යටතේ ඉගෙනීමට අවස්ථාව සාද තිබෙනවා.

- ඉනෝකා පෙරේරා බණ්ඩාර

ඡායාරූප : සාලිය රූපසිංහ










# DFCC බැංකුව ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සුවිශේෂ දායකත්වයක් දුන් බැංකුවක්

ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල සැපයුම සඳහා පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය වැදගත් දායකත්වයක් සපයයි. එය රටේ වාර්ෂික විදුලි උත්පාදනයෙන් 35%-40% අතර පංගුවකි. එම බලශක්ති මූලාශ්‍ර අතුරින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වන කුඩා ජල විදුලි බලාගාර, සුළඟ, කෘෂිකර්මාන්තය හා සූර්ය බලය ද, කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය ද පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා දායක වේ. මෙම ප්‍රමාණය සමස්ත විදුලිබල සැපයුමෙන් 10%ක් පමණවේ.

මෙම ක්ෂේත්‍රයේ පුරෝගාමී අරමුදල් සපයන බැංකුවක් වශයෙන් DFCC බැංකුව පසුගිය 25 වසර පුරාම පුද්ගලික අංශයේ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන මුලපිරීම් සඳහා සහාය වීමේදී ඉදිරියෙන් සිටී. සිය තිරසර උපායමාර්ග යටතේ බැංකුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ, පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමය. අනාගත පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා සහාය වීමේදී ද DFCC බැංකුව වැදගත් භූමිකාවක් ඉටු කරයි.

මෙම වැදගත් සන්ධිස්ථානය සමරන අවස්ථාවේ DFCC බැංකුවේ ජ්‍යෝෂ්ඨ උප සභාපති සහ DFCC බැංකුවේ ආයතනික බැංකුකරණ අංශ ප්‍රධානී සොහාන්ත විජේසිංහ මහතා සමග අප සංවාදයක යෙදුණේ පසුගිය 25 වසර පුරා මේ ක්ෂේත්‍රය වෙනුවෙන් බැංකුවේ දායකත්වය පිළිබඳ කතා කිරීමටය.



**සොහාන්ත විජේසිංහ**
DFCC බැංකුවේ ජ්‍යෝෂ්ඨ උප සභාපති සහ ආයතනික බැංකුකරණ අංශ ප්‍රධානී

## DFCC බැංකුව අරමුදල් සම්පාදනය කළ පුද්ගලික අංශයේ පළමු බලශක්ති ව්‍යාපෘතිය කුමක් ද?

1988 වසර අග භාගයේදී පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ ව්‍යාපාර සඳහා මුදල් යොදවමින් DFCC බැංකුව, සූර්යබල PV මොඩියුල එකලස් කිරීමේ කර්මාන්තයකට සහාය වුණා. පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ක්ෂේත්‍රයේ අපේ පළමු ප්‍රධාන නියැළීම වශයෙන් අප සලකන්නේ "හයිඩ්‍රෝටෙක් ලංකා දික්ඔය" ව්‍යාපෘතියයි. එය විදුලි ඒකක මෙගොවොට් 0.96ක් උත්පාදනය කරන කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතියක්. එහිදී අප ණය මෙන්ම සම කොටස් හිමිකාරිත්වයක් සහිතවත් ඊට සම්බන්ධ වුණා. මේ ව්‍යාපෘතිය 1996 දී සාර්ථකව ක්‍රියාත්මක වුණේ ශ්‍රී ලංකාවේ පළමු උපයෝගිතා පරිමාණයේ පද්ධති සම්බන්ධයක් සහිත කුඩා පරිමාණයේ ජල විදුලි ව්‍යාපෘතියක් ලෙසයි. මෙය ක්‍රියාත්මක වීමේදී DFCC බැංකුවේ භූමිකාව ණය දෙන ආයතනයකටත් වඩා එහාට ගියා. මෙම වැදගත් ව්‍යාපෘතිය දිරි ගන්වමින් ජාතික මට්ටමේ සහ අනෙකුත් අදාළ රජයේ ආයතන සමග සමීප සහයෝගයෙන් කටයුතු කරමින් මෙවැනි ආයතන සඳහා ප්‍රතිපත්ති සහ නියාමනයක් සහිතව සංවර්ධනය කිරීමට අප දායක වුණා. මෙම පුරෝගාමී ප්‍රයත්නය, ප්‍රමිතිගත විදුලි මිලදී ගැනීමේ සම්මුතියක් 1997 වසරේදී හඳුන්වා දීමටත් හේතු වුණා. පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ක්ෂේත්‍රයේ පුද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සැලැසීමේදී එය මූලික සාධකයක්.

## පුනර්ජනනීය බලශක්ති අවකාශය තුළ DFCC බැංකුවේ අනෙකුත් මුලපිරීම් මොනවා ද?

ශ්‍රී ලංකාවේ පළමු පුද්ගලික අංශයේ සුළං, සූර්ය හා අපද්‍රව්‍ය බලශක්ති ව්‍යාපෘති සඳහා DFCC බැංකුව එම අරමුදල් සම්පාදකයෙක් ලෙස දායක වුණා. එය 2010 වසරේදී පිහිටවූ මෙගාවොට් 10ක විදුලි උත්පාදනයක් කළ Senok සුළං බලාගාර ව්‍යාපෘතිය හා මෙගාවොට් 10ක Saga සූර්යබල ව්‍යාපෘතියයි. 2017 මෙගාවොට් 10ක නාගරික අපද්‍රව්‍ය මඟින් බලශක්ති උත්පාදනය කිරීමේ ව්‍යාපෘතියකට Western Power සමාගම සඳහා අරමුදල් සම්පාදනය කළා. ඒ 2021 වසරේදී. DFCC බැංකුව සී/ස සූර්යදනවි ව්‍යාපෘතිය සඳහාත් දායක වුණා. පළමුවරට බෙදාහැරීම් පද්ධතියත් සමග සම්බන්ධ වූ වහල මත පිහිට වන සූර්යබල විදුලි ව්‍යාපෘතිය යටතේ මෙගාවොට් 11.4ක් උත්පාදනය කිරීම වෙනුවෙනුත් 2018 දී අප අරමුදල් සැපයුවා. අප බැංකුව ශ්‍රී ලංකාවේ පළමු ජෛව ස්කන්ධ (Biomass) පාදක ඒකාබද්ධ තාප බල ව්‍යාපෘතිය සඳහාත් (මෙගාවොට් 4) අප දායක වුණා. එම ව්‍යාපෘතිය 2017 වසරේදී දියත් වුණා. ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති වටිනාකම් දමය ශක්තිමත් කිරීම වෙනුවෙන් උපකාරි වීමට අපට හැකිවී තිබෙනවා. ශ්‍රී ලංකාවේ පළමු ජල විදුලි ටර්බයින නිෂ්පාදනය කිරීමේ පහසුකම වෙනුවෙනුත් අප මූල්‍ය සම්පාදනය කළා. ඒ 2017 වසරේදී V.S. - Turbo පුද්ගලික සමාගම සමගයි. මෙම සාර්ථක ශ්‍රී ලංකා - ජර්මානු සහයෝගිතාව යටතේ ජල විදුලි බලාගාර ක්ෂේත්‍රය වෙනුවෙන් අවශ්‍ය



විදුලි කාර්මික උපාංග නිෂ්පාදනය කිරීම සිදු වෙන්නේ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාව සඳහා පමණක්ම නොවෙයි, අප්‍රිකාවට අපනයනය කිරීම සඳහාත් බව සඳහන් කළ යුතුයි. ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති බලාගාර නිෂ්පාදකයකු ලෙස Vallibel Power Erathna PLC පළමුව කළ කොටස් නිකුතුව සඳහාත් සමාගමෙහි IPO (Initial Public offering) සඳහාත් 2006දී අප සම කළමනාකාරිත්වය දක්වමින් දායක වුණා.

ග්‍රාමීය ජලවිදුලි ව්‍යාපෘති සඳහාත් DFCC බැංකුව මූල්‍ය සම්පාදනය කර තිබෙනවා. ජාතික විදුලිබල පද්ධතිය හා සම්බන්ධ නැති ප්‍රජාව වෙනුවෙන් ජල විදුලිය සැපයීම සහ කාරක ප්‍රාග්ධන පහසුකම් සලසමින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහාත් සම්බන්ධ වුණේ පාරිභෝගිකයන්ට ගෘහ මට්ටමින් සූර්යබල පද්ධති සවි කිරීම සඳහා ණය පහසුකම් සලසමින්.

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ව්‍යාපාරය ආදර්ශමත් ව්‍යාපාරයක් ලෙස හඳුනාගෙන තිබෙනවා. එසේම DFCC බැංකුව කාම්බෝජය, ඝානාව, ඉන්දියාව, මොසැම්බික්, නේපාලය, පිලිපීනය සහ උගන්ඩාව යන රටවලින් දැනුම ලබා ගැනීම හා හුවමාරුව සඳහා මෙහි පැමිණි විවිධ අධ්‍යයන කණ්ඩායම් සඳහා සත්කාරකත්වය දක්වමින් එක් වුණා. DFCC බැංකුවේ කාර්යමණ්ඩලයට විවිධ අන්තර්ජාතික වැඩමුළු සඳහා ආරාධනා ලැබී තිබෙනවා. එහිදී ඔවුන් පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්ෂේත්‍රයේ නියැළීමේදී සිය අත්දැකීම් බෙදාගෙන තිබෙනවා. උගන්ඩාව හා නේපාලය යන රටවල් ද ඇතුළුව විදේශ රටවල මේ ක්ෂේත්‍රයේ උපදේශන මට්ටමේ භූමිකාවක් DFCC බැංකුව යෙදී තිබෙනවා.

උගන්ඩාවේදී DFCC බැංකුවේ ප්‍රවීණත්වය ලබා දුන්නේ Uganda Energy Credit Capitalization Company (UECU) වෙනුවෙන්. එය උගන්ඩාව තුළ ක්‍රියාත්මක ලෝක බැංකු ආධාර ලබන සූර්යබල විදුලි උත්පාදනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනික ණය පහසුකම් සලසන සමාගමක්.

## පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ DFCC බැංකුව සම්බන්ධ වූ, අරමුදල් යෙදවූ විවිධ ව්‍යාපෘති පිළිබඳවත් පැහැදිලි කිරීමක් කළ හැකි ද?

මෙම ක්ෂේත්‍රයේ අපේ දිගුකාලීන නියැළීම සහ ප්‍රවීණත්වය ගැන කතා කරන විට, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වෙනුවෙන් රට ඍජු විදේශ ආයෝජන (DFI) ලබා ගැනීමේදීත් අප හවුල් කරුවන් වූ බව සඳහන් කළ යුතුයි. 1997 දී, ශ්‍රී ලංකා රජය විසින් DFCC බැංකුව, ලෝක බැංකුවේ අරමුදල් මත හා ගෝලීය පාරිසරික පහසුකම් (GEF) මත ක්‍රියාත්මක බලශක්ති බෙදාහැරීම ව්‍යාපෘති පාලනය සම්බන්ධයෙන් පත් කළා. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් එහි සාර්ථකත්වය ලෝක බැංකුවේ ඇගැයීමට ලක් වුණේ "ඉහළ සාර්ථකත්වයක්" සහිත ව්‍යාපෘතියක් වශයෙන්. එය DFCC බැංකුව ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා පුනර්ජනනීය බලශක්තිය නම් ව්‍යාපෘතිය හා එහි අතිරේක මූල්‍යකරණය (RERED) (2002 – 11) සඳහා පාලන මට්ටමින් පත් කිරීමටත් හේතු වුණා.


මේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ යම් පරිණාමයක් ඇති වීමට මෙන්ම NCRE ස්ථාපිත කිරීම පිණිසත් හේතු වුණා. එය රටේ බලශක්ති උත්පාදනයට අදාලව ඉතා වැදගත් විකල්පයක්. 2013 දී DFU බැංකුව, යුරෝපීය ආයෝජන බැංකුව (EIB) අරමුදල් සම්පාදනය කළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ හරිත බලශක්ති ක්ෂේත්‍රය වෙනුවෙන් යුරෝ මිලියන 90ක ණය පහසුකම් සැලසීමේදී එය ක්‍රියාත්මක කිරීම පිණිසත් පත් කෙරුණා.

2018 දී, DFCC බැංකුවේ ව්‍යාපෘති සඳහා උපදේශන ලබා දීමේ අංශය වන DFCC Consulting (PVT) LTD, ආසියානු සංවර්ධන බැංකු (ADB) ආධාර යටතේ ක්‍රියාත්මක වහල මත සූර්ය බලශක්ති උත්පාදනය සඳහා ණය පහසුකම් ලබා දීමේ (RSPALOC) ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහාය ලබා දීම වෙනුවෙන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මතකය කළමනාකරණය කිරීම වෙනුවෙන් පත් කෙරුණා. ඊට අමතරව මූල්‍ය ආයතනයක් ලෙස සහභාගි වීමේදී DFCC බැංකුව RSPGLOC යටතේ උප ව්‍යාපෘති 261ක් සඳහා අරමුදල් සම්පාදනය කර තිබෙනවා. ඒ යටතේ කුඩා පරිමාණ හා ගෘහස්ථ මට්ටමින් ද, වාණිජ මට්ටමේ ද වහල මත සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘති මඟින් ජාතික පද්ධතියට මෙගාවොට් 5 ක් එකතු කිරීමට හැකිවී තිබෙනවා. අන්තර්ජාතික සංවර්ධන නියෝජිතායතන මෙවැනි ණය පහසුකම් ශ්‍රී ලංකා ආණ්ඩුවට ලබා දීමේදී DFCC බැංකුවේ එම කාර්යභාරය ඉහළ සාර්ථකත්වයක් මෙන්ම සාර්ථක කළමනාකාරිත්වයක් සහිත බවට පිළිගැනීමට ලක්ව තිබෙනවා.

## පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ව්‍යාපාර අංශයේ අනාගතය කෙබඳු ද?

ශ්‍රී ලංකාව සිය විදුලි අවශ්‍යතාව පිරිමසා ගැනීමේදී වසර 2030 වන විට 70%ක පුනර්ජනනීය බලශක්ති ඉලක්කයකට යෑමට අපේක්ෂා කරනවා. වර්තමාන ඉන්ධන අර්බුදයෙන් ද වැඩි දුරටත් අවධාරණය කරන්නේ, දේශීය හා පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයවලට යොමු වීමේ වැදගත්කම හා අවශ්‍යතාවයි. මෙය අවිවාදයෙන්ම සුවිසල් අභියෝගයක්. පුනර්ජනනීය බල ශක්ති නිෂ්පාදන අංශයේ අනාගතය රටේ දිරිගැන්වීම සඳහා රජයේ දායකත්වය දෙස අවධානය යොමු කරන විට, මෙම ක්ෂේත්‍රයේ අනාගතය දෙස අප බලන්නේ සුබවාදීවයි. එහිදී අප තව දුරටත් මෙම අතිශය වැදගත් ක්ෂේත්‍රය වෙනුවෙන් අපගේ දායකත්වය ලබා දෙමින් සිටිනවා.






## වහල මත සවි කරන සූර්ය පැනල මඟින්

# ජාතික විදුලිබල සැපයුමට ප්‍රබල දායකත්වයක්

වෙනත් ඕනෑම ශ්‍රී ලාංකිකයකු මෙන් ඔබත් ශ්‍රී ලංකාවේ විදුලි පාරිභෝගිකයකු නම්, ඔබගේ නිවසට වර්ෂය පුරා මනාව හිරු එළිය පතිත වන වහලයක් පවතී නම්, මේ අපූරු පණිවිඩය ඔබ ඇසිය යුතුමය. හිරු හොඳින් පායමින් ඔබට මුදල් ඉපැයීමට උපකාර වෙන්නේ කෙසේ දැයි මේ ලිපිය කියවන විට ඔබට දැන ගත හැකි වනු ඇත. 2010 වසරේ දියත් කළ සූර්ය බල සංග්‍රාමයේ ශුද්ධ මිනුම්කරණ යෝජනා ක්‍රමයේ වත්මන් වැඩපිළිවෙළ මෙයයි. විදුලිබල සැපැයුම්කාර ආයතන දෙක වන ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි සමාගම මේ වැඩපිළිවෙළ සඳහා ක්‍රමවේද තුනක් ඉදිරිපත් කරයි. මේ යටතේ පාරිභෝගිකයන්ට තම නිවෙසේ වහලය භාවිත කරමින් විදුලි බලය ජනනය කර, එයින් වැඩ රාජකාරි රැසක් ඉටු කරවා ගැනීමට හැකිය. මේ වසරේ අවසානය වන විට වහල මත සවි කළ සූර්ය පැනල මඟින් මෙගාවොට් 500ක විදුලිබලයක් ජනනය කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය පියවර පෙළ ගස්වා තිබේ.

ශුද්ධ මිණුම්කරණය (Net metering) - 2010 ජූනි මස සිට පාරිභෝගිකයාට පිරිනැමූ ඉහත යෝජනා ක්‍රමය දිගට ම ක්‍රියාත්මක වේ. මසකට විදුලි ඒකක 160කට වැඩියෙන් භාවිත කරන නිවාසවලට මේ යටතේ ඉතා ඵලදායී අයෝජනයකට අවස්ථාව හිමිවේ. මාසිකව විදුලි බිල් සඳහා ගෙවන මුදල සැලකීමේදී මේ සඳහා කරන ලද අයෝජනය වසර පහකට අඩු කාල සීමාවක දී නැවත උපයාගත හැකි ය. එසේම ජාතික විදුලිබල පද්ධතියෙන් නිවසට ලබා ගත් විදුලිබලය සහ නිවසේ සූර්ය පැනල පද්ධතියෙන් ජාතික විදුලිබල පද්ධතියට මුදාහල විදුලි ඒකක ගණන මැන ගැනීම සඳහා මේ නිවාසවලට ද්වි දිසා විදුලි මීටර් සවි කළ යුතුය.

පාරිභෝගිකයා විසින් ලබා ගත් විදුලි ඒකක ප්‍රමාණය ඔහු විසින් ලබා දුන් විදුලි ඒකක ගණනට වඩා අඩු නම්, පාරිභෝගිකයාට ගෙවීමක් සිදු නොකරන අතර එසේ වුවත් ඔහුට බලශක්ති බැර ප්‍රමාණය වසර 10ක් දක්වා ඉදිරියට ගෙන යැමට හැකිවේ. මේ වසර දහයක කාලය ඇතුළත බලශක්ති බැර ප්‍රමාණය භාවිත කිරීමට ඔහුට හැකිවේ. පාරිභෝගිකයා ලබා ගත් විදුලි ඒකක ප්‍රමාණය ඔහු විසින් ලබා දුන් විදුලි ඒකක ප්‍රමාණයට වඩා වැඩි නම්, ඔහු ගාස්තු ගෙවිය යුත්තේ ලබා ගත් විදුලි ඒකකවලින් ලබා දුන් විදුලි ඒකක ගණන අඩු කිරීමෙන් ලැබෙන ඉතුරු ඒකක ගණනට පමණි. ක්ෂුද්‍ර තාප සහ සුළු සුළං බලශක්ති වැනි සුනිත්‍ය බලශක්ති මූලාශ්‍රයවලට මේ ක්‍රමවේදය යෙදිය හැකි ය.

ශුද්ධ ගිණුම්කරණය (Net accounting) - මේ යෝජනා ක්‍රමය යටතේ ශුද්ධ මිනුම්කරණ යෝජනා ක්‍රමයට අයත් ලක්ෂණ රැසක්ම ලබාගෙන ඇත. මෙයට වෙනස් වන කරුණ වන්නේ බලශක්ති බැර ප්‍රමාණය ඉදිරියට ගෙන යනවා වෙනුවට තුලනය කිරීමට ලක් කිරීමයි.

ලබා ගත් බලශක්ති ප්‍රමාණය ලබා දුන් බලශක්ති ප්‍රමාණයට වඩා වැඩි නම් ලබා ගත් සහ ලබා දුන් බලශක්ති ප්‍රමාණය අතර වෙනසට සරිලන පරිදි බිල්පත සකස් කෙරේ. කෙසේ වෙතත් ලබා ගත් බලශක්ති ඒකක ගණනට වඩා ලබා දුන් බලශක්ති ඒකක ගණන වැඩි නම් වසර 20ක කොන්ත්‍රාත්තුවේ පළමු වසර හත ඇතුළත එවැනි වැඩිපුර ලබා දුන් බලශක්ති ප්‍රමාණයට ඒකකයකට රුපියල් 22.00 බැගින් පාරිභෝගිකයාට ගෙවයි. පළමු වසර හතට පසු 20 වසරක කොන්ත්‍රාත්තුව අවසන් වනතුරු පාරිභෝගිකයාට ඒකකයකට රුපියල් 15.50ක මුදලක් ගෙවයි. තමන්ගේ විදුලි බිල අවම මට්ටමකට පත්කරගෙන නව ජීවන රටාවකට හැඩගැසීමට නෙට් මීටරිං පහසුකම පාරිභෝගිකයාට උදවු කරයි.

වරක් එක් පාරිභෝගිකයෙක් තමන්ගේ කාමර රැසක්ම වායුසමනය කරමින් අතිරික්ත විදුලිබලය ස්වකීය පාරිභෝජනයටම උපයෝගී කර ගත්තේය. නව ක්‍රමය යටතේ ජාතික බලශක්ති සුරක්ෂණය කිරීමේ ප්‍රතිපත්තිය යටතේ විදුලිබලය සංරක්ෂණය කරගෙන මුදල් ඉපැයීමට ඔවුන් දිරිමත් කරයි.

ශුද්ධ එකතු (Net Plus) - මේ යෝජනා ක්‍රමය යටතේ ඔබගේ නිවසේ සාමාන්‍ය විදුලි සම්බන්ධතාව නොවෙනස්ව පවතියි. එසේම ඔබගේ විදුලි බිල්පත සාමාන්‍ය පරිදි ලැබෙයි. වෙනම පරිපථයක් යටතේ ඔබගේ වහලය මත සවි කර ඇති සූර්ය පැනලයෙන් නිෂ්පාදනය කරන විදුලිබලය ජාතික පද්ධතියට එකතු කෙරේ. මේ සඳහා පළමු වසර හතේදී පාරිභෝගිකයාට එක් විදුලි ඒකකයකට රුපියල් 22.00 බැගින් ගෙවීමට කටයුතු කරයි. ගිවිසුමේ ඉතිරි කාලය සඳහා ඒකකයකට රුපියල් 15.50ක් ගෙවයි.

ඔබගේ මාසික විදුලි බිලේ අමතර විදුලි ඒකක ගණන සඳහන් කරන අතර අමතර විදුලි ඒකක සඳහා ඔබට ගෙවිය යුතු මුදල මෙහි සඳහන්වේ. මේ යෝජනා ක්‍රමයට කාර්මික ආයතනවලින් පුළුල් ලෙස ඉල්ලීමක් ඇති වනු ඇත. ඒ, ඔවුන්ට නිවාසවල පාරිභෝගිකයන්ට වඩා විදුලිය ජනනය කිරීමේ විශාල වහල වපසරියක් ඇති බැවින් මණ්ඩලයෙන් සපයන විදුලිබලයට වඩා පුනර්ජනනීය විදුලිය කෙරෙහි වැඩි නැඹුරුතාවක් ඇති කර ගන්නා හෙයිනි.



### වහල මත සවි කරන සූර්යබල පැනල පද්ධතිය

- ❖ පැනල, ඉන්වර්ටර්ස් සහ අනෙකුත් උපාංගවලින් සමන්විත සූර්ය බල පද්ධතියක් ශ්‍රී ලංකාවේදී කිලෝවොටයකට රුපියල් 105,000 සිට 250,000 දක්වා මිල පරාසයකින් යුක්තවේ. එය තීරණය වන්නේ පැනලයේ සන්නාමය සහ එහි උපාංග නිෂ්පාදනය කළ රටේ සහ එය ස්ථාපනය කරන දේශීය ආයතනය කුමක් ද යන්න මතයි.
- ❖ උපකරණවල වර්ගය සහ ගුණාත්මකභාවය අනුව මිල ඉතා විශාල පරාසයක් දක්නට ඇති අතර, ස්ථාපනය කරන ප්‍රමාණය අනුව ද එය තීරණයවේ. සේවාදායකයන්ගේ මිල කෙරෙහි ඇති දයකත්වය විශේෂයෙන් සඳහන් කළ යුතු නැත. මේ වන විට ශ්‍රී ලංකාවේ එවැනි සේවාදායකයෝ 400කට වැඩි පිරිසක් සිටිති.
- ❖ සූර්යබල පද්ධතියේ ධාරිතාව ප්‍රකාශ කරන්නේ කිලෝවොට් පීක්වලිනි. මෙයින් පද්ධතියේ ඇති විවිධ උපාංග සමස්තයෙන් නිෂ්පාදනය කරන සැබෑ බල ධාරිතාව අදහස් කෙරේ. සම්මත තත්ත්ව සහ උෂ්ණත්වය යටතේ කෝෂ 36කින් සමන්විත සාමාන්‍ය පැනලයකින් කිලෝවොට් 0.35ක් (වොට් 350ක්) ජනනය කළ හැකිය. එහෙත් දැන් වෙළෙඳපොළේ ඇති එම ප්‍රමාණයේ නවතම පැනලවලින් කිලෝවොට් 0.75ක් (වොට් 750ක්) ජනනය කළ හැකිය.
- ❖ සාමාන්‍යයෙන් කිලෝවොට් එකක ධාරිතාවකින් යුක්ත පැනල පද්ධතියක් සවි කිරීමට වර්ග මීටර් 6.5ක ඉඩ ප්‍රමාණයක් අවශ්‍යවේ. කොළඹ සඳහා පද්ධති ස්ථාපනය කිරීමට ඉතාම උචිත ආනතිය වන්නේ දකුණු දිශානතිව හතක ආනතියකි. කෙසේ වෙතත් දූහුවිලි බැඳීම සම්බන්ධයෙන් සලකා ස්වාභාවිකවම සේදී යැම සඳහා ඒකක 10ත් 15ත් අතර ආනතියක් නිර්දේශ කරයි.

44 පිටුවට






# වහල මත සවි කරන සූර්ය පැනල...

43 පිටුවෙන්



❖ කිලෝවොට් එකක ධාරිතාවෙන් යුක්ත පැනල කට්ටලයක සාමාන්‍ය බර කිලෝග්‍රෑම් 80ක් පමණවේ. එසේම මේ බර වහලය පුරා බෙදී යනු ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ බොහෝ වහලවලට මේ අමතර බර දරාගත හැකිය. එසේම විශාල වහල සහ පරණ වහලවල් මත මේ කට්ටලය සවි කිරීමට පෙර ඉංජිනේරුවකු මඟින් එහි සුරක්ෂිත බව පරීක්ෂා කර ගැනීම වැදගත්ය.

❖ වෙළෙඳපොළේ විවිධ ප්‍රමාණ ඉතා විශාල පරාසයක් තෝරා ගැනීමට ඇත. එසේම සූර්ය පැනල ප්‍රධාන වර්ග දෙකකි. එනම් පොලි-ක්‍රිස්ටලින් සිලිකන් සහ මොනෝ-ක්‍රිස්ටලින් සිලිකන්ය. මේ දෙකෙන් මොනෝ ක්‍රිස්ටලින් පැනල කල්පැවැත්මෙන් වැඩි අතර මිලෙන් ද ඉහළය.

❖ විදුලිබල සැපයුම බිඳ වැටුණු විට මේ පද්ධතියට ඔබගේ නිවස බලශක්ති ගැන්වුමට හැකිද? යන ප්‍රශ්නය ඔබට නැගෙනු ඇත. කිසිසේත්ම නැත. මේ පද්ධති ක්‍රියාත්මක වීමට ජාතික විදුලි බල පද්ධතියෙන් තරංග සංඥ ලැබිය යුතුය. එයින් විදුලිය ජනනය වෙන්නේ සාමාන්‍ය පද්ධතියේ විදුලිබල සැපැයුම ඇති විට පමණි. එසේම දුර බැහැර පිහිටි ස්ථානවලට ගැළපෙන සූර්ය පැනල පද්ධතියක් ද තිබේ. එය ග්‍රිඩ් මාර්කින් ඉන්වර්ටර්ස් ලෙස හැඳින්වේ. ජාතික විදුලිබල සැපැයුමෙන් විදුලිබලය නොලැබෙන විට දී පවා මේවා ක්‍රියාත්මකවේ. මේ ආකාරයේ ඉන්වර්ටර්ස් සවි කරන විට විශේෂ තාක්ෂණික ආරක්ෂක උපාංගයක් සමඟ සවි කිරීමට අවසර ලබාදී තිබේ.

❖ සෝලා පීවී රූෆ් ටොප් සූර්යබල පැනල පද්ධතියෙන් දිවා කාලයේ සූර්යයා පවතින විට උත්පාදනය වන විදුලිබලය (නෙට් මීටරිං සහ නෙට් අකවුන්ටිං ක්‍රම යටතේ) අසල්වැසි නිවාස කරා ගමන් කිරීමට ප්‍රථම මුලින්ම භාවිත වන්නේ නිවෙසේම එදිනෙද කටයුතු සඳහාය. ඒවා පිටතට ගමන් කරන්නේ තමන් විසින් භාවිත කළ යුතුව තිබූ ප්‍රමාණයට වඩා තිබුණොත් පමණි. නෙට් ප්ලස් සැලැස්ම යටතේ නිෂ්පාදනය කරන විදුලිබලය ඔබගේ නිවසේ සිට අසල්වැසි නිවාස කරා සෘජුවම ගමන් කරයි. මේ ආකාරයෙන් ජාතික විදුලිබල පද්ධතියට ලබාදෙන විදුලිබල සැපයුම් නිසා විදුලි බල මණ්ඩලයෙන් ඇති විදුලිබල ඉල්ලුම අඩු වනු ඇත.

❖ නෙට් ප්ලස් සැලැස්මට අයත් වුවත් නැතත් රාත්‍රී කාලයේ සියලුම විදුලි පාරිභෝගිකයන්ට ලංකා විදුලිබල මණ්ඩලයෙන් සැපැයෙන මධ්‍යම විදුලි ජනනයෙන් අවශ්‍ය විදුලිබලය ලබා ගැනීමට සිදු වනු ඇත. සූර්යබල පද්ධතියෙන් නිෂ්පාදනය වන විදුලිබලය ගබඩා කිරීම සඳහා යොදා ගන්නා බැටරි ඉතාම මිල අධික වන නමුත් දැන් ඒවා පහත බැසීමට පටන් ගෙන ඇත.

❖ දැනට පවතින සාමාන්‍ය තත්ත්ව යටතේ සූර්යබල පැනලවලින් වසර විස්සක් දක්වා විදුලිබලය ජනනය කළ හැකිය. කෙසේ වෙතත් මේ උපකරණයේ හදවත බඳු උපාංගය වන ඉන්වර්ටරය කල් පවතින්නේ වසර දහයක කාලයකි. එසේම පැනල වසරකට සියයට 0.5ක ක්ෂය වීමක් දක්වයි. ඒ නිසා කිලෝවොට් එකක ධාරිතාවයෙන් යුක්ත සූර්යබල පැනලයක් වසර 12ක් අවසානයේ දී කිලෝවොට් 0.85ක් දක්වා නිෂ්පාදනය පහළ බසියි.

❖ සෙවනැලි අඩු යහපත් තත්ත්වයන් යටතේ කොළඹදී ස්ථාපනය කර ඇති කිලෝවොට් එකක ධාරිතාවෙන් යුක්ත නිසි ක්‍රියාකාරිත්වයෙන් යුක්ත සූර්යබල පද්ධතියකින් දින 30කින් යුක්ත මාසයකදී කිලෝවොට් පැය 116ක් ජනනය කළ හැකි ය. මේ ධාරිතාව වසර දෙළහකින් අනතුරුව කිලෝවොට් පැය 98කට පහළ යයි. මේ පැනල නිසි තත්ත්වයේ නොතිබුණොත් සහ සෙවනැලිවලට යටත් වුණොත් අපේක්ෂිත නිෂ්පාදනය ඇති නොවන බව ද දැනගත යුතුය.

❖ සෝලාර් පීවී සූර්යබල උත්පාදක පද්ධති භාවිත කරන පාර්භෝගිකයන් තමන්ට අවශ්‍ය කරන ධාරිතාව තම අභිමතය පරිදි තීරණය කළ යුතුය. සාමාන්‍යයෙන් නිවසකට කිලෝවොට් හතක ධාරිතාවෙන් යුක්ත සූර්ය පැනල පද්ධතියක් නිර්දේශ කෙරේ.
කිසියම් ප්‍රදේශයක නිවාස ඒකක රැසක් සූර්යබල පැනල සවිකර ඇති විට, පසු කාලයේ සූර්යබල පැනල සවි කිරීමට උත්සාහ කරන අයට ඒ සඳහා අවස්ථාව නැති වී යා හැකිය. ඒ ප්‍රදේශයක ස්ථාපිත කරන සූර්ය බල පද්ධතිවලින් එහි පවතින විදුලිබල ඉල්ලුම තෘප්තිමත් වුණොත් තව දුරටත් පැනල සවි කිරීමෙන් බෙදාහැරීම් පද්ධතියට සහ ට්‍රාන්ස්ෆෝමර්වලට අහිතකර තත්ත්වයක් ඇති විය හැකි නිසාය.


❖ පීවී සූර්ය පැනල පද්ධති නිෂ්පාදනය කරන්නේ අමුතු ක්‍රියාකාරිත්වයක් ඇති අර්ධ සන්නායකවලිනි. එහි පැනල රත්වන විට එයින් ජනනය වන විදුලිබල ප්‍රමාණය අඩුවේ. ඒ නිසා හිරු එළිය තදින් පතිත වන ප්‍රදේශ සූර්ය පැනල සවි කිරීම සඳහා උචිතම ස්ථාන ලෙස සැලකිය නොහැකිය. මේ නිසා උණුසුම් සහ හිරු එළිය තදින් වැටෙන ස්ථානවලට වඩා සිසිල් සහ සාමාන්‍ය හිරු එළිය වැටෙන ප්‍රදේශ සූර්යබල ජනනය සඳහා වඩාත් උචිතය.

❖ සෝලා පීවී රූෆ්ටොප් විදුලි බල ජනනය ඉතා ලාභදායක ආයෝජනයකි. එය ස්ථාපනය කිරීමට ඔබ වැය කළ මුදලට සාපේක්ෂව එයින් වසරකට (සියයට 15ත් 17.5ත් අතර) ඉතා ඉහළ පොලියකට සමාන ආදායමක් ලබාගත හැකිය. එය ඕනෑම බැංකුවකින් ගෙවන පොලියට වඩා වැඩිය. සියලුම ආකාරයේ පාරිභෝගිකයන්ට සේවා සපයන 420කට වැඩි සේවාදායකයන් පිරිසක් මෙරට ක්‍රියාත්මක වේ. සේවාදයකයකු තෝරා ගැනීමේ දී දීර්ඝ කාලීනව සේවය සැලසිය හැකි වැඩි පාරිභෝගිකයන් පිරිසක් සහිත සමාගමක් තෝරා ගැනීම නුවණැති කාරණාවකි.

❖ සූර්ය පැනල ස්ථාපනය කිරීමේ සේවයේ ප්‍රමිති සුරක්ෂිත කිරීමට ආචාරධර්ම පද්ධතියක් පිහිටුවා තිබේ.


❖ විදේශ රටවලින් ඉවත දැමූ පාවිච්චි කරන ලද සූර්යබල පද්ධති උපාංග, අඩු ගුණාත්මක ඉන්වර්ටර් උපාංග යොදා ගන්නා සහ දුර්වල ක්‍රියාකාරිත්ව වාර්තා ඇතිව ස්ථාපන සේවයේ නිරත වන සමාගම්වලින් ප්‍රවේසම් වන්න. සේවා දයකයා තෝරා ගැනීමට පෙර ඔහුගේ පාරිභෝගිකයන් ජාලය පිළිබඳ සොයා බැලීමට කටයුතු කරන්න.

පසුගිය වසර එකොළහක මෙහෙයුම් වාර්තා අනුව මේ සැලැස්ම වේගවත් වර්ධනයක් පෙන්නුම් කළේය. දැන් 2022 දී මේ සැලැස්මෙන් ජාතික විදුලිබල සැපැයුමට මෙගවොට් 420ක අමතර විදුලිබලයක් එකතු කළේය. ඒ 2010 දී ඉතාම සුළුවෙන් ආරම්භ කළ මෙහි කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. එය පහත වගුවේ දැක්වේ.




සේවා දයකයන් හය දෙනකුගෙන් ආරම්භ වූ මේ ව්‍යාපාරය මේ වන විට සේවා දයක සමාගම් 420කට වැඩියෙන් වර්ධනය වී ඇත. මේ නිසා ලොව පුරා නිෂ්පාදකයන්ගේ විවිධ මිල ගණන්වල වෙනස අත්විඳීමට පාරිභෝගිකයාට අවස්ථාව උදා වී ඇත. වසර 40ක කාලය ඇතුළත වොට් 1ක ධාරිතාවෙන් යුක්ත පැනලයක මිල අමෙරිකන් ඩොලර් 100ක සිට අමෙරිකන් ඩොලර් ශත 22කට පහත වැටිණි. එය පහත වගුවෙන් ප්‍රකාශ වේ.


**1976 සිට සූර්යබල මොඩියුලවල මිල පහත වැටීම සියයට 99.6කි.**



විදුලි පාරිභෝගිකයන් නෙට් මීටරිං සම්බන්ධතා ලබා ගත් පසු වියදම ගැන නොසලකා තමන්ගේ විදුලිබල පරිභෝජනය ඉහළ නංවා ඇති බව ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි සමාගමේ පාරිභෝගිකයන් සිටින ප්‍රදේශ නියැඳියක් ආශ්‍රිතව සිදු කළ සමීක්ෂණයක දී අනාවරණය වී තිබේ. පාරිභෝගිකයන් බහුතරයකට සූර්ය බලශක්තිය භාවිත කිරීමට ඇති බාධා තුරන් කර ඔවුන් ඊට දිරි ගැන්වීමට ආණ්ඩුවට අවංක වුවමනාවක් තිබේ. මේ සංග්‍රාමයට සෑම පාරිභෝගිකයකුටම ඇතුළු වීමට ඉඩ සලසා දීමට ආණ්ඩුවට අවශ්‍යය. මෙය මෙගාවොට් පරිමාණයෙන් සූර්ය විදුලිබලය නිෂ්පාදනය කරන ඉහළ මට්ටමේ නිෂ්පාදකයන්ට සහ කිලෝවොට් මට්ටමෙන් විදුලිය නිෂ්පාදනය කරන උසස් මට්ටමේ නිවාස හිමියන්ට පමණක් සීමා නොකිරීම ආණ්ඩුවේ අභිලාශයය. විශාල පරිමාණයේ විදුලි බල නිෂ්පාදකයන් කිහිප දෙනකුට විදුලිබල මණ්ඩලයට විදුලි බලය විකිණීමේ අයිතිය සීමා නොකොට සෑම දෙනාට ජාතික විදුලි බල පද්ධතියට පුනර්ජනනීය විදුලිය ලබා දීමට අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වෙයි.

ඉහත සඳහන් කළ සැලැසුම්වලට සියලුම පාරිභෝගිකයන්ට සම්බන්ධ විය හැකිය. මේ යටතේ කර්මාන්තවල සිට ව්‍යාපාර දක්වාත් ඉතා දුර ඈත ප්‍රදේශවල පිහිටා ඇති නිවාසවලටත් ජාතික විදුලිබල පද්ධතියට අයත් සම්බන්ධතාව ලබා ඇත් නම් මේ ව්‍යාපෘතියට සම්බන්ධ විය හැකිය. පළමු සැලැස්ම වන නෙට් මීටරිං ක්‍රමය ඉහළ මට්ටමේ ආයතන වෙනුවෙන් සකස් කර ඇති අතර දෙවැනි සැලැස්ම වන නෙට් එකවුන්ටිං ක්‍රමය මධ්‍යම මට්ටමේ ආදායමක් ඇති නිවාස සහ කුඩා පරිමාණ ව්‍යාපාර වෙනුවෙන් සකස් කර ඇත.

තුන් වැනි ක්‍රමය වන නෙට් ප්ලස් ක්‍රමය ඕනෑම කෙනකුට ගැළපේ. 2014 වසරේ ජූනි මාසයේ දී පාරිභෝගිකයන් විදුලිය භාවිත කළ මට්ටමේ විහිදුම දැක්වෙන පහත වගුව මේ ගැන වඩාත් සවිස්තර වාර්තාවක් සපයයි.




මධ්‍ය ආදායමක් ඇති පවුල්වලට සූර්ය බලශක්ති ජනනය අත්පත් කළ හැකි දෙයක් බවට පත් කිරීමට නවෝත්පාදන ක්‍රමවේද රැසක් පවතියි. ඉතාම ඉක්මනින් එවැනි ක්‍රමවේ ද ද හඳුන්වා දීමට නියමිත ය.

## අනාගතයේ බලශක්තිය සූර්ය බලශක්තිය වේද?

වෙනත් ප්‍රදේශවල අත්දැකීම් විමසා බලන විට සූර්ය බල ශක්තිය දෙපැත්ත කැපෙන කඩුවක් බඳුය. මෙයින් පොසිල ඉන්ධන දහනය අවම අගයකට අඩු කිරීමට හැකිය. එහි නරක පැත්ත වන්නේ කඩුව දරන්නාට තුවාල කිරීමට ද එයට හැකි නිසාය. මෙය යුරෝපා රටවල අත්දැකීම්වලින් පෙන්නුම් කෙරිණි. සූර්ය බල ශක්ති ලබා ගැනීමට උපාංගවලට අධික මිලක් ගෙවීමට සිදු වීම නිසා, ආයතන බංකොලොත් විය.

මේ සඳහා උපකරණවල ඉහළ මිල ගණන් සහ සූර්ය බලශක්තියේ සැමදෙනා කොටස්කරුවන් කර ගැනීමට බාධා කරන ආණ්ඩුවල ආර්ථික – තාක්ෂණික ප්‍රතිපත්ති මය කාරණා ද බලපැවේය. මේ නිසා පාරිභෝගිකයන්ට විශාල පිරිවැයක් දැරීමට සිදු වේ. ඉහළ මිල ගණන් ගෙවීමට සිදු වීම නිසා එය දරාගත නොහැකිව ආයෝජකයන්ට වේදනා විඳින්න සිදු වීම එයින් ඉවත් වීමට ඉඩ සලසමින් නරක ආදර්ශයක් සපයයි. මෙවැනි බලපෑම්වලට විසඳුම් සපයා ගත් බොහෝ රටවල් පොසිල ඉන්ධනවලින් ඈත් වීමට සහ පරිසර දූෂණයෙන් ඈත් වීමට මඟ පාද ගත්හ.

වැරැදීම්වලින් ඉගෙන ගැනීම මඟින් ශ්‍රී ලංකාවේ සූර්යබල සංග්‍රාමය මෙගාවොට් නිෂ්පාදනයට වඩා උපරිම පාරිභෝගිකයන් පිරිසක් අද්දවා ගැනීමේ වැඩපිළිවෙළක් වෙත විතැන් වී තිබේ. වෙනත් රටවල යොදා ගන්නා ආකාරයෙන්ම ශ්‍රී ලංකාවේ ද ප්‍රාග්ධන සහන සැලසීමට පියවර ගෙන ඇත.

මේ මඟින් ක්ෂේත්‍රයේ නිරත කර්මාන්තකරුවන්ට තම පාරිභෝගිකයා වෙත සහනදායී මිලට උපාංග ලබා දී තම සේවය සැලසීමට ඉඩ සලසා දී තිබේ. එයින් නතර වන්නේ නැත, සේවාදයකයන්ට ආණ්ඩුවෙන් ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දී ඇති අතර සේවාදයකයන් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් තුළින් පාරිභෝගිකයාට තම සේවාදයකයා ගැන දැන ගැනීමට ක්‍රමවේදයක් සලසා තිබීම වැදගත්ය. මේ මඟින් පොදු ජනතාවට කර්මාන්තයේ හොඳ, නරක සහ අප්‍රසන්නතා සියල්ල පහසුවෙන් හඳුනා ගත හැකිය. මේ වන විට ස්වාධීන පරීක්ෂණ පහසුකමක් ඇති කිරීමට මෙන්ම තෙවැනි පාර්ශ්වීය ස්ථාපන සහතික කිරීමේ සැලැස්මක් කර්මාන්තයට අවශ්‍ය කරයි. මේ මඟින් සේවාදයකයන් මුදලට වටිනා උපාංග භාවිත කරමින් සැබෑ සේවයක් සලසන්නේ දැයි සොයාබැලීමට හැකිය.

ගෝලීය වශයෙන් කල්පනා කර බලන විට සංවර්ධිත ලෝකයේ වහල මත නිෂ්පාදනය කරන කුඩා විදුලි බලශක්ති ඒකකවලට ඇති වෙළෙඳපොළ පුළුල් වන බව පෙනෙන්න ඇති කරුණකි. මෙහි මිල දී ගැනීමේ මිල ගණන් සෑම තත්ත්පරයක දී ම වෙනස් වනු නිසැක ය. වර්තමාන ලෝකය පී ටු පී ලෙස හැඳින්වන සමානයන් අතර ඇති වන ගනුදෙනුවලින් සමන්විත ලෝකයේ දී ඔබගේ වහල මත නිෂ්පාදනය කරන විදුලිබලය ඔබට, අසල්වැසියන්ට හෝ රටේ අනෙක් ප්‍රදේශයක පිහිටි කර්මාන්ත ශාලාවකට අලෙවි කළ හැකි වනු ඇත.

ඉන්පසු මධ්‍යම විදුලිබල ශක්ති වෙළෙඳපොළෙන් මාසය අගදී ගෙවීම් ලබා ගත හැකි වනු ඇත. ස්ථානයකින් ස්ථානයකට විදුලි කිලෝවොට් පැයක් සම්ප්‍රේෂණය කිරීමට වැය වන මුදල අමෙරිකන් ඩොලර් 500ක තරමේ මුදලකට අඩු වන තාක්ෂණය වැඩි ඈතක නොවේ.

බලශක්ති ගබඩා කිරීමේ ක්ෂේත්‍රයේ මේ විප්ලවය දැනටමත් ආරම්භ වී ඇති බව රහසක් නොවේ. වඩාත් සරල විදුලි කෝෂ නිර්මාණය වී ඇත. මතක තබා ගන්න ඉතාම නුදුරු දිනයක දී ඔබට අවශ්‍ය විදුලිබලය ඔබගේ නිවසේ වහලය මතින් නිෂ්පාදනය කරගෙන රාත්‍රී කාලයට භාවිත කිරීම සඳහා විදුලි කෝෂයක තැන්පත් කර ගැනීමට ඔබට හැකි වනු ඇත. ජාතික විදුලි සැපයුමේ විදුලිබලය ලැබුණත් නැතත්, එය ඉතාම පහසු මිලකට ලබා ගත හැකි වනු ඇත. එය දශක කිහිපයකට පෙර සන්නිවේදන ක්ෂේත්‍රයේ රේඩියෝ සංඥ විප්ලවය සිදු වූ ආකාරයෙන්ම යථාර්ථයක් බවට පත්වනු ඇත.

අපට ශ්‍රී ලංකාව තුළ මේ කර්මාන්තයේ ඉහළ වර්ධනයක් ඇති කර ගත හැක්කේ අපගේම උපාංග නිෂ්පාදනයක් සංවර්ධනය කර ගතහොත් පමණි. එනම් පැනල්, ඉන්වර්ටර්ස්, අනෙකුත් උපාංග සහ වඩාත් වැදගත්ම ලෙස කිවහොත් මෙහිම බැටරි නිෂ්පාදනය කර ගන්නා විටදීය. බැටරි සහ පැනල නිෂ්පාදනයට අවශ්‍ය ඛනිජ සම්පත අපට නොඅඩුව තිබීම අපට ඇති තවත් වාසියකි. මෙරටදී දීර්ඝ ආයු කාලයක් ඇති බැටරි නිෂ්පාදනය කිරීමට එක් ශ්‍රී ලාංකික සමාගමක් හෝ වැඩ ආරම්භ කර තිබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාව සැබැවින්ම බලශක්ති සුරක්ෂිත රටක් බවට පත් කිරීමට තිරසර බලශක්ති විප්ලවයක් සිදු කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතුය.

හර්ෂ වික්‍රමසිංහ – ශ්‍රී ලංකා තිරසර බලශක්ති අධිකාරියේ
ශුද්ධ ගිණුම්කරණ යෝජනා ක්‍රමය ශුද්ධ මිනුම්කරණයකට
ප්‍රවර්ධනය කිරීමේ කමිටුවේ කැඳවුම්කරු
(ප්‍රතිචාර සඳහා harsha@energy.gov.lk)




දැන්වීම් අතිරේක අංශය
: 0112 429 339, 0777 270 076
සම්බන්ධීකරණය
යසිර් මුම්දාස්
LAKE HOUSE

වෂී 2022ක් වූ මාර්තු මස 13 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# සිළුමිණ The Silumina JOBS
## රැකියා අතිරේකය

## පොලිස් රෝහලේ පුරප්පාඩුව පවතින ඖෂධවේදී කාර්ය මණ්ඩලය සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික ඖෂධවේදීන් බඳවා ගැනීම

01. නාරාහේන්පිට හා කුණ්ඩසාලේ පොලිස් රෝහල්වල පුරප්පාඩුව පවතින ඖෂධවේදී තනතුරු 07 ක් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කර, විශ්‍රාම ලැබූ ඖෂධවේදීන්, පොලිස් නිල තනතුරු රහිතව සිවිල් නිලධරයන් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.
02. මෙම තනතුර සඳහා පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කර විශ්‍රාම ලැබූ ඖෂධවේදීන්ට අයදුම් කළ හැක.
    - i. 2021.12.31 දින හෝ ඊට පෙරාතුව වයස අවුරුදු 60 ක් සම්පූර්ණ වූ සහ එදිනට වයස අවුරුදු 63 ට අඩු අවම වශයෙන් වසරක කාලයක් සේවය කිරීමට හැකියාව ඇති අයෙකු වීම.
    - ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඖෂධවේදියෙකු ලෙස (අභ්‍යන්තර හෝ බාහිර) ලියාපදිංචි වී තිබීම.
    - iii. විනය හේතුන් නොමැතිව සාමාන්‍ය පරිදි විශ්‍රාම ගත්වා ඇති අයෙකු වීම.
    - iv. වෛද්‍ය නිර්දේශයකින් තවදුරටත් සේවය කළ හැකි බවට තහවුරු කර තිබීම.
    - v. දිවා / රාත්‍රී සේවය කිරීමට හැකියාවක් තිබීම.
    - vi. දිවයිනේ ඕනෑම ස්ථානයක රාජකාරී කිරීමට හැකියාව තිබීම.
03. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගන්නා අතර, ඔවුන් අදාළ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ.
04. නැවත සේවයේ යොදවා ගන්නා නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 අනුව දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.
05. නියමිත අයදුම්පත සමග අදාළ විශ්‍රාමික නිලධාරියා තවදුරටත් සේවයේ යෙදීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයකින් යුතු බවට වෛද්‍ය වාර්තාවක් සෞඛ්‍ය 307 ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය.
06. ඊට අමතරව, අදාළ නිලධාරියාගේ අයදුම්පත්‍රය සමග පහත ලිපි ලේඛන ද ඉදිරිපත් කළ යුතුයි.
    - i. නිලධාරියා විශ්‍රාම ගත්වා ඇති ලිපියේ සහතික කළ පිටපත
    - ii. ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත
    - iii. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත
07. අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2022.04.01 දිනට පෙර යොමු කළ යුතුයි. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පොලිස් රෝහලේ ඖෂධවේදී තනතුර සඳහා විශ්‍රාමික ඖෂධවේදීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කරන්න.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

**අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන),**
**අංක 78, දෙවන මහළ,**
**මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල,**
**ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.**

**සී.ඩී. වික්‍රමරත්න**
**පොලිස්පති.**

### පොලිස් රෝහලේ සේවය සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික ඖෂධවේදීන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය

01. සම්පූර්ණ නම - ..................
02. මුලකුරු සමග නම - ..................
03. ස්ත්‍රී / පුරුෂ භාවය - ..................
04. උපන් දිනය - ..................
05. ජාතික හැඳුනුම්පත් අංකය - ..................
06. ආගම - ..................
07. පෞද්ගලික ලිපිනය - ..................
08. අධ්‍යාපන සුදුසුකම් - ..................
09. විශ්‍රාම ලැබීමට ආසන්න වසර 05 තුළ රාජ්‍ය සේවයේ දැරූ තනතුරු

| ආයතනය | තනතුර | සේවාව / පන්තිය / ශ්‍රේණිය සමග | කාලපරිච්ඡේදය (සිට / දක්වා) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. රාජ්‍ය සේවයේ අවසාන වසර 05 තුළ විනය ක්‍රියාමාර්ගයකට ලක්වී ඇති / නැති බව - ..................
11. විනය ක්‍රියාමාර්ගයකට ලක්වී ඇත්තම් විස්තර - ..................
(මේ පිළිබඳව ආයතන ප්‍රධානියා සෑහීමකට පත්විය යුතුය)
12. විශ්‍රාම ගැන්වූ දිනය - ..................
13. විශ්‍රාම ලැබූ ආකාරය - (අදාළ නොවන කොටස කපා හරින්න)
    - i. අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට ළඟාවීම
    - ii. වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයසට ළඟාවීම
    - iii. ස්වේච්ඡා විශ්‍රාම ගැනීමේ වයසට ළඟාවීම
    - iv. විනය හේතු මත
    - v. වෙනත් (හේතු දක්වන්න)
14. විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවනු ලබා ඇත්තම් ඒ පිළිබඳ විස්තර -

| ආයතනය | තනතුර | සේවාව / පන්තිය / ශ්‍රේණිය සමග | කාලපරිච්ඡේදය (සිට / දක්වා) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : ..................

..................
අයදුම්කරුගේ අත්සන

## පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

## ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ

---

**උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

## උක් පර්යේෂණ ආයතනය

## ඇබෑර්තු

උඩවලවේ උක් පර්යේෂණ ආයතනයේ පහත දක්වා ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සහිත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ සම්ප්‍රේෂණ) (HM 1-3) - තනතුරු 01**
- **ප්‍රධාන පර්යේෂණ නිලධාරී (HM 1-3) - තනතුරු 05**
- **ප්‍රධාන තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී (HM 1-3) - තනතුරු 01**
- **ජ්‍යෙෂ්ඨ තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී (AR 2) - තනතුරු 01**
- **පර්යේෂණ නිලධාරී (AR 1) - තනතුරු 01**

විස්තර සඳහා ආයතනයේ වෙබ් අඩවිය වෙත යොමු වන්න.

අයදුම්පත්‍ර, ආයතනයේ වෙබ් අඩවිය වන www.sugarres.lk වෙතින් බාගත කළ අදාළ පෝරමයේ සම්පූර්ණ කර ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් 2022 අප්‍රේල් 07 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබීමට සළස්වන්න.

**අයදුම් කරනු ලබන තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර එවන්න**

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී හරහා යොමුකළ යුතුය.

මෙම අවශ්‍යතාවයන් සමග අනුකූල නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප විය හැක.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**උක් පර්යේෂණ ආයතනය,**
**උඩවලවේ.**

---

**වැවිලි අමාත්‍යාංශය**

**පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

## පොල් පර්යේෂණ ආයතනය - ලුණුවිල

## පරාග සංයෝජන සහයකයින් බඳවා ගැනීම

පොල් පර්යේෂණ ආයතනයේ පුරප්පාඩු ව පවතින පරාග සංයෝජන සහයකයින් බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්** : අයදුම්කරුවන් මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවිය යුතු අතර, පොල් ගස්වල බඳිනු ලබන හැර භාවිතයෙන් පොල් ගස් නැගීමට හැකියාව පුහුණුවෙන් පසු පැවතිය යුතුයි.

**වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 නොවැඩි පිරිමි අයවලුන් විය යුතුය.

**පුහුණුව** : වැටුප් සහිත මාසික පුහුණු කාලසීමාව සාර්ථකව නිම කිරීමෙන් පසුව සුදුසුකම්ලත් අයවලුන්ගෙන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඔවුන් සඳහා පොල් පර්යේෂණ ආයතනය විසින් පිළිගත් සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

**වැටුප්** : මාසයකට රු. 30,000/- කට වැඩි වැටුපක් උපයාගත හැකිය. දීමනා : පැමිණීමේ දිරි දීමනාව (අත්පරාගත) දිනකට රු. 175/-, වෛද්‍යාධාර, තේ දීමනාව හිමි වේ.

**අනෙකුත් ප්‍රතිලාභ** : නිල ඇඳුම්, රාජකාරී හැඳුනුම්පත, බැංකු ණය පහසුකම්, EPF, ETF, පාරිතෝෂිත දීමනා, කම්කරු වන්දි රක්ෂණ ක්‍රමය හා වෙනත් පහසුකම් ලබාදෙනු ලැබේ.

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහ ග්‍රාමසේවා සහතිකය පිටපත්, වෙනත් සුදුසුකම් සමග සම්පූර්ණ තොරතුරු ඇතුළත් කර, තමා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් 2022.03.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල ලිපිනයට එවීමට කටයුතු කරන්න. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පරාග සංයෝජන සහයකයින් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

**සභාපති,**
**පොල් පර්යේෂණ මණ්ඩලය,**
**බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල.**

---

## සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම
### විශ්ලේෂක වැඩසටහන් සම්පාදක තනතුර
### (Analyst Programmer)

මීගමුව සිට ගාල්ල දක්වා වන දිවයිනේ වෙරළ මාර්ගයේ මෙහෙයුම් කලාප ආවරණය කරමින් ශාඛා 07 ක් සහිත, පාරිභෝගිකයින් 500,000 කට අධික ප්‍රමාණයකට සේවය සපයන, 1500 ක සේවක පිරිසක් සහිත ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ බෙදාහැරීම් ඒකකයක් වන සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් විශ්ලේෂක වැඩසටහන් සම්පාදක තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින් බඳවා ගනු ලැබේ.

| | |
|---|---|
| **අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද** | පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ හෝ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර (03) ක පළපුරුද්ද<br>හෝ<br>පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණිතය හෝ භෞතික විද්‍යාව පිළිබඳ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර (04) ක පළපුරුද්ද |
| **අනෙකුත් සුදුසුකම්** | Java, Net සහ C. පිළිබඳ වැඩසටහන් සම්පාදක දැනුම සමග ව්‍යාපාර ක්‍රියාවලීන් පිළිබඳ මනා විශ්ලේෂණ හැකියාව<br>ඵලදායි සන්නිවේදන හැකියා (වාචික සහ ලිඛිත) මනා නායකත්ව සහ කණ්ඩායම් වැඩ හැකියාව. |
| **වයස** | වයස අවු. 40 ට අඩු |

තෝරාගනු ලබන අයදුම්කරුහට පුළුල් පරාසයක ප්‍රතිලාභ සමග ආකර්ෂණීය වැටුපක් හිමිවනු ඇත.

ඔබගේ සවිස්තරාත්මක අයදුම්පත්‍ර, සහතික පත්‍ර පිටපත් සමග, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සමග පහත ලිපිනය වෙත 2022 මාර්තු 23 හෝ ඊට පෙර ලැබෙන සේ එවන්න.

අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව අයදුම්පත්‍රයේ සහ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර එවිය යුතුය.

**අතිරේක සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පරිපාලන,**
**සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම,**
**පළමු මහල, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල,**
**411, ගාලු පාර, කොළඹ 03.**

---

**ටිපර් රථ රියැදුරන් වහාම අවශ්‍යයි**

ටිපර් රථ රියැදුරු (3cube/5cube)

වැටුප 60,000

පැය 12 සේවාව සඳහා වහාම අවශ්‍යයි

ආහාර හා නවාතැන් පහසුකම් නොමිලේ

0742 900 338
0776 729 772
0770 112 230

---

**ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න**

සිළුමිණ වාහන

---

**පුහුණු / නුපුහුණු දන්ත ශල්‍ය සහයිකාවක් සඳහා ඇබෑර්තු ඇත**

වැටුප් රු. 35,000/- දක්වා.

27/1, කින්රොස් පාර, කොළඹ 04.
දුරකථනය: 077 1109061

---

## සී/ස ප්‍රයිම් විෂ් (පුද්) සමාගම

(කීල්ස් - මට්ටක්කුලිය, කොළඹ 15 අසල)

**ඇඟලුම් කම්හල් ඇබෑර්තු**

**ජුකී ඔපරේටර්ස් - පිරිමි / කාන්තා**

තත්ත්ව පරීක්ෂකයින් (QC) - පිරිමි / කාන්තා මිකැනික් / කාර්මික / කටර්ස් (කපන්නන්)

**මාස්ක් (මුඛ ආවරණ) කම්හල් ඇබෑර්තු**

යන්ත්‍ර ක්‍රියාකරවන්නන්
මිකැනික් / කාර්මික / ගබඩා භාරකරු / කම්කරුවන් / රියදුරන්
ආකර්ෂණීය වැටුප්, ආහාර / නවාතැන් / ප්‍රවාහනය සැපයේ.
ඔබගේ අයදුම්පත්‍රය ඊමේල් මගින් යොමු කරන්න.
හෝ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අමතන්න. hr@primewish.co

**457, ෆර්ගියුසන් පාර, කොළඹ - 15.**
**දු.ක. 077-1666919, 076-7935537**

---

## ඇබෑර්තු

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයොටෙක්නොලෝජි පුද්ගලික සමාගම, යනු ජෛව තාක්ෂණය ආශ්‍රිත නිෂ්පාදන, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුවන වන රජය සතු පුද්ගලික සමාගමකි. අප ආයතනය සමග සහයෝගීව වැඩ කටයුතු කිරීමට කැපවූ අයදුම්කරුවෙකු සොයමු.

### රියදුරු සහ කාර්යාල සහකාර

**අවශ්‍යතා :**

- වලංගු රියදුරු බලපත්‍රයක්
- සියලුම මාර්ග නීති අනුගමනය කරමින් සහ ස්ථාන සහ හොඳම මාර්ග සොයා ගැනීමට ගූගල් සිතියම භාවිතා කරමින් ආරක්ෂිතව ධාවනය කිරීම
- පැහැදිලි ලිඛිත / වාචික සන්නිවේදන කුසලතා
- අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඊට සමාන සුදුසුකම් සපුරා තිබීම
- සංවිධානාත්මක කුසලතා
- වසර පහකට වැඩි සේවා පළපුරුද්ද
- Microsoft Office භාවිතා කරමින් පරිගණකය හැසිරවීම අමතර සුදුසුකමකි
- ඡායා පිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේ හැකියාව
- වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය
- ස්වාධීනව සහ ආරක්ෂිතව වැඩ කිරීමේ හැකියාව
- සංවිධානයට අවශ්‍ය පරිදි සතියේ දිනවල සහ සෙනසුරාද දිනවල දිගු වේලාවක් වැඩ කිරීමේ හැකියාව
- රාජගිරියට ආසන්නව වාසය කිරීම
- යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම

ඔබ ඉහත අවශ්‍යතා සපුරාලන්නේ නම්, මෙම දැන්වීම පළ කළ දින සිට වැඩ කරන දින 7 ක් ඇතුළත ඔබගේ තොරතුරු ඇතුළත් සම්පූර්ණ අයදුම්පතක් ඥාතීන් නොවන විනිසුරුවන් දෙදෙනෙකුගේ විස්තර ඇතුළත්ව පහත සඳහන් විද්‍යුත් තැපෑල හරහා අප වෙත යොමු කරන්න.

**විද්‍යුත් තැපෑල : slibtec@gmail.com**

**ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයොටෙක්නොලෝජි පුද්ගලික සමාගම**
**මාහෙන්වත්ත තලගල පාර, පිටිපන, හෝමාගම.**
**දුරකථන : +94113431844**

# සිළුමිණ සිංහල The Silumina Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk    011 242 9351 - 071 782 9018

## ආරක්ෂක අමාත්‍යාංශය
## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## ලංසු ආරාධනයයි

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා බිත්ති පැනල සහ බිම අතුරන කාපට් සැපයීම, පිරිසැකසීම සහ ස්ථාපනය**

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**
**කොන්ත්‍රාත් අංකය: *KDU/PRO/RP&SERVICE/ 2711/2021***

1 . රත්මලාන, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා බිත්ති පැනල සහ බිම අතුරන කාපට් සැපයීම, පිරිසැකසීම සහ ස්ථාපනය සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

2 . උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2022/03/14** සිට **2022/04/05** දක්වා **පැය 0900** සිට **පැය 1500** අතර කාලය තුළ **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූලයාධිකාරී** වෙත නැවත ගෙවනු නොලබන **රු. 12,500.00** ක ගාස්තුවක් ගෙවා **අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** වෙත ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිල දී ගත හැකි ය.

3. ඉහත ලිපිනයේදී **2022/03/14** සිට **2022/04/05** දක්වා **පැය 0900** සිට **පැය 1500** දක්වා කාලය තුළ ගාස්තුවකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය. **(දුරකථනය: 071 0219449 ෆැක්ස්: 011 2632430).**

4. මුද්‍රා තබන ලද ලංසු, අවසන් දිනට පෙර පහත ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර එසේ නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ.

5. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දී **2022/04/05** දින **පෙ.ව. 10.00 ට** ටෙන්ඩර් භාරගැනීම අවසන් වී විවෘත කෙරෙනු ඇත.

6 . උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** වෙතින් වැඩි දුර තොරතුරු ලබාගත හැකි ය. **(දුරකථනය: 011 2632430 ෆැක්ස්: 011 2632430**, ඊමේල්: directorlogistics@kdu.ac.lk, www.kdu.ac.lk/ocls/tender-notices පළ කළ "ලංසු ආරාධනය")

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**
**රත්මලාන, ශ්‍රී ලංකාව.**

---

## USDA | Save the Children

# Request for Quotation: Kitchen Utensils

(cooking pots, food carriers, eating plates and measuring cups)

**PR-LKA-COL-2022-0072**

Save the Children is implementing a United States Department of Agriculture (USDA) funded school meals project, known as the PALAM/A project in coordination with the Government of Sri Lanka (GoSL), The Ministry of Finance, The Ministry of Education, and The Ministry of Health. The PALAM/A project is part of the McGovern-Dole International Food for Education and Child Nutrition Program, which will provide approved supplementary food items to children in the Government primary schools in seven districts in Sri Lanka.

Save the Children in Sri Lanka wishes to call for an **invitation to bid** from qualified suppliers to supply **kitchen utensils (cooking pots, food carriers, eating plates and measuring cups)** which will provide the school meal providers with the correct kitchen utensils to prepare hot school meals with the USDA donated food commodities, under the PALAM/A Project.

The detailed technical specifications, price schedule, delivery terms and conditions are included in the associated public tender documents, which can be made available once requested via email: **tenders.srilanka@savethechildren.org**. Tender documents will be sent electronically to applicants in a return email on or before **18th March 2022**.

- OR -

Potential bidders may collect the quotation format documents in-person from the following person/location:

Senior Manager – Supply Chain, Admin & IT
Save the Children International,
No: 8 Sinsapa Road, Colombo 06.

It is recommended to request or collect quotation documents as soon as possible.

Formal quotation submissions received after the closing date of **March 25, 2022 at 4:30pm** will not be accepted.

---

## ආරක්ෂක අමාත්‍යාංශය
## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## ලංසු ආරාධනයයි

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා සිවිලිම් පද්ධතිය සැපයීම, පිරිසැකසීම සහ ස්ථාපනය**

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**
**කොන්ත්‍රාත් අංකය: *KDU/PRO/RP&SERVICE(AUD)/ 2713/2021***

1. රත්මලාන, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා සිවිලිම් පද්ධතිය සැපයීම, පිරිසැකසීම සහ ස්ථාපනය සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

2 . උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2022/03/14** සිට **2022/04/05** දක්වා **පැය 0900** සිට **1500** අතර කාලය තුළ **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූලයාධිකාරී** වෙත නැවත ගෙවනු නොලබන **රු. 12,500.00 ක** ගාස්තුවක් ගෙවා **අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** වෙත ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිල දී ගත හැකි ය.

3. ඉහත ලිපිනයේදී **2022/03/14** සිට **2022/04/05** දක්වා **පැය 0900** සිට **පැය 1500** දක්වා කාලය තුළ ගාස්තුවකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය. **(දුරකථනය: 071 0219449 ෆැක්ස්: 011 2632430).**

4. මුද්‍රා තබන ලද ලංසු, අවසන් දිනට පෙර පහත ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර එසේ නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ.

5. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දී **2022/04/05** දින **පෙ.ව. 10.00 ට** ටෙන්ඩර් භාරගැනීම අවසන් වී විවෘත කෙරෙනු ඇත.

6 . උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** වෙතින් වැඩි දුර තොරතුරු ලබාගත හැකි ය. **(දුරකථනය: 011 2632430 ෆැක්ස්: 011 2632430, ඊමේල්: directorlogistics@kdu.ac.lk**, **www.kdu.ac.lk/ocls/tender-notices** පළ කළ "ලංසු ආරාධනය")

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,**
**රත්මලාන, ශ්‍රී ලංකාව.**

---

## ලංසු කැඳවීමයි

## වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය වැලිසර, රාගම වෙත පතරොම් ප්‍රසම්පාදනය කිරීම

01. දේශීය සහ විදේශීය සැපයුම්කරුවන් වෙතින් වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (CEFAP Unit) වෙත පහත සඳහන් පුපුරණ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසු ආරාධනා පත්‍රයේ තුන්වන කොටසේ (Section III) හි සඳහන් සුදුසුකම් සපුරාලිය හැකි සැපයුම්කරුවන්ගෙන් පමණක් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

**කොන්ත්‍රාත් අංකය**

CEFAP/PRT/09/2021

| | | | |
|---|---|---|---|
| a. | Cartridges 12 SG | - | 250,000 No's |
| b. | Cartridges 12 / 4 | - | 200,000 No's |
| c. | Cartridges 16 SG | - | 9,000 No's |
| d. | Cartridges 16 / 4 | - | 8,000 No's |
| e. | .177 Air Pallets | - | 500,000 No's |

02. ලංසු කැඳවීම ජාත්‍යන්තර තරගකාරී ලංසු කාර්යය පටිපාටිය අනුකූලව සිදු කරනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය සැපයුම්කරුවන්හට අවශ්‍ය වැඩිදුර තොරතුරු වැලිසර, රාගම පිහිටි වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකයේ මිලදී ගැනීමේ නිලධාරීගෙන් දුරකථන අංක 0112958227 හෝ අධ්‍යක්ෂ, වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (දුරකථන අංක 0112955514) වෙතින් ලබාගත හැකිවේ.

04. එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන වෙනම ලංසු ලේඛන මිලදී ගත යුතුය.

05. අධ්‍යක්ෂ, වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය, වැලිසර, රාගම වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර එක් ලංසුවක් සඳහා ආපසු නොගෙවන රු. 4,500.00 බැගින් ගාස්තුවක් මුදලින් ගෙවා 2022 මාර්තු මස 14 වන දින සිට 2022 මැයි මස 04 දක්වා සතියේ වැඩ කරන දිනයන්හිදී 0900 පැයේ සිට 1600 පැය දක්වා ලංසු ලේඛන මිලදීගත හැක. (විදේශීය සැපයුම්කරුවන් විසින් දේශීය නියෝජිතයකු මේ සඳහා පත්කළ යුතුය.)

06. ලංසු විවෘත කරන දින සිට දින 120 ක කාලසීමාවක් සඳහා ලංසු වලංගුතාවය පැවතිය යුතු අතර, සියලු ලංසු සඳහා කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් (Bid Bond) ඉදිරිපත් කළ යුතුය. අදාළ ලංසු සුරක්ෂණය ලංසු විවෘත කිරීමේ දින සිට දින 150 ක කාලසීමාවක් සඳහා වලංගු විය යුතුය. (එම ලබා ගන්නා ලද ලංසු සුරක්ෂණය දේශීය වාණිජ බැංකුවක් මගින් ලබා දීමට කටයුතු කළ යුතුය.)

07. ඇණවුම්පත පිරිනැමීමත් සමග අදාළ සැපයුම්කරු විසින් බදු රහිත ලංසු වටිනාකමින් 10% වටිනාකමට සමාන කොන්දේසි විරහිත කාර්යය සාධන සුරක්ෂණයක් (Performance Bond) ලබාදිය යුතුය.

08. 2022 මැයි මස 05 වන දින 1400 පැය දක්වා කොළඹ 01, කොඩිගහ වීදියේ ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩල සභාපතිවරයා වෙත දෙපිටපතකින් යුතු මුද්‍ර, තබන ලද ලංසු භාර දීම හෝ එම ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ නාවික හමුද මූලස්ථානයේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර්පත් බහාලුම වෙත බහාලීම සිදු කළ හැකි අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන ලංසු නියෝජිතයින් ඉදිරිපිට දී ඒවා විවෘත කරනු ලැබේ.

09. මෙම ලංසු කැඳවීම පිළිබඳ වැඩිදුර විස්තර නාවික හමුද වෙබ් අඩවිය www.navy.lk මගින් ලබාගත හැක.

**අධ්‍යක්ෂ,**
**වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය,**
**රජයේ වෙඩිබෙහෙත් ගබඩාව,**
**වැලිසර, රාගම.**

---

BE BETTER INFORMED! News you can trust now free on your mobile phone.
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
Dinamina  Daily News  Thinakaran
AVAILABLE AT
LAKE HOUSE

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

### කොන්ත්‍රාත් අංකය : HOMESHOP/CAPC/01

ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාන්තා ව්‍යවසායකයින් මගින් ක්‍රියාත්මක කරන කුඩා සුපිරි වෙළඳසැල් ජාලය ස්ථාපිත කිරීම සඳහා පහත සඳහන් භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනලද ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කැඳවීමේ අංකය | උපකරණ / භාණ්ඩ | අවශ්‍ය ප්‍රමාණය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|
| HOMESHOP/CAPC/01/I | තනි පැති රාක්ක | අවම – 48,000<br>උපරිම – 98,000 | 20,000.00 |
| HOMESHOP/CAPC/01/II | දෙපැත්ත සහිත රාක්ක | අවම – 24,000<br>උපරිම – 60,000 | 20,000.00 |

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්වචනය කොට ඇති පරිදි ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසු කැඳවන අතර, එම නිපුණතා සපුරාලන සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘතය.

03. උනන්දුවක් දක්වන සුදුසුකම් ඇති ලංසුකරුවන්ට ඉහත සඳහන් එක් එක් භාණ්ඩ/උපකරණ සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් **20,000.00ක** මුදලක් සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල හෝ කට්ටලයක් **2022.03.14 දින සිට 2022.03.30 දින ප.ව. 2.00** දක්වා රාජකාරී දිනයන්හි දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍යනම් ඉහත දැක්වූ දින හා කාලය තුළ මුදල් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.

04. ඔබගේ මිල ගණන් 2022.03.31 දින ප.ව. 2.00ට හෝ ඊට පෙර **සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC), සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය, 8 වන මහළ, එච් කියු කළම්බු ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමෙන් හෝ එම ලිපිනයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙත ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ සැලැස්විය යුතුයි.

05. ලංසු ඉදිරිපත් කිරීමේ දී එක් භාණ්ඩයකට හෝ භාණ්ඩ කිහිපයක් සඳහා හෝ එක් එක් භාණ්ඩයකින් කොටසකට හෝ ලංසුකරුවෙකුට ලංසු ඉදිරිපත් කළ හැකිය.

06. ලංසුව බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු කැඳවීමේ අංකය එක් එක් භාණ්ඩ හා උපකරණ සඳහා වෙන් වෙන්ව සඳහන් කර එක් එක් ලංසුව තනි අදියරේ එක් ලියුම් කවරයකින් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

07. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, එම ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුව සමග ලංසු ලේඛනයේ සඳහන් පරිදි ලංසුකරණ දත්ත පත්‍රිකාවෙන් **(BDS)** නිර්දිෂ්ඨ ශ්‍රී ලංකා රුපියල්වලින් අනුමත ශ්‍රී ලංකාවේ බැංකුවකින් නිකුත් කළ දින 90ක් සඳහා වලංගු ලංසු ඇපකරයක් තිබිය යුතුයි.

08. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 04 ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති අමාත්‍යාංශයේ දී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍යවේ නම් මෙම අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙතින් (**දුරකථන අංක** 0112681186/0714457846හෝ විද්‍යුත් තැපැල **info@coopmin.gov.lk**) ලබා ගත හැක.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC),**
**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය.**

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

### කොන්ත්‍රාත් අංකය : HOMESHOP/CAPC/02

ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාන්තා ව්‍යවසායකයින් මගින් ක්‍රියාත්මක කරන කුඩා සුපිරි වෙළඳසැල් ජාලය ස්ථාපිත කිරීම සඳහා පහත සඳහන් භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කැඳවීමේ අංකය | උපකරණ / භාණ්ඩ | අවශ්‍ය ප්‍රමාණය | | | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|---|---|
| | | ලීටර ප්‍රමාණය (L) | අවම ප්‍රමාණය | උපරිම ප්‍රමාණය | |
| HOMESHOP/CAPC/02/I | අධිශීතකරණ | 140–180 | 1,500 | 6,000 | 20,000.00 |
| | | 180–230 | 1,500 | 6,000 | |
| | | 230–290 | 5,000 | 9,000 | |
| HOMESHOP/CAPC/02/II | ශීතකරණ | 80–120 | 1,500 | 6,000 | 20,000.00 |
| | | 120–170 | 1,500 | 6,000 | |
| | | 170–230 | 5,000 | 9,000 | |
| HOMESHOP/CAPC/02/III | බෝතල් ශීතකරණ | 120–200 | 1,500 | 6,000 | 20,000.00 |
| | | 200–300 | 5,000 | 9,000 | |

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්වචනය කොට ඇති පරිදි ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසු කැඳවන අතර, එම නිපුණතා සපුරාලන සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘතය.

03. උනන්දුවක් දක්වන සුදුසුකම් ඇති ලංසුකරුවන්ට ඉහත සඳහන් එක් එක් භාණ්ඩ/උපකරණ සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් **20,000.00ක** මුදලක් සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල හෝ කට්ටලයක් **2022.03.14 දින සිට 2022.03.30 දින ප.ව. 2.00 දක්වා** රාජකාරී දිනයන්හි දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍යනම් ඉහත දැක්වූ දින හා කාලය තුළ මුදල් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.

04. ඔබගේ මිල ගණන් 2022.03.31 **දින** ප.ව. 2.30ට හෝ ඊට පෙර **සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC), සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය, 8 වන මහළ, එච් කියු කළම්බු ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමෙන් හෝ එම ලිපිනයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙත ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ සැලැස්විය යුතුයි.

05. ලංසු ඉදිරිපත් කිරීමේ දී එක් භාණ්ඩයකට හෝ භාණ්ඩ කිහිපයක් සඳහා හෝ එක් එක් භාණ්ඩයකින් කොටසකට හෝ ලංසුකරුවෙකුට ලංසු ඉදිරිපත් කළ හැකිය.

06. ලංසුව බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු කැඳවීමේ අංකය එක් එක් භාණ්ඩ හා උපකරණ සඳහා වෙන් වෙන්ව සඳහන් කර එක් එක් ලංසුව තනි අදියරේ එක් ලියුම් කවරයකින් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

07. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, එම ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුව සමග ලංසු ලේඛනයේ සඳහන් පරිදි ලංසුකරණ දත්ත පත්‍රිකාවෙන් **(BDS)** නිර්දිෂ්ඨ ශ්‍රී ලංකා රුපියල් වලින් අනුමත ශ්‍රී ලංකාවේ බැංකුවකින් නිකුත් කළ දින 90ක් සඳහා වලංගු ලංසු ඇපකරයක් තිබිය යුතුයි.

08. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 04 ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති අමාත්‍යාංශයේ දී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍යවේ නම් මෙම අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙතින් (**දුරකථන අංක** 0112681186/0714457846 හෝ විද්‍යුත් තැපැල **info@coopmin.gov.lk**) ලබා ගත හැක.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC),**
**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය.**

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි (EOI)

### කොළඹ "සමුපකාර චතුරස්‍ර" ගොඩනැගිල්ලේ සුඛෝපභෝගී නිවාස ඒකක පෙර - විකිණීම සඳහා අලෙවි උපදේශන සමාගමක්/ ආයතනයක් තෝරා ගැනීම

සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුව (CPCC) විසින්, මුළුමනින්ම නවෝත්පාදක නිර්මාණශීලි පෙනුමක් සහිතව කොළඹ නගර මධ්‍යයේ පිහිටි **"සමුපකාර චතුරස්‍ර"** (COOP SQUARE) ගොඩනැගිල්ලේ සුඛෝපභෝගී නිවාස ඒකක පෙර – විකිණීම (Pre - Sale) සඳහා උපදේශන සේවා සැපයීම අරභයා ස්වකීය අභිලාෂය ප්‍රකාශ කරන මෙන් (EOI) පහත දැක්වෙන යෝග්‍යතා නිර්ණායක සපුරාලන පිළිගත් කීර්තිමත් හා පළපුරුදු අලෙවිකරණ උපදේශන සමාගම්/ ආයතන වෙත, මෙයින් ආරාධනය කරනු ලැබේ. ව්‍යාපෘතියට සමුපකාර අතිරික්ත/ සංවර්ධන අරමුදල් සහ තෝරාගත් ලියාපදිංචි සමුපකාර සමිති මගින් මූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

අලෙවිකරණ උපදේශන සමාගමේ/ ආයතනයේ, යෝග්‍යතාව (සනාථ කිරීමේ ලිපිලේඛන EOI (අභිලාෂය ප්‍රකාශ කිරීම්) යෝජනාව සමග ඉදිරිපත් කළ යුතුය.)

- එම උපදේශක ආයතනය/ සමාගම පසුගිය වසර 3 තුළ ක්‍රියාත්මකව පැවති ක්‍රියාකාරී අලෙවිකරණ උපදේශක සමාගමක්/ ආයතනයක් විය යුතු අතර, සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචිය 2018.07.01 වන දින සිට වලංගුව පැවතිය යුතුය.
- ආයතනයේ අඩුම තරමින් ස්ථිර සේවයේ/ පූර්ණ කාලීන පදනම මත වැටුප් ගෙවනු ලබන සේවකයින් තිදෙනෙකුවත් සිටිය යුතු වන අතර, ඇත්නම් ආශ්‍රිත සමාගමේ ආයතනයේ ලිඛිත තහවුරු කිරීමක්ද ඉදිරිපත් කළ යුතුය. වෘත්තීයවේදී අලෙවිකරණ ආයතනයකින් පිළිගනු ලබන සුදුසුකම් සහිත පූර්ණ ස්ථිර අලෙවිකරුවන් (**Marketers**) අඩුම තරමින් දෙදෙනෙකුවත් සිටිය යුතුය. නම් සුදුසුකම් සහ EPF ආපසු එවුම් වාර්තා (Returns) ඉදිරිපත් කළ යුතුය.
- පසුගිය වර්ෂ තුන සිට පහ දක්වා කාලය තුළ ඉටුකරන ලද අලෙවිකරණ උපදේශක කටයුතුවල පරිමාවේ සාමාන්‍ය අගය රුපියල් මිලියන 5 කට වැඩි විය යුතු වන අතර, ඉන් අඩුම තරමින් එක් උපදේශන කාර්යයක් (සේවාවක්) හි වටිනාකම රුපියල් මිලියන 7.5 කට වැඩි විය යුතුය.
- අලෙවිකරණ උපදේශක ආයතනයට පසුගිය වසර තුනක කාලය තුළ අලෙවිකරණ උපදේශන සේවා සැපයීම පිළිබඳව සනාථ කළ සේවා වාර්තාවක් තිබිය යුතු වන අතර, පසුගිය වර්ෂ තුන සිට පහ (5) දක්වා වූ කාලය තුළ රුපියල් මිලියන 1,000 කට නොඅඩු වටිනාකමින් යුත් සුඛෝපභෝගී නිවාස ඒකක පෙර විකුණුම් අඩුම තරමින් එකකවත් (01) තියැලී සිටිය යුතුය.
- උපදේශක ආයතනය, ඩිජිටල් අලෙවිකරණ කටයුතුවල යෙදී ඇත්නම් එය අමතර වාසියක් වනු ඇත.
- ආයතනය / සමාගම, අසාධුලේඛනගත නොවී සිටිය යුතු වන අතර, මොනයම් හෝ රජයේ අධිකාරියක් හා සමග දැනට සිදුවෙමින් / විභාග වෙමින් පවතින අධිකරණ නඩුවක නොයෙදී සිටිය යුතුය.
- අලෙවිකරණ උපදේශක ආයතනය/ සමාගම විසින් සැපයිය යුතු සේවාවන් හි විෂය පථය, වනාහි, ඊළඟ ඉදිරි වසර තුනක කාලය තුළ ඉදිකිරීමට නියමිත සුඛෝපභෝගී මහල් නිවාස පෙර විකිණීමේ කාර්ය වනු ඇත. උපදේශක කාල පරිච්ඡේදය එක් වසරක් පමණක් වනු ඇත.
- උපදේශක ආයතනය/ සමාගම තෝරාගනු ලබන්නේ 2007 වර්ෂයේදී ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් ප්‍රසිද්ධියට පත්කරන ලද උපදේශකවරුන්ව තෝරා ගැනීම හා සේවයේ යොදා ගැනීම සඳහා මාර්ගෝපදේශවල එළිදක්වා ඇති විධිවිධාන/ ප්‍රතිපාදන වලට අනුව වන ගුණාත්මක තත්ත්ව හා පිරිවැය පාදක තෝරා ගැනීම (QCBS) පරිද්දෙන් වනු ඇත. එසේ හෙයින් අදාළ සුදුසුකම් සහිත හා සිය අභිලාෂය ප්‍රකාශ කරන ලද උපදේශක ආයතන අතරින් උපරිමව උපදේශක ආයතන/ සමාගම් හතක් කෙටි ලැයිස්තුගත කරනු ලැබේ. කාර්ය ගුරුත්වය පිළිබඳ සමාලෝචනයට අයත් ප්‍රධාන අංශයන් අතරට අදාළ සුදුසුකම් තාක්ෂණික හා කළමනාකරණ දක්ෂතා හැකියාවන් හා ව්‍යාපාර කටයුතු සහ ව්‍යාපාරයේ නියුතු වර්ෂ ගණන, ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් අනුග්‍රාහකයින්ගේ නිර්දේශ සහ පරිපාලනමය හා මූල්‍ය ශක්තිය ශක්‍යතාවයන් අන්තර්ගත වනු ඇත.
- මෙම අභිලාෂය ප්‍රකාශ කිරීමේ (EOI) ඔබගේම ආකෘතියක් මගින් ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, කෙටිලැයිස්තුගත කිරීම සඳහා ඉතා පැහැදිලිව ඉහත තොරතුරු සාරංශගත කිරීම, අරභයා උපුටා ගැනීමට එමගින් හැකියාව ලැබෙනු ඇත. අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) මුද්‍රා, තබන ලද ලිපිකවරයක බහා, එම ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, **"EOI Marketing (අභිලාෂය ප්‍රකාශ කිරීම් අලෙවිකරණය)"** යනුවෙන් සටහන් කර 2022 අප්‍රේල් මස 04 වන සඳුදා දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **"කැබිනට් මණ්ඩලය පත් කළ උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති"** වෙත යොමුකර එවීම හෝ, කොළඹ 10, T.B. ජයා මාවතේ අංක 464A හි HQ කොළඹ ගොඩනැගිල්ලේ 8 වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම එම පහත ලිපිනයට අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය. අවශ්‍ය වැඩිදුර තොරතුරු හා පැහැදිලි කරගැනීම සඳහා ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් උපුල් ශාන්ත ද අල්විස් මහතා, වෙතින් (**දුරකථන අංක** 011–2681186/ **ජංගම** 071–4457846) මගින් සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා විමසන්න.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය පත්කළ උපදේශන ප්‍රසම්පාදන කමිටුව,**
**8 වන මහල, HQ කොළඹ ගොඩනැගිල්ල,**
**අංක 464A, T. B. ජයා මාවත,**
**කොළඹ 10.**

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

### කොන්ත්‍රාත් අංකයඃ HOMESHOP/CAPC/03

ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාන්තා ව්‍යවසායකයින් මගින් ක්‍රියාත්මක කරන කුඩා සුපිරි වෙළඳසැල් ජාලය ස්ථාපිත කිරීම සඳහා පහත සඳහන් භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කැඳවීමේ අංකය | උපකරණ/භාණ්ඩ | අවශ්‍ය ප්‍රමාණය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|
| HOMESHOP/CAPC/03/I | නාම පුවරු | අවම –7,000<br>උපරිම –14,000 | 60,000.00 |
| HOMESHOP/CAPC/03/II | නාම පුවරු (Lollipop Sign Board) | අවම –7,000<br>උපරිම –14,000 | |

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්වචනය කොට ඇති පරිදි ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසු කැඳවන අතර, එම නිපුණතා සපුරාලන සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන්ට විවෘතය.

03. උනන්දුවක් දක්වන සුදුසුකම් ඇති ලංසුකරුවන්ට ඉහත සඳහන් එක් එක් භාණ්ඩ/උපකරණ සඳහා ආපසු ගෙවනු නොලබන **රුපියල් 60,000.00ක** මුදලක් සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය **2022.03.14 දින සිට 2022.03.30 දින ප.ව. 2.00 දක්වා** රාජකාරී දිනයන්හි දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍යනම් ඉහත දැක්වූ දින හා කාලය තුළ මුදල් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.

04. ඔබගේ මිල ගණන් 2022.03.31 දින ප.ව. 3.00ට හෝ ඊට පෙර **සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC), සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය, 8 වන මහළ, එච් කියු කළම්බු ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමෙන් හෝ එම ලිපිනයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙත ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ සැලැස්විය යුතුයි.

05. ලංසු ඉදිරිපත් කිරීමේ දී එක් භාණ්ඩයකට හෝ භාණ්ඩ කිහිපයක් සඳහා හෝ එක් එක් භාණ්ඩයකින් කොටසකට හෝ ලංසුකරුවෙකුට ලංසු ඉදිරිපත් කළ හැකිය.

06. ලංසුව බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර ලංසු කැඳවීමේ අංකය එක් එක් භාණ්ඩ හා උපකරණ සඳහා වෙන් වෙන්ව සඳහන් කර එක් එක් ලංසුව තනි අදියරේ එක් ලියුම් කවරයකින් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

08. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, එම ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුව සමග ලංසු ලේඛනයේ සඳහන් පරිදි ලංසුකරණ දත්ත පත්‍රිකාවෙන් (BDS) නිර්දිෂ්ඨ ශ්‍රී ලංකා රුපියල්වලින් අනුමත ශ්‍රී ලංකාවේ බැංකුවකින් නිකුත් කළ දින 90ක් සඳහා වලංගු ලංසු ඇපකරයක් තිබිය යුතුයි.

09. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 04 ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති අමාත්‍යාංශයේ දී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

10. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් මෙම අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් වෙතින් (**දුරකථන අංක** 0112681186/0714457846 හෝ විද්‍යුත් තැපැල info@coopmin.gov.lk) ලබා ගත හැක.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC)**
**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය.**

සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

**කොන්ත්‍රාත් අංකය: HOMESHOP/MPC/02**

ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාන්තා ව්‍යවසායකයින් මගින් ක්‍රියාත්මක කරන කුඩා සුපිරි වෙළඳසැල් ජාලය ස්ථාපිත කිරීම සඳහා පහත සඳහන් භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) විසින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කැඳවීමේ අංකය | උපකරණ/භාණ්ඩ | අවශ්‍ය ප්‍රමාණය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|
| HOMESHOP/MPC/02 | අයකැමි මේස | අවම – 7,000<br>උපරිම –14,000 | 20,000.00 |

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්වචනය කොට ඇති පරිදි ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසු කැඳවන අතර, එම නිපුනතා සපුරාලන සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘතය.

03. මේ සඳහා රුචිකත්වයක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ඉහත සඳහන් භාණ්ඩ/උපකරණ සඳහා ආපසු ගෙවනු නොලබන **රුපියල් 20,000.00ක මුදලක්** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය **2022.03.14දින සිට 2022.04.04 දින ප.ව. 2.00 දක්වා** රාජකාරි දිනයන්හි දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍යනම් ඉහත දැක්වූ දින හා කාලය තුළ මුදල් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක

04. ඔබගේ මිල ගණන් 2022.04.05 දින ප.ව. 2.00ට හෝ ඊට පෙර **සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC), සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය, 8 වන මහල, එච් කියු කළම්බූ ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ලිපිනයේ අතිරේක ලේකම් (පාලන) නිලකාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ සැලැස්විය යුතුයි.

05. ලංසු ඉදිරිපත් කිරීමේ දී ඉහත සඳහන් අවශ්‍ය ප්‍රමාණයට ම හෝ අවශ්‍ය ප්‍රමාණයෙන් කොටසකට හෝ ලංසුකරුවෙකුට ලංසු ඉදිරිපත් කළ හැකිය.

06. ලංසු ලේඛන "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් මුද්‍රාතබන කවර වල බහා කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"HOMESHOP/MPC/02"** ලෙස සඳහන් කර ලංසුව තනි අදියරේ එක් ලියුම් කවරයකින් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

07. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, එම ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුව සමග ලංසු ලේඛනයේ සඳහන් පරිදි ලංසුකරණ දත්ත පත්‍රිකාවෙන් (BDS) නිර්දිෂ්ඨ ශ්‍රී ලංකා රුපියල් වලින් අනුමත බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් නිකුත් කළ දින 90ක් සඳහා වලංගු ලංසු ඇපකරයක් තිබිය යුතුයි.

08. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 04 ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති අමාත්‍යාංශයට පැමිණ, එම අවස්ථාවට සහභාගීවීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් ඉදිරියේදී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) තීරණය අවසාන තීරණය වේ.

10. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍යවේ නම් මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වෙතින් (**දුරකථන අංක** 0112684185/0741313697 හෝ විද්‍යුත් තැපැල info@coopmin.gov.lk) ලබා ගත හැක.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC),**
**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය.**

---

සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

**කොන්ත්‍රාත් අංකය: HOMESHOP/MPC/01**

ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාන්තා ව්‍යවසායකයින් මගින් ක්‍රියාත්මක කරන කුඩා සුපිරි වෙළඳසැල් ජාලය රක්ෂණ ආවරණය කිරීමට අදාළව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) විසින් සුපිරි වෙළෙඳසැල්වල භාණ්ඩ, උපකරණ, පරිශ්‍රයන් සහ පුද්ගලයන් රක්ෂණ ආවරණය කිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කැඳවීමේ අංකය | ආවරණය කළ යුතු දේපළ/භාණ්ඩ/පුද්ගලයන් | රක්ෂණ මුදල රු. | අවශ්‍ය ප්‍රමාණය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|---|
| HOMESHOP/MPC/01 | වෙළඳසැල් පරිශ්‍රය | 225,000.00 | අවම –7,000<br>උපරිම – 14,000 | 12,500.00 |
| | රාක්ක සහ වෙනත් උපකරණ | 500,000.00 | | |
| | ගෘහ භාණ්ඩ සඳහා | 300,000.00 | | |
| | විදුලි භාණ්ඩ (අධිශීතකරණ, කිරුම් යන්ත්‍ර, පරිගණක, ශීතකරණ සහ බෝතල් ශීතකරණ, තීරු කේත ස්කෑනරය ආදී ) | 450,000.00 | | |
| | ලාච්චුවේ ඇති මුදල් | 25,000.00 | | |
| | මහජන වගකීම් රක්ෂණ ආවරණය (පුද්ගලයන් 02 සඳහා) | 1,000,000.00 | | |
| | පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය (පුද්ගලයන් 02 සඳහා) | 1,000,000.00 | | |

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්වචනය කොට ඇති පරිදි ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසු කැඳවන අතර, අවම වශයෙන් අදාළ රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් ලබා ඇති සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) මගින් බලපත්‍ර ලත් රක්ෂණ සමාගමක් (සාමාන්‍ය) ලෙස ලියාපදිංචිය ලත් සියලුම රක්ෂණ සමාගම් සඳහා ලංසුව විවෘතය.

03. මේ සඳහා රුචිකත්වයක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ඉහත සඳහන් රක්ෂණාවරණය සඳහා ආපසු ගෙවනු නොලබන **රුපියල් 12,500.00ක** මුදලක් සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද විස්තර ඇතුළත් ලේඛනය **2022.03.14 දින සිට 2022.04.04 දින ප.ව. 2.00 දක්වා** රාජකාරි දිනයන්හි දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(පාලන) වෙතින් ලබා ගත හැක.

04. ඔබගේ මිල ගණන් 2022.04.05 දින ප.ව. 3.00ට හෝ ඊට පෙර **සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC), සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය,8 වන මහළ, එච් කියු කළම්බූ ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ලිපිනයේ අතිරේක ලේකම් (පාලන) නිල කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ සැලැස්විය යුතුයි.

05. ලංසු ලේඛන "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් මුද්‍රා තබන කවර වල බහා කවරයේ වම්පස ඉහළ කෙළවරේ "HOMESHOP/MPC/01" ලෙස සඳහන් කර ලංසුව තනි අදියරේ එක් ලියුම් කවරයකින් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

06. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, එම ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුව සමග ලංසු ලේඛනයේ සඳහන් පරිදි ලංසුකරන දත්ත පත්‍රිකාවෙන් (BDS) නිර්දිෂ්ඨ ශ්‍රී ලංකා රුපියල් වලින් අනුමත බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් නිකුත් කළ දින 90ක් සඳහා වලංගු ලංසු ඇපකරයක් තිබිය යුතුයි.

07. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 04 ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති අමාත්‍යාංශයට පැමිණ,එම අවස්ථාවට සහභාගීවීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් ඉදිරියේදී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

08. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) තීරණය අවසාන තීරණය වේ.

09. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වෙතින් (**දුරකථන අංක** 0112684185/0741313697 හෝ විද්‍යුත් තැපැල info@coopmin.gov.lk) ලබා ගත හැක

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC)**
**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය.**

---

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්

## ලංසු කැඳවීම

**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත පහත සේවාවන් ලබාගැනීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමට ලංසු කැඳවනු ලැබේ.**

| | ව්‍යාපෘති නාමය සහ අංකය | ආපසු නොගෙවන ගාස්තු ( රු ) | ලංසු ඇපකරය ( රු ) | මූලික සුදුසුකම | පූර්ව ලංසු රැස්වීම | ලංසු භාරගැනීමේ අවසාන දිනය සහ වේලාවන් | ලංසු පෝරම ලබා ගැනීමේ දිනයන් සහ වේලාවන් |
|---|---|---|---|---|---|---|---|
| 1 | **SLIC/ADMIN/002/2022 -** Selection of a suitable service provider/ professional for work study assignment in SLIC Head Office and two (02) model branches | 3,500/- | 150,000/- (දින 91ක කාලයක් සඳහා) | 1. ලංසුකරු ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු විය යුතුය. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කලයුතුය)<br>2. ලංසුකරුට මේ හා සම්බන්ධ කාර්යන්හි අවම වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (දේශීයව හා ජාත්‍යන්තරව)<br>(තහවුරු කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කර යුතුය) | 2022.03.18 වන දින ප.ව 03.30, ZOOM හරහා පැවැත්වෙනු ලැබේ.(ලංසු පෝරම ලබාගන්නා පාර්ශව සඳහා) | 2022.03.29 වන දින ප.ව 1.00 | 2022.03.14 වන දින සිට 2022.03.28 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා (සතියේ දින) |
| 2 | **SLIC/ADMIN/004/2022 -** MDRT Annual Conference 2022 | 17,900/- | 1,290,000/- (දින 119 ක කාලයක් සඳහා) | 1. ලංසුකරු ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු විය යුතුය. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කලයුතුය)<br>2. IATA සාමාජික සහතිකය තිබිය යුතුය<br>3. සිවිල් ගුවන්සේවා අධිකාරියේ සහතිකය තිබිය යුතුය<br>(තහවුරු කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කර යුතුය) | 2022.03.16 වන දින ප.ව 02.00, ZOOM හරහා පැවැත්වෙනු ලැබේ.(ලංසු පෝරම ලබාගන්නා පාර්ශව සඳහා) | 2022.03.22 වන දින ප.ව 1.00 | 2022.03.14 වන දින සිට 2022.03.21 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා (සතියේ දින) |
| 3 | **SLIC/ADMIN/006/2022 -** Printing and posting of Life Renewal Notices/ Reminders/ Receipts | 3,725/- | 165,000/- | 1. ලංසුකරු ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු විය යුතුය. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කලයුතුය)<br>2. ලංසුකරුහට පහත සඳහන් යන්ත්‍ර තිබිය යුතුය.<br>- Variable Data Printing Machines<br>- Pressure/Self seal Machines<br>- Offset Printing Machines (04 & 05 color)<br>(තහවුරු කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කර යුතුය) | 2022.03.24 වන දින ප.ව 02.00, ZOOM හරහා පැවැත්වෙනු ලැබේ.(ලංසු පෝරම ලබාගන්නා පාර්ශව සඳහා) | 2022.04.05 වන දින ප.ව 1.00 | 2022.03.14 වන දින සිට 2022.04.04 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා (සතියේ දින) |
| 4 | **SLIC/ADMIN/005/2022 -** Printing and posting of Motor Renewal Notices/ Reminders/ Receipts | 4,625/- | 225,000/- | | 2022.03.24 වන දින ප.ව 02.30, ZOOM හරහා පැවැත්වෙනු ලැබේ.(ලංසු පෝරම ලබාගන්නා පාර්ශව සඳහා) | 2022.04.05 වන දින ප.ව 1.00 | 2022.03.14 වන දින සිට 2022.04.04 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා (සතියේ දින) |

- ලංසු පෝරම සඳහා ටෙන්ඩර්කරුගේ ඉල්ලීම ව්‍යාපාර ලිපි ශීර්ෂයක ලිඛිතව අදාළ සුදුසුකම් තහවුරු කිරීමේ ලේඛන සහිතව ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රධාන කාර්යාලය වෙත නියමිත ගාස්තු ගෙවා ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැක. (ආපසු නොගෙවන පදනම මත.)
- ලංසු පෝරම පරීක්ෂාව ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රධාන කාර්යාලය තුලදී සාමාන්‍ය කාර්යාල වේලාවේදී ගාස්තු ගෙවීමෙන් තොරව සිදුකල හැක.
- තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු පහත සඳහන් ඇපකර ලබාදිය යුතුය.
  **(අ)** අත්තිකාරම් මුදලක් නිකුත්කිරීමේදී මුළු ලංසු මුදලේ වටිනාකමින් 30% ක උපරිමයකට යටත්ව වටිනාකමින් යුතු බැංකු ඇපකරයක් දින 91ක කාලයකට වලංගු වනසේ ලබාදිය යුතුය.
  **(ආ)** මුළු මුදලේ වටිනාකමින් 5% /10% ක වටිනාකමකින් යුත් කාර්ය සාධන බැදුම්කරයක්, කොන්ත්‍රාත් කාලය සඳහා වලංගු වන පරිදි, සේවා ඇණවුම් ලැබී දෙසතියක් ඇතුලත ලබා දිය යුතුය.
- ලංසුකරු අසාදු ලේඛණගත නොවී සිටිය යුතුය.
- ලංසු පෝරම පහත ලිපිනයෙන් ලබාගත හැක.
- නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු විවෘත කිරීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සියලුම ලංසු පිලිබඳව අවසන් තීරණය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතුවේ.

**වැඩි විස්තර සඳහා - 011-235 7905/ 011 - 235 7928/ 011 - 235 9186**

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව**
**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්**
**08 වැනි මහල**
**නො. 21, වොක්ෂෝල් වීදිය**
**කොළඹ 02.**
**සමාගම් අංකය** - PB - 289
Web: www.srilankainsurance.com

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

---

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)**

ICTA ideas actioned

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**ලංකා රාජ්‍ය මේඝයේ ස්ථාපිත සේවාවන් සඳහා ජාල ආරක්ෂණ තත්වයන් තක්සේරු කිරීමේ මෙවලමක් හා වෙබ් යෙදවුම් සඳහා වන ආරක්ෂණ තත්වයන් තක්සේරු කිරීමේ මෙවලක් ස්ථාපනය හා වින්‍යාසගත කිරීම ප්‍රසම්පාදනය**

**ICTA/GOSL/GOODS/NS/2021/07**

1. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් ලංකා රජයේ ක්ලවුඩ් ස්ථාපිත කරනු ලැබූ අතර, එය රජය සතු ප්‍රධාන යටිතල පහසුකම වන අතර, වෙබ් යෙදුම් 800 අධික ප්‍රමාණයකට සත්කාරකත්වය ලබා දී ඇත. IT යටිතල පහසුකම් සඳහා විස්තීරණ පරීක්ෂණ සඳහා ආරක්ෂක පරීක්ෂක මෙවලම් (ජාල අවදානම් තක්සේරුව සහ යෙදුම් අවදානම් තක්සේරුව) මිලදී ගැනීමට ICTA ප්‍රගමනය කරනු ලැබේ.එබැවින් LGC සහ සත්කාරක වෙබ් යෙදුම් ආරක්ෂක මට්ටම වලංගු කිරීම සහ නංවාලීම සඳහා ආරක්ෂක පරීක්ෂණ මෙවලම් මිලදී ගැනීමට ICTA අදහස් කරයි.
2. ICTA වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපතිවරයා විසින් ලංකා රජයේ ක්ලවුඩ් (LGC 2.0) සත්කාරක සේවාව සඳහා ජාල ආරක්ෂණ තක්සේරු කිරීමේ මෙවලම සහ ක්ලවුඩ් මත පදනම් වූ වෙබ් යෙදුම් ආරක්ෂණ තක්සේරු කිරීමේ මෙවලම ස්ථාපනය කිරීම සහ වින්‍යාස කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
3. සියලුම ලංසු, ලංසු ලිපි ලේඛන සමග ලබාදී ඇති ආකෘතියට අනුව බැංකු ඇපකරයක් ආකාරයෙන් ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂ විසි දහසක (ශ්‍රීලරු. 120,000.00) වටිනාකමින් යුතු ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුය.
4. මෙම ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ පැවැත්වෙන අතර, එය ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මගින් මෙහෙයවනු ලබන අතර, ලංසු ලිපිලේඛනයන් හි දක්වා ඇති යෝග්‍යතා හා සුදුසුකම් සපුරාලන යෝග්‍යතාපූර්ණ සියලුම ලංසුකරුවන් හට විවෘතව පවතී.
5. අභිලාෂී ලංසුකරුවන් හට නොමිලේ ලංසු ලිපි ලේඛන පරීක්ෂාව කාර්යාල වේලාවන් තුළදී **2022 මාර්තු මස 14 වන දින සිට** **නො. 490, 6 වන මහල, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03** පිහිටි ICTA ප්‍රසම්පාදන අංශයේදී සිදුකළ හැක. **දුරකථන අංකය 2369099 විද්‍යුත් තැපැල** procurement@icta.lk **ලංසු ලිපි ලේඛන** ICTA **වෙබ් අඩවියේ එනම්** (https://www.icta.lk/ procurement/) පරීක්ෂා කර බැලීම සඳහා පමණක් දක්වා ඇත.
6. ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්හට ලිඛිත අයදුම්පතක් එවීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලංකා රුපියල් තුන්දහසක (ශ්‍රී.ලං.රු. 3,000.00) ගාස්තුවක් ගෙවීමෙන් පසු **2022 මාර්තු මස 14 වනද** සිට රාජකාරි දිනයන්හිදී කාර්යාල වේලාවන් තුළදී 5 වන ඡේදයේ දක්වා ඇති කාර්යාල ලිපිනයෙන් මිලදී ගත හැක.
7. සම්පූර්ණ කරන ලද ලංසු 5 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයට **2022 මාර්තු මස 28 වන දින ප.ව. 3.00** හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුභාර ගැනීමේ වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම මේ සඳහා පැමිණෙන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී සිදු කරනු ලැබේ. සියලුම ලංසු, ලංසු ලිපි ලේඛන සමග දී ඇති ආකෘතියට අනුව, 3 වන ඡේදයේ සඳහන් වටිනාකමට බැංකු ඇපකරයක ආකාරයේ ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුය.
8. ලංසු භාර ගැනීමේ අවසාන දිනයට **දින 5 කට** පෙර පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් procurement@icta.lk යන විද්‍යුත් ලිපිනයට ඒවා යොමු කරන ලෙස ලංසුකරුවන්ගෙන් මෙමගින් ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA),**
**නො. 490, 6 වන මහල, ආර්. ඒ. ඩී. මෙල් මාවත,**
**කොළඹ 03.**
**2022 මාර්තු මස 13 වන දින.**

සිළුමිණ The Silumina Tender/OTHER ADVERTISEMENTS
silumina.advt@lakehouse.lk
011 242 9351 - 071 782 9018

# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## ලංසු සඳහා ආරාධනය

### ජාතික ඖෂධ නියාමන අධිකාරියට (NMRA) මයික්‍රොසොෆ්ට් මෘදුකාංග සැපයීම සඳහා ටෙන්ඩර් ලිපිලේඛන

01. NMRA වෙත මයික්‍රොසොෆ්ට් මෘදුකාංග සැපයීම සඳහා සහතිකලත් ප්‍රතිවිකුණුම්කරුවන් හෝ සැපයුම්කරුවන් වෙතින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති විසින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසුකරණ ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රමය (NCB) මගින් මෙහෙයවනු ලැබේ.

03. ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රු. 3,500.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් (ලංකා බැංකුවේ රීජන්ට් වීදිය ශාඛාවේ) අංක 78088835 දරන ගිණුමට NMRA / සභාපති නමට ගෙවීමෙන් අනතුරුව 2022.03.14 දින සිට 2022.04.01 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 09.30 ත් ප.ව. 03.00 ත් අතර කොළඹ - 02, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, නො. 47, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ගිණුම් අංශයෙන් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

04. ලංසු දින 60 ක කාලයකට වලංගු විය යුතුය.

05. යෝග්‍යතා පූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් විස්තර කොළඹ - 02, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, නො. 47, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ගණකාධිකාරී වෙතින් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.30 ත් අතර දුරකථන අංක 0112303157 මගින් ලබාගත හැකිය.

06. **"මයික්‍රොසොෆ්ට් මෘදුකාංග සැපයීම"** යනුවෙන් වම් ඉහළ කෙළවරේ පැහැදිලිව ලකුණු කළ මුද්‍රා තැබූ කවරයක බහාලූ ලංසු 2022.04.04 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **කොළඹ - 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, නො. 47, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ,** ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් කොළඹ 02, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, නො. 47, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වෙත තැපැල් මගින් ලැබෙන්නට සැලැස්විය යුතුය.

07. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ, ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් කටයුතු වල යෙදෙන වාණිජ බැංකුවක් මගින් නිකුත් කළ දින 60 ක කාලයකට වලංගු ශ්‍රී ලං. රු. 100,000.00 ක වටිනාකමැති ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.

08. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. 2022.04.04 දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීමේ වේලාව අවසන් වූ වහාම ගිණුම් අංශයේදී ලංසු විවෘත කෙරේ. එම අවස්ථාවට සහභාගී වන ලෙස ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,
ජාතික ඖෂධ නියාමන අධිකාරිය,
නො. 47, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත,
කොළඹ - 02.**

---

1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491
LAKE HOUSE

---

# දැන්වීමයි

## කර්මාන්ත අමාත්‍යාංශය

## ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

**ටෙන්ඩර් අංකය :** LMSL/SUP/PR/WDA/2022/48/2

### පරිපාලන, මූල්‍ය සහ විනය පටිපාටි සකස් කිරීම සඳහා මිල ගණන් කැඳවීම

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ස්ථාපිත මහා භාණ්ඩාගාරය සතු සමාගමකි. මෙම ආයතනයේ ප්‍රධාන කාර්යාලය රාජගිරියේ පිහිටා ඇති අතර, ඛනිජ වැලි නිෂ්පාදන යන්ත්‍රාගාරය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුල්මුඩේ ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 842 ක් වේ. ආයතනයේ පරිපාලන හා මූල්‍යමය කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පරිපාලන කාර්ය පටිපාටිය, මූල්‍ය පටිපාටිය සහ විනය පටිපාටිය සකස් කර ගැනීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් හා හෝ ආයතනයන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

ඒ සඳහා කැමැත්තක් දක්වන පාර්ශවයන් තම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, අදාළ විෂය ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද (Experience) හා එක් එක් කාර්ය පටිපාටිය සකස් කිරීම සඳහා වන මිල ගණන් වෙන් වෙන් වශයෙන් 2022-03-28 දින ප.ව. 2.30 ට පෙර සභාපති, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්, අංක 341/21, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීම හෝ රාජගිරිය, ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම හෝ සිදුකළ හැක. 2022-03-28 වෙනි දින ප.ව. 02.30 ට රාජගිරිය ප්‍රධාන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවට අවශ්‍ය නම් ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැක.

තවද මේ සම්බන්ධයෙන් කැමැත්තක් දක්වන පාර්ශවයන්ට වැඩිදුර තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වේ නම්, 2022-03-16 වෙනි දින පෙ.ව. 09.00 සිට ප.ව. 12.00 දක්වා කාලය තුළදී ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ රාජගිරියේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී හමුවී අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

**සභාපති,
ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්.**

---

කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

Funded by
The European Union

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) විසින් අරමුදල් සපයන ලද්දකි

**ණය අංකය - CR5873 LK**

**ව්‍යාපෘති හැඳුනුම් අංකය : P156019**

## වසරක කාලයක් සඳහා ASMP නියමු ව්‍යාපෘති සඳහා ගොවි සමාගම් ස්ථාපනය කොට මෙහෙයවීම සඳහා සේවා සපයන්නෙකු කුලී පදනම මත ලබාගැනීම

**ප්‍රසම්පාදන අංකය : LK-MOA-PMU-277937-NC-RFB**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙතින් කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP) සඳහා විවිධ මුදල් වර්ගවලින් US$ මිලියන 125.00 ට සමාන ණය මුදලක් ලැබී ඇති අතර, එයින් US$ 58.63 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වෙන් කොට ඇත. එම US$ 58.63 ක මුදලින් දළ වශයෙන් US$ 6.20 මුදලක් ගොවි පුහුණුව හා ධාරිතා ගොඩනැගීම සඳහා ආයෝජනය කිරීමට වෙන් කොට ඇත. එම ණය මුදලින් කොටසක් වසරක කාලයක් සඳහා ASMP නියමු ව්‍යාපෘති සඳහා ගොවි සමාගම් ස්ථාපනය හා මෙහෙයුම සඳහා ජාතික සේවා සපයන්නෙකු කෙටි කාලීනව කුලී පදනම මත ලබාගැනීමට කෘෂිකර්ම අමාත්‍යාංශය අපේක්ෂා කරයි. මෙම පැවරුමේ මුළු පිරිවැය රු. මිලියන 94.260 කි.

1. වසරක කාලයක් සඳහා ASMP නියමු ව්‍යාපෘති වෙනුවෙන් ගොවි සමාගම් ස්ථාපනය කොට මෙහෙයවීම සඳහා සුදුසු හා හැකියාව සහිත කෙටි කාලීන සේවා සපයන්නෙකු ASMP හා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අපේක්ෂා කෙරේ.
   යොමුකිරීමේ අනුදේශය (TOR) සඳහා https://www.asmp.lk/advertisement/ බලන්න.
2. කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වසරක කාලයක් සඳහා ASMP නියමු ව්‍යාපෘති වෙනුවෙන් ගොවි සමාගම් ස්ථාපනය කොට මෙහෙයවීම සඳහා කෙටි කාලීන සේවා සපයන්නෙකු කුලී පදනම මත ලබා ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

| විස්තරය | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) |
|---|---|
| වසරක කාලයක් සඳහා ASMP නියමු ව්‍යාපෘති වෙනුවෙන් ගොවි සමාගම් ස්ථාපනය කොට මෙහෙයවීම සඳහා කෙටි කාලීන සේවා සපයන්නෙකු කුලී පදනම මත ලබා ගැනීම | 1,200,000.00 |

03. ලෝක බැංකුව විසින් අනුමත කරන ලද ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන විශේෂඥ වෙතින් ලබාගත හැකි අතර, පහත සඳහන් ලිපිනයේදී 2022-03-14 වෙනි දින සිට 2022-04-04 වෙනි දින දක්වා රාජකාරි දිනයන් හි පෙ.ව. 9.00 සහ ප.ව. 2.00 අතර ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට හා මිලදී ගැනීමට හැකිය.

05. පූර්ව ලංසු රැස්වීමක් 2022 මාර්තු 24 වෙනි දින පෙ.ව. 11.00 ට බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 123/2 හි පිහිටි කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘති කාර්යාලයේදී පැවැත්වේ.

**අ. සේවා සපයන්නාට තිබිය යුතු සුදුසුකම් හා පළපුරුද්ද**

- සතුටුදායක පුහුණු කිරීමේ කළමනාකරණ වාර්තාවක් සහිතව කෘෂි තාක්ෂණය, වෙළඳපල හා බැඳීම් හා ව්‍යවසාය සංවර්ධන පුහුණු කිරීම්වලට අදාළ ක්ෂේත්‍රයන්හි තාක්ෂණික හා කළමනාකරණ සේවාවන් සැපයීම පිළිබඳව අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.
- සමාගම් පිහිටුවීම හා ඒවා කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහිතව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තාක්ෂණ පැවරීමේ වැඩසටහන් හා වෙළඳපල සම්බන්ධකම් ස්ථාපනය කිරීම යන පුළුල් පරාසයක පළපුරුද්ද.
- අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය සහිත හොඳ පළපුරුද්දක් සහිත වෘත්තිකයන් කණ්ඩායමක් නියුක්ත කිරීමේ හැකියාව සේවා සපයන්නාට තිබිය යුතුය.
- අදාළ ක්ෂේත්‍රයේ රජයේ අධිකාරිය විසින් නිකුත් කරන ලද ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ලංසුකරු සතුව තිබිය යුතුය.
- පසුගිය වසර පහ තුළ වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය රු. මිලියන 50 ක් විය යුතුය.

**ආ. තෝරාගැනීමේ නිර්ණායක**

i) කෘෂි තාක්ෂණය, වෙළඳපල හා බැඳීම් හා ව්‍යවසාය සංවර්ධන පුහුණු කිරීම්වලට අදාළ ක්ෂේත්‍රයන්හි තාක්ෂණ හා කළමනාකරණ සේවාවන් සැපයීම පිළිබඳ පළපුරුද්ද - වසර ගණන
ii) පැවැරුම ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩ සැලැස්ම හා ක්‍රමවේදය.
iii) ප්‍රධාන කාර්ය මණ්ඩලයේ නිපුණතා හා ශක්‍යතාවන් : විශේෂඥයින්ගේ සුලභතාවය හා ඔවුන්ගේ සුදුසුකම්
iv) සේවාදයකයන්ගේ යොමුව - ක්‍රියාවට නැංවූ පැවරුම් හා සේවාදයකගේ සම්බන්ධකරගත හැකි විස්තර

(පළපුරුදු ලේඛනගත සාක්ෂි මගින් තහවුරු කළ යුතුය.)

ඇ. ආපසු ගෙවනු නොලබන රු. 20,000/- ක ගාස්තුව ව්‍යාපෘතියේ සරප් වෙත මුදලින් ගෙවීමෙන් අනතුරුව පහත සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.

ඈ. ලංසු, 2022 අප්‍රේල් 04 වෙනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාර දිය යුතුය. විද්‍යුත් මාර්ගගත ලංසුකරණයට අවසර නොමැත. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. 2022-04-04 වෙනි දින ප.ව. 2.00 ට පහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
සම්පූර්ණ කරන ලද ලංසු, මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. එම පිටපත් වෙන් වෙන් වශයෙන් කවර දෙකක බහා මුල් පිටපත හා අනුපිටපත ලෙස සඳහන් කළ යුතුය. එම කවර දෙක නැවත තනි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "LK-MOA-PMU-277937-NC-RFB" යන කොන්ත්‍රාත් අංකය සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද ලිපිනය නම්;

**සභාපති,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය,
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 122/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.**

---

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න
සිළුමිණ වාහන

---

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

**කොන්ත්‍රාත් අංකය : HOMESHOP/MPC/03**

ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාන්තා ව්‍යවසායකයින් මගින් ක්‍රියාත්මක කරන කුඩා සුපිරි වෙළඳසැල් ජාලය ස්ථාපිත කිරීම සඳහා පහත සඳහන් භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) විසින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කැඳවීමේ අංකය | උපකරණ / භාණ්ඩ | අවශ්‍ය ප්‍රමාණය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|
| HOMESHOP/MPC/03/I | ට්‍රොලි (60L) | අවම - 14,000<br>උපරිම -28,000 | 20,000.00 |
| HOMESHOP/MPC/03/II | ප්ලාස්ටික් රෝලර් සාප්පු කූඩ | අවම - 25,000<br>උපරිම -47,000 | 20,000.00 |

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්වචනය කොට ඇති පරිදි ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසු කැඳවන අතර, එම නිපුණතා සපුරාලන සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘතය.

03. මේ සඳහා රුචිකත්වයක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ඉහත සඳහන් එක් එක් භාණ්ඩ/උපකරණ සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් **20,000.00ක** මුදලක් සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල හෝ කට්ටලයක් **2022.03.14 දින සිට 2022.04.04 දින ප.ව. 2.00 දක්වා** රාජකාරි දිනයන්හි දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍යනම් ඉහත දැක්වූ දින හා කාලය තුළ මුදල් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක

04. ඔබගේ මිල ගණන් **2022.04.05 දින ප.ව. 2.30ට** හෝ ඊට පෙර **සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC), සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය,8 වන මහල, එච් කියු කළම්බු ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ලිපිනයේ අතිරේක ලේකම් (පාලන) නිලකාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ සැලැස්විය යුතුයි.

05. ලංසු ඉදිරිපත් කිරීමේ දී ඉහත සඳහන් අවශ්‍ය ප්‍රමාණයට ම හෝ අවශ්‍ය ප්‍රමාණයෙන් කොටසකට හෝ ලංසුකරුවෙකුට ලංසු ඉදිරිපත් කළ හැකිය.

06. ලංසු ලේඛන **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** වශයෙන් මුද්‍රා තබන කවරවල බහා කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු කැඳවීමේ අංකය එක් එක් භාණ්ඩ හා උපකරණ සඳහා වෙන් වෙන්ව සඳහන් කර එක් එක් ලංසුව තනි අදියරේ එක් ලියුම් කවරයකින් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

07. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලබන අතර, එම ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසුව සමග ලංසු ලේඛනයේ සඳහන් පරිදි ලංසුකරණ දත්ත පත්‍රිකාවෙන් (BDS) නිර්දිෂ්ඨ ශ්‍රී ලංකා රුපියල් වලින් අනුමත බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් නිකුත් කළ දින 90 ක් සඳහා වලංගු ලංසු ඇපකරයක් තිබිය යුතුයි.

08. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 04 ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති අමාත්‍යාංශයට පැමිණ, එම අවස්ථාවට සහභාගීවීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් ඉදිරියේදී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) තීරණය අවසාන තීරණය වේ.

10. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වෙතින් (**දුරකථන** අංක 0112684185/0741313697 හෝ විද්‍යුත් තැපැල **info@coopmin.gov.lk**) ලබා ගත හැක.

**සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC),
සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය.**

බිස්නස් නිවුස්

## ලෝක ශ්‍රවණ දිනය වෙනුවෙන් ඩයලොග් සවිබලයෙන්

# රත්මලාන ශ්‍රවණ මධ්‍යස්ථානයේ නොමිලේ ශ්‍රවණ පරීක්ෂණ





ඩයලොග් ආසියාටා සමාගම, රත්මලාන ශ්‍රවණ (Audiology) මධ්‍යස්ථානය සහ ලංකා අන්ධ සහ බිහිරි පාසල -රත්මලාන සමග එක්ව ශ්‍රවණ දිනය වෙනුවෙන් සංවිධානය කරනු ලබන නොමිලේ ශ්‍රවණ පරීක්ෂණ වැඩසටහන මාර්තු 3 වනදා සිට මාර්තු 16 දක්වා සිදු කිරීමට කටයුතු කර ඇත. සියලු ශ්‍රී ලාංකිකයින් වෙත විවෘතව ඇති මෙම සුවිශේෂී අවස්ථාව එම දිනයන්හි පෙ.ව 9 සිට ප.ව 4 දක්වා රත්මලාන බොරුපන පාරේ, අංක 15 ස්ථානයේ පිහිටි රත්මලාන ශ්‍රවණ (Audiology) මධ්‍යස්ථානයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන් හට 0117307308 අංකය ඇමතීමෙන් හෝ 0768 050 600 අංකයට කෙටි පණිවිඩයක් ලබා දීමෙන් නොමිලේ ශ්‍රවණ පරීක්ෂණයක් සඳහා වේලාවක් වෙන් කර ගැනීමට අවකාශ උදා වේ.

ඩයලොග් ආසියාටා සහ ලංකා අන්ධ සහ බිහිරි පාසල එක්ව හවුල් ව්‍යාපාරයක් ලෙස 2007 වසරේදී රත්මලාන ශ්‍රව්‍ය (Audiology) මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ ශ්‍රවණ හා කථන අපහසුතා සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ශ්‍රවණ හා කථන ප්‍රතිකාර පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීමේ අරමුණින් යුතුවය. මෙම පහසුකම පිහිටුවීම වෙනුවෙන් වන අරමුදල් සැපයීම ඩයලොග් සමාගම විසින් සිදු කළ අතර, නඩත්තු සම්බන්ධ වියදම් සහ ප්‍රාග්ධන වියදම් ද අඛණ්ඩව ආවරණය කරනු ලබන්නේ ඩයලොග් සමාගමයි. නවීන උපකරණයන්ගෙන් යුතුව අංග සම්පූර්ණ පහසුකම්වලින් සමන්විත මෙම මධ්‍යස්ථානය තුළින් ශ්‍රවණ පරීක්ෂණ, කථන ඇගයීම් මෙන්ම ශ්‍රවණ හා කථන චිකිත්සාව දැරිය හැකි මිලකට සපයා ගැනීමේ හැකියාව මහජනතාවට උදා වේ.

ලංකා අන්ධ සහ බිහිරි පාසල විසින් කළමනාකරණය කරනු ලබන මෙම මධ්‍යස්ථානය තුළින් එම විද්‍යාලයේ සිසුන් වෙත ශ්‍රවණ පරීක්ෂණ හා කථන චිකිත්සක සේවාවන් නොමිලේ සැපයීමද විශේෂත්වයකි. එසේම මෙම මධ්‍යස්ථානයේ සමාජ වගකීම් අනුව යමින් රජයේ ENT විශේෂඥ වෛද්‍යවරයකුගේ හෝ ග්‍රාම නිලධාරීවරයකුගේ නිර්දේශයන් මත අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් ශ්‍රවණ පරීක්ෂණ නොමිලේ පැවැත්වීමට පියවර ගෙන ඇත. ඊට අමතරව ඒ අවට ඇති රජයේ රෝහල් තුළදී අලුත උපන් දරුවන් සඳහා නව ජන්ම ශ්‍රවණ පිරික්සුම් පරීක්ෂණ නොමිලේ සිදු කිරීමටද කටයුතු කරනු ලබයි. එහිදී ප්‍රධාන වශයෙන් කලුබෝවිල, දකුණු කොළඹ ශික්ෂණ රෝහල සහ පානදුර කේතුමතී මාතෘ රෝහල වෙත එම සේවාවන් ලබා දෙනු ලබයි.

දිවයින පුරා අනෙකුත් බිහිරි විද්‍යාල සඳහාද සහයෝගය ලබා දෙන මෙම මධ්‍යස්ථානය තුළින් දෙමව්පියන්, බිහිරි විද්‍යාලයේ ගුරුවරුන් සහ උපදේශකයින් සඳහා නොමිලේ වැඩමුළු සංවිධානය කිරීමද සිදු කරනු ලබයි.

# AIA ඉන්ෂුවරන්ස්,

## BFSI හොඳම සේවා ස්ථාන10 අතරට තේරී පත්වේ



AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගම ශ්‍රී ලංකාවේ බැංකු, මූල්‍ය සේවා සහ රක්ෂණ ක්ෂේත්‍රය තුළ (BFSI) හොඳම සේවා ස්ථාන 10 අතරට තේරී පත්වීම මහත් අභිමානයෙන් සමරයි. සැමදෙනා එකතුකර ගනිමින් ඔවුන් හා ඉතා හොඳ සන්නිවේදනයක් පවත්වා ගනිමින් සිය වැඩ පරිසරය නිර්මාණය කරගැනීමට AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගමට ඇති කැපවීම ක්ෂේත්‍රයේ අනෙකුත් සමාගම් අතරින් කැපී පෙනීම සඳහා හේතු වේ. කාර්යමණ්ඩල සාමාජිකයින්හට ඉතා හිතවත්ව මෙන්ම සේවය කිරීමට අවැසි සහයෝගය නිරතුරුව ලබා දෙන වැඩ පරිසරයක් සපයා දීමටත්, ඔවුන් කරනා කර්තව්‍යය න්හි වටිනාමකම් පිළිබඳ මනා අවබෝධයෙන් සැමවිට ඔවුන්ව දිරිමත් කරමින් ඇගැයීමටත් සමාගම සමස්තයක් වශයෙන් කටයුතු කරයි.

AIA ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන විධායක නිලධාරී නිබිල් අද්වානී කියා සිටියේ "Great Place to Work වෙතින් හොඳම සේවා ස්ථාන සඳහා පිරිනැමෙන තවත් සම්මානයකට හිමිකම් කීමට හැකි වීමඅපට මහත් ගෞරවයක්. සමාගමක් ලෙස අඛණ්ඩව අප ලබන ශක්තිමත් වර්ධනය සමගින්, කාර්යමණ්ඩල සාමාජිකයින්හට හොඳම දේ ලබාදීමටත් අප යොමු වී සිටිනවා.

AIA ඉන්ෂුවරන්ස් සැමවිටම, සේවය කරන සැමදෙනාගේ සහයෝගයෙන් සහ සහභාගීත්වයෙන් කටයුතු කරමින් වඩාත් ප්‍රීතිමත් මෙන්ම ධනාත්මක වැඩ පරිසරයක් ඇතිකරලීමට කටයුතු කරනවා. අපගේ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකයින් තුළ ඇති, ලැදි බව, අධිෂ්ඨාන ශක්තිය සහ සැමදෙනා තුළ එකම අභිමථාර්තයක් වෙතට ඇති යොමුවීම හේතුකොට, AIA ඉන්ෂුවරන්ස් සේවය කිරීම සඳහා විශිෂ්ටතම සේවා ස්ථානයක් ලෙස අර්ථ දැක්වෙන අතර අප නිරතුරුව එකිනෙකාගේ මෙන්ම අපගේ අගනා සේවාලාභීන්ගේ ජීවිතවලටත් ධනාත්මක වෙනසක් ඇතිකරලීමට උත්සුකව කටයුතු කරනවා".

AIA ඉන්ෂුවරන්ස් හි මානව සම්පත් අධ්‍යක්ෂිකා තුෂාරී පෙරේරා සිය අදහස් දක්වමින් කියා සිටියේ, "මෙවන් සුවිශේෂී සම්මානයක් හිමිවීම පිළිබඳ මා හදවතින්ම සතුටුවන අතර එය අප සමාගමට අත්පත් කරදී, මෙරට මූල්‍ය ක්ෂේත්‍රය තුළ සේවය කිරීම සඳහා හොඳම සේවා ස්ථාන 10 අතරට ඔසවා තැබීමට උරදුන් අපගේ ආදරණීය කාර්යමණ්ඩල සාමාජික සාමාජිකාවන් හට මගේ හදපිරි කෘතඥතාව පළකර සිටිනවා.

විවිධත්වය අගයමින්, සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිගැනෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අපට ඇති කැපවීම මෙවන් ඇගයීම් මගින් තව තවත් ධෛර්යමත් කෙරෙනු ඇති. අපගේ කාර්යමණ්ඩල සාමාජිකයින් ව්‍යාපාර සාර්ථක කරගැනීමට දක්වන දායකත්වයට මෙන්ම, AIA පවුල තුළ ධනාත්මක වෙනසක් ඇතිකරලීම සඳහා ඔවුන්ගේ සුවිශේෂී කාර්යභාරය අප මහත් සේ අගය කරනවා..."

# AIA ඉන්ෂුවරන්ස්

## ඇය සුරකින AIA කාන්තා වැඩසටහන දියත් කරයි.



AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගම 2022 ජාත්‍යාන්තර කාන්තා දිනය සනිටුහන් කරමින් දිවයින පුරා විසිර සිටින කාන්තාවන් සවිබල ගැන්වීමට සහ ඔවුනට සහාය වීම සඳහා වූ සුවිශේෂී කාන්තා වැඩසටහනක් වන "ඇය සුරකින AIA " වැඩසටහන ඉතා සාර්ථක අයුරින් දියත් කරයි.

ශ්‍රී ලංකාවේ රැකියාව කිරීමට හොඳම සේවා ස්ථානයක් පිදුම් ලබා ඇති AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගම සිය කාන්තා කාර්ය මණ්ඩල සාමාජිකාවන් සඳහා විවිධාකාර ප්‍රතිලාභ රැසක් ලබා දෙනු ලබන අතර අඛණ්ඩව ඉතා යහපත් වැඩ පරිසරයක් පවත්වාගෙන යමින්, කාර්ය මණ්ඩල සාමාජිකාවන් හට සැම විට සමාන සහ සාධාරණ අවස්ථා ලබා දෙමින්, ඔවුන්ගේ හොඳම කාර්යසාධනය එළිදක්වමින්, සිය වෘත්තීය අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමට සහාය වෙයි. කාන්තාවන් සවිබලගැන්වීම සඳහා විශ්වසනීය ක්‍රමවේදයක් සකස් කිරීමේ වැදගත්කම සමාගම කල්තියා හඳුනාගත් අතර එසේ නොවුණහොත් කාන්තාවකට ජීවිතයේ මුහුණ දීමට සිදුවන විශේෂිත කඩයීම්වලදී ඔවුන්ගේ වෘත්තීය පසෙකලා එම අභියෝගයන්ට ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට ඇයට සිදුවනු ඇති බව ඉන්ෂුවරන්ස් ලංකා සමාගම මනාව අවබෝධ කරගන්නා ලදී.

"ඇය සුරකින AIA "වැඩසටහන සමගින් AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගමේ කැපවීම සිය සේවිකාවන්ගෙන් ඔබ්බට ගොස් තම සේවාලාභීන්ට, කාන්තා ව්‍යවසායිකාවන්ට මෙන්ම, පොදුවේ මුළු මහත් සමාජය වෙතද දිගුකර ඇත. මෙම වැඩසටහන ඔස්සේ කාන්තාවන් හට රක්ෂණ විසඳුම් සඳහා අවකාශය ලැබෙනවා පමණක් නොව, මූල්‍යමය සාක්ෂරතාව නංවාගැනීම සඳහා පුහුණුව, විවධ තොරතුරු සඳහා අවකාශය මෙන්ම ඇගැයීමට ලක්වීමේ අවස්ථා ද ලැබෙනු ඇති අතර, ඒවා රක්ෂණය හා බැඳුණු දේ පමණක් නොව එහෙත් රක්ෂණය ඔස්සේ යම්කිසි සහාය වීමක් ලබාදිය හැකි වන ආකාරයේ කරුණු ද වේ. කාන්තාවන් සඳහාම වන මෙම නවතම මුලපිරීම් ඔස්සේ AIA හි අපේක්ෂාව වනුයේ කාන්තාවන්ව දිරි ගැන්වීමත්, විශ්වාසයෙන් යුක්තව ඔවුන්ගේ කටයුතු කරගෙන යාමට සහාය දැක්වීමත්, ඔවුන්ගේ රැකවරණය තහවුරු කරමින් ඔවුන්ගේ වටිනාකම අගයන සුරක්ෂිත පරිසරයක් ඔවුන්ට නිර්මාණය කර දීමත් ඔවුන්ගේ මූල්‍යමය සුරක්ෂිතතාව තහවුරු කිරීමත්ය.

AIA ඉන්ෂුවරන්ස් හි මානව සම්පත් අධ්‍යක්ෂිකා තුෂාරී පෙරේරා මහත්මිය සමාගම තුළ කාන්තා පුරුෂ සේවක සමානාත්මතාව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ කරුණු දක්වමින් කියා සිටියේ, "AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගම සිය කාන්තා සේවක බලකාය වෙනුවෙන් පරිපූර්ණ මාතෘ ප්‍රතිලාභ වැඩසටහනක් දියත් කළ, "සිලෝන් සේවායෝජක ෆෙඩරේෂණයෙහි" - EFC (Employers' Federation of Ceylon) පළමු සාමාජික සමාගම වන බවයි

.මෙම වැඩසටහන ඔස්සේ 2015 වසරේ සිට දරු ප්‍රසූතියෙදී මවට නිවාඩු දින 100ක් සමගින් පියා සඳහා පීතෘත්ව නිවාඩු ද ලබා දීමට කටයුතු කර ඇත. පසුගිය වසරේ දී සමාගම සිය කාන්තා සේවක බලකාය 41%ක ප්‍රතිශතයකින් වැඩි කර ඇති අතර සමාගම තුළ කාන්තා නියෝජනය වැඩි කිරීම පමණක් නොව ඔවුන් වෘත්තීය වශයෙන් වැඩිවර්ධනය වීම ද තහවුරු කර ඇත. එමෙන් ම ඉහළ කළමනාකාරීත්වය තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමත් සමාගම මූලිකත්වයෙහි ලා සලකන කරුණකි.

කාන්තාවන්ට රැකියාව කිරීමට නම්‍යශීලී කාලවේලාවන් සහිත සේවා පරිසරයක් ඇතිකරමින් සිය රැකියාව කරන අතරතුර දී දේශීයව මෙන්ම විදේශීයවත් පුහුණු කිරීම් සිදුකරමින් සමාගම සිය කාන්තා සේවක බලකායේ දැනුම, කුසලතා සහ නිපුණතා වර්ධනය සිදුකරනු ලබයි. වර්තමානය වනවිට ඉහළ කළමනාකාරීත්වයේ 33%ක කාන්තා නියෝජනයක් පවතියි. එමෙන්ම AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගමේ අලෙවි බලකාය තුළද 45%ක කාන්තා නියෝජනයක් ඇති අතර මේ ප්‍රමාණය තවදුරටත් වර්ධනය කරගැනීමට සමාගම අපේක්ෂා කරයි.

# යූනියන් ඇෂුවරන්ස්

## විශිෂ්ටයන්ට ඇගයුම්



යූනියන් ඇෂුවරන්ස් සමාගමේ මධ්‍ය වාර්ෂික සම්මාන උළෙල පසුගිය ද උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. රක්ෂණ නියෝජිත, බැංකු රක්ෂණ සහ ආයතනික විකිණුම් යනඅංශ වල සාමාජික සාමාජිකාවෝ 300 කට අධික පිරිසක් මෙම සම්මාන උළෙලේදී ඇගැයීමට ලක්වූහ.

ජයග්‍රාහකයන් සියලුම දෙනා වෙත සිය උණුසුම් සුබපැතුම් එක් කළ යූනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් ගෝමිස් මහතා, අභියෝග පිරුණු වසරක් වූ 2021 වසර තුළ ඔවුන් මෙතරම් විශිෂ්ට ප්‍රතිඵල අත්පත් කරගැනීම විශේෂයෙන්අගය කළේය.

ඒ මහතා වැඩිදුරටත් කියා සිටියේ, ශ්‍රී ලාංකිකයන් අතර ජීවිත රක්ෂණ සම්බන්ධයෙන් ඇති උනන්දුව ඉහළ නැංවීම සඳහා මෙම සාමාජික සාමාජිකාවන් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරමින් සිටින බවයි. තම සාමාජික සාමාජිකාවන් ගේ වෘත්තීය දියුණුව උදෙසා ඉහළ තලයේ පුහුණු අවස්ථා ලබා දීමට යූනියන් ඇෂුවරන්ස් සමාගම සැම විටම කටයුතු කරයි. එමෙන්ම, මෙම සාමාජික සාමාජිකාවන්ගේ දක්ෂතාවන් පුළුල් මට්ටමින් ඇගැයීමට ලක් කෙරෙන අතර, ඒ නිසා ඔවුහු නිරන්තරයෙන් විශිෂ්ටතම සේවාවක් සිය ගනුදෙනුකරුවන් වෙත ලබා දීමට පෙළැඹී සිටිති.

“උසස් මට්ටමේ වෘත්තීය ගුණාංග සමගින් ගනුදෙනුකරුවන් වෙත විශිෂ්ට සේවාවක් ලබා දීම නිසා මේ පිරිස අද මෙසේ ඇගැයීමට ලක්වුණා. ඔවුන්ගේ උනන්දුව හා කැපවීම අප සැබැවින්ම අගය කළ යුතුයි. නොපසුබට උත්සාහය හා කැපවීම ඔස්සේ සාර්ථකත්වය ළඟා කරගත හැකි බව ඔවුන් යළිත් වරක් පෙන්වා දී තිබෙනවා...” යූනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන බෙදාහැරීම් නිලධාරී සෙනත් ජයතිලක මහතා පැවසී ය.

මෙම සම්මාන උළෙලේදී ප්ලැටිනම්, දියමන්ති, රන්, රිදී සහ ලෝකඩ වශයෙන් සම්මාන පිරිනැමිණි. FYPN (First Year Premium New), NOP (Number of Policies), සහPremium Persistency සහ, වාර්ෂික සම්මාන හිමිකරගත් සාමාජිකයන් සංඛ්‍යාව (නායකත්ව කාණ්ඩය සඳහා) යන සාධක අනුව ජයග්‍රාහකයන් තෝරා ගන්නා ලදි. සම්මාන උළෙල Virtual ක්‍රමයට පවත්වන ලද අතර, ජනප්‍රිය ගායිකා ෆැලන් ඇන්ඩ්‍රියා උළෙල රස ගැන්වීමට එක්වූවා ය.

සෑම කලාපයකම ඉහළම ANBP (Annualized New Business Premium) අගයන් වාර්තා කළ සාමාජික සාමාජිකාවන් කලාපීය නව ව්‍යාළපාර ශූරයන් ලෙස තෝරා ගන්නා ලදි. යූනියන් ඇෂුවරන්ස් සමාගමේ සියලුම ජීවිත රක්ෂණ උපදේශකවරුන් අතරින්, ඉහළම නව රක්ෂණ අලෙවියක් වාර්තා කළ සාමාජිකයා ජාතික නව ව්‍යාපාර ශූරයා ලෙස තෝරා ගනු ලැබූ අතර, එම සම්මානය හලාවත ප්‍රාදේශිකයේ චානක අප්පුහාමි වෙත හිමි විය. ‘Sprinter Awards’ කාණ්ඩය තුළ වේගයෙන්ම වර්ධනය වන ඒකකය සහ ‘Team Builder’ වශයෙන් උපකාණ්ඩ දෙකක් යටතේ සම්මාන පිරිනමන ලදි. ‘විශිෂ්ටතම ප්‍රාදේශිකය’ සම්මානය ජා-ඇල ප්‍රාදේශිකය වෙත හිමි වූ අතර, විශිෂ්ටතම කලාපය සම්මානය උතුරු කලාපය විසින් දිනාගන්නා ලදි.

ශ්‍රී ලංකාවේ විශාලතම ලැයිස්තුගත සමූහ ව්‍යාපාරයක් වන ජෝන් කීල්ස් සමූහයේ සාමාජිකයකු වන යූනියන් ඇෂුවරන්ස්, මෙරට පැරණිතම පෞද්ගලික ජීවිත රක්ෂණ සමාගම් අතරින් එකකි.

මේ වනවිට එහි 3,000 කට අධික පරිසක් සේවය කරන අතර, රටපුරා ශාඛා රාශියක් විවෘත කර තිබේ.එම සමාගම 2021 සැප්තැම්බර් මාසය වන විට රු. බිලියන 15.9 ක වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයක්, රු. බිලියන 47.5 ක ක ජීවිත රක්ෂණ අරමුදලක් සහ 250% ක ප්‍රාග්ධන සප්‍රමාණතා අනුපාතයක් (Capital Adequacy Ratio - CAR) වාර්තා කරගෙන ඇත. ශ්‍රී ලාංකිකයන්ට තම සිහින හඹා යාමට අත්වැලක් වෙමින් එම සමාගම, අධ්‍යාපනය, සෞඛ්‍ය, ආයෝජන, රැකවරණය සහ විශ්‍රාම ජීවිතය යන විවිධ අංශ ආවරණය වන පරිදි රක්ෂණ විසඳුම් රාශියක් හඳුන්වා දී තිබේ.

# S-lon

## උතුරේ ජලනළ කාර්මික ප්‍රජාව වෙනුවෙන් විශේෂ වැඩසටහන් දෙකක්





s-Lon Lanka (පුද්.) සමාගම මෑතකදී දිවයිනේ උතුරු පළාතේ ජලනළ කාර්මික ප්‍රජාව වෙනුවෙන් විශේෂ වැඩසටහන් දෙකක් පැවැත්වීමට කටයුතු කළේ ය. මේ අතරින් පළමු වැඩසටහන ජනවාරි 11 දින යාපනය ග්‍රීන් ග්‍රාස් හෝටලයේදී පැවැත්වුණු අතර, දෙවැනි වැඩසටහන ජනවාරි 12 දින පේන්දුරුතුඩුවේ සූරියමහල් හෝටලයේදී පවත්වන ලදි. ජලනළ කර්මාන්තය සම්බන්ධ නවතම තාක්ෂණයන් හා ප්‍රවණතා ආදිය සම්බන්ධයෙන් ජලනළ කාර්මික ප්‍රජාව දැනුවත් කිරීම එම වැඩසටහන් වල මූලික අරමුණ විය. එස්-ලෝන් සමාගම පේරුතුඩුවේදී මෙවැනි වැඩසටහනක් සංවිධානය කළ ප්‍රථම අවස්ථාව මෙය වීම විශේෂත්වයකි.

S-lon ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ ජනප්‍රියතම සන්නාමයක් වන අතර S-lon Lanka (පුද්.) සමාගම කැපිටල් මහරාජා සමූහයට අයත් සමාගමකි. 2001 වසරේදී ශ්‍රී ලංකාවේ ජලනළ කාර්මික ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ ජලනළ කාර්මික ප්‍රජාව සවිබල ගැන්වීම අරමුණු කරගෙන, කැපිටල් මහරාජා සමූහයේ සමූහ අධ්‍යක්ෂ එස්. සී. වීරසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් S-lon ජලනළ කාර්මිකයන්ගේ සමාජය ආරම්භ කරන ලදි. මේ වනවිට 8,000 කට අධික පිරිසක් මෙම සමාජයේ සාමාජිකත්වය ලබාගෙන ඇති අතර, S-lon සමාගම ඔවුන් වෙනුවෙන් රට පුරා වැඩසටහන් රාශියක් ක්‍රියාවට නැංවීමට පියවර ගෙන ඇත. ක්ෂේත්‍රයේ ප්‍රවීණතම වෘත්තිකයන්ගේ සම්පත් දායකත්වය සමගින් මෙම වැඩසටහන් පැවැත්වේ.

S-lon ජලනළ කාර්මික සමාජය ආරම්භ කරන ලද්දේ, මෙරට ජලනළ කර්මාන්තයේ උන්නතියට දායක වෙමින්, ජලනළ කාර්මික ප්‍රජාව වෘත්තීය මට්ටමින් හා පෞද්ගලික මට්ටමින් සවිබල ගැන්වීම අරමුණු කරගෙන බව කැපිටල් මහරාජා සමූහයේ සමූහ අධ්‍යක්ෂ එස්. සී. වීරසේකර මහතා පැවසී ය. මේ යටතේ ජලනළ කාර්මිකයන්ට තම වෘත්තීය කුසලතා හා සුදුසුකම් වැඩිදියුණු කරගැනීමට මගපෙන්වීම් ලබාදෙන අතර, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග එක්ව ඔවුන්ට ජාතික වෘත්තීය පරීක්ෂණය (NTT) සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) වැනි සුදුසුකම් සම්පූර්ණ කිරීමට අත්වැලක් ලබාදීමද සිදුකෙරේ.

## කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට

# මහ බැංකුව සමඟ කාගිල්ස් පෙරමුණට





දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (SME) සහාය දැක්වීමේ සිය දීර්ඝ කාලීන වැඩපිළිවෙළ අඛණ්ඩව කරගෙන යන Cargills සමාගම, SME පුහුණු වැඩමුළු මාලාවක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව කටයුතු කරයි.

පළමු වැඩමුළුව මාර්තු මස 03 වැනි දින රාජගිරියේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු 'විදු පියස' ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර, එහි සමාරම්භක සැසිය ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාවට කෘෂිකර්ම අමාත්‍යාංශය, රාජ්‍ය ආයතන, විදේශ තානාපති කාර්යාල, ජාත්‍යන්තර සංවිධාන සහ විද්වතුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී විය. මෙම පුහුණු වැඩමුළුවට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100කට අධික පිරිසක් සහභාගී විය.

මෙම පුහුණු වැඩමුළුව Cargills 'Village to Home' වැඩසටහනේ තවත් එක් දිගුවක් වන අතර එමගින් Cargills Food City පරිශ්‍රවල කුටි ලබාදෙමින් රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට විශාල පාරිභෝගික ජාලයක් සමග සම්බන්ධ වීමට වේදිකාවක් සලසා දෙයි. අද වන විට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100 කට අධික සංඛ්‍යාවක් මෙම කාගිල්ස් 'ගමෙන් ගෙදරට' වැඩසටහනට සහභාගී වී ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තම නිෂ්පාදන වෙළෙඳපොළට ගෙන ඒමේ දී මුහුණ දෙන අභියෝග, එනම් මූල්‍ය සාක්ෂරතාව අඩුකම සහ වෙළෙඳපොළ ප්‍රමිතීන් සහ තාක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැනි අභියෝග හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය සාක්ෂරතා පුහුණු වැඩසටහන සමඟ එක්ව කුඩා ව්‍යාපාර හිමියන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට Cargills සමාගම කටයුතු කරයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මේවාට සහභාගී වීමෙන් මූලික මූල්‍ය සාක්ෂරතාව, ඇසුරුම්කරණය සහ නිෂ්පාදන සංවර්ධනය සහ තත්ව සහතිකය පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙනු ඇත. මෙම කුඩා ව්‍යාපාර හිමියන් දේශීය ආර්ථිකයට අර්ථවත් ලෙස දායක විය හැකි සාර්ථක ව්‍යවසායකයින් බවට පත් කිරීමට කාගිල්ස් සමාගම කැපවී සිටියි.

වර්ෂ 2022ක් වූ මාර්තු මස 13 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.